# KAWSIḶUMIṆA,

OR

# KUSADÁWATA.

BY HIS MAJESTY
KALIKÁLA SAṄGÍTA SÁHITYA SARWAJÑA PANḌITA
PARÁKRAMA BÁHU,

*King of Ceylon.*

**With a Paraphrase.**

---


EDITED BY

MAḌUGALLE SIDDHATTHA THÉRA,
*Principal of the Saṅgharája Parivéṇa of the Maluatta Monastery, Kandy.*

A PUPIL OF THE VENERABLE SIRI SUMAṄGALA,
*Principal Náyaka Théra of the Western Province of Ceylon, and Principal of the Widyódaya College, Máligákanda, Colombo.*


---


**Published under the Patronage of T. B. Panabokke, Esq.**

---

COLOMBO:
H. ROSS COTTLE, GOVERNMENT PRINTER, CEYLON.

---

*Reprint.*] 1926.

සන්න සහිත

# කව්සිළුමිණ

හෙවත්

# කුසදාවත.

ශ්‍රීමත්

**කැම්බඹර කලිකාල සඞ්ගීත සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු**

මහරජතුමන් විසින් විරචිතයි.

---

**ජී. බී. පාණබොක්කේ මන්ත්‍රීශ්වරයානන්ගේ ආරාධනාවෙන්**

විද්‍යෝදයපරිවෙණාධිපති

**පූජ්‍යපාදශ්‍රී සුමඞ්ගලාභිධාන**

කොළඹ නවකෝරළේ ප්‍රධාන සංඝනායක ස්ථවිරපාදයන්

වහන්සේගේ ශිෂ්‍යවූ

මහනුවර සඞ්ඝරාජපරිවෙණාධිපති

**මඩුගල්ලේ සිද්ධාර්ථාභිධාන ස්ථවිරයන්වහන්සේ විසින්**

චිරකාලානන්තරාගතඅල්පශ්‍රැතලේඛකදෝෂාපහරණයෙන්

සංස්කරණලදී.

---

නෛකශ්‍රීන් විරාජමාන සර් ආර්තර් ඇලිබැංක් හැව්ලොක් ලඞ්කේශ්වර
උතුමානන්වහන්සේගේ අණපරිද්දෙන්

රාජකීය මුද්‍රාලයෙහි ප්‍රධානතැන්පත් එච්. රෙස් කොට්ල් මහතා විසින්
මුද්‍රණයකරණලදී.

---

නැවත මුද්‍රිතයි. | 2470.

TO

HIS EXCELLENCY

SIR ARTHUR ELIBANK HAVELOCK, G.C.M.G.,

*GOVERNOR OF MADRAS,*

THIS BOOK

IS (BY GRACIOUS PERMISSION) *MOST RESPECTFULLY* AND GRATEFULLY

**Dedicated,**

AS A SMALL MARK OF THE APPRECIATION OF THE GREAT AND MATERIAL BENEFITS CONFERRED ON THE SIṆHALESE PARTICULARLY IN FOSTERING THEIR LANGUAGE AND LITERATURE,

DURING

HIS ADMINISTRATION OF THE ISLAND OF CEYLON

FROM 1891 TO 1895,

BY

THE EDITOR.

# PREFACE.

THE Sinhalese language contained a varied and valuable literature. Much of it has disappeared from time to time owing to the ruthless barbarity of our Tamil invaders and from other causes. It is therefore, we think, our pleasing duty to preserve what has been handed down to us by not allowing it to disappear by the ravages of time.

The derivation of the term "Siṇhala," which formed the subject of much discussion at an early period of this century, has now been settled, and is traced to the fabulous lion-origin of our line of kings. Eḷu is now definitely settled to be another term for the ancient dialect of the Siṇhalese language. The most ancient dialect of the language, as appears in old inscriptions and works such as *Sikawalandana Vinisa*, *Dampiyá Aṭuwágeṭapadaya*, &c., is very little understood at the present day.

*Kawsiḷumiṇi Kusadá*, *Sasadá*, *Muwadewdá*, *Lakuṇusara*, *Siyabaslakara*, and *Sidatsaṇgará* are couched in language considered the most elegant by the Siṇhalese scholar, being unalloyed, so to speak, by the importation of foreign words and idioms, of which the later compositions, such as *Kávyasékhara*, *Guttila*, and *Seḷaḷihiṇi Sandésa*, works which are considered as of great merit at the present day, abound. The writers of these works seem to have given way more to ornament, verbal alliteration, and other graces which came into fashion later on, than to purity of language. The present work, which is distinguished by the three names *Kawsiḷumiṇa*, *Kusadáwa*, and *Kusadáwata*, stands

prominently above the rest of its contemporary works named above in elegance of versification, the purity of the language used, and the unbending adherence to the various rules of grammar and versification. For these reasons it is entitled to a very distinguished place among the works of the Sinhalese language, as its name itself indicates : " A Gem in the Diadem of Poesy " (*Kawsiḷumiṇa*).

The learned author of the *Sidatsaṇgará* has drawn many of his illustrations and examples from this work, an additional indication of the respect in which it has always been held.

The author of this work was Kalikála Saṇgíta Sáhitya Sarwajña Paṇḍita Parákrama Báhu II., of Nembambara, who flourished about 1791 A.B. (1248 A.C.). He reigned at Dambadeniya, in the present North-Western Province, and was considered a very powerful monarch, whose glory as a warrior and distinguished patron of literature (he himself being a very distinguished scholar, as the work under notice and others show) gave him a prominent place among the kings and men of letters of his day. He is said to have been versed in all the arts and sciences considered liberal at the time. He is attributed to have possessed a knowledge of the sixty-four sciences and arts which will be found enumerated in the Siṇhalese version of this Preface. He was considered a renowned Buddhist divine, as his Sannaya of the famous work *Visuddhimagga* amply shows. His great and continued victories over the Tamils, who overran our country at this period, barbarously destroying all literature, was the theme of the historian of the time. The *Maháwaṇsa* and other works give prominence to his reign as one of the most illustrious in the annals of Ceylon. We have quoted some references from these works in our Siṇhalese Preface, but refrain from reproducing them here, for obvious reasons.

The work not being intelligible to the ignorant copyists, was full of errors, and our efforts, by collating several manuscripts with a view to bringing out a correct edition,

were at first so much beset with difficulties that we gave up the idea of editing it. It was reported in a newspaper at the time that several efforts made in the same direction by others ended in their giving up the work.

When we were in this state of mind, Mr. PÁNABOKKE, who has always evinced a great and laudable interest in matters of this kind, encouraged us to proceed with the work, and, having brought the matter to the notice of His Excellency the then Governor of the Island, obtained His Excellency's kind permission to have the work printed at the Government Press. Encouraged by his (Mr. Pánabokke's) advice and help, we collected about thirteen manuscripts from various parts of the Island, and after a very careful comparison of the texts now lay the result of our long and tedious labours before the public. In none of these have we found the opening stanzas of the poem adoring the subject of the writer's faith, usual in all works of Oriental literature. As the subject of the poem is the birth story of King Kusa as found in the Játakas, we have given the Páli version of the story from the Játakas.

This book contains fifteen chapters. Some of the stanzas are so constructed as to admit of being reduced to the form of diagrams, and we have printed them in that form at the end of the work.

My special thanks are due to His Excellency Sir A. E. HAVELOCK for graciously permitting me to have the work printed at the Government Press free of expense. In Ceylon, as is well known, works of this nature find no ready sale. The consequence is very few people care to sacrifice their time, with the prospect of not being able even to recoup the bare expenses of printing and paper. But for His Excellency's gracious permission, it is doubtful whether I would ever have ventured to undertake the printing of this work: I have already said, and would repeat it here, that it was obtained through the kind intervention of Mr. PÁNABOKKE.

In conclusion, my best thanks are due to the learned MAHAGODA ÑÁNISSARA STHAVIRA, Sub-Assistant Principal of the Widyódaya College, Colombo, for looking over the final proof sheets for me, and to the Government Printer (Mr. G. J. A. SKEEN) and his Principal Assistant (Mr. H. C. COTTLE), who, in carrying the work through the press, showed much consideration to the delays, not to speak of other shortcomings, on my part.

MAḌUGALLE SIDDHATTHA STHAVIRA.

*Saṇgharája Parivéṇa,*
*Malwatta Monastery, Kandy,*
*January, 1899.*

# විඥාපනය.

ශ්‍රී සද්ධර්මවරචක්‍රවර්ත්තිස්වාමීවූ අප ත්‍රිලෝගුරු සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජොත්තමයානන්වහන්සේ විසින් සකලසත්ත්වයන් කෙරෙහි පතළ මහාකරුණාවෙන් උපලක්ෂිතව මුළුලොව ප්‍රකම්පිත කරවමින් දෙශනා කර වදාළ තමන්වහන්සේගේ ප්‍රවචනසඞ්ඛ්‍යාත සාර්ථකථාත්‍රිපිටකපාලිධර්මගති කොට ඇති මාගධීසඞ්ඛ්‍යාත මාතෘභාෂාහුගේ පුත්‍රීරූපවූ දෙශීයභාෂාන්තරයෙන් උතුම්කොට ගිණිය යුතු කර්ණ්ණමාධුර්ය්‍යයෙන් සුලලිතවූ මේ සිංහල භාෂාගෙන් නොයෙක් මාහැඟි ධර්මප්‍රකරණ කාව්‍යග්‍රන්ථනිර්මාණසදලාප වෛචිත්‍ර්‍යයෙන් පශ්චිමජනතානුග්‍රහකළ අප ලාඞ්කිකපුරාතනාචාර්ය්‍යවර්ය්‍යයන්ගේ සච්චරිතාපදානකීර්ත්තිප්‍රතිබිම්බයන් ප්‍රතිවිලොකනයට වජ්‍රදර්පණතලප්‍රතිභාගවූ තත්තවාඞ්මයග්‍රන්ථප්‍රබන්ධ මන්දබුද්ධිකලෙඛකදොෂකාලුෂ්‍යයෙන් දූෂිතව අදෘශ්‍යතාභාවප්‍රාප්තවිය නොදී උද්ග්‍රහණධාරණාවබොධයට සුකරසේ ශොධනය ප්‍රකටීකරණය ආවශ්‍යක වේ.

ඒ මේ සිංහලභාෂාව නම් :—දඹදිවැ කලිඟුරට කලිඟුසක්විති රජහුගේ රාජවංශය නොසිඳැ පැවැතා වඟුරට වඟුරජදූ කුසැ ලාඩදෙශයෙහි සිහරදෙකුනිසා උපන් සිංහබාහු නම් කුමරු එම සිහරදුන් ලානය ආදානය කළහෙයින් සිංහල නම් විය; භගීරථ ශබ්දයෙන් භගීරථරජහුගේ පරපුරෙන් පැවැතා කපිලවස්තුපුර වාසී සෙසුරජවරුත් ප්‍රකාශකරණු ලබන්නාක් මෙන් සිහරදුන් නිසා උපන් සිංහබාහුරජහු පිය් දෙතිස් රජකුමරුවරුන් අතුරෙන් පවිත්‍ර චාරිත්‍ර විචිත්‍රගුණ ප්‍රඥාතෙජොබලපරාක්‍රම ඇති අතිජාතපුත්‍රවූ රුද්‍රයක්ෂශත්‍රුමථනයෙන් ප්‍රථමකොට ලක්දිව් විජයග්‍රහණයෙන් රජසිරිපැමිණි විජයරජහුද—ඔහුගේ කනිෂ්ඨ භ්‍රාතෘවූ දඹදිවැ සිංහපුරයෙහි රජසිරිපැමිණි සුමිත්තාරජහුද ඔහු පිත් සිංහපුරයෙන් අවුත් ලක්දිවැ රජසිරිපැමිණි පඬුවස් දෙව්රජහුද ඔහු දරුමුනුබුරු පරපුරෙන් පැවැති රජකුමරු මැතිවරුද සිංහල නම් වෙත් ;

ඒසින් කීහ :

සීහබාහුනරින්දො සො සීහමාදිනනවා ඉති,
සීහලො තෙන සම්බන්ධා ආහු සබ්බෙපි සීහලා-සී.

සක්දෙව්රජහට නිවාසභූමිවූ **පුරය ශක්‍රපුර** නමින් ප්‍රකටවූසේ එකී සිංහලරජුන්ට නිවාසභූමිවූ මේ විපය **සිංහලවිප** නම් විය : මඛ්‍යදෙසස්වූ ජනයා **මඛ්‍ය** ශබ්දයෙන් කියනුලබන්නාක් මෙන් සිංහලදෙශස්ථවූ ජනයෝ **සිංහල** ශබ්දයෙන් කියනුලැබෙත්. ඒ සෛංහලිකයන්ගේ භාෂාව **සිංහලභාෂා** නම් වියයි දතයුතු.

තවද ඒ **සීහලභාසා** යන පාලිශබ්දයෙන් හෝ **සිංහලභාෂා** යන සංස්කෘතශබ්දයෙන් හෝ තද්භව වශයෙන් සිඩවූ **හෙළුබස** යන පදයාගේ ආදිහකාරස්ථ එකාරය ශෙෂව හකාරය ලොප්වැ **එළුබස** කියාද **එළුව** කියාද ව්‍යවහෘත විය, තද්භෂාතොමෝ **මිශ්‍රාමිශ්‍ර** විසින් විවිධ විය, ඉන් අමිශ්‍රවූ ගැඹුරුවූ සූතිස්අකුරකින් හොබනාවූ සිංහලභාෂාවට **එළුබස=එළුව** යයි බෙහෙවින් ව්‍යවහාර කරති.

ඉතා පුරාතන **ශිලාලෙඛන, සිකවළඳනවිනිස, දම්පියාටුවා ගැටපදාදියෙන්** ප්‍රකාශවන සිංහලභාෂාව වනාහි මෙකලට දුරවබොධ අන්‍යභාෂාවක් සේ භාස්‍යවිසමයොත්පාදකවාඛ්‍යමාල බාහුල්‍යයෙන් සමන්විතයි

**කව්සිළුමිණ් කුසද, සසද, මුවදෙව්ද, ලකුණුසර, සිය බස්ලකර, සිදත්සඟරාදියෙන්** ප්‍රකාශ වන භාෂා වූකලි ඉතා පිරිසිදු ගැඹුරු මාහැඟි සිංහලභාෂාවයි.

දැනට ජෙකප්‍රයොගයයි සම්මතවූ **කාව්‍යශෙඛර, ගුත්තිල, ශාරිකාපක්ෂිසන්දෙශාදිකාව්‍ය** ඉතා යහපත් නිමුත් ඇතම් තැන්හි එළිසමකිරීම් යවහන්දොස්පහකිරීම් විත්‍තකිරීම් ආ්‍යම කිරීම් ආදිවශයෙන් ප්‍රකෘතිශබ්ද වෙනස් කොට ගළපනලද භාෂායෙන් හා පදපුරවනු සඳහා යොදනලද වාක්‍යබාහුල්‍යයෙන් යුත් කාව්‍යාපෙතයි.

මෙකී **කව්සිළුමිණ් කුසද, සසද,** ඈ ගීපොත් එබඳු විත්‍තාගම පාදපූරණාදි වාග්බාහුල්‍යයෙන් බෙහෙවින් විරලවූ යහපත් පිරිසිදු ගැඹුරු සිංහලභාෂායෙන් සුලලිතයි.

**කව්සිළුමිණ = කුසදාව = කුසදාවත**—යි නාමධෙයත්‍රයකින් ප්‍රකටවූ මේ මහාසීසිංහලකාව්‍යය එකී **සසද, මුවදෙව්ද** ආදි

සිංහලකාව්‍යයන් අතුරෙන් ශ්‍රෙෂ්ඨතර හෙයින්ද විශාලත්වයෙන් මහත්හෙයින්ද ජනෙද්‍රාවෘත්තව්‍යාකරණශබ්දාලඞ්කාර අර්ථාලඞ්කාර දුෂ්කර සමකබන්ධනාදියෙන් අනූනවූ මහාකාව්‍ය ලක්ෂණයෙන් උපලක්ෂිතවූ විචිත්‍රාර්ථයෙන් සම්පූර්ණහෙයින්ද **සිංහලකාව්‍ය නැමැති ශිරෝමස්තකයෙහි බබලන මාණික්‍යරත්නයක්** හා සදෘශවේමය, එබැවින් මෙය අන්වර්ථවිශෙෂසංඥා වශයෙන් **කව්සිළුමිණ** නම් විය. මෙහි **කථාශරීරය** ඉක්ෂ්වාකුවංශප්‍රභව ශ්‍රීබුද්ධාඞ්කුර වික්‍රමප්‍රතාපාලඞ්කෘත කුශනරෙන්ද්‍රයන්වහන්සේගේ සච්චරිතප්‍රකාශක **කුසජාතකය**වූ* හෙයින් සාමාන්‍ය සංඥාවශයෙන් **කුසදා** නම් විය.

මෙහි 9 වන සගෙහි 413 වන "කාව්‍යනාමගර්භචක්‍රයෙන්" සාමාන්‍යසංඥාවූ **කුසදා** නාමමාත්‍රය ප්‍රකාශ නමුත් අවශානයෙහි **කව්සිළුමිණ් කුසදා** යි විශෙෂසාමාන්‍යසංඥා (නාම) වයම යොදා තිබෙන බැව් පෙනේ.

සිදත්සඟරාවේ පුරාතනසන්නයෙහි "**නරනිඳුනු,** යනාදී **කාව්‍යචූඩාමණි** කව්හි **ඉංගෙන්** යන ප්‍රයොගයද" යි යන මේ ව්‍යාඛ්‍යානයෙන් හා—බාරශකාව්‍යයෙහි "අමුතුවන **කාව්‍යචූඩාමණි** ආදි ග්‍රන්ථයන්හි නිර්දිෂ්ටකාව්‍යනාමගර්භචක්‍ර නම් ප්‍රබන්ධයට වෙනස්ව තිබෙන්ට රචනාකළ හෙයින් අමුත්තක්වූ" යන මේ ව්‍යාඛ්‍යානයෙන්ද—එහි කර්තෘවූ උගත් කරතොට නායක ස්ථවිරයන්වහන්සේගේ තවත් රචනාවක්වූ :—

ර **කා** ලා කෙවුළු ලිසිට තැළුවා සෙමි න
පැ ණ ලා ගිය මෙගණ සය මැද වණකෙමෙ න
දූ න ලා මෙනම් යුත් පොත විමසා සොඳි න
නු මු ලා සිව එවනු අප වෙත මෙහි මෙදි න

යන මේ කාව්‍යයෙන්ද මීට **කව්සිළුමිණ** යන නාම ව්‍යවහාරයම ප්‍රාඥයන් **අතිප්‍රකටබැව් පෙණේ.**† සංස්කෘත කාව්‍යශාස්ත්‍රඥ

---

* මේ කුසජාතක දෙශනාර්ථකථාව සිංහල වාසගම්හි ගීවලිත් කව්වලිත් ප්‍රකරණරූඪව ලක්දිව ජනමනොරඤ්ජනය කරන්නාක් මෙන් සංස්කෘත භාෂාමය ප්‍රකරණ ග්‍රන්ථාරූඪව දඹදිව පණ්ඩිතජනමනොරඤ්ජනයද කරණ බැව් නොයෙක් ඉතිහාසාන්තර්ගත සංස්කෘත ප්‍රකරණයන්ගෙන් ප්‍රකාශවෙන හෙයින් සර්වජනකර්ණරසායන කථාවක්මැයි දතයුතු.

† සී ර ස කව්වර පැළැඳි මිණිවත් පවරකලිකල්හිරිඳු පවස න
ස ර ස් යුතු සඳපදතලකුණෙන් සපිරි කුසදා මෙ කව්සිළුමි ණ
ව රු ස සක එක්දහස්සත්සිය පසැත්තෑ රවි මිතුන සැනිදි න
ස ච ස ලිපිකර නීමකළේ දෙන් පිලිප්අප්පුහාමි මවිසි න

සිත්ට **ශිශුපාලබධ** නම්වූ **මාඝකාව්‍යය** යම්සේවීනම් සිංහල කාව්‍යශාස්ත්‍රඥයින්ට. එසේ මහාකාව්‍ය ලක්ෂණයෙන් සාදෘශ්‍ය කළහැකි එකම සිංහලකාව්‍යය නම් මේ **කව්සිළුමිණ** බව දතයුතු.

මේ මාහැඟි කාව්‍යයෙහි කර්තෘතුමා නම්—ශ්‍රීබුද්ධ වර්ෂයෙන් (1791) එක්වාදහස් සත්සියඅනූඑක්වන්නෙහි, ක්‍රිස්තු වර්ෂයෙන් **1248** වන්නෙහි පමණ ලංකාරාජශ්‍රීපදප්‍රාප්තව සියල්ලවුන්ගේ මනදොළ පුරණ අපමණ ශ්‍රීවිභූතියෙන් භ්‍රාජිතවූ **මායාරටබද ජම්බුද්‍රොණි** නම් පුරප්‍රවරය අග්‍රරාජධානිය කොට වැඩවිසූ මහත් තෙජෝබල පරාක්‍රමයෙන් අප්‍රමාණවූ ලොකශාසන විනාශකාරී පරශත්‍රුමර්ථනයෙන් දෙලොස්යුද්ධයකින් විජයග්‍රහණය කොට ලොකශාසනොපකාරීත්වයෙහි යෙදී අපමණ විහාරාරාමාදිය කරවීමෙන් හා පිරිවෙන් පිහිටුවා ආගමධර්ම ශබ්දශාස්ත්‍රාදිය පුහුණු කරවීමෙන්ද නානාග්‍රන්ථරචනාකරවීමෙන් හා කිරීමෙන්ද අත්වැඩ පරවැඩ පිරූ නානාශාස්ත්‍ර ප්‍රවීන පාණ්ඩිත්‍යයෙන් සකල විබුද්ධජන හෘදයානන්දකරවූ දශදිගන්තරව්‍යාප්ත කීර්තිප්‍රබන්ධ ඇති සර්වරාජ ගුණඝනයෙන් අද්විතීයවූ ද්විතීය ශ්‍රීමත් **නැම්බඹර කලිකාල සඞ්ගීත සාහිත්‍ය සර්වඥ පණ්ඩිත ශ්‍රී පරාක්‍රමබාහු** මහා **රාජෝත්තමයානන්** බව පෙනේ.

මේ මහරජතුමානෝ—දඹදිව **ධර්මාශොක මහරජ**තුමානන්ගේ මෙහෙයීමෙන් **දක්ෂිණශාඛා ශ්‍රීමහාබොධීන්වහන්සේ** ලක්දිවට වැඩමවා ගෙණ ආවාවූ එම අශොකචක්‍රවර්තීන් හා සමානවූ ගොත්‍රඇති රාජකුමාරවරුන්ගේ **ශ්‍රීසඞ්ඝබොධිවංශයෙන්** අසම්භින්නසන්තතිකව පැවැතාවාවූ **විජයමල්ල** නම් රජහට ඖරසපුත්‍රවූ දඹදෙණිය, පළමුවෙන් රාජධානියක් කොට විසූ මහොත්සාහයෙන් ශාසනශුද්ධිය කළ **නැම්බඹර කාලිඞ්ගවිජය බාහු** මහරජතුමන්ගේ පුත්‍රරත්නයයි. මෙතුමා කුමාර කාලයෙහි අටලොස්විද්‍යාවන් හා සිව්සැටකලාවන් ඉගෙණ ගත්බව **දඹදෙණි අස්න**යෙන් හා **රාජරත්නාකර**යෙන් ප්‍රකාශවේ, එහි විසතර සහිතව **දඹදෙණිඅස්න**යෙහි මෙසේ පෙණේ.

‘දඹදෙණි නම් පුරප්‍රවරයෙහි රජකරන්නාවූ නැංබඹර කාලිඞ්ග විජයබාහු පුත්—ශ්‍රී පණ්ඩිතපරාක්‍රමබාහු නම් බොධි සම්භාරපූරණ මහපිණැති රජ බාලවයසැ අකුරු කරවන්නාහු—

ග්‍රන්ථය, දෙමළය, සිංහලය, නිඝණ්ඩුය, බාලාවතාරය, ධාතුපාඨය, විජම්බණදෙසනාවය, ඡන්දෝලක්ෂණය, ත්‍රිවේදය, නක්ෂත්‍රය, ශික්ෂාය, මොක්ෂය, සිරිතය, කඩුසරමය, පලඟසරමය, තෙතකම් රාජවිල්දෙලොස්භාගය, ධනුඃශිල්පය, සාමුද්‍රිකාය, පරකථාය, නීති ශාස්ත්‍රය, තර්කය, යනාදි අෂ්ටාදශ ශිල්පයෙහිද* ඉතිහාසය, පුරාණය, අග්නිස්තම්භය, ජලස්තම්භය, කූපශාස්ත්‍රය, උච්චාටනය. ත්‍රොටනය. දූරගමනය, දූරදර්ශනය, හෙරිත්‍රොටනය, පත්‍රච්ඡේද නය, චිත්‍රකර්මය, ද්‍යූතය, භරතය, ස්ත්‍රීලක්ෂණය, පුරුෂලක්ෂණය, නපුංසකලක්ෂණය, පරහිතඥානය, කනකපරීක්ෂාය, තෙන පරීක්ෂාය, ආකර්ෂණය, ආකාශගමනය, කාෂ්ඨකර්මය, හෙමකර්මය, රත්නපරීක්ෂාය, යනාදිවූ සූසැටකලාශිල්ප උගත්තාවූ මෙ රජ දඹදෙණි නුවරට පැමිණ—බුද්ධ වර්ෂයෙන් එක්දහස්අටසිය සූවිස්සක්වූ අවුරුදු වප් මඟුල් කරණ දිනයෙහි† **නෑංබර කලිකාල සඞ්ගීත සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු නම් මහරජ‡** යයි කියා ඔබුනු පැළැඳ රාජ්‍යය කරණ සමයෙහි ".. යනුයි.

වුත්තෝදය සුබොධාලඞ්කාරය, සම්බන්ධචින්තා, සුසද්දසිද්ධි, කුදුසිකවිකා, ආදි නොයෙක් ග්‍රන්ථකරණයෙන් බොහෝ ලොක ශාසනානුග්‍රහ කළ ත්‍රිපිටකධාරි **සඞ්ඝරක්ඛිත** මහාස්වාමිපාදයන් වහන්සේ ප්‍රමුඛ භික්ෂුසඞ්ඝයාට තමන් පියරජහු විසින් මෙතුමා පාවා දුන් බව මහාවංශාදියෙන් ප්‍රකාශ හෙයින් **එකී සඞ්ඝරක්ඛිත** මහාස්වාමිපාදයන්වහන්සේ ගුරුතනතුරෙහි තබාගෙණ උන් වහන්සේ වෙතින් බුද්ධධර්මය සහිත නානාශාස්ත්‍රාදග්‍රහණය කළ බැව් සිතිය යුතුව තිබේ. **එයින් කීහ මහාවංශයෙහි.**

---

* ශ්‍රුතිස්මෘති ව්‍යාකරණං ඡන්දෝවිචිතිරෙවච,
නිරුක්තිර්ජ්‍යොතිෂං ශික්ෂා, මොක්ෂඥානං ක්‍රියාවිධිඃ.
ධනුර්වේදො හස්ති ශික්ෂා කාමතන්ත්‍රශ්ච ලක්ෂණං,
පුරාණමාශ්ච නීතිශ්ච තථා තර්කාථ වෛද්‍යකම්,
වදන්ත්‍යෂ්ටාදශෛතානි විද්‍යාස්ථානානි පණ්ඩිතාඃ—සී.

† මේ වර්ෂප්‍රමාණය මහාවංශාගත ක්‍රමයට වෙනස් නමුත් අත්තනගලු විහාරවංශයෙහිත් මෙසේම 1824 බව පෙණේ.

‡ මේ "නෑංබඹර-සඞ්ගීත" යන වචනමය මහාවංශාදියෙහි ප්‍රකටවැ [illegible] දඹදෙණි අස්නයෙහි තිබේ. මේ "සර්වඥපණ්ඩිත" යන වචනය මැත ඇතැම්කෙනෙක් "සර්වඥකුලාදිත්‍ය" කියා ලියාගෙණ තිබෙත්නා.

අථ තෙසු පරක්කන්ති භුජසෙට්ඨං සුතං තදා,
මහාසාමිං පුරක්ඛත්වා **සඞ්ඝරක්ඛිත** විස්සුතං.

සමාගතස්ස සඞ්ඝස්ස නීයාදෙත්වා තතො පුන,
තස්සාපි මුනිනො දාඨාපත්තධාතුවයං තථා.—යනුයි.

මෙසේ සර්වශාස්ත්‍රයෙහි කුසල බුද්ධියක් ඇතිව නිපුණවූ හෙයින් අන් කිසිම රජෙකු විසින් නොලැබිය හැකි තරම් මහත් ගරු නාමයක්වූ මේ "නැම්බඹර කලිකාලසඞ්ගීතසාහිත්‍ය සර්වඥ පණ්ඩිත ශ්‍රී පරාක්‍රමබාහු මහරජානෝ" කියා ශ්‍රී නාමය සහිත කඩු ඔටුනු පැලඳීම ලැබූබව ප්‍රකාශයි. මහාවංශයෙහි—

අච්චයෙ පිතුනො **රාජා පරක්කමභුජව්හයො,**
තිසීහලගතං සබ්බං එකී කත්වා මහාජනං.

අලඞ්කත්වා පුරං රම්මං සුරරාජසමො විය,
පඨමං අභිසෙකං සො කාරාපෙසි මනුස්සවං.

**කලිකාලදිසාහිච්චසබ්බඤ්ඤූපණ්ඩිතො**' ති සො.
පතීතං නාමධෙය්‍යම්පි පණ්ඩිතත්තා සයං ලභී.—යනුයි.

**විශුද්ධිමාර්ගවාඛ්‍යානය** හා **නිස්සන්දෙහ** නම් **වනවිනිය සන්නයත්** මේ රජතුමන් විසින් කල බැවින් සර්පෘථිවීශ්වර යන්ට ශ්‍රෙෂ්ඨතර පුරොගාමීජයකුන්තයක් වැනි අප ශ්‍රී ලඞ්කා වීපාධිපතිවූ මේ පරාක්‍රමබාහු මහරජතුමන්ගේ ධර්මවිනය දැනීමේ තත්වය විවර්ජනවර්ණනාවිෂයාතික්‍රාන්තව පවත්නා හෙයින්ද නානාශාස්ත්‍රප්‍රවීණත්වය යට කී සියල්ලෙන් හා මේ මාහැඟි **කව්සිළුමිණ** කාව්‍යයෙන් ප්‍රාඥයන්ට ප්‍රත්‍යක්ෂව හැඟෙන හෙයින්ද ඒ ගැණ වැඩිදුර ප්‍රපඤ්චකථා නොදක්වනු ලැබේ. මේ මහරජතුමන්ගේ **විශුද්ධිමාර්ගවාඛ්‍යාන** ප්‍රාරම්භයෙහි මෙසේ පෙණේ :—

පාමොජ්ජත්ථාය යොගීනං බුද්ධඝොසෙන ධීමතා,
විසුද්ධිමග්ගො යො වුත්තො විසුද්ධනයමණ්ඩිතො.

**පරක්කමනරින්දෙන** සබ්බභූපාලකෙතුනා,
**ල**ඞ්කාදීපාධිපතිනා සාසනොදයකාමිනා.

තස්ස සංවණ්ණනා එසා **සීහලානං නිරුත්තියා,**
යොගීනං මන්දබුද්ධීනං හිතත්ථාය කතීයති.—සී.

මේ කව්සිළුමිණ අවසානයෙහි තමන් විසින් ප්‍රකාශිත ක්‍රමය නම් :—

සියබස්සකුමගද මීහගත්සයුරු තෙරපත්,
සරසවිය නම් කලිකල් දෙව්සිරි කළ අයදමෙන්.

කළමහමේ දඟ අඩයපියෙන් සිවුසයුරු,
වැළකූ බූමෙහේ ගත් පඬුඉඳුහු පරපුරෙනා.

සඳකුලකැත්කොත් වහත්දෙරණිත් නත් වන්,
මෙත්කිත් පතළ කලිකල් සවැණි නිරිඳු කෙළේ මේ.—සී.

මෙහි අදහස :—සිංහල සංස්කෘත පාලි සඞ්ඛ්‍යාත මහාශාස්ත්‍ර ලක්‍ෂණ ඇති සාගරයාගේ පරතෙරට පැමිණි කලිකාල සරස්වතී යන නම් ඇති දෙව්ඓශ්වය්‍යීයා විසින් කරණලද ආරාධනාවෙන් පිහාමෙස නොවැස්ස දුන්නාවූ අඩයපියෙන් චතුස්සාගරයන් වැළකූවාවූ භූතයන් අතින් මෙහෙගත්තාවූ පාණ්ඩවරාජවංශ පරම්පරාවෙන් පැවැත ආවාවූ චන්ද්‍රවංශයෙහි ක්‍ෂත්‍රියන්ට ජයධ්වජයක් බඳුවූ මේ මහාපෘථිවිය උසුලන්ට අනන්තනම් නාගරාජයා වැනිවූ දශදිගන්තරව්‍යාප්ත මෛත්‍රී හා කීර්ති ඇති කලිකාලසාහිත්‍ය සර්වඥපණ්ඩිත පරාක්‍රමබාහු නරේන්ද්‍රයන් විසින් මේ කාව්‍යචූඩාමණි නම් කාව්‍යය කරණලදී. යන්නෙන් හා මෙහි 9 සග 419වෙනි ගීයේ කවිනාමගර්භචක්‍රයෙහි පෙණෙන "පඬුඉඳු කෙළේ" යන්නෙන්ද මේ රජතුමන් මේ කාව්‍යය කළ බවත් පාණ්ඩවරාජවංශ පරම්පරාවෙන් පැවැතා කෙනෙක් බවත් ප්‍රකාශයි.

මේ සා මහත් විශාල ග්‍රන්ථයක් නිර්මාණකරණයෙන් ලෝකශාසනානුග්‍රහ කළ බෝධිසම්භාර පූරණ උත්තමයෙකුගේ ඒසාමහත් රාජ්‍යකෘත්‍යයන් සම්බන්ධ වීරචරිතයන් ප්‍රකට කරණය අවශ්‍යක නමුත් එබඳු බලපරාක්‍රම පුණ්‍යක්‍රියාදි උත්තම සච්චරිතාපදානයන් විස්තරවශයෙන් මෙහි ප්‍රකාශ කරණය අනවකාශ හෙයින් තදර්ථීන් විසින් මහාවංශ, හත්ථවනගල්ලවිහාරවංස, රාජාවලි, පූජාවලී, රාජරත්නාකර, දඹදෙණි අස්න ආදියෙන් එය බලා දතයුතු.

තවද **සිදත්සගරා** කර්තෘභූත **ප්‍රතිරාජ පරිවෙණාධිපති වෙදෙහස්ථවිරස්වාමිපාදයන්** වහන්සේ විසින් පවා මේ මහරජතුමන් ගුරුතැන්හි තැබීමෙන් තත්ත්වව්‍යාකරණ ලක්‍ෂණයන් සපිරකිරීමට ලක්‍ෂ්‍යවශයෙන් නොයෙක් නිදසුන් මේ

" කව්සිළුමිණෙන් " උපුටා ගෙණ ස්වකීය සිංහලව්‍යාකරණ ග්‍රන්ථයෙහි බහා තිබෙන බැවින් ඉන් මඳක් මෙහි දක්වමි. එනම්, සිංහල භාෂාවේ බින්දුවර්‍ණය ස්පිරීකරණයට

213. **නරනිඳුහු ඉංගෙන් සෙමෙනද නැයි පැසැහි,**
විලසකළ ලඟකප්තුරු මදලෙලහෙම්ලියකලඹ.

යන මේ ගීයේ පූර්වාර්ධයද ; ක්‍රියාවිපර්‍ය්‍යාසයට

1. තමාවරදස නොදිස් නෙ මෙරමා දෙස්මැ දිස්නෙ,
නුවන් බැහැරු තමාමුත් විතාරත නොදක්නෙ කිම්.

යන මෙ ගීයේ **තමාවරදසනොදිස්ණෙ** යන්නද ; විභවරූපයට

475. අමතා පුරපියන් පැනත් උයන් ඇසිරි,
එතර උයන්පල්ලා කෙළෙ තුවු ඒ ලොපල්ලා.

යන මෙ ගීයේ **තුවුකෙළෙ ඒ ලොපල්ලා** යන්නද—අවධි අර්ථයෙහි යෙදෙන " තෙක් " යන වචනයට

52. ඔහු යසස සේසත් සිරි රුකුලෙ බඹමුදුනේ,
සුරගඟයටගැ රඳනා දියතෙක් සෙවන බඳනා.

යන මේ ගීයේ **දියතෙක් සෙවන බඳනා** යන්නද " අතතම්, ගෙතතම්, වතතම්, පතනම්, විසසම්, පින්සිපිහුකළ අතතම්. එ පුරේ නිරිදෙක් වී " මේ ආදිය ඇතුළුවූ තවත් සිදත්සඟරාවේ පෙණෙන බොහෝ උදාහරණද . මේ කව්සිළුමිණෙන් උපුටාගෙණ තිබේ.

5. රජපැමිණී බෝසත් සත්රජුනෙඩි මැඩැ විසී,
විසී තමා කැරු කලක කලක දසරජදම්නෙත්.

යන මේ ගීයද කව්සිළුමිණෙන් උපුටාගෙණ එලුජනදශෙහි සන්දෂ්ටකයට නිදර්ශන කර තිබේ.

තව්ද **තොටගමුවේ ෂඩ්භාෂා පරමෙශ්වර ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය ශ්‍රී රාහුල් සඞ්ඝරාජ** ස්ථවිර ස්වාමිපාදයන්වහන්සේ ඇතුළුවූ නොයෙක් පණ්ඩිතාචාර්‍ය්‍යවරයන් පවා මේ කව්සිළුමිණ ගුරුතැන්හි තැබීමෙන් ආශ්‍රය කළ බැව් තත්තද්ග්‍රන්ථ රචනාවන් මීට සමකර බැලූකල මොනවට හැගේ. ඒ සියල්ල දක්විය නොහැකි බැවින් ඉන් කවි ගාථා ස්වල්පයක් අඩොලිපි වශයෙන් පොතේ යොදා ඇති නමුත් තත්ප්‍රස්තුතාවස්තාව ස්පිරීකරණය සඳහා මෙතැන්හිද කව්සිළුමිණෙන් ගී 2ක් හා සැමුල්සන්දෙශයෙන් කවි 2ක්ද මෙහි පිළිවෙළින් දක්වම්හ.

39. දසඅත සඳත ඔහු තෙද එක්වන් මෙහෙසරා,
සඳැසඳින් පෙරසේ පිරිසේ නොදත නැවුමේ.

42. ස ක ත   සවත විකුමැති මෙරජුගෙ සොබ   න
දි ග ත   පැතිරැ යත තෙද සුගත නළ මෙ   න
තිනෙ ත   සඳවලාපෙළයයි සලකම්   න
ත හ ත   රඟා වෙහෙසුනි අවසර නොදූ   න

51. විමලිඳුනිල්මිණි තරපතර හෙබි මහමුහුදු,
එ වෙන් නොවෙන්යී තිබී යෙසෙනොහු කිරිමුහුදු හා.

49. සි රි න්   සුරිඳු වන් මෙනිරිඳුගෙ දියත   ග
නි ති න්   පැතිරැ යත පිරිසිදුසස තෙදි   ග
ප ස න්   සුනිල්මිණිතරහෙබිකළිඳුග   ග
එ වෙ න්   නොවෙන් කෙලෙ කිරිසිඳු හා සම   ග

යන ආදිවශයෙන් එකිනෙකට සසඳ නුවණින් විමසා බැලූකල ග්‍රන්ථගෞරවය වඩවඩා උසස්වැ ප්‍රකාශවේමයයි දතයුතු.

මේ මාහැඟි කාව්‍යයේ පදාර්ථව්‍යාඛ්‍යානයද මේ රජතුමන් විසින්ම හෝ තත්කාලික අන්‍ය ප්‍රාඥවරයෙකු විසින් හෝ කරණලදැයි සැලකීම යුක්තියුක්තයි, එය මේ ව්‍යාඛ්‍යානුසාර යෙන් හා අවසානයෙහි පෙණෙන "මෙකවිකැරැ (යළි) කලි කල් සවැණිඳදහස් දත්එකල්ලෝ පදඅත්මේපිරික්සා" යන මේ ආකුලවූ ගීයෙන්ද මොනවට ඟැහෙයි.

මෙහි ප්‍රමාණය සර්ග නොහොත් පරිච්ඡේද (15) පස ළොසකි, ගීකාව්‍ය (770) සත්සිය සැත්තෑවකි, එයින් සාමාන්‍ය වශයෙන් 1 සර්ගයෙහි, ග්‍රන්ථාරම්භ, කුසාවතීපුර, වර්ණනා, තෙජොවර්ණනා, යශොවර්ණනාදියද ; 2 සර්ගයෙහි, කුස රජහු ගිහිගෙයි වාසයකරවීම සඳහා පිය මහරජ හා මව්බිසව් අග්‍රාමාත්‍යවරුන් සමග කළ ධර්මසාකච්ඡාදියද ; 3 සර්ග යෙහි, රූපදර්ශනියක් විමසනු පිණිස දූතජනසමූහයා ස්වර්ණ රූපය රැගෙණ නොයෙක් ගම්නියම්ගම් රාජධානිවල හැසු රුණු විලාසාදියද ; 4 සර්ගයෙහි, එසේ ස්වර්ණරූපය රැගෙණ ගිය දූතජනයා සාගලනුවරට පැමිණ ප්‍රභාවතිය දුක සෞමනස්‍ය ප්‍රාප්තවිලාසාදියද ; 5 සර්ගයෙහි, ඒ ප්‍රභාවතියගේ රූපවර්ණනා හා ඇ නිසා සීලවතී බිසව් සහිත ඔක්කාක රජ සිවුරඟසෙනඟින් සගල්පුරට සම්ප්‍රාප්ත විලාසාදියද ; 6 සර්ගයෙහි, සන්ධ්‍යාවර්ණනා, අන්තඃපුර ස්ත්‍රීවර්ණනා, ජ්වලිත

චන්ද්‍ර ආපානවර්ණනාදියද; 7 සර්ගයෙහි, ස්ත්‍රී පුරුෂ ක්‍රීඩා කාලය, ජ්වලිත උදය සන්ධ්‍යා වර්ණනා, ප්‍රභාවතිය සමග කුසාවතියට පැමිණි විලාසාදියද; 8 සර්ගයෙහි. විවාහ මඞ්ගල්‍යය, ගජතුරගවර්ණනා, වනනිග්‍රහකේළි ග්‍රීෂ්ම ඍතු වර්ණනා, කුසනිරිඳු කෙරෙහි ප්‍රභාවතියගේ ශඞ්කාදියද; 9 සර්ගයෙහි, චක්‍රබන්ධ අනුලෝමප්‍රතිලෝමාදි දුෂ්කරයමක පද්‍යයන්ගේ විස්තර, වර්ෂාකාලයාගේ ස්වභාවාදියද; 10 සර්ගයෙහි, ශරත්කාලය, පුරඟනන් සහිත රජමැතිවරුන්ගේ උද්‍යානක්‍රීඩාදියද; 11 සර්ගයෙහි, ප්‍රභාවතිය හා එක්ව තඩාග ක්‍රීඩා, කුසනිරිඳුගේ කාන්තාව පක්ෂයෙහි අනුරාගාදියද; 12 සර්ගයෙහි, ප්‍රභාවතිය වෙන්ව ගියකල්හි විරහශෝකයට පැමිණි කුසරජහු ඈ පතා සගල්පුරට වැඩි විලාසාදියද; 13 සර්ගයෙහි, ප්‍රභාවතිය කෙරෙහි ලොල්වූ කුසරජහු ඈ පතා කළ දුඞ්මෙහෙකම් හා ශෝකයට පැමිණි පබවතියගේ ප්‍රවෘත්තිය ආදීයද; 14 සර්ගයෙහි, කුසරජතුමානන්ගේ විරහ ශෝක දුඃඛය දුටු සක්දෙව්රජහු විසින් මදුනිරිඳුගේ හසුන් විලස්නෙන් සත්රජුන්ට හසුන් දී දූතයන් යවීම, පබවතිය පතා ආ ඔවුන් සමග කළ යුද්ධය* හා ශාන්තිය, අෂ්ටවඞ්කමාණික්‍යය ලැබීමාදියද; 15 සර්ගයෙහි, සමාගමශ්‍රියට පැමිණි ප්‍රභාවතිය රැගෙණ සියනුවර පැමිණ සිවුසඟරාවතින් ලෙව්හට කළ නානා ශාන්ති ප්‍රවෘත්ත්‍යාදියද මනාසේ ප්‍රකාශයි.

මේ තරම් පණ්ඩිත සම්භාවනීයවූ මේ මහාකාව්‍යරත්නය ප්‍රාඥයන්ටම විෂයවූ හෙයින් දෝහෝ අවියත් ලිපිකරුවන්ගේ නොසැලකීමෙන් දෝහෝ "මේ තරම් ඌනාතිරික්තතාදි දෝෂකාලුෂ්‍යයෙන් ගහණවූ පොතක් මේ හැර වෙන නැත" කියයුතුසේ ආකුලව්‍යාකුලවැ තිබෙන බව මෙයින් දශවර්ෂයකට පූර්වයෙහි දැකැ අහෝ මෙය යන්තමක් ප්‍රයෝජන ගත හැකිසේවත් ප්‍රතිසංස්කරණය කෙළෙම් නම් ඉතා යෙහෙකැයි සිතා පරණ පොත් සොයනාතර අසම්පූර්ණත්වයෙන් යුත් පොත් කීපයක්ම දක්නාලැබූහෙයින්ද, මෙය ශුද්ධකිරීමට උගත් කිහිපදෙනෙක්ම උත්සාහකර බැරිවූ බව එකල ප්‍රවෘත්ති පත්‍රයක පවා පළවූහෙයින්ද මේ කෘත්‍යයෙහි මගේ උත්සාහ ඇතිවූයෙමි.

* ජාතකාර්ථකථායෙහි නොමැති මදුරජහු සම්බන්ධ යුද්ධවර්ණනාවක් මෙහි පෙනේ.

ඉක්බිති මෙබඳු වැඩගැණ හිතැති සමස්තවික්‍රමකරුණා තිලක අභයවර්ධන භුවනශේඛර ජයසුන්දර මුදලිනාමොපලක්ෂිතවූ ප්‍රාචීන ප්‍රතීචීන භාෂාශාස්ත්‍ර ප්‍රවීණ ශ්‍රීමත් **පී. බී. පාණබොක්කේ මන්ත්‍රීශ්වරයානන්ගෙන් ලබකලද ආරාධනා පූර්වඞ්ගමාධාර** ඇත්තෙම් ප්‍රාකසාහිව කොළඹ, ගාල්ල, මාතර, සපරගමුව මීගමුව, මහනුවර යන මෙකී පලාත්වලින් පුස්කොලපොත් 13ක් සපයා ගෙණ එකිනෙකට සංසන්දනයකර බලා ඇතැම්තැන්හි අන්‍යග්‍රන්ථාගතමතානුසාරීව පරීක්ෂා කිරීමෙන් යුක්තව පෞරාණික භාෂාරීතික්‍රමොල්ලඞ්ඝනය නො කොට චිරකාලාගතඅව්‍යක්තඅල්පශ්‍රැතලෙඛකදොෂපාඨා පහරණ යෙන් සර්වාශක්තීන් ප්‍රතිසංස්කරණය කෙළෙමි.

තවද, මෙසේ මහොත්සාහයෙන් පොත් 13ක් සපයාගත් නමුත් එයින් පොත්හතක් මුලින් පත්ඉරු කීපයක්හුගේ අවිද්‍යාමානත්වයෙන් යුක්තයි ඉතිරි පොත්හය සම්පූර්ණ නමුත් එහිදු මේ කාව්‍යයෙහි නමස්කාරකව නොමදක්නාලැබේ. ඉන් කිසිසේත් මේ කාව්‍යගෞරවයට හානියක් නොමැති නමුත් එය දශවර්ෂප්‍රමාණකාලයක පටන් අදවනතෙක් මෙදුතුර නොයෙක් පලාත්හි විමසුයෙමි. මේ සඳහා දඹදෙණිපුර පුරාණ විහාරස්ථානයට පවා ගොසින් බැලීමි. මහනුවර ප්‍රාචීන පුස්තකාලයෙන් හා මාතර ගල්කන්දේ විහාරස්ථාන යෙන් ලැබුනු පොත් දෙකේ පමණක් මෙහි පළමුවැනි ගීයට මුලින් "කළාවූ චිත්තයතෙමෙ මා මෙහි යුහුකෙළෙ කාව්‍ය බන්ධනයෙහි මා දක්ෂ කෙළෙ" යන මෙකී වාසගම තිබෙන නමුත් සසඳාවතේ 6 කාව්‍යව්‍යාඛ්‍යානාවසානයෙහි පෙණෙන වාසගමත් මීට සමානහෙයින් එය පොතට ඇතුළත් නොකළ බව දතයුතු.

මෙකී පොත් සාමාන්‍යවශයෙන් විමසා බැලූකල පරම්පරා තුණක ගුරුපොත් තුණකින් ලියවූසේද ඇතැම්තැන්හි ගුරු පොත් සතරකින් ලියවූසේද සමානත්වයක් පෙණේ, මේ ඇර ගීයේදී ස්වරාන්තව පෙණෙන වචන සන්නයේදී හලන්තවශ යෙන්ද සන්නයේදී ස්වරාන්තව පෙණෙන වචන ගීයේදී හලන්තවශයෙන්ද, ගීයේදී "දෙවසරන්, කෙළිතු, විත්, විඳු, විඳිනා, දුරැළී, විසිරු, දිවු, ගැජුන්, මීකපුරු, හඳනා, හත්වක" යනාදි වචන සන්නයේදී "දිවසරන්, කෙළුතු, වුන්, වුදු, විදුනා, දුරළු, විසුරු, දුවු, ගැජුම්, මිහිකපුරු, අදනා, අත්වක"

යනාදිවශයෙන්ද නානාපාඨයන්ගේ බහුලත්වය මෙහි බෙහෙවින් දක්නා ලැබේ. ආචාය්‍ය෨වරයන් අතර ශස්ත්‍රසාරරත්නයක් මෙන් පවත්වන මෙහි 9 වන සගෙහි ප්‍රකාශිත දුෂ්කර යමකබන්ධනයන්ගේ ස්වභාවපරිඥනය සඳහා තදර්‍ථීවූ අධුනිකජනතාව කෙරෙහි දයානුකම්පාවෙන් ඉන් කාව්‍යනාම ගර්භචක්‍රය ආදී කාව්‍යචක්‍ර තුදුසක් සුඛාවබොධවියයුතුසේ චක්‍රවින්‍යාසයෙන් ප්‍රකරණාවසානයෙහි යොදා ඇත.

කුසජාතක දෙශනාර්ත්‍ථකථාව සිංහල කාව්‍යයට පරිවර්ත්තනය කිරීමෙන් මේ "කව්සිළුමිණ" කළ බැවින් ඒ කථාශරීරයවූ "කුසජාතකට්ඨකථාව" මෙහි පොතේ මුල යෙදුවා ඇත.

යථොක්ත අප **පී. බී. පාණබොක්කේ මන්ත්‍රීශ්වරයන්** විසින් මේ "කව්සිළුමිණ" සම්බන්ධ කාරණ නෛකශ්‍රීන් විරාජමාන **සර් ආර්තර් ඇලිබැංක් හැව්ලොක් නාමධෙය ලඞ්කෙශ්වරොත්තමයන්ට** මතක්කරණලදින් එම ගරුතර **උතුමානන්වහන්සේගේ** කරුණාධාර ආඥව පරිද්දෙන් ලඞ්කා රාජකීය මුද්‍රායන්ත්‍රාලයෙහි මුද්‍රණය කරවනලදී.

එබැවින් අපේ මේ ජගද්ධිතපූර්වඛ්‍යමව්‍යාපාරයට ප්‍රාඥයෝ සන්තුෂ්ටවෙත්වා. එසේම මෙහි යම් ප්‍රමාදභ්‍රමාදියෙන් ජනිතස්ඛලිතස්ථානයක් විද්‍යමාන නම් එය ඊර්ෂ්‍යාපරවශව සුහුසුලු නොව පොත මුල පටන් පරීක්ෂාවෙන් බලා මේ කාව්‍යග්‍රන්ථයේ ස්වභාවය පරිඥනයෙන් ලොකාභිවෘද්ධිය සඳහා ප්‍රකාශ කෙරෙත්වා යි ආශංසනය කරම්හ.

කොළඹ විද්‍යොදය පරිවෙණවාසී ආචාය්‍ය෨ **මහගොඩ ඥනෙශ්වරාභිධාන ස්ථවිරයන්** විසින් සාදරයෙන් මෙහි අවසාන ශුද්ධිපත්‍රය බලා දුන් බව සතුතියෙන් මෙහි සඳහන් කරම්හ.

එසේම මෙය මුද්‍රණයෙහිදී රාජකීය මුද්‍රායන්ත්‍රාලයෙහි ප්‍රධාන තැන්පත් **ජී. ජේ. ඒ. ස්කීන් මහතා** සහ එහි උප ප්‍රධාන තැන්පත් **එච්. සී. කොටල් මහතාත්** ඉතා ඕනැකමින් සහ අපේ සිත්වූ පරිද්දෙන් මෙහි කටයුතු ඉෂ්ටකරදුන් බවද සතුතියෙන් මෙහි සඳහන් කරම්හ.

මේවගට, **මඩුගල්ලේ සිද්ධාර්ථාභිධාන ස්ථවිර.**

ශ්‍රී බුද්ධ වර්ෂ 2442ක්වූ ධනුරවි 10 භාග පූර්‍ව 10වක්
තිපියලත් ගුරදින මහනුවර ශ්‍රී පුෂ්පාරාම
විහාරස්ථානයේ සඟරජපිරිවෙනේදීය.

# ශු ද්ධි ප ත්‍ර ය.

---

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 2 | 4 | කලක් කලක් | කලක කලක |
| 3 | 9 | යත්නැවූ | ගත්නාවූ |
| ,, | 22 | සෞවත | ශෞවත |
| 5 | 1 | සලෙලුවන් අලලත | සලලුවනලලත |
| ,, | 2 | සැතපිගි | සැතපි ගී |
| 6 | 1 | එපුරේහි | එපුරවෙරේ |
| ,, | 4 | —තත් | තත්— |
| ,, | 11 | ඒ පුරයෙහි | ඒ පුරප්‍රවරයෙහි |
| ,, | 20 | වක්‍ෂඃශ්‍රී | සමාගමශ්‍රී |
| 7 | 22 | වඃපතවූ | රැස්වූ |
| 8 | 1 | සක්නි* | සක්නි |
| 10 | 1 | වී එපුරෙ | වී එ පුරේ |
| 11 | 1=2 | ගුණමුවරදපමණ—<br>ලෙව්සවණතබිගුවැල.<br>පමණඅමාමදනරස—<br>පමාහිදකිරණවමපණ | ගුණමුවරුදලෙව්<br>සවණත බිගුවැල පමණ,<br>අමාමදනරසපමා—<br>හිදකිරණවිමපමණ. |
| ,, | 3 | හිවිගුණ | ගුණහිවි |
| ,, | 5 | හිවී* | හිවි |
| 12 | 3 | වැඩි* | වැඩි |
| ,, | 17 | සිඳුනාවූ | සිඳුනා |
| 13 | 1 | මනකෙතැ | මන—කෙතැ |
| ,, | ,, | බිජුනිදුනු* | බිජුනිදුනු |
| 14 | 3 | ශුගතපතකුරිරු | ශුගඅතපතකුරුරු |
| ,, | 5 | යතෙහිත් | යතමෙත් |
| ,, | 20—21 | තාමෙබ්‍රාසාගලායත එහිත් | තාමෙම්‍රාසප්‍රහාරයෙත් |
| 15 | 1 | මුළු | මුළු |
| ,, | 3 | කර | තර |
| ,, | 4 | වෙත් | එ වෙත් |
| ,, | 17 | විෂ්ණුතෙම | ඒ විෂ්ණුතෙමේ |
| ,, | 18 | තිබුයෙ නොවේ | තැබිය නොහි |
| 16 | 8 | යසසෙත් | යශස්කරණකොටගෙණ |

---

* මෙබඳු තැන් මෙසේම දතයුතු.

මුළු මුදු මූදු

| පිට. | පෙල. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 20 | 15 | මනොකල්‍ය | මනඃකල්‍ය |
| 30 | 12 | කුංබ | කුබ† |
| ,, | 19 | නිර්මිතකරණලද | නිර්මිතවූ |
| 32 | 2 | සිත්මිත | සිත්තම් |
| 33 | 21 | ඊපොෂත | ඊපොශථ (ඊපොෂිත) |
| 35 | 5 | දෙවෙනි | දෙවනු |
| ,, | 27 | නිගම | නිගමග්‍රාම |
| 39 | 23 | සුයඃ | සූයඃ |
| 47 | 9 | බුජ්ජිකා | බුජ්ජිකානතා* |
| 49 | 13 | මෙනි | මෙන් :— |
| 57 | 2 | සහනරු* | සහතර |
| ,, | 10 | නරුසයිතවූ | ශොභාසයිතවූ |
| 66 | 30 | කොළෙමෝල | කරමෝල |
| 70 | 4 | ඊබ්බලැගැ | ඊබ්බලැගැ |
| ,, | 10 | මද්‍යනරෙන්‍ද්‍රයා | මද්‍යනරෙන්‍ද්‍රතෙමේ |
| ,, | 12 | චන්‍ද්‍රයා | චන්‍ද්‍රයාගේ |
| ,, | 16 | සමූහයා | සමූහයාද |
| 71 | 11 | කලස් හා | කලසයෙන් හා |
| ,, | 12 | පරිෙ ද | පරිච්ඡෙද |
| 73 | 14 | අඩකරග | අඩකාර |
| 78 | 27 | ජගත්‍රය | ජ ත |
| 80 | 7 | නොසිම්ගේ කිය,ග | නොසිම්යො කියග |
| 104 | 3 | විර | විසුරු |
| 129 | 7 | සුරතතැ—හි | සුරතත—හි |
| 150 | 24 | පරිචිතයන් | පරිචිතයෙනි |
| 195 | 12 | වී | වී, |

මේ ඇර ඇතම් තන්හි හ්‍රස්වවියයුතු තැන දීර්ඝවශයෙනුත් දීර්ඝ වියයුතු තැන හ්‍රස්ව වශයෙනුත් පෙණෙන පාඨ ශුද්ධපත්‍රයට ඇතුළත් නොකළ බව දතයුතු. එසේම වැදගත් කීපදෙනෙකුන් විසින් අයදනාලදින් පොත්හි තිබූනුක්‍රමය අඩොලිපිවශයෙන් ස්වල්පයක් දැක්වූ නමුත් එහි ආකුලත්වය 7 පිටේ අඩොලිපියෙන් පවා හැගෙන හෙයින් ඉන් ඔබ්බෙහි එබඳු තැන් නොදැක්වූ බව දතයුතු.

## කුසජාතකකථා.

"ඉදන්තෙ රට්ඨ" න්ති, ඉදං සත්ථා ජෙතවනෙ විහරන්තො උක්කණ්ඨිතභික්ඛුං ආරබ්භ කථෙසි; සො කිර සාවත්ථිවාසී කුලපුත්තො සාසනෙ උරං දත්වා පබ්බජිතො එකදිවසං සාවත්ථියං පිණ්ඩාය චරන්තො එකං අලඞ්කතඉත්ථිං සුභනිමිත්තග්ගාහවසෙන ඔලොකෙත්වා කිලෙසාභිභූතො අනභිරතො විහාසි:— දීඝකෙසනඛො කිසසරීරො කිලිට්ඨචීවරො උප්පණ්ඩුප්පණ්ඩුකජාතො ධමනිසන්ථතගත්තො; යථා හි දෙවලොකෙ චවනධම්මානං දෙවපුත්තානං පඤ්චපුබ්බනිමිත්තානි පඤ්ඤායන්ති, මාලා මිලායන්ති වත්ථානි කිලිස්සන්ති සරීරෙ දුබ්බණ්ණියං ඔක්කමති උභොහි කච්ඡෙහි සෙදා මුච්චන්ති දෙවො දෙවාසනෙ නාභිරමති; එවමෙවං සාසනා චවනධම්මානං උක්කණ්ඨිතභික්ඛූනං පඤ්චපුබ්බනිමිත්තානි පඤ්ඤායන්ති, සද්ධාපුප්ඵානි මිලායන්ති සීලවත්ථානි කිලිස්සන්ති මඞ්කුභාවතායචෙව අයසවසෙන ච දුබ්බණ්ණියං ඔක්කමති කිලෙසසෙදා මුච්චන්ති අරඤ්ඤරුක්ඛමූලසුඤ්ඤාගාරෙසු නාභිරමන්ති; තස්සපි තානි පඤ්ඤායිංසු; අථ නං සත්ථුසන්තිකං නෙත්වා අයං භන්තෙ උක්කණ්ඨිතො'ති දස්සෙසුං; සත්ථා සච්චං කිරාති පුච්ඡිත්වා සච්චං භන්තෙති වුත්තෙ මා භික්ඛු කිලෙසවසිකො අහොසි; මාතුගාමො නාමෙස පාපො; තස්මිං පටිබද්ධචිත්තතං විනෙහි; සාසනෙ අභිරම; මාතුගාමෙ පටිබද්ධචිත්තතාය හි තෙජවන්තොපි පොරාණකපණ්ඩිතා නිත්තෙජා හුත්වා අනයව්‍යසනං පාපුණිංසූති වත්වා අතීතං ආහරි.

අතීතෙ මල්ලරට්ඨෙ කුසාවතීරාජධානියං ඔක්කාකො නාම රාජා ධම්මෙන රජ්ජං කාරෙසි; තස්ස සොළසන්නං ඉත්ථිසහස්සානං ජෙට්ඨිකා සීලවතී නාම අග්ගමහෙසී අහොසි; සා නෙව පුත්තං න ධීතරං ලභති; අථස්ස නාගරා චෙව රට්ඨවාසිනො ච නිවෙසනද්වාරෙ සන්නිපතිත්වා රට්ඨං නස්සිස්සති විනස්සිස්සතීති උපක්කොසිංසු; රාජා සීහපඤ්ජරං උග්ඝාටෙත්වා මයි රජ්ජං කාරෙන්තෙ අධම්මකාරො නාම නත්ථි; කස්මා උපක්කොසථා'ති පුච්ඡි; සච්චං දෙව අධම්මකාරො නත්ථි; වංසානුරක්ඛකො පන වො පුත්තො න

විජ්ජති; අඤ්ඤෙ රජ්ජං ගහෙත්වා රට්ඨං නාසෙස්සති තස්මා ධම්මෙන රජ්ජං කාරෙතුං සමත්ථං පුත්තං පත්ථෙථාති; පුත්තං පත්ථෙන්තා කිං කරොමාති; පඨමං තාව එකං සත්තාහං චුල්ලනාටකං ධම්මනාටකං කත්වා විස්සජ්ජෙථ; සචෙ තා පුත්තං ලභිස්සන්ති සාධුනො චෙ, අථ මජ්ඣිමනාටකං විස්සජ්ජෙථ; තතො ජෙට්ඨනාටකං (විස්සජ්ජෙථ.) අවස්සං එත්තිකාසු ඉත්ථීසු එකා පුඤ්ඤවතී පුත්තං ලභිස්සතීති; රාජා තෙසං වචනෙන තථා කත්වා සත්තමෙ සත්තමෙ දිවසෙ යථාසුඛං අභිරමිත්වා ආගතා ගතා පුච්ඡි කච්චි වො පුත්තො ලද්ධොති; සබ්බා න ලභාම දෙවාති ආහංසු; රාජා න මෙ පුත්තො උප්පජ්ජිස්සතීති අනත්තමනො අහොසි; නාගරා පුන තථෙව උපක්කොසිංසු; රාජා කිං උපක්කොසථ මයා තුම්හාකං වචනෙන නාටකානි විස්සට්ඨානි; එකාපි පුත්තං න ලභි; ඉදානි කිං කරොමීති ආහ; දෙව එතා දුස්සීලා භවිස්සන්ති නිප්පුඤ්ඤා, නත්ථි එතාසං පුත්තලාභාය පුඤ්ඤං; තුම්හෙ එතාසු පුත්තං අලභන්තීසු මා අප්පොස්සුක්කතං ආපජ්ජථ; අග්ගමහෙසී වො සීලවතී දෙවී සීලසම්පන්නා නං විස්සජ්ජෙථ; තස්සා පුත්තො උප්පජ්ජිස්සතීති; සො සාධූති සම්පටිච්ඡිත්වා ඉතො කිර සත්තමෙ දිවසෙ රාජා සීලවතිං දෙවිං ධම්මනාටකං කත්වා විස්සජ්ජෙස්සති පුරිසා සන්නිපතන්තූති භෙරිං චරාපෙත්වා සත්තමෙ දිවසෙ දෙවිං අලඞ්කාරාපෙත්වා රාජනිවෙසනා ඔතාරෙත්වා විස්සජ්ජෙසි; තස්සා සීලතෙජෙන සක්කභවනං උණ්හාකාරං දස්සෙසි; සක්කො කින්නුඛොති ආවජ්ජෙන්තො දෙවියා පුත්තං පත්ථනභාවං ඤත්වා එතිස්සා මයා පුත්තං දාතුං වට්ටතීති අත්ථි නු ඛො දෙවලොකෙ එතිස්සානුච්ඡවිකො පුත්තොති උපධාරෙන්තො බොධිසත්තං අද්දස; සො කිර තදා තාවතිංසභවනෙ ආයුං ඛෙපෙත්වා උපරි දෙවලොකෙ නිබ්බත්තිධම්මො අහොසි; සක්කො තස්ස විමානද්වාරං ගන්ත්වා තං පක්කොසාපෙත්වා මාරිස තයා මනුස්සලොකං ගන්ත්වා ඔක්කාකරඤ්ඤො අග්ගමහෙසියා කුච්ඡිම්හි පටිසන්ධිං ගණ්හිතුං වට්ටතීති සම්පටිච්ඡාපෙත්වා අපරම්පි දෙවපුත්තං ත්වම්පි තස්සායෙව පුත්තො භවිස්සසීති වත්වා මා ඛො පනස්සා කොචි සීලං භින්දී'ති මහල්ලකබ්‍රාහ්මණවෙසෙන රඤ්ඤො නිවෙසනද්වාරං අගමාසි; මහාජනොපි න්හාතාලඞ්කතො අහං දෙවිං ගණ්හිස්සාමි අහං දෙවිං ගණ්හිස්සාමීති රාජද්වාරෙ සන්නි

පති; සක්කං ච පන දිස්වා ත්වං කස්මා ආගතොති පරිහාසං අකාසි; සක්කොපි කිං මං ගරහථ සචෙපි මෙ සරීරං ජිණ්ණං රාගො පන න ජීරති, සචෙ සීලවතිං ලභිස්සාමි ආදාය නං ගමිස්සාමීති ආගතොම්හීති වත්වා අත්තනො ආනුභාවෙන සබ්බෙසං පුරතො අට්ඨාසි; අඤ්ඤො තස්ස තෙජෙන පුරතො භවිතුං නාසක්ඛි; සො තං සබ්බාලඞ්කාරපතිමණ්ඩිතං නිවෙසනා නික්ඛමන්තිංයෙව හත්ථෙ ගහෙත්වා පක්කාමි; අථ නං තත්ථ තත්ථ ඨිතා ගරහිංසු පස්සථ භො මහල්ලකබ්‍රාහ්මණො එවං උත්තමරූපධරං දෙවිං ආදාය ගච්ඡති අත්තනො යුත්තං න ජානාතීති; දෙවීපි මහල්ලකො මං ගහෙත්වා ගච්ඡතීති අට්ටීයති හරායති ජිගුච්ඡති; රාජාපි වාතපානෙ ඨත්වා කො නු ඛො දෙවිං ගහෙත්වා ගච්ඡතීති ඔලොකෙන්තො තං දිස්වා අනත්තමනො අහොසි; සක්කො තං ආදාය නගරද්වාරෙන නික්ඛමිත්වා ද්වාරසමීපෙ එකං ඝරං මාපෙසි විවටද්වාරං පඤ්ඤත්තකට්ඨත්ථරිකං; අථ නං සා ඉදං වො නිවෙසනන්ති පුච්ඡි, සො ආම භද්දෙ පුබ්බෙ පන අහං එකකො ඉදානි මයං ද්වෙ ජනා— අහං භික්ඛාය චරිත්වා තණ්ඩුලාදීනි ආහරිස්සාමි ත්වං ඉමිස්සා කට්ඨත්ථරිකාය නිපජ්ජාහීති වත්වා තං මුදුනා හත්ථෙන පරාමසි; දිබ්බසම්ඵස්සං ඵරාපෙත්වා තත්ථ නිපජ්ජාපෙසි; සා දිබ්බසම්ඵස්සඵරණෙන සඤ්ඤං විස්සජ්ජෙසි; අථ නං අත්තනො ආනුභාවෙන තාවතිංසභවනං නෙත්වා අලඞ්කතවිමානෙ දිබ්බසයනෙ නිපජ්ජාපෙසි; සා සත්තමෙ දිවසෙ පබුජ්ඣිත්වා තං සම්පත්තිං දිස්වා න සො බ්‍රාහ්මණො මනුස්සො සක්කො භවිස්සතීති අඤ්ඤාසි; සක්කොපි තස්මිං සමයෙ පාරිච්ඡත්තකමූලෙ දිබ්බනාටකපරිවුතො නිසින්නො හොති; සා සයනා උට්ඨාය තස්ස සන්තිකං ගන්ත්වා වන්දිත්වා එකමන්තං අට්ඨාසි; අථ නං සක්කො වරං තෙ දෙවි දෙමි ගණ්හාහීති ආහ; තෙනහි මෙ දෙව පුත්තං දෙහීති, දෙවි තිට්ඨතු එකො, අහං තෙ ද්වෙ පුත්තෙ දස්සාමි තෙසු පන එකො පඤ්ඤවා භවිස්සති න රූපවා. එකො රූපවා න පඤ්ඤවා, තෙසු පඨමං කතරං ඉච්ඡසීති පඤ්ඤවන්තං දෙවාති; සො සාධූති වත්වා තස්සා කුසතිණං දිබ්බං ච වත්ථං දිබ්බචන්දනං පාරිච්ඡත්තකපුප්ඵං කොකනදඤ්ච නාම වීණං දත්වා තං ආදාය රඤ්ඤො සයනඝරං පවිසිත්වා රඤ්ඤා සද්ධිං එකසයනෙ නිපජ්ජාපෙත්වා අඞ්ගුට්ඨකෙන තස්සා නාභිං පරා

මසි; තසමිංඛණෙ බොධිසතෙතා තසසා කුචඡිමහි පටිසනිධං
ගණහි; සකෙකාපි සකඨානමෙව ගතො; පණඩිතා දෙවී
ගබභසස පතිඨිතභාවං ජානි; අථ නං පබුධො රාජා දිසවා දෙවි
කෙන නීතාසීති පුචඡි; සකෙකන දෙවාති; අහං පචචකඛ
තො එකං මහලලකබ්‍රාහමණං තං ආදාය ගචඡනතං අදදසං;
කසමා මං වඤෙචසීති; සදදහ දෙව සකෙකා මං ගහෙතවා දෙව
ලොකං නෙසීති; න සදදහාමි දෙවීති; අථසස සා සකක
දතතියං කුසතිණං දසෙසතවා සදදහාති ආහ; රාජා කුසතිණං
නාම යතො කුතොචි ලබභතීති න සදදහි; අථසස සා දිබබ
වතථානි දසෙසසි; රාජා තානි දිසවා සදදහිතවා භදෙද සකෙකා
තාව තං නෙතු පුතෙතා පන තෙ ලදෙධාති පුචඡි; ලදෙධා මහා
රාජ ගබෙභා මෙ පතිඨිතොති; සො තුටෙඨා තසසා ගබභපරි
හාරං අදාසි; සා දසමාසචචයෙන පුතතං විජායි; තසස අඤඤං
නාමමකතවා කුසතිණණනාමමෙව අකංසු; කුසකුමාරසස
පදසා ගමනකාලෙ ඉතරො දෙවපුතෙතා තසසා කුචඡිමහි
පටිසනිධං ගණහි; තසස ජයමපතීති නාමං කරිංසු. තෙ මහ
නෙතන යසෙන වඩිඪංසු, බොධිසතෙතා පඤඤවා ආචරියසස
සනතිකෙ කිඤචි අනුගගහෙතවා අතතනො පඤඤාය සබබ
සිපෙපසු නිපඵතතිං පාපුණි; අථසස සොළසවසසකාලෙ රාජා
රජජං දාතුකාමො දෙවිං ආමනෙතතවා භදෙද පුතතසස තෙ
රජජං දතවා නාටකානි උපටඨපෙසසාම ජීවනතායෙව නං
රජෙජ පතිඨිතං පසසිසසාම, සකලජමබුදීපෙ බො පන යසස
රඤෙඤා ධීතරං ඉචඡති, තමසස ආනෙතවා අගගමහෙසිං
කරිසසාම, චිතතමසස ජානාහි කතරං රාජධීතරං රොචෙතීති;
සා සාධූති සමපටිචඡිතවා කුමාරසස ච ඉමං පවතතිං ආරො
චෙතවා චිතතං ජානාහීති එකං පරිචාරිකං පෙසෙසි; සා
ගනතවා තසස තං පවතතිං ආරොචෙසි; තං සුතවා මහාසතෙතා
චිනෙතසි අහං න රූපවා රූපසමපනනා රාජධීතා ආනීතාපි
මං දිසවා කිං මෙ ඉමිනා විරූපෙනාති පලායිසසති ඉති නො
ලජජිතබබකං භවිසසති; කිමෙම ඝරාවාසෙන ධරමානෙ
මාතාපිතරෙ උපටඨහිතවා තෙසං අචචයෙන නිකඛමිතවා පබබ
ජිසසාමී " ති, සො මයහං නෙව රජෙජනතෙථා න නාට
කෙහි, අහං මාතාපිතූනනං අචචයෙන පබබජිසසාමීති ආහ;
සා ගනතවා තසස තං කථං දෙවියා ආරොචෙසි; දෙවීපි තං
රඤෙඤා ආරොචෙසි, රාජා අනතතමනො හුතවා පුන ඤාති

පාහච්චවසෙන සාසනං පෙසෙසි; සො හි පටිබාහියෙව; එවං යාවතතියං පටිබාහිත්වා චතුත්ථවාරෙ චින්තෙසි “මාතාපිතූහි සද්ධිං එකන්තෙන පටිපක්ඛභාවො න යුත්තො, එකං උපායං කරිස්සාමී” ති සො කම්මාරජෙට්ඨකං පක්කොසාපෙත්වා බහුං සුවණ්ණං දත්වා එකං ඉත්ථිරූපං කරොහීති උය්‍යොජෙත්වා තස්මිං පක්කන්තෙ අඤ්ඤං සුවණ්ණං ගහෙත්වා සයං ඉත්ථිරූපං අකාසි; බොධිසත්තානං අධිප්පායා නාම ඉජ්ඣන්ති තං රූපං ජීවහාය අවණ්ණීයසොභං අහොසි: අථ නං මහාසත්තො ඛොමං නිවාසාපෙත්වා සිරිගබ්භෙ ඨපාපෙසි; සො කම්මාරජෙට්ඨකෙන ආහතෙ රූපකෙ තං ගරහිත්වා ගච්ඡ අම්හාකං සිරිගබ්භෙ ඨපිතරූපකං ආහරාති ආහ; සො ගබ්භං පවිට්ඨො තං දිස්වා කුමාරෙන සද්ධිං අභිරමිතුං එකා දෙවච්ඡරා ආගතා භවිස්සතීති හත්ථං පසාරෙතුං අවිසහන්තො නික්ඛමිත්වා දෙව සිරිගබ්භෙ අය්‍ය එකිකාව ධීතා උපගන්තුං න සක්කොමීති ආහ; තාත ගච්ඡ සුවණ්ණරූපං එතං ආහරාති පුන පෙසිතො ආහරි; කුමාරො කම්මාරෙන කතං රූපං සුවණ්ණගබ්භෙ ඛිපාපෙත්වා අත්තනා කතං අලඞ්කාරාපෙත්වා රථෙ ඨපාපෙත්වා එවරූපං ලභන්තො ගණ්හාමීති මාතුසන්තිකං පහිනි; සා අමච්චෙ පක්කොසාපෙත්වා තාතා මය්හං පුත්තො මහාපුඤ්ඤො සක්කදත්තියො අනුච්ඡවිකං කුමාරිකං ලභිස්සති තුම්හෙ ඉමං රූපං පටිච්ඡන්නයානෙ ඨපාපෙත්වා සකලජම්බුදීපං චරන්තා යස්ස රඤ්ඤො එවරූපං ධීතරං පස්සථ තස්සෙතං දත්වා ඔක්කාකරාජා තුම්හෙහි සද්ධිං ආවාහං කරිස්සතීති දිවසං ඨපෙත්වා ආගච්ඡථාති ආහ; තෙ සාධූති තං ආදාය මහන්තෙන පරිවාරෙන නික්ඛමිත්වා විචරන්තා යං යං රාජධානිං පාපුණන්ති තත්ථ සායණ්හසමයෙ මහාජනස්ස සමොසරණට්ඨානෙ තං රූපකං වත්ථපුප්ඵලඞ්කාරෙහි අලඞ්කරිත්වා සුවණ්ණසිවිකං ආරොපෙත්වා තිත්ථමග්ගෙ ඨපෙත්වා සයං පටික්කමිත්වා ආගතාගතානං කථා සවණත්ථං එකමන්තෙ තිට්ඨන්ති; මහාජනා තං ඔලොකෙත්වා සුවණ්ණරූපකන්ති සඤ්ඤං අකත්වා අයං මනුස්සිත්ථිසමානා දෙවච්ඡරපටිභාගා අතිවිය සොභති, කින්නුඛො එත්ථ ඨිතා කුතො වා ආගතා, අම්හාකං නගරෙ එවරූපා නත්ථීති වණ්ණෙන්තා පක්කමන්ති; තං සුත්වා අමච්චා සචෙ ඉධ එවරූපා දාරිකා භවෙය්‍ය අසුකරාජධීතා විය අසුකඅමච්චධීතා වියාති වදෙය්‍ය අද්ධා ඉධ එවරූපා

නත්ථීති තං ආදාය අඤ්ඤං නගරං ගච්ඡන්ති; තෙ එවං විච රන්තා මද්දරට්ඨෙ සාගලනගරං සම්පාපුණිංසු; තත්ථ මද්ද රඤ්ඤො අට්ඨධීතරො උත්තමරූපධරා දෙවච්ඡරපටිභාගා. තාසං සබ්බජෙට්ඨිකා පභාවතී නාම; තස්සා සරීරතො බාල සූරියස්ස විය පභා නිච්ඡරන්ති, කාලන්ධකාරෙපි චතුහත්ථ ගබ්භෙ පදීපකිච්චං නාම නත්ථි; සබ්බො ගබ්භො එකො භාසොව හොති; ධාතී පනස්සා ඛුජ්ජා; සා පභාවතිං භොජෙත්වා තස්සා සීසං නහාපනත්ථං අට්ඨහි වණ්ණදාසීහි අට්ඨ ඝටෙ ගාහාපෙත්වා සායණ්හසමයෙ උදකත්ථාය ගච්ඡන්තී තිත්ථමග්ගෙ ඨපිතං තං රූපකං දිස්වා පභාවතීති සඤ්ඤාය අයං දුබ්බිනීතා සීසං නහායිස්සාමීති අම්හෙ උදකත්ථාය පෙසෙත්වා පඨමතරං ආගන්ත්වා තිත්ථමග්ගෙ ඨිතාති කුජ්ඣිත්වා අරෙ කුලලජ්ජාපනිකෙ පුරිමතරං ආගන්ත්වා ඉධ ඨිතාසි. සචෙ රාජා ජානිස්සති නාසෙස්සති නොති වත්වා හත්ථෙන ගණ්ඩපස්සෙ පහරි; හත්ථතලං භිජ්ජනප්පමාණං ජාතං, තතො සුවණ්ණරූපකන්ති ඤත්වා හසමානා* වණ්ණදාසීනං සන්තිකං ගච්ඡන්තී පස්සථ මෙ කම්මං මම ධීතාති සඤ්ඤාය පහාරං අදාසිං අයං මම ධීතුසන්තිකෙ කිං අග්ඝති කෙවලං මම හත්ථො දුක්ඛාපිතොති ආහ. අථ නං රාජදූතා ගහෙත්වා ත්වං මම ධීතා ඉතො අතිරූපතරාති වදන්ති කිං නාම කථෙසීති; මද්දරඤ්ඤො ධීතරං පභාවතිං ඉදං රූපං තස්සා සොළසමම්පි කලං නාග්ඝතීති; තෙ තුට්ඨමානසා රාජද්වාරං ගන්ත්වා ඔක්කාකරඤ්ඤො දූතා ද්වාරෙ ඨිතාති රඤ්ඤො පටිහාරෙසුං, රාජා ආසනා උට්ඨාය ඨිතකොව පක්කොසථාති ආහ; තෙ පවිසිත්වා රාජානං වන්දිත්වා මහාරාජ අම්හාකං රාජා තුම්හාකං ආරොග්‍යං පුච්ඡතීති වත්වා කතසක්කාර සම්මානා කිමත්ථං ආගතාති වුත්තෙ අම්හාකං රඤ්ඤො පුත්තො සීහස්සරො කුසකුමාරො නාම, රාජා තස්ස රජ්ජං දාතුකාමො තුම්හාකං සන්තිකං පහිනි තුම්හාකං කිර ධීතරං පභාවතිං තස්ස දෙථ; ඉදඤ්ච සුවණ්ණරූපං දෙය්‍යධම්මං ගණ්හථාති තං රූපකං තස්ස අදංසු; සොපි එවරූපෙන මහාරාජෙන සද්ධිං විවාහමඞ්ගලං භවිස්සතීති තුට්ඨචිත්තො සම්පටිච්ඡි; අථ නං දූතා ආහංසු; මහාරාජ අම්හෙහි න සක්කා පපඤ්චෙතුං. කුමාරිකාය ලද්ධභාවං ගන්ත්වා රඤ්ඤො ආරොචෙස්සාම; අථ සො ආගන්ත්වා ආදාය ගමිස්සතීති; සො සාධූති

වත්වා තෙසං සක්කාරං කත්වා විස්සජ්ජෙසි; තෙ ගන්ත්වා රඤ්ඤො ච දෙවියා ච ආරොචෙසුං; රාජා මහන්තෙන පරිවාරෙන කුසාවතිතො නික්ඛමිත්වා අනුපුබ්බෙන සාගලනගරං සම්පාපුණි; මද්දරාජා පච්චුග්ගන්ත්වා තං නගරං පවෙසෙත්වා මහන්තං සක්කාරමකාසි; සීලවතීදෙවී පණ්ඩිතත්තා කො ජානාති කිමහවිස්සතීති එකාහද්වීහච්චයෙනෙව මද්දරාජානං ආහ; මහාරාජ සුණිසං දට්ඨුකාමම්හාති; සො සාධූති සම්පටිච්ඡිත්වා පක්කොසාපෙසි; පභාවතී සබ්බාලඞ්කාරපටිමණ්ඩිතා ධාතීගණපරිවුතා ආගන්ත්වා සස්සුං වන්දි; සා තං දිස්වාව චින්තෙසි; "අයං කුමාරිකා අභිරූපා මය්හං පුත්තො විරූපො, සචෙ එසා තං පස්සිස්සති එකාහම්පි අවසිත්වා පලායිස්සති උපායං කරිස්සාමී"ති සා මද්දරාජානං ආමන්තෙත්වා මහාරාජ සුණිසා මෙ පුත්තස්ස අනුච්ඡවිකා අපිචො පනම්හාකං කුලෙ පවෙණියා ආගතචාරිත්තං අත්ථි සචෙ අයං තස්මිං චාරිත්තෙ වත්තිස්සති නෙස්සාම නන්ති ආහ; කිම්පන වො චාරිත්තන්ති; අම්හාකං වංසෙ යාව එකස්ස ගබ්භස්ස පතිට්ඨානා දිවා සාමිකං පස්සිතුං න ලභන්ති සචෙ එසා තථා කරිස්සති නෙස්සාම නන්ති, රාජා කිං අම්ම සක්ඛිස්සසි එවං වත්තිතුන්ති ධීතරං පුච්ඡි; සා ආම තාතාති ආහ; තතො ඔක්කාකරාජා මද්දරඤ්ඤො බහුං විභවං දත්වා ආදාය පක්කාමි; මද්දරාජා මහන්තෙන පරිවාරෙන ධීතරං උය්යොජෙසි ඔක්කාකො කුසාවතිං ගන්ත්වා නගරං අලඞ්කාරාපෙත්වා සබ්බබන්ධනානි මොචාපෙත්වා පුත්තස්ස අභිසෙකං දත්වා පභාවතිං අග්ගමහෙසිං කාරෙත්වා කුසරාජස්ස ආණති භෙරිං චරාපෙසි; ජම්බුදීපතලෙ රාජානො යෙසං ධීතරො අත්ථි තෙ කුසරඤ්ඤො ධීතරො පහිනිංසු; යෙසං පුත්තා අත්ථි තෙ තෙනෙව සද්ධිං මිත්තභාවං ආකඞ්ඛන්තා පුත්තෙ උපට්ඨාකෙ කත්වා පහිනිංසු බොධිසත්තස්ස නාටකපරිවාරො මහා අහොසි; මහන්තෙන යසෙන රජ්ජං කාරෙසි පභාවතිං පන දිවා පස්සිතුං න ලභති, සාපි තං දිවා පස්සිතුං න ලභති, උභින්නම්පි රත්තිං දස්සනමෙව හොති; තත්ථ පභාවතියා සරීරප්පභාපි අබ්බොහාරිකා අහොසි; බොධිසත්තොපි සිරිගබ්භතො රත්තිංයෙව නික්ඛමති; සො කතිපාහච්චයෙන පභාවතිං දිවා දට්ඨුකාමො මාතු ආරොචෙසි; සා මා තෙ රුච්චි යාවෙකං පුත්තං ලභති තාව ආගමෙහීති පටික්ඛිපි, සො පුනප්පුන යාචියෙව අථ නං ආහ. තෙනහි

හත්ථිසාලං ගන්ත්වා හත්ථිමෙණ්ඩවෙසෙන තිට්ඨ; අහං තං තත්ථ ආනෙස්සාමි අථ නං අක්ඛීනි පූරෙත්වා ඔලොකෙය්‍යාසි මා ච අත්තානං ජානාපෙසීති සො සාධූති සම්පටිච්ඡිත්වා හත්ථිසාලං අගමාසි; රාජමාතා හත්ථිමඞ්ගලං කාරෙත්වා පභාවතිං එහි සාමිකස්ස තෙ හත්ථිනො පස්සිස්සාමාති තත්ථ නෙත්වා අයං හත්ථී අසුකො නාම; (අයං) අසුකො නාමාති දස්සෙසි; තත්ථ නං රාජා මාතු පච්ඡතො ගච්ඡන්තිං හත්ථිවච්චකනපිණ්ඩෙන පිට්ඨියං පහරි; සා කුද්ධා රඤ්ඤො තෙ හත්ථං ඡින්දාපෙස්සාමීති වත්වා දෙවිං උජ්ඣාපෙසි; සා නං සඤ්ඤාපෙත්වා පිට්ඨිං පරිමජ්ජි; පුනපි රාජා දට්ඨුකාමො හුත්වා අස්සසාලාය අස්සගොපකවෙසෙන දිස්වා තථෙව අස්සවච්චකනපිණ්ඩෙන පහරි; තදාපි නං කුද්ධං සස්සු සඤ්ඤාපෙසි; පුනෙකදිවසං පභාවතී මහාසත්තං පස්සිතුකාමා හුත්වා සස්සුයා ආරොචෙත්වා අලං තෙ මා රුච්චීති පටික්ඛිත්තාපි පුනප්පුන යාචි; අථ නං සා ආහ තෙනහි ස්ව මම පුත්තො නගරං පදක්ඛිණං කරිස්සති ත්වං සීහපඤ්ජරං විවරිත්වා පස්සෙය්‍යාසීති එවඤ්ච පන වත්වා පුන දිවසෙ නගරං අලඞ්කාරාපෙත්වා ජයම්පතිකුමාරං රාජවෙසං ගාහාපෙත්වා හත්ථිපිට්ඨෙ නිසීදාපෙත්වා නගරං පදක්ඛිණං කාරාපෙසි පභාවතිඤ්ච ආදාය සීහපඤ්ජරෙ ඨත්වා පස්ස තව සාමිකස්ස සිරිසොභග්ගන්ති ආහ; සා අනුච්ඡවිකො මෙ සාමිකො ලද්ධොති අත්තමනා අහොසි, තං දිවසං පන මහාසත්තො හත්ථිමෙණ්ඩවෙසෙනෙව ජයම්පතිස්ස පච්ඡිමාසනෙ නිසීදිත්වා යථාධිප්පායෙන පභාවතිං ඔලොකෙත්වා හත්ථිවිකාරාදිවසෙන චිත්තරුචියං කීළං දස්සෙසි; හත්ථිම්හි අතික්කන්තෙ රාජමාතා පභාවතිං පුච්ඡි; දිට්ඨො තෙ අම්ම සාමිකොති; ආම අය්‍යෙ; පච්ඡිමාසනෙ පනස්ස නිසින්නො හත්ථිමෙණ්ඩො අතිවිය දුබ්බිනීතො. මය්හං හත්ථිවිකාරාදීනි දස්සෙසි; කස්මා එවරූපං අලක්ඛිකං රඤ්ඤො පච්ඡිමාසනෙ නිසීදාපෙසුන්ති; අම්ම රඤ්ඤො පච්ඡාසනෙ රක්ඛා නාම ඉච්ඡිතබ්බාති; සා චින්තෙසි හත්ථිමෙණ්ඩොඅතිවිය නිබ්භයො රාජානං රාජාතිපි න මඤ්ඤති කච්චි නුඛො එසොව කුසරාජා අද්ධා හි සො විරූපො භවිස්සති තෙනෙව මං න දස්සෙන්තීති; සා ඛුජ්ජං කණ්ණමූලෙ ආහ; අම්ම ගච්ඡ තාව ජානාහි කිං පුරිමාසනෙ නිසින්නකො රාජා උදාහු පච්ඡිමාසනෙති, කථං පනාහං ජානිස්සාමීති, සචෙ හි සො රාජා භවිස්සති පඨමතරං හත්ථිපිට්ඨිතො ඔතරිස්සති ඉමාය

සඤ්ඤාය ජානාහීති; සා ගන්ත්වා එකමන්තෙ ඨිතා පඨමං මහාසත්තං ඔතරන්තං අද්දස; පච්ඡා ජයම්පතිකුමාරං; මහාසත්තොපි ඉතො චිතො ච ඔලොකෙන්තො ඛුජ්ජං දිස්වා ඉමිනා කාරණෙන එසා ආගතා භවිස්සතීති ඤත්වා පක්කොසාපෙත්වා ඉමං අන්තරං මා කථෙහීති දළ්හං වත්වා උය්‍යොජෙසි; සා ගන්ත්වා පුරිමාසනෙ නිසින්නො පඨමං ඔතරීති ආහ; පභාවතී තස්සා වචනං සද්දහි; පුන රාජා දට්ඨුකාමො හුත්වා මාතරං යාචි; සා පටික්ඛිපිතුං අසක්කොන්ති තෙනහි අඤ්ඤාතක වෙසෙන උය්‍යානං ගච්ඡාහීති ආහ; සො උය්‍යානං ගන්ත්වා පොක්ඛරණියං ගලප්පමාණං උදකං පවිසිත්වා පදුමිනී පත්තෙන සීසං ඡාදෙත්වා පුප්ඵිතපදුමෙන මුඛං අවත්ථරිත්වා අට්ඨාසි, මාතාපිස්ස පභාවතිං උය්‍යානං නෙත්වා සායණ්හසමයෙ ඉමෙ රුක්ඛෙ පස්ස. සකුණෙ පස්ස. මිගෙ පස්සාති පලොභයමානා පොක්ඛරණීතීරං පෙසෙසි; සා පඤ්චවිධපදුම සඤ්ඡන්නං පොක්ඛරණිං දිස්වා නහායිතුකාමා පරිචාරිකාහි සද්ධිං පොක්ඛරණිං ඔතරිත්වා කීළන්තී තං පදුමං දිස්වා ගහෙතුකාමා හත්ථං පසාරෙසි; අථ නං රාජා පදුමිනිපත්තං අපනෙත්වා අහං කුසරාජාති හත්ථෙ ගණ්හි සා තස්ස මුඛං දිස්වා යක්ඛො මං ගණ්හාතීති විරවිත්වා තත්ථෙව විසඤ්ඤිතං පත්තා; අථස්සා රාජා හත්ථං මුඤ්චි; සා සඤ්ඤං පටිලභිත්වා කුසරාජා කිර මං හත්ථෙ ගණ්හි; ඉමිනාචාහං හත්ථිසාලායං හත්ථිවච්ඡකනකෙන; අස්සසාලායඤ්ච අස්සවච්ඡකනකෙන පහටා, අය මෙව මං හත්ථිස්ස පච්ඡාසනෙ නිසීදිත්වා උප්පණ්ඩෙසි; කිමෙම එවං විරූපෙන දුම්මුඛෙන පතිනා, අහං ජීවන්ති අඤ්ඤං පතිං ලභිස්සාමීති චින්තෙත්වා අත්තනා සද්ධිං ආගතෙ අමච්චෙ පක්කොසාපෙත්වා මම යානවාහනං සජ්ජං කරොථ; අජ්ජෙව ගමිස්සාමීති ආහ; තෙ රඤ්ඤො ආරොචෙසුං; රාජා චින්තෙසි සචෙ ගන්තුං න ලභිස්සති හදයමස්සා ඵලිස්සති ගච්ඡතු. පුන තං අත්තනො බලෙන ආනෙස්සාමීති අථස්සා ගමනං අනුජානි; සා පිතුනගරමෙව අගමාසි, මහාසත්තොපි උය්‍යානතො නගරං පවිසිත්වා අලඞ්කතපාසාදං අභිරුහි, බොධිසත්තං හි සා පුබ්බපත්ථනා වසෙන න ඉච්ඡි; සො පුබ්බ කම්මවසෙනෙව විරූපො අහොසි :—

අතීතෙ කිර බාරාණසී ද්වාරගාමෙ උපරිමවීථියා ච හෙට්ඨිම වීථියා ච ද්වෙ කුලානි වසිංසු; එකස්ස කුලස්ස ද්වෙ පුත්තා එකස්ස

කාච ධීතා අහොසි, වීසු පුත්තෙසු බොධිසත්තො කනිට්ඨො තං කුමාරිකං ජෙට්ඨස්ස ආනෙසුං කනිට්ඨො අඩ්ඪරාභරණෙ භාතු සන්තිකෙයෙව වසි; අථෙක දිවසං තස්මිං ඝරෙ අතිරසපූවෙ පචිංසු, බොධිසත්තො අරඤ්ඤං ගතො හොති තස්ස පූවං ඨපෙත්වා අවසෙසා භාජෙත්වා ඛාදිංසු, තස්මිං ඛණෙ පච්චෙක බුද්ධො භික්ඛාය ඝරද්වාරං ආගමි, බොධිසත්තස්ස භාතුජායා චුල්ලපතිනො අඤ්ඤං පූවං පචිස්සාමීති තං ගහෙත්වා පච්චෙක බුද්ධස්ස අදාසි; සොපි තඞ්ඛණඤ්ඤෙව අරඤ්ඤතො ආගඤ්ඡි; අථ නං සා ආහ, සාමි චිත්තං පසාදෙහි තව කොට්ඨාසො පච්චෙකබුද්ධස්ස දින්නොති; සො තව කොට්ඨාසං ඛාදිත්වා මම කොට්ඨාසං දෙහි අඤ්ඤං කිං කරිස්සසීති කුද්ධො ගන්ත්වා පත්තතො පූවං ගණ්හි; සා මාතුඝරං ගන්ත්වා නවවිලීනං චම්පකපුප්ඵවණ්ණං සප්පිං ආහරිත්වා පත්තං පූරෙසි; තං ඔභාසං මුඤ්චි; සා තං දිස්වා පත්ථනං ඨපෙසි භන්තෙ නිබ්බත්ත නිබ්බත්තට්ඨානෙ මෙ සරීරං ඔභාස ජාතං හොතු උත්තමරූප ධරා භවෙය්‍යං, ඉමිනා ච මෙ අසප්පුරිසෙන සද්ධිං එකට්ඨානෙ වාසො මා අහොසීති, ඉති සා ඉමිස්සා පුබ්බපත්ථනාය වසෙන තං න ඉච්ඡි; බොධිසත්තොපි තං පූවං තස්මිං පත්තෙ ඔසීදාපෙත්වා පත්ථනං ඨපෙසි; භන්තෙ ඉමං යොජනසතෙ වසන්තිම්පි ආනෙත්වා මම පාදපරිචාරිකං කාතුං සමත්ථො භවෙය්‍යන්ති පත්ථනං ඨපෙසි; තත්ථ යං සො කුද්ධො හුත්වා පූවං ගණ්හි, තස්ස පුබ්බකම්මස්ස වසෙන විරූපො අහොසි

සො පභාවතියා ගතාය සොකප්පත්තො අහොසි; නානාකාරෙහි පරිචරමානාපි නං සෙසිත්ථියො ඔලොකෙතුම්පි න සක්ඛිංසු; පභාවතීරහිතමස්ස සකලම්පි නිවෙසනං තුච්ඡං විය ඛායි; සො ඉදානි සා සාගලනගරං පත්තා භවිස්සතීති පච්චූස සමයෙ මාතුසන්තිකං ගන්ත්වා අම්ම අහං පභාවතිං ආනෙස්සාමි තුම්හෙ රජ්ජං අනුසාසථාති, පඨමං ගාථමාහ.

1. ඉදන්තෙ රට්ඨං සධනං සයොග්ගං
සකායුරං සබ්බකාමූපපන්නං,
ඉදන්තෙ රජ්ජං අනුසාස අම්ම
ගච්ඡාමහං යත්ථ පියා පභාවතී'ති.

තත්ථ—"සයොග්ග" න්ති හත්ථියොග්ගාදි සහිතං; "සකායුර" න්ති පඤ්චරාජකකුධභණ්ඩං; "අනුසාස අම්මා" ති—සො

ඛීර පුරිසස්ස රජ්ජං දත්වා පුන ගණ්හනං නාම මෙ අයුත්තන්ති පිතු වා භාතු වා අනීයාදෙත්වා මාතු නීයාදෙන්තො එවමාහ—සා තස්ස කථං සුත්වා තෙනහි තාත අප්පමත්තො භවෙය්‍යාසි මාතුගාමො නාම අසුද්ධාසයොති වත්වා නානග්ගරසභොජනස්ස සුවණ්ණකරොටිං පූරෙත්වා ඉදං අන්තරමග්ගෙ භුඤ්ජෙය්‍යාසීති වත්වා උය්‍යොජෙසි; සො තං ආදාය මාතරං වන්දිත්වා තික්ඛත්තුං පදක්ඛිණං කත්වා ජීවන්තො පුන පස්සිස්සාමීති සිරිගබ්භං පවිසිත්වා පඤ්චායුධං සන්නය්හිත්වා භත්තකරොටියා සද්ධිං කහාපණසහස්සං පසිබ්බකෙ කත්වා කොකනදං වීණං ආදාය නගරා නික්ඛමිත්වා මග්ගං පටිපජ්ජිත්වා මහබ්බලො මහාථාමො යාව මජ්ඣන්තිකා පණ්ණාසයොජනානි ගන්ත්වා භත්තං භුඤ්ජිත්වා සෙසෙන දිවසභාගෙන පුන පණ්ණාසයොජනානි ගන්ත්වා එකාහෙනෙව යොජනසතිකං මග්ගං ඛෙපෙත්වා සායණ්හසමයෙ නහාත්වා සාගලනගරං පාවිසි; තස්මිං පවිට්ඨමත්තෙ යෙව තස්ස තෙජෙන පභාවතී සයනපිට්ඨෙ සණ්ඨාතුං අසක්කොන්තී ඔතරිත්වා භූමියං නිපජ්ජි—බොධිසත්තම්පි කිලන්තින්ද්‍රියං වීථියං ගච්ඡන්තං අඤ්ඤතරා ඉත්ථී දිස්වා පක්කොසාපෙත්වා නිසීදාපෙත්වා පාදෙ ධොවාපෙත්වා සයනං දාපෙසි; තස්මිං නිද්දූපගතෙ භත්තං සම්පාදෙත්වා පබොධෙත්වා භත්තං භොජෙසි; සො තුට්ඨො තස්සා සද්ධිං කරොටියා කහාපණසහස්සං අදාසි; සො පඤ්චායුධං තත්ථෙව ඨපෙත්වා ගන්තබ්බට්ඨානං නො අත්ථීති වත්වා වීණං ආදාය හත්ථිසාලං ගන්ත්වා අජ්ජ මෙ ඉධ වසිතුං දෙථ ගන්ධබ්බං වො කරිස්සාමීති වත්වා හත්ථිගොපකෙහි අනුඤ්ඤාතො එකමන්තෙ නිපජ්ජිත්වා පටිප්පස්සධරථො උට්ඨාය වීණං මුඤ්චිත්වා සකලනගරවාසිනො ඉමං සද්දං සුණන්තූති වීණං වාදෙන්තො ගායි. පභාවතී භූමියං නිපන්නා තං සද්දං සුත්වා අයං න අඤ්ඤස්ස වීණාය සද්දො, නිස්සංසයං කුසරාජා මමත්ථාය ආගතොති අඤ්ඤාසි; මද්දරාජාපි තං සද්දං සුත්වා අතිවියමධුරං වාදෙති, ස්වෙ එතං පක්කොසාපෙත්වා මම ගන්ධබ්බං කාරෙස්සාමීති චින්තෙසි, බොධිසත්තො න සක්කා ඉධවසමානෙන පභාවතිං දට්ඨුං අට්ඨානමෙතන්ති පාතොව නික්ඛමිත්වා සායං භත්තගෙහෙයෙව පාතරාසං භුඤ්ජිත්වා වීණං ඨපෙත්වා රාජකුම්භකාරස්ස සන්තිකං ගන්ත්වා තස්ස අන්තෙවාසිකභාවං උපගන්ත්වා එකදිවසෙනෙව ඝරං මත්තිකාය පූරෙත්වා භාජනානි කරෙමි ආචරියාති වත්වා ආම කරොහීති

වුත්තෙන එකං මත්තිකාපිණ්ඩං චක්කෙ ඨපෙත්වා චක්කං ආවිජ්ඣි සකිං ආවිද්ධමෙව යාවමජ්ඣන්තිකාතික්කමා භමියෙව; සො නානාවණ්ණානි ඛුද්දකමහන්තානි භාජනානි කත්වා පභාවතියා අත්ථාය භාජනං කරොන්තො නානාරූපානි සමුට්ඨාපෙසි, බොධිසත්තානං හි අධිප්පායා ඉජ්ඣන්ති තානි පනරූපානි පභාවතියෙව පස්සතූති අධිට්ඨාසි; සො සබ්බභාජනානි සුක්ඛාපෙත්වා පචිත්වා ගෙහං පූරෙසි; කුම්භකාරො නානාභාජනානි ගහෙත්වා රාජකුලං අගමාසි; රාජා දිස්වා කෙනිමානි කතානීති පුච්ඡි; මයා දෙවාති, අහං තයා කතානි ජානාමි කථෙහි කෙන කතානීති, අන්තෙවාසිනා දෙවාති, න සො අන්තෙවාසී ආචරියො සො තෙ, ත්වං තස්ස සන්තිකෙ සිප්පං සික්ඛ; ඉතො පට්ඨාය ච සො මම ධීතානං භාජනානි කරොතු ඉමඤ්චස්ස සහස්සං දෙහීති සහස්සං දාපෙත්වා ඉමානි ඛුද්දකභාජනානි මම ධීතානං දෙහීති ආහ. සො තානි තාසං සන්තිකං හරිත්වා ඉමානි කීළනත්ථාය ඛුද්දකභාජනානීති ආහ, තා සබ්බා ආගමිංසු; කුම්භකාරො මහාසත්තෙන පභාවතියා අත්ථාය කතභාජනමෙව තස්සා අදාසි, සා භාජනං ගහෙත්වා තත්ථ අත්තනො ච මහාසත්තස්ස ච ඛුජ්ජාය ච රූපං පස්සිත්වා ඉමං න අඤ්ඤෙන කතං කුසරාජෙනෙව කතන්ති ඤත්වා කුජ්ඣිත්වා ඉමිනා මය්හං අත්ථො නත්ථි ඉච්ඡන්තානං දෙහීති ආහ; අථස්සා භගිනියො කුද්ධභාවං ඤත්වා කුසරඤ්ඤා කතන්ති මඤ්ඤසි න ඉදං තෙන කතං කුම්භකාරෙන කතං ගණ්හාහි නන්ති අපහසිංසු; සා තෙන කතභාවං තස්ස ච ආගතභාවං තාසං න කථෙසි; කුම්භකාරො සහස්සං බොධිසත්තස්ස දත්වා තාත රාජා තෙ තුට්ඨො ඉතො කිර පට්ඨාය රාජධීතානං භාජනානි කරෙය්‍යාසි තානාහං තාසං හරිස්සාමීති ආහ; සො ඉධාපි වසන්තෙන න සක්කා පභාවතිං දට්ඨුන්ති තං සහස්සං තස්සෙව දත්වා රාජුපට්ඨාකස්ස නළකාරස්ස සන්තිකං ගන්ත්වා තස්සන්තෙවාසිකො හුත්වා පභාවතියා තාලවණ්ටං කත්වා තත්ථෙව සෙතච්ඡත්තං ආපානභූමිඤ්ච විත්ථං ගහෙත්වා ඨිතං පභාවතිං චාති නානාරූපානි දස්සෙසි; නළකාරො තඤ්ච අඤ්ඤඤ්ච තෙන කතභණ්ඩං ආදාය රාජකුලං අගමාසි; රාජා දිස්වා කෙනිමානි කතානීති පුච්ඡිත්වා පුරිමනයෙනෙව සහස්සං දත්වා ඉමානි නළකාරභණ්ඩානි මම ධීතානං දෙහීති ආහ; සොපි බොධිසත්තෙන පභාවතියා අත්ථාය කතතාලවණ්ටං

කො පු ල් කර විලස් වත වෙත් බඳ සොබ නා
නි ම ල් දිගු පුළුල් පැහැදුල් සුවිලැසි නා
කු හු ල් දුරැර සැපසේ වුහු කමලඟ නා (48, සැවුල්)

‡ දිනු: පැරැඳවූ. § දුරළු-සියළු සත්නා.

57. කෙළෙ මෙද සඳ නො වෙන්
යෙසොහු* කැලුම්නි උවන්,
වසන් පහළ ද සෙපියන්
පියනඳහස පිරී හා.

---

58. පැලඹෙනොහු තෙදගිම්—පැදුම්හි රුපිවමියන්,
තනහස පුඩු තුඩු තබා—උරවිල් කුමුදු වන් වූ.

59. දුලු දියමුදුනෙ ඉඳුහු—ඒ යසරැස් නොසරස්,
කෙළෙ දකුණෙණ් රුපුවමියන්—උවන්පියුම්වන මුහුළු.

---

57. ඔහු, ඒ රාජෝත්තමයාගේ; යෙසේ, යශස්තෙමේ; කැලුම්නි, කාන්තියෙන්; උවන්, වක්ත්‍රය හා; සඳ, නොවෙන් කෙළෙ මෙදු, චන්ද්‍රයා හා විභාග නො කෙළේ මතුද; පියන්; වල්ලභයන් විසින්; වසන් පහළද, වස්ත්‍රාපහරණය කරණ ලද්ද; සෙපියන්, සෙව්‍යප්‍රියාවන්ගේ; අඳහස, අධ්‍යාශය; පිරී හා, පූර්ණයද කෙළේයි.

යශස්-වර්ණනායි.

---

58. ඔහු, ඒ රාජෝත්තමයාගේ; තෙදගිම්, තේජෝග්‍රීෂ්ම; පැලඹෙන, විජෘම්භමාන වන කල්හි; පැදුම්හි, පූර්වදිග්හි; රුපු වමියන්, ශත්‍රුවනිතාවන්ගේ; තන, පයෝධර නැමැති; හස, හංසයෝ; පුඩු, චූචුක නැමැති; තුඩු තබා, වක්ත්‍ර තබා;† උරවිල්, වක්ෂස්ථල නැමැති තඩාගයෙහි; කුමුදු වන් වූ, නිමග්න වූවාක් වැනි වූ.

59. දියමුදුනේ, ජගන්මස්තකයෙහි; දුලු, දීප්තිමත්වූ; ඒ ඉඳුහු, ඒ රාජචන්ද්‍රයාගේ; යසරැස්, යශෝරශ්මිය කරණකොට ගෙණ; දකුණේ, දක්ෂිණදිග්හි; රුපුවමියන්, ශත්‍රුවනිතා වන්ගේ; උවන්, වක්ත්‍ර නැමැති; පියුම්වන, පද්ම සමූහයන්; නොසරස්, වහාම; මුහුළු කෙළේ, මුකුලිත කෙළේයි.

---

* යෙසෙනොහු-හැමු.

† චූචු, චූචුක නැමැති; තුඩ තබා, තුඩුව පමණක් තබා-සමහර.

60. යෙසෙන් කැරැ ලෝ හෙළ—නිරිඳු පැලඳිගු බිත්හි,
නුවනුපුල මතු ලතුයෙන්—තැවිරූ වන් රුපුපියන්.

61. සෙනගෙහි ගජනා—ගජමේකැලතුරු දෙසේ,
තනහස ගත රුපුපියන්—හරපොකුරුකුරු දුරළී.

62. සිවුසයුරත් දෙරණ—කරතෙකසතොහු සරණ,
නියරැසහස්ගඟ දරා—රුපුරජ ලද ඉසුරුතැන්.*

---

60. නිරිඳු, නරේන්ද්‍රෝත්තමයා ; යෙසෙන්, යසසින් ; ලෝ, ලොකය, හෙළ කැරැ, ධවල කෙරෙමින් ; පැලඳිගුබිත්හි, පශ්චිමදිග්භිත්තියෙහි ; රුපුපියන්, ශත්‍රුවනිතාවන්ගේ ; නුව නුපුලමතු, නෙත්‍රොත්පලමාත්‍රයක් ; ලතුයෙන්, අලක්තයෙන් ; තැවැරූ වන්, චර්චිත කළාක් වැනිවී.

61. සෙනගෙහි, සෙනාවෙහි ; ගජනා, ගර්ජනා කරන් නාවූ ;† ගජමේකැල, හසති නැමැති මෙඝසමූහ තෙමේ තුරුදෙසේ, උත්තරදිසාවෙහි ; රුපුපියන්, ශත්‍රුවනිතාවන්ගේ ; තනහස, පයොධර නැමැති හංසයන් ; ගත, ග්‍රහණය කළාවූ ; හර, මුක්තාහාර නැමැති ; පොකුරුකුරු පුෂ්කරාඞ්කුර ; දුරළී, දුරීකරණය කෙළේයි.‡

62. සිවුසයුරත්, චතුස්සාගර පර්‍ය්‍යන්තවූ ; දෙරණ, පෘථිවිය ;§ කරතෙකසත, එකච්ඡත්‍ර කළ කල්හි ; ඔහු, ඒ රාජොත්තමයාගේ ; සරණ නියරැස්, චරණනඛමයූඛ නැමැති ; අහස්ගඟ, ආකාශ ගඞ්ගාව ; දරා, උමහනය කොට ; රුපුරජ, ශත්‍රුරාජ තෙමේ ; ඉසුරුතැන් ලද, ඊශ්වරස්ථාන ලදී.

---

* ම නා හ ද මෙ රදඟිම් මිහිමඬල නොමහැ ර
පි රි සි ද සිවුසයුර එකසත කරණව ර
මොහු ප ද නියකිරණ සුරගඟ දරා සි ර
රු පු ර ද ඉසුරුබව ලදු බියගිම් දුරැ ර (39, සැවුල්.)

† ගර්ජනා නුගත්නාවූ-සිද, ගජ්ජනා ගත්නාවූ-සිද සමහර.

‡ පුෂ්කරාඞ්කුරය දුරළී, සමහර. § දෙරණෙ, පෘථිවියෙහි-හැම.

63. යදිදනනදහස—පුරතොහු දන්වතුරෙන්,
සුරතුරු මමකරමැණි*—වෙසෙසිනිසිලි පණිත්මත්.

64. පුරෙහි කුසාවත්† වසාන
යසෙන වසාන තිලො
දුහැ හව් වසාන
කුසා පවසාන කළ ගුණිවසාන සග.

**පළමුවන සඟ.**

---

65. වි ඔහුහට සොහොවුරු—රුවින් කඳප් දප් හළ.
යසතෙද සොමිගුණි නුවණි—නිරිඳෙක් වරදතැන් පත්.

---

63. ඔහු, ඒ රාජොත්තමයාගේ; දන්වතුරෙන්, දානප්‍රවාහයෙන්; යදිදනන්, යාචක ජනයන්ගේ; අදහස. අධ්‍යාශය; පුරත, පූරණය කරණ කල්හි; සුරතුරු, කල්පද්‍රැමය ද; මමකරමැණි චින්තාමාණික්‍යය ද;‡ වෙසෙසින්, විශෙෂයෙන්; පණිත්මත්, ප්‍රත්‍යෙපතිමාත්‍රයක්;§ ඉසිලී, දැරී.

64. තිලෝ, ත්‍රෛලොක්‍යය; යසෙනු, යසසින්; වසාන, ප්‍රච්ඡන්නකළාවූ; හව් වසාන. සකලව්‍යසනයන්; දුහැ, දුරු කළාවූ; කුසාවත්පුරෙහි වසාන, කුසාවතීපුරයෙහි වාසයකරන්නාවූ; කුසා, කුසරජහුගේ; ගුණිපවසාන, ගුණිප්‍රකාශක; අවසාන කළ, සමාප්ත කළාවූ; සග, සර්ගයයි.

ප්‍රථමසර්ගයයි.

---

65. ඔහුහට, ඒ රාජොත්තමයාහට; සොහොවුරු, සහෝදරවූ; රුවින්, රූපයෙන්; කඳප්, කන්‍දර්පයාගේ; දප් හළ, දර්පමර්දනය කළාවූ; යස, යශස් හා; තෙද, තෙජස් ද; සොමිගුණි, සෞම්‍යවූ ගුණ හා; නුවණි, ප්‍රඥා ඇති; නිරිඳෙක්, නරෙන්ද්‍රයෙක්; වරද තැන්, භ්‍රාත්‍යස්ථානයට; පත්වි, ප්‍රාප්ත වී.

---

* මකර-මෙණ-සිඳ, මිණ-සිඳ සමහර.
† කුසවත්-හැමතැනම.
‡ මමකරමිණ, මාකර චින්තාමාණික්‍යය ද—ඇතැම්.
§ ප්‍රව්‍යක්තිමාත්‍රයක්-හැම.

66. වි එක්දහක් මතුරු—යෙදී ඔහු ගුරුවරන්,
ඉකි මැතිසක් සිම්දියේ—අනේ සිරිසර විඳියේ.

67. මුළු ලෝ නෙත බඳන—මනකල් කලුන් නෙත්සිත්,
විසි කරණ ගුණනදන්—නිරිඳු අප ලෝ පහණෙක්.

68. අප නිරිඳු සියො සිරී—පත් රජසිරි සහා සිරී,
නො ලැබ ඒ පලඳනා—විලසත නොලා රඳනා.

69. උමවතත්පලුගල*—මල්දමින් හෙබි මෙහෙසරා,
උරමල්නි එව් රඳනේ—ගොවිඳු කමල් වලඳනේ.

---

66. අනේ, අනේකප්‍රකාරවූ ; සිරිසර, ශ්‍රීසාරයන් ; විඳියේ, අනුභව කළාවූ ; ඔහු, ඒ රාජෝත්තමයාගේ ; ගුරුවරන්, ගුරු ශ්‍රේෂ්ඨයන් ; ඉකි, එක්වැ ; මැතිසක්, අමාත්‍යසමූහතෙමේ ; එක් දහක්, එක් දිනයෙක්හි ; මතුරු, මන්ත්‍රණයෙහි ; යෙදී, යොජිතවැ ;† සිම්දියේ වී, මෙසේ සමුරණය කෙළේ.

67. මුළු ලෝ, සමස්ත ලොකයාගේ ; නෙත බඳන, නෙත්‍ර බන්ධනය කරන්නාවූ ; මනකල්, මනොකල්‍යවූ ;‡ කලුන්, කාන්තාවන්ගේ ; නෙත්, නෙත්‍රයන් ද ; සිත්, චිත්තයන් ද ; විසිකරණ, වාශ්‍ය කරන්නාවූ ;§ ගුණනදන්, ගුණයට නිධානයක් වැනිවූ ; ලෝ පහණෙක්, ලොකයට අසහාය ප්‍රදීපයක් වැනිවූයේ ; අප නිරිඳු, අපගේ නරේන්ද්‍රොත්තමයායි :—

68. අප නිරිඳු, අපගේ නරේන්ද්‍රොත්තමයාගේ ; සියොසිරි පත්, සමාගමශ්‍රියට ප්‍රාප්තවූ ; රජසිරි, රාජ්‍යශ්‍රීතොමෝ ; සහා සිරි, සමාගමශ්‍රී නැමැති ; ඒ පලඳනා, ඒ ප්‍රසාධනය ; නොලැබ, අලබ්ධවීමෙන් ; රඳනා, රඤ්ජමානවූ ; විලස විලාසය ; අත නො ලා, හස්තයෙහි නො බැඳූ.

69. මෙහෙසරා, මහෙශ්වරතෙමේ ; උමවත, උමාදෙවීගේ ; අත්පලු, හස්තපල්ලව නැමැති ; ගලමල්දමින්, කණ්ඨමාලා දාම්යෙන් ; හෙබි, ශොභමාන වූයේය ; ගොවිඳු, විෂ්ණුතෙම ; කමල්, ශ්‍රීකාන්තාව ; වලඳනේ, ආශ්ලෙෂ කරන්නේ ; උරමල්නි එව්, වක්ෂඃස්ථ මාලාවකින් මෙන් ; රඳනේ, රඤ්ජමාන වෙයි.

---

* උමවත පළු මල්ගල්-යි හැම. † යොජ්ජව-යොජ්‍යව-හැම.

‡ මනොනුකූලවූ-මනොකල්‍යාණවූ-සමහර.

§ සිත්, චිත්තාවට ; විසිරණ, වාශ්‍යකාරණවූ-බොහෝ.

70. දියදෙස දෙනෙඳඉති—පමාරුවනැත හොබනේ,
අප හිමිකුල විමල් විල්—මෙහෙසි හසකැත* හොබනේ.

71. තමනදහස් නදන්†—මැතිසක් වදන්දූපුණේ,
වැජඹුත් කැලි විදියෝ—යහද නොමැ සිම්දියෝ.

72. ගුරුදෙදෙන සොම්නසි—තිතිරිපැ සතුටුකඳුලෙන්,‡
සියලඟ සදමිනි දුනු—නරතුරු.ලොමුදහ සියෙන්.

---

70. ඉති, මෙසේ ; දෙනෙඳ, මහාසත්වයන්ට ;§ පමාරුවනැත, ප්‍රමදාරත්නප්‍රතිලාභයක් ඇතහොත් ;|| හොබනේ, ශොභමාන වන්නේය ; දියදෙස, ජගත්සාක්ෂිය ; අප හිමිකුල, අපගේ ස්වාමි කුල නැමැති ; විමල්, නිර්මලවූ ; විල්, තඩාගය ; මෙහෙසි, මහෙසිකා නැමැති ; හසක්,¶ හංසදුවක් ; ඇත, විද්‍යමානවූවහොත් ; හොබනේ, ශොභමාන වන්නේයි.

71. මැතිසක්, අමාත්‍යසමූහතුමූ ; තමනදහස්, තමන්ගේ අධ්‍යාශය නැමැති ; නදන්, නිධානයන් ; වදන්දූපුණේ, වචන නැමැති දර්පණයෙහි ; වැජඹුත්, විජෘම්භමාන කරත්ම ; කැලි විදියෝ, පාප අනුභව කළාහ ; යහද, සුබජනයන් ; නොමැ සිම්දියෝ, සමරණය නො කළෝ.

72. ගුරු දෙදෙන, මාතෘ පිතෘ දෙදෙන ; සොම්නසින්, සන්තොෂයෙන් ; ඉතිරි, අතිරික්තවූ ; සතුටු, සන්තුෂ්ටිය ; කඳුලෙන්, බාෂ්පයෙන් ; පැ, දක්වමින් ; දූනු, ජනිතවූ ; ලොමුදහසියෙන්, රොමොද්ගම ශතයෙන් ; නරතුරු, අවිච්ඡින්නවූ ; සියලඟ, සකල ශරීරය ; සදමිනි, සජ්ජිත කෙරෙමින්.**

---

* මෙහෙසුන් හසන-හැම.
† නදන් තමනදහස්-සී හැම.
‡ තිතිරි පැ තුටු කඳුලෙන්-සී කි කලැ මාත්‍රා සමයි.
§ දෙනෙඳ, සත්වයන්ට-සත්වයන්ද පවා ; හැම.
|| ප්‍රතිලාභයෙන්-හැම.
¶ හසකන-සමහර.
** මෙතන පටන් ඌනත්වයක් පෙණෙයි.

73. කෙලෙස් මදවරණ—කුසහු කුසහු ඇසහු දියට,
දියවැඩනිල යුහුබෙවෙ—සඳ දළගති මෙත්ලෙන්.*

74. අසුබු නො දක්නේ—ලෝ දද අයල පහණෙන්,†
යළ දතහොත් විදස්නෙන්‡—ගරවස් වසන්නේ කවර.

75. දවන් දවනෙක්වන්—රුසිරඟ අඟපසඟ වී,
ලොබ සහගිය සිත් හුදු—සමහම් ඔවුන් කෙවදන්.

---

73. කෙලෙස් මදවරණ, සකලක්ලේශ නැමැති මත්ත හස්තීන්ට ; අකුසහු, අඞ්කුසයක් වැනිවූ ; දියට ඇසහු, ජගජ්ජනතාවූ ; ඒ කුසහු, ඒ කුසනරපතීහු ; දියවැඩනිලයුහුබෙවෙ, ජගද්වෘද්ධික්‍රියා යෝග්‍යභාවයෙහි ; සඳ, චිත්ත (අධ්‍යාශ)ය ; මෙත්ලෙන්, (ලෝකයා කෙරෙහි) මෛත්‍රී චිත්තයෙන් ; දළගති, දෘඪ ග්‍රහණය කළහ.§

74. දද ලෝ, මුග්ධ ලෝකතෙමේ ; අයළ පහණෙන්, අවිද්‍යා ප්‍රාසනත්‍යයෙන් ; අසුබු, අශුභයක් ; නො දක්නේ, දෘශ්‍යමාන කොට නො වන්නේය ; යළ, නැවත ; විදස්නෙන්, විදර්ශනා ඥානයෙන් ; දතහොත්, විඥානය|| කළ හොත් ; ගරවස්, ගෘහවාසයෙහි ; වසන්නේ, වාසයකරන්නේ ; කවර, කවරෙක්ද?¶

75. හුදු, උදක් ; ලොබසහගිය සිත්, ලොභසහගත චිත්තය, රුසිරඟ, රුචිරාඞ්ගියගේ ; අඟපසඟ, අඞ්ගප්‍රත්‍යඞ්ගය ; එක්වන්; අනවරතයෙන් ; දවන, දග්ධකරන්නාවූ ; දවන් වී, වහ්නියක් වැනි විය ; ඔවුන්, ඒ කාන්තාවන්ගේ ; සමහම්, සමාගමය : කෙවදන්, කියනුම කිම්ද ?

---

* දියවැඩනිල සහුබෙසි (සුහුබෙවෙ) හිලසඳළමේතලෙන්-පොත්.
(මෙය මේඅදීන් නන්වැදෑරුම්ව ආකුලවී තිබේ.)

† අසල පහණෙන්-ඇතැම්. ‡ විමස්නෙන්-හැම.

§ මේ 73 ගීයේ සන්නය අපවත්ව තිබූහෙයින් අප විසින් සන්න ලියාලන ලදී.

|| විඥාපනය, සමහර. ¶ කවරෙක්හිද, සමහර.

76. පැවතුම් හුදු දහ—මුත් වැ උවුනොවුන් ඇසිරැ,
පෙවෙත වී ගත් දදලෝ—විසිනත් නැතත්සර නම්.

77. සසර රණ සරණ—දනමුවනවොත තරපස,
අවා මුහුදුදර පමා—දෙනෙ හෝවාර හදනා.*

78. දුක් පිළියම් මුත්—ගිහි ඉසුරෙ යෙහෙ කවර,
මොහොගඬෙහි ගේ අස්වස්—කිමි බුදුන එව් මස්පෙස්.

79. ගජන්කැල පුස්නා—දෙලොහොළ මහත් යසවර,†
ගිහිඉසුරුකා මෙ පෙළා—දනනුවන්වැට කෙලෙස් ගේඉනන්.

---

76. ඔවුනොවුන් ඇසිරැ වැ, අනෙන්‍යාන්‍යාශ්‍රිත වැ ; හුදු දහ මුත්, සංස්කෘත ධර්මයන්ගේ : පැවැතුම්, ප්‍රවෘත්තිය , පෙවෙත වී, ශරීරයකැයි කියා, ගත්, ග්‍රහණය කළාවූ ; දද ලෝ මුග්ධ ලොකයා, විසිනත්, පරීක්ෂා කරණ කල්හි ; අත්සර නම්, අර්ථ සාරයක් නම් ; නැත්, නැත්තේයි.

77. පමාදෙනෝ, ප්‍රමාදජනතෙමේ ; සසර, සංසාරනැමැති ; රණ, අරණ්‍යයෙහි ; සරණ, සඤ්චාරණය කරන්නාවූ ; දන මුවන්, සත්ව නැමැති මෘගයන්ට , අවොත, උද්ඝාත කළාවූ ; තර පස, ස්ථිරවූ පාශයක් මෙන්ද ; අවා මුහුදුදර, අපාය නැමැති සමුද්‍රොදරයට ; අදනා, ආකර්ෂණය කරන්නාවූ ; හෝවාර, දිය වරෙක් මෙන්ද වේ.‡

78. මොහොගඹහි. මොහ නැමැති ගණ්ඩයෙහි ; අස්වස් ගේ, ආස්වාදයස්§ හෙතුකොට්ගෙණ ; කිමි, කෘමීන් ; මස්පෙස්, මාංසපෙශීන් ; බුදුන එව්, අනුභව කරන්නාක් මෙන් ; දුක්පිළියම් මුත්, දුඃඛප්‍රතිකාර මුත් ; ගිහිඉසුරෙ. ගෘහඓශ්වර්‍ය්‍යයෙහි යෙහෙ කවර, කවර සුඛයෙක්ද ?

79. මහත් යසවර, (හස්තිප්‍රතිලාභයෙන් ලබන්නාවූ)|| මහත්වූ කීර්තියට වඩා ; ගජන්කැල, හස්තිසමූහයාගේ ; පුස්නා, පොෂ්ණය ; දෙලොහොළ, මහත් දුක්වන්නේය ; දනනුවන්වැට; ජන යන්ගේ නෙත්‍රවෘත්තිය ;¶ කෙලෙස් ගේනෙන්, කෙලශයන් හෙතු කොටගෙණ ; ගිහිඉසුරුකාමෙ, ගෘහ ඓශ්වර්‍ය්‍ය සමූහයම ; පෙළා, පෙළා දුක් දෙන්නේයි.

---

* අවාමුහුදෙර පමාදෙනේ හොවර හදනා-සමහර.
† යසසට-ඇතම්. ‡ දියවරෙකි-හැම. § ආශ්වාසය-බොහෝ.
|| හස්තිප්‍රතිලාභයෙන් ලබන්නාවූ, මහත් යසසට වරා-යි පුරාණ පොත්.
¶ නෙත්‍රාවත. සයෙහි-යි බොහෝ.

80. මදුරු වැ ඇත් සුදු—වරත් දෙලොහොළ හරණින්,
ගිහි ගෙදෙළෙහි දුගී බැව්—නුවලා පිරි කෙලෙස්නෙන්.

81. සහලඟරකතිනතට—පෙරළී කැරැ ගැන්මෙව් දුක්,
විඳුන පිරිවැටුම්රියව්—නො දැන පමදෙනෙ හා ලෙව්.

82. දහමට පියෙව් ලෙව්—ගෙදළ වසනවුලේ හී,*
හිවී විසුළ සිදුහත්—ගජනත්නෙන් අසිඳුනා.

83. දදදේනේ පස්කම්—ගුණෙහි ලොල් සිත් විසිවූ,
සරණ මතවරණ හරණ—නරසී සී දූරු සිරෙන්,†

---

80. මදුරුවැ, මකසවැ; සුදු. සුඛයෙන්; ඇත්, හස්තියක්හු; වරත්, වළකත්; දෙලොහොළ හරණින්. දුඃඛයම මහත් වූවාක් මෙන්; කෙලෙස්නෙන්, කෙලශයෙන්; පිරි, සමපූර්ණවූ; ගෙදෙළෙහි, ගෘහබූරයෙහි; දුගී බැව්. දරිද්‍රභාවය: ගිහී. ගෘහීහු; නුවලා, කලකිරුවා.‡

81. සහලඟරක්, ජලිතාඞගාරයක්; අතිනතට, හස්තයෙන් හස්තයට; පෙරළී කැරැ පරිවර්තනය කොට; ගැන්මෙව්, ග්‍රහණය කරන්නාක් වැනිවූ; ඉරියව් පිරිවැටුම්. ඊර්‍ය්‍යාපථ පරිවර්තනයෙන්; විඳුන. අනුභව කරන්නාවූ; දුක්, දුඃඛය; නො දැන, විඥානය නො කොට; ලෙව් හා, ලොකයා ද; පම දෙනේ, ප්‍රමාද වන්නේසි.

82. ගෙදළ, ගෘහබූර නැමැති; වසන් අවුලේ, ව්‍යසනාකුල යෙහි; හී, පතිත වැ;§ දහමට, ධර්‍මයට; පියෙව්, ප්‍රිය වන්නාවූ; ලෙව්, ලොකතෙමේ; විසුළ, විසර්ණවූ;|| සිදුහත්. සර්‍පයන්; ගජනත්නෙන්, හස්තිචුණ්ඩාග්‍රයෙන්; අසිඳුනා, අසිදගැන්මක්, හිවී, ප්‍රකාශ කෙළේ.

83. පස්කම්ගුණෙහි, පඤ්චකාමගුණයෙහි; ලොල්, ලොභ යෙන්; සිත්විසි වූ, චිත්තය වසඟ කළාවූ; දදදෙනේ, මුග්ධ සත්ව තෙමේ; . නරසී, නරොත්තමයා, .(දූරු චරිතයෙන්;)¶ සිරෙන්, මස්තකයෙන්; සී දූරු, සිංහයක්හු ලඞඝනය කොට; සරණ, සඤ්චාරණය කරණ; මතවරණ, මත්තහස්තියක්හු; හරණ, සම වී.

---

* හෙද වසනවුලෙ දෙළෙ ගිහි. † සී දූරු සිරෙත් නරසී-ඇතැම්.
‡ හුනුවලා, කලකිරීවා-සමහර.
§ ගිහිදෙලෙ, ගෘහබූර නැමැති; වසත්අවුලෙ, ව්‍යසනාකුලයෙහි; හෙද, පතිතව; ඇතම්. || විශිර්ණවූ-හැම. ¶ නරොත්තමය-හැම.

84. රජ සිරි යෝනෙහී—පිහිටා දම් සරත් මත්,
බූ බුමුතැත් අත්නෙන්—මුතු අවුණත් කෙ නම් බර.

85. යෙහෙ වේ පටන් මද—පිළි වෙ මහදුක් පස්කම්,
පුළුඳු පුළුදු මියුරු—ගි ගින්* මුවනට දුක්ද.

86. ගිහිගෙ යහ ඉස්නා – දෙනෙ රු බොල් තමපබඳ,
දුපතැ දියුණිනුකුණිලු—පතා කැරු යා යා හේ.†

87. පසිඳුරණට සැණ—බවසයුරේ සළාවන්,
ලොබ්ලියට තුමුල් මුල්—අවයට හැයූ දෙර වන්.

---

84. රජ, රාජත්වය ද ; සිරි, සම්පත්තිය ද ; යෝනෙහි, යෞවනයෙද යන මෙහි ; පිහිටා, ප්‍රතිෂ්ඨිත වැ දම් සරත්, ධර්‍මයෙහි හැසිරෙත් ; මත්, මත්තභාව නැමැති ; බූ, භූතාවේශවැ ; බුමුත්, භ්‍රමණය කරන්නාවූ ඇත්, හස්තිහුගේ ; අත්නෙන්, හස්තයෙන් ; මුතු, මුක්තාඵලයන් ; අවුණත්, ආවුණන කරත් ; කෙ නම්, කවර නම් ; බර, භාරයෙක් ද ?

85. පස්කම් මද, පඤ්චකාම මදය ; පටන්, ප්‍රථමයෙහි ; යෙහෙ වේ, යහපත්වන්නේය ; පිළි, නැවත ; මහදුක් වේ, මහත්වූ දුඃඛයට පමුණුවන්නේය ; (කෙසේද යත් ?) පුළුඳු, පුලින්දයන්ගේ ; පුළුදු, ප්‍රලුබ්ධවූ මියුරු, මධුරවූ ; ගී, ගීති කාව ; මුවනට, මෘගයන්ට ; දුක්දගින්,‡ දුඃඛදායක වූවාක් මෙනි.

86. ගිහිගේ, ගෘහද්වාරයෙහි ; යහඉස්නා, සුඛප්පසිතවූ ; දෙනේ, ජනතෙමේ ; බොල්, ඝනවූ ; තමපබඳ, තමඃප්‍රබන්ධයන්ඇති ; රු, රාත්‍රියෙහි ; දුපතැ, දුෂ්පථයෙහි ; යා, යාත්‍රාවට ; යාහේකැරු, සුඛහෙතු කොට ;§ දියුණින් දිගුණිතවූ ; අකණිලු, විද්‍යුත්ආලොකය ; පතා, ප්‍රාර්ථනා කෙරේ ||

87. පසිඳුරණට, පඤ්චෙන්ද්‍රියයන්ට ; සැණ, උත්සවයක් වැනි වූ ; බවසයුරේ, සංසාරසාගරයෙහි ; සළා වන් ආවර්‍තයක් වැනි වූ : ලොබලියට, ලොභ නැමැති ලතිකාවට ; තුමුල්, මහත්වූ ; මුල්, මූලයක් වැනි වූ ; අවයට අපායට ; හැයූ, විවෘතවූ ; දෙර වන්, ද්වාරයක් වැනි වූ.

---

* ගී-ගිගී-බොහෝ. † පතා යා යා හේ-බොහෝ. ‡ දුක්ද-හැම.
§ යාහේ, සුඛහෙතුකොටගෙන-බොහෝ. || කෙළෙ-සමහර.



ජාතික පුස්තකාල හා ප්‍රලේ... ...ඛ්‍යාපොලෝකය

88. උලැඟි සැඬපවනින්—පරණලා ගින් හී සත්,*
අවිදුහේ පුනපුනා—බෙමේ කම්රුවාරුහි.

89. ඉති පවසත එ විරුහු—පස්කම් වුහුටු බැව්,
සුහැඟිය ද ගුරුවෝ—යළ මේ ඔවා රුකුලෝ,

90. කුසල් කම්වැදරී—පස්කම් විවා දෙනුයේ,
ගරහා රජසිරි සියල්—යළ පින්කිම කරන්නේ.

91. රජසිරි පැමිණ මුත්—නො එනී ඒ නො සුලබ.
දියග සිව්වත් සඟරා—බෝ සඹර මේ සඟරා.†

92. සැරූ දසරජදම්—විනිස කිසින් නරපවර,
සගපවගෙක රජ බෝ—කළවුන් මෙහි ගණින් නැත්.

---

88 අවිදුහේ, අවිද්‍යාව හෙතු කොට ගෙණ; සැඬපවනින්, චණ්ඩමාරුතයෙන්; උලැඟි, උල්ලඞ්ඝිත වූ; පරණලාගින්, පුරාණ පත්‍ර පරිද්දෙන්; කම්රුවාරුහි, කාමරූපාරූප ලොක යෙහි; හී, පතිත වැ; සත්, සත්‍වතෙමේ; පුන පුනා, නැවත නැවත; බෙමේ, භ්‍රමණය කෙරේ.

89. ඉති, මෙසේ; පවසත, කීකල්හි; එ විරුහු, ඒ උතත මයා; පස්කම්, පඤ්චකාමය; වුහුටු බැව්, පරිත්‍යාග කළ භාවය; සුහැඟියද, විශෙෂයෙන් දැනුන ද; ගුරුවෝ, මව් පියෝ; යළ, නැවත; මේ ඔවා, මේ අවවාද වචනය; රුකු ලෝ, හෙළ වූ.

90. කම්වැදරී කුසල්, කාමාවචර කුශලය; පස්කම් විවා, පඤ්චකාම විපාකයන්; දෙනුයේ, දානය කරන්නේය; සියල් රජසිරි, සකලරාජ්‍යශ්‍රියට; ගරහා, ගර්හා කොට; යළ, නැවත: පින්කරන්නේ, පුණ්‍යරාශි කරන්නේ; කිම, කවරේ ද?

91. දියග, ජගදග්‍රය; සිව්වත්සඟරා, චතුස්සඞ්ග්‍රහ වස්තුව; මේ බෝසඹර, මේ බොධිසම්භාරයෙහි; සඟරා, සඞ්ගෘහීතය; රජසිරි පැමිණ මුත්, රාජ්‍යශ්‍රියට සම්ප්‍රාප්තව මුත්; නො එනී; අන්‍ය උපායකින්; ඒ, ඒ චතුස්සඞ්ග්‍රහවස්තුව; නො සුලබ, සුලභ නො වන්නේයි.

92. නරපවර, නරප්‍රවරය; දසරජදම්, දශරාජධර්මයෙහි: සැරූ, හැසිර; විනිසකිසින්, විනිශ්චයක්‍රියාවෙන්; සගපවග

---

* පරණලගින් සත් හි-සමහර. † බෝසත්සබර මෙ සඟරා—බොහෝ.

93. තබා එ අප සෙරෙනා රජමිණිවැල සිඳුනේ,
තමා ඔවසින්* මුස්නේ—නරවිරු නො තා පුස්නේ.

94. පිදී මත් එ වදන්—මුහුලැදිලි බඳ මුදුනෙන්,
ගෙණේ ද ඒ හේ දත්—මහසත්† අන් වදන් හා.

95. නැවතා දෙතා‡ සඳුත් මැ එක්වන් ගුරුවරන්,
පිළිසෙව් නො පැලැඟි§ වී—ළවසර සිතා සත්සර.

---

ස්වර්ගාපවර්ගයෙහි; එක රජබෝ කළවුන්, එකරාජ්‍යභොග අනුභව කළවුන්; මෙහි, මේ රාජවංශයෙහි; ගණින් නැත්, ප්‍රමාණාතික්‍රාන්තයි.

93. නරවිරු, නරවීරය;|| අප සෙරෙනා, අපගේ චිරාත් කාලයක් පැවැත එන්නාවූ; රජමිණිවැල, රාජවංශ නැමැති රත්නමාලාව; සිඳුනේ, ඡින්න කිරීම; එ තබා, ඒ තිබැද්දී; තමා, තොප බන්දවුන්; ඔවසින්.¶ අවවාදයෙන්; මුස්නේ, මිඳීම; තා නො පුස්නේ, තොපට සුදුසු නොවන්නේයි.

94. මුහුලැදිලි, මුකුලිතාඤ්ජලී; බඳ, බඳනාලද; මුදුනෙන්, මස්තකයෙන්; එ වදන්, ඒ වචනය; පිදී මත්, පූජා කෙළේ මතුද; ඒ හේතු දත්, ඒ හේතුව විඥානය කළාවූ; මහසත්, මහාබොධිසත්වතෙමේ; අන් වදන් හා, අන්‍යවචනයන් හා; ගෙණේ ද, පරීක්ෂා කෙරේ ද.

95. නැවතා, නැවත; එක්වන් ගුරුවරුන් දෙතා සඳුත්මැ, නිරන්තරයෙන් මව්පිය දෙදෙනා විගුණ කොට ආරාධනා කරත්ම; සත්සර, සත්වසාරතෙමේ; ළවසර සිතා, ආදර සිතා; පිළිසෙව් නොපැලැඟි වී, ප්‍රතික්ෂෙපය නුසුදුසු යයි කියා.

---

* ඔවදින්-ඇතැම්.

† එහේදත් මහසත් ගෙනේද-ඇතැම්.

‡ තවතා දෙවතා-සමහර.

§ නො ලගනේ-බොහෝ.

|| නරොත්තමය-නරවරය-සමහර.

¶ ඔවාසින්-ඇතැම්.

96. කැඳවා සිපිහි—නිමියතැදුරකු මිහිනඳුන්,
මලසුන් කසුන් රුසිරු—විලසින් රූ කරා වී.

97. මවා කසුන් රුවක්—දෙවසර මෙන් දිස්නා,
රූ දැක්වී මහත්මා—දළ සොම්නසිනෙ ඇදුරා.

98. සුරත ලවනත සැදූ—වහසසිනෙනි රුසිරු,
සිරි පෑ ළසඳකැල්මේ—පැහැසර සඳවලා ලඟැ.

99. දිසි රුසිරු සරා—වලාතුරෙ විදුලිසිරින්,*
අසිරි සිරිගබ රදනා—සිය අත්තම් කනාරු.†

100. ගෙණේ වී‡ මෙහෙයී—එ වීරු සිපිහුහට ගොස්,
දැක ද එ රූ රුසරු—සහ විස්මලෙන් මේ වී.

---

96. මිහිනඳුන්, මහීනන්දනතෙම ; සිපිහි, ශිල්පයෙහි ; නිමියත, කොටිප්‍රාප්තවූ ; ඇදුරකු, ආචාරියකු ; කැඳවා, ආමන්ත්‍රණය කොට ; මලසුන්, නිර්මලවූ ; කසුන්, කාඤ්චනමය ; රුසිරු, සිත්කලුවූ ; විලසින්රූ, විලාසිනී රූපයක් ; කරා, කරවයි ; වී, කථනය කෙළේ.

97. දෙවසර මෙන්, දිව්‍යාප්සරාවක් මෙන් ; දිස්නා, දෘශ්‍යමානවූ ; කසුන් රුවක්, කාඤ්චන රූපයක් ; මවා, නිර්මාණය කොට ; එ ඇදුරා, ඒ ආචාරිතෙමේ ; දළ, මහත්වූ ; සොම්නසින්, සන්තොෂයෙන් ; මහත්මා, මහාත්මයාහට ; රූ දැක්වී, රූපය ගෙණ හැර නිරීක්ෂණය කරවී.

98. සුරත, අතිරක්තවූ ; ලවනත, අධරය ; සැදූ, සජ්ජිත කළාවූ ; රුසිරු, සිත්කලු වූ ; වහසසිනෙනි, අපහාසස්මිතයෙන් ; පැහැසර, ප්‍රභාසාර වූ ; සඳවලා ලඟැ, සන්ධ්‍යාවලාහකාසන්නයෙහි ;§ ළසඳකැල්මේ, අභිනවචන්ද්‍රකාන්ති ; සිරි, ශෝභාව ; පෑ, ප්‍රකාශ කෙළේ.

99, 100. රුසිරු, සිත්කලුවූ ; සරාවලා අතුරේ, ශරද්වලාහකාභ්‍යන්තරයෙහි ; දිසි, දෘශ්‍යමානවූ ; විදුලිසිරින්, විද්‍යුත් ශොභාවෙන් ; අසිරි, ආශ්චර්ය්‍ය වූ ;|| සිරිගබ, ශ්‍රීගර්භ

---

* වලඅතුරෙවිදුලිසිරින්-හැම. † කළකනාරු—ඇතැම්
‡ ගෙනෙත්වී-ඇතැම්.
§ වලාහකාභ්‍යන්තරයෙහි-හැම. || අසිරිමත්, ආශ්චර්ය්‍යමත්වූ ; බොහො.

101. ලෝ මනනෙත් කොඳ—කුමුදුවන පොබයන්නා,
සරාසිරි ලකළ ළවන්—සිසිමඬලෙන් වොරජනා.

102. පැහැතොනෙන් විලිරළි—නී හරපොකුරු දූලියෙන්,
ලකළ තුනුවිල්නෙන් පින්—පියවුරු හසුසුලන්නා

103. මෙ රූ දුරූ තොප—නුබඳ මනනෙත් බඳනා,
යහදසන මුත් අන්නැත්—සිරිගබමැද වැජඹෙනා.

---

යෙහි ; රඳනා, රඤ්ජමාන වූ ;† සිය අත්තම්, ස්වකීය හස්ත කර්මාන්ත ;‡ කනාරූ, ස්වර්ණරූපය :—එ විරූ, ඒ වීරතෙමේ ; සිපිහුහට, ශිල්පීහට ; ගොස්, ප්‍රයාණය කොට ; එ ගෙණේ වී, ඒ ස්වර්ණරූපය ගෙණෙයි කියා ; මෙහෙයී, ප්‍රෙෂණය කෙළේයි ; රූසර, රූපසාර වූ ; එ රූ, ඒ රූපය ; දුකද, නිරීක්ෂණය කොට ; සහවිස්ම ලෙන්, විස්මයසහිතවූ චිත්ත යෙන් ; මේ වී, මෙසේ කථනය කෙළේ.

**101.** ලෝ, ලෝකයාගේ ; මන, චිත්තය හා ; නෙත්, නෙත්‍ර නැමැති ; කොඳ, කුන්දයන් හා ; කුමුදුවන, කෞමුදසමූහයා ;§ පොබයන්නා,|| ප්‍රබොධ කරන්නාවූ ; සරාසිරි, ශරත්ශ්‍රීන් ; ලකළ, අලඞ්කෘතවූ ; ළවන්, වක්ත්‍ර නැමැති ; සිසිමඬලෙන්, චන්ද්‍ර මණ්ඩලයෙන් ; වොරජනා, විරාජමානවූ :—

**102, 103.** පැහැ, ප්‍රභා නැමැති ; තොනෙන්, තොය යෙන්¶ හා ; විලි, වලිත්‍රය නැමැති ; රළිනි, තරඞ්ගයෙන් හා ; හර, මුක්තාහාර නැමැති ; පොකුරු දූලියෙන්, පුෂ්කරාඞ්කුර යෙන් හා ;** ලකළ, අලඞ්කෘතවූ ; තුනුවිල්නෙන්, ශරීර නැමැති තඩාගයෙන් ; පින්පියවුරු, පූර්ණපයොධර නැමැති ; හසුසුලන්නා, හංසයන් ළවහනය කරන්නාවූ.—මෙ රූ, මේ රූපය ; දුරූ, දර්ශනලද්දාවූ ; තොප, නුඹවහන්සේගේ ; නුඹද,

---

* කුමුදුවනය පොබයවූ-පූ : බො : කුමුදුවනය පොබයනා-සම ;
† රජමාන වන්නාවූ—සමහර.
‡ හස්තකර්මාන්තය ; කළ, කළාවූ ; ඇතැම්.
§ කෞමදවනසමූහයා-ඇතැම්.
|| පොබයවූ-පොබයනා-පොබකරණ-හැම.
¶ තොයාවෙන්-හැම.
** පුෂ්කරලතායෙන්හා-පූ : සම :

104. කුඹුබුවැළ දෙලෙහි—සරාසිසිකැලුම්සුළු,
සිරි දුරලමින් සත්සර—ලවනින් සිනා රඳනා.

105. නො දතෙහි ත පියසු—රූසිරිසර දිස්නේ,
ම අත්තමින් නියමිත්—ගෙණේ එ වී කනාරූ.

106. නො ලගනෙයයි සිතා—හිමිවදනික්මෙන්නේ,
යහදසන මුත් අන් නැත්—කියා වී රූ තුබු තැන්.*

---

අනවරතයෙන්; මන, චිත්තය හා; නෙත්, නෙත්‍රයන්; බඳනා, බන්ධනයකරන්නාවූ; යහදසන මුත්, ප්‍රියදර්ශිනීය මුත්; සිරිගබමැද, ශ්‍රීගර්භමධ්‍යයෙහි; වැජඹෙනා, විජෘම්භමානවූ; අන්, අන්‍ය රූපයෙක්; නැත්, නැතැයි (කියත්).

104. සරාසිසිකැලුම්සුළු, ශරච්චන්ද්‍රකාන්ති උපහනය කරන් නාවූ; කුඹුබුවැළ දෙලෙහි, පරිණත කුඹපත්‍රයෙක්හි; සිරි දුරලමින්, ශෝභාව දූරීකරණය කෙරෙමින්; සත්සරූ, සත්ව සාරතෙමේ; සිනා, (මන්ද) ස්මිතයෙන්; රඳනා, රඤ්ජමානවූ; ලවනින්, අධරයෙන් යුක්ත වූ.

105. නො දතෙහි, නොදත්තෙහි ද; ත පියසු, තා විසින් කථනය කරණලද; රූසිරිසර, රූපශ්‍රීසාරයෙන්; දිස්නේ, දෘශ්‍යමාන වන්නේ; ම අත්තමින්, මාගේ හස්තකර්මාන්තයෙන්; නිමියත්, නිර්මිත කරණ ලද; කනාරූ, ස්වර්ණරූපයයි; ‡ එ ගෙණේ, ඒ ගෙණ ඒයි; වී, කථනය කෙළේ.

106. හිමිවදන්, ස්වාමිහුගේ වචනය; ඉක්මෙන්නේ, අතික්‍රාන්ත කිරීම; § නො ලගනෙ යයි, සුදුසු නොවන්නේ යයි; සිතා, චින්තනය කොට; යහදසන මුත්, ප්‍රියදර්ශිනීය මුත්; අන් නැත්, අන්‍ය රූපයෙක් නැත; රූ තුබූ තැන්, රූපය තුබූ ස්ථානය; කියා, කථනය කළ මැනවැයි; වී, කථනය කෙළේ.

---

* කියවී රූ තුබූ තැන්-හැම. † කුඹ-කුම්භ-සම:

‡ රූපයහ-රූපයය-පු: පො:

§ හිමි, ස්වාමිහුගේ; වදන්නික්මෙන්නේ, වචන අතික්‍රාන්ත-පු: පො:

107. යහදුසන වී තා දුටු—රුවෙක් ද යම් ඒ ගොස්,
ගෙණේ වී මහසත්*—කෙළේ යා සිපි සිරිගප්

108. පැසුලු කැඳී සිපි—නුමුතු සඳසඳුනෙන්,†
නො තෙපලත ගේ හෙම්රූ—ලඟා මගා අත්තම්.

109. සහ විස්මලෙන් සිත්—මිනෙ රූ විසිත් සිත්තම්,
ලොමුදෙහෙනඟ සදමින්—කැරූ නෙත්හමු දියපියා.

110. මෙ රූ තා නුවණට—නුරූ තා නුවණ රූ,
පිළිරූ නෝයි එ නිරිඳු—පිණිපානෙන් පිදූයේ.

---

107. යහදසන, ප්‍රියදර්ශිනිය යයි; වී, කියනලද; තා දුටු, තා විසින් දර්ශනය කරණ ලද; යම් රුවෙක් ද, යම් රූපයෙක්‡ ඇද්ද; ගොස්, ප්‍රයාණය කොට; ඒ ගෙණේ වී, ඒ රූපය ගෙණෙයි කියා; මහසත්, මහාසත්වතෙමේ සිපි, ශිල්පීහු; සිරිගප්, ශ්‍රීගර්භයට; යා කෙළේ, යාත්‍රා කැරුවී.

108. සිපි, ශිල්පීහු; නුමුතු, අමුක්තවූ; සඳ සඳුනෙන්, සන්‍දෙහ සහිතවූ චිත්තයෙන්; පැසුළු, පසුව; කැඳී, ආමන්ත්‍රණය කෙළේ; ගේ හෙම්රූ, ඒ හෙමරූපය; නො තෙපලත, කථනය නො කරණ§ කල්හි; ලඟා, සම්පසව වූ; අත්තම්, හස්ත කර්මාන්ත; මගා, විලොකනය කොට:—

109. එ රූ, ඒ රූපයෙහි; විසිත්, විචිත්‍රවූ; සිත්තම්, චිත්‍ර කර්මාන්තය; සහවිස්මලෙන්, විස්මය සහිත චිත්තයෙන්; සිත් මින්, චින්තනය කෙරෙමින්; ලොමුදෙහෙන්, ලොමොද්ගම යෙන්; අඟ ශරීරය; සදමින්, සජ්ජිත කෙරෙමින්; දිය පියා, ජගත්පිතෲහුගේ; නෙත්හමු කැරූ, නෙත්‍රයට විෂය කොට:—

110. මෙ රූ, මේ රූපය; තා, නුඹවහන්සේගේ; නුවණට, ප්‍රඥාවට; අනුරූ, සුදුසු වන්නේය; තා නුඹවහන්සේගේ; නුවණ රූ, ප්‍රඥාරූපයාගේ; පිළිරූ නෝයී, ප්‍රතිරූපයයි; පිණි පානෙන්, ප්‍රණිපාතයෙන්;|| එ නිරිඳු, ඒ නරෙන්‍ද්‍රයා; පිදූයේ, පූජා කෙළේ.

---

* මහත්මා-බොහෝ. † සඳසඳනෙන්-සම.

‡ යම් සෞම්‍යරූපයක්-ඇතම්. § නොකල-ඇතම්.

|| ප්‍රණිපාතනයෙන්-සම.

111. සිවුවත් වෙන් තිසුල—විය විස්සම් දිවඉසින්,
සුවහසුන රූ අත්තම්—පැරැයී මෙ රූ සිත්තම්.

112. ඉති වෙසිසින් තෙමම්—නි* තුන් ලෝ පිළිසරණ,
සරණ නියුරැස්† තමා—තබා මුදුන් කෙළෙ බිසෙස්

113. ලැබ ඔහු ඉඟි එතර—රූ දැක්වී ගුරුවරන්,
ගුරු විස්මලෙන් හැඟියෝ—රූ එ සිරිසර මැඟියෝ.

114. මෙ රූ හරණ කරණ—‘ඟනකැතහොත‡ ගිහිනිවෙස්,
බෙජෙම් වී දියනුවන්—ගුරුනබියෙසැ සිපි වී.

---

111. මෙ රූ, මේ රූපයෙහි ; සිත්තම්, චිත්‍රකර්මාන්තය ; සිවුවත්, චතුර්මුඛයා ද ; වෙන්, විෂ්ණු ද ; තිසුලවිය, ත්‍රිශූලායුධයා ද ; විස්සම්, විශ්වකර්මයාද ; දිවඉසින්, දිව්‍යඍෂි ද යන මොවුන්ගේ ; සුවහසුන, ලක්ෂගණන් ; අත්තම් රූ, හස්තකර්මාන්තරූපයන් ; පැරැයී, පරාජය කෙළේ.§

112. ඉති, මෙසේ ; වෙසෙසින්, විශේෂයෙන් ; තෙමම්නි, සතුති කෙරෙමින් ; තුන්ලෝ, ත්‍රෛලෝක්‍යයට ; පිළිසරණ, ප්‍රතිෂ්ඨාධාරවූ ; සරණ නියරැස්, චරණනඛමයූඛයන් ; තමා මුදුන්, තමාගේ මස්තකයෙහි ; තබා, සමර්පණය කොට ; බිසෙස් කෙළේ, අභිෂේක කෙළේයි.

113. ඔහු, ඒ උත්තමයාගේ ; ඉඟි අභිප්‍රාය ; ලැබ, ලබ්ධවැ ; එතර, ඒ ක්ෂණයෙහි ; ගුරුවරන් ; ගුරුශ්‍රේෂ්ඨයන්ට ; රූ, .දැක්වී, රූපය ගෙණහැර දැක්වූයේය ; ගුරු, මව්පිය දෙදෙන ; විස්මලෙන්, විස්මය සහිත චිත්තයෙන් ; හැඟියෝ, සිතන්නාහු ; එ රූසිරිසර, ඒ රූපශ්‍රීසාරය ; මැඟියෝ, බැලූහ (එ කල්හී.)||

114. මෙ රූ හරණ කරණ, , මේ රූපය හා සමාන ශරීර ඇති ; අඟනක්, කාන්තාවක් ; ඇතහොත, විද්‍යමාන වූව හොත් ; ගිහිනිවෙස්, ගෘහස්ථවාසය ;¶ බෙජෙම්, භජනය කෙරෙමියි ; දියනුවන්, ජගනෙනත්‍රතෙම ; වී, කීයයි ; ගුරුනබියෙසැ, මවුපියන්ගේ අභිමුඛයෙහි ; සිපි, ශිල්පීතෙම ; වී, කථනය කෙළේ.

---

* තෙමනී-පූ : බො : (මේ විමසනු.) † රැස්නි-රැසිනි-හැම.
‡ මෙ හරණකරණ අඟනාකැතහොත-හැම.
§ මේ රූ, මේ රූපයෙහි ; සිත්තම්, චිත්‍රකර්මාන්ත ; සිවුවත්, චතුර්මුඛයාගේ ද ; වෙන්, විෂ්ණුගේ ද ; තිසුලවිය, ත්‍රිශූලායුධයාගේ ද ; විස්සම්, විශ්වකර්මයාගේ ද ; දිවඉසින්, දිව්‍ය ඍෂින්ගේ ද ; සුවහසුන, ලක්ෂගණන් ; අත්තම් රූ, හස්තකර්මාන්ත රූපයන් ; පැරැයී, පරාජය කෙළේසී—සම :
|| බලනකල්හි-හැම. ¶ ගෘහස්ථවාසයෙහි-හැම.

115 ඔහු සිනිඳු සුවඳ—මුවතඹරෙනුතුළ මියුරු.
වදන්මුවරදිනි තමන්—සවණිත් බිඟුන් සනහා.

116. නැත් මුළු දඹදිවැ—විසිනත් මෙ රු පිළිරු.
නරවිරු මෙනෙන් පස්කම්—පියුවි නුසී පිය වී.

117. සුතවිරුහු පින් නොද—නුවැ* හිමියෙනි මිහිනඳුන්.
පෙහෙවස්මුවැ† විසූ රැ—සුරිඳු සුරලෙව් රැඳවී.

118. දතුම් ඔහු ඉති රැ—කොමල දිව යහ යහන්.‡
මේ විරුහු පිළිසඳ වස්—දියහිමියැ මෙ තුනුසිරින්.

---

115. ඔහු. ඒ ශිලපිහුගේ; සිනිඳු සනිගධවූ; සුවඳ. සුගන්ධවූ; මුවතඹරෙන්. මුඛතාමරසයෙන්; උතුළ බාහෘවූ; මියුරු වදන්. මධුර වචන නැමැති; මුවරදිනි මකරන්දයෙන්; තමන්. තමන්ගේ; සවණිත්. කණ්ණ නැමැති; බිඟුන්. භෘඞ්ගයන්; සනහා. සන්තර්පණය කොට.§

116 මුළු දඹදිවැ. සකල ජම්බුද්වීපයෙහි; විසිනත්. පරීක්ෂා කරත් හොත්; මෙ රු. මේ රූපයට; පිළිරු, ප්‍රතිරූපයෙක්; නැත් නැත්තේය; නරවිරු. නරවීරතෙම; මෙනෙන්. චිත්තයෙන්; පස්කම් පඤ්චකාමය; පියවි නු සී. හළුයේ වනැයි; පිය, පිතෘරාජතෙමේ; වී. කථනය කෙළේ.

117. හිමියෙනි ස්වාමිනි; මිහිනඳුන් මහීනන්දනවූ; සුත විරුහු. පුත්‍රවීරයාගේ; පින් නො දනුවැ. පුණ්‍යානුභාව නො දනුවැද; පෙහෙවස්මුවැ උපොෂථ|| මුඛයෙහි; විසූ. වාසය කළාවූ; රැ. රාත්‍රියෙහි; සුරිඳු (ශක්‍ර) දෙවේන්ද්‍රතෙමේ; සුරලෙව් දිව්‍යලොකයෙහි; රැඳ වී රඤ්ජමාන කෙළේ.

118. දියහිමියැ. ජගත්ස්වාමිය; මේ විරුහු මේ වීරයාගේ; පිළිසඳ වස්, ප්‍රතිසන්ධිය පිණිස; මෙ තුනුසිරින් මේ ශරීරශ්‍රීන්; කොමල කොමලවූ; දිව, දිව්‍යමයවූ; යහන්, යහනෙහි;¶ යහ, සුබය; රැ, රාත්‍රියෙහි; ඔහු ඉති, ඒ ශක්‍රයා හා සමග; දතුම්, දුත්තමෝ වොද.

---

* නොදු න්වැ-නොදූන-හැම.
† මුයැ-බො:
‡ දිව්යහන් යහන්-ඇතැම්.
§ කෙරෙමින්-ඇතැම්.
|| පොෂධ-පවුසථවූ-හැම.
¶ ශයනයෙහි-බො:

119. සහ සොම්නස්වදනින්—දින් තිදසිඳු එ දවස්,
නරනිඳු කොකුමුවාවෙණ—කුසතණ හෙ දූන් ත පසක්.

120. මහපින්සඹර* පුතු—තුමහට මෙ රූ වෙළපු,
කලක් ලැබේ නොසරස්—නරනිඳු තොනොකර කුහුල්.

121. ඉති කියා සහ සොම්—නසින් ඒ උතුමා මා,
කැඳූ දූවහරණෙන්—සරණ විසකුණු බමුණන්.

122. කළ උතුමඟ සමග—සරණතල පුල්තඹරන්.
අවුදු එ දූනට සුත්—පියසු බිසෝ මෙ වදන්.

---

119. නරනිඳු, නරෙන්ද්‍රොත්තමය; සහ සොම්නස්, සෞමනස්‍ය සහිත; වදනින්, වචනයෙන්; තිදසිඳු, ශක්‍ර දෙවෙන්ද්‍ර තෙමේ; එ දවස්, ඒ දිනයෙහි; කොකුමුවාවෙණ, කොකනද වීණාව ද; කුසතණ, කුශතෘණයන් ද; දින්, දුනය කෙළේසී; දූන්, දූන් වනාහි; හෙ, හේ ප්‍රවෘත්තිය; ත. නුඹවහන්සේට; පසක්, ප්‍රත්‍යක්ෂ නොවේද?

120. මහපින්සඹර, මහාපුණ්‍යසම්භාර ඇත්තාවූ; පුතුතුමහට, පුත්‍රොත්තමයාහට; මෙ රූ වෙළපු, මේ රූපය විඩම්බනකරන්නාවූ; කලක්, (ක්ෂත්‍රිය) කන්‍යාවක්; නොසරස්, වහාම; ලැබේ, ප්‍රතිලාභ වන්නේය; නරනිඳු, නරෙන්ද්‍රොත්තමය; තෝ, නුඹවහන්සේ; කුහුල් නො කර. සැක නො කළ මැනැවැයි (කියා.)

121. ඉති. මෙසේ; කියා, කථනය කොට; ඒ උතුමා, ඒ උත්තමයාගේ; මා, ජනනීතොමෝ; සහ සොම්නසින්, සන්තොෂයෙන් යුක්තවැ; දූවහරණෙන්, දූතව්‍යවහාරයෙන්; සරණ, සඤ්චාරණය† කරන්නාවූ; විසකුණු බමුණන්; විචක්ෂණවූ බ්‍රාහ්මණයන්; කැඳූ, ආමන්ත්‍රණය කළා.

122 අවුදු, සම්ප්‍රාප්තවැ; සරණතල, චරණතල නැමැති; පුල්තඹරන් ඵුල්ලතාමරසයන්; උතුමඟ උත්තමාඞ්ගය හා; සමග කළ, සමග්‍ර කළාවූ; එ දූනට, ඒ දූතයන්ට; බිසෝ, මෙහෙසීතොමෝ; සුත්, යුක්තවූ; මෙ වදන්, මේ වචනය; පියසු ප්‍රකාශ කළා.

---

* සඹර-හැම. † සඹාරණ-සම:

123. බැපින් මෙ රූ දුරු—සැරු දඹදිව්තෙලෙ සියල්,
මෙ එක්දූසි දිගැසියක්—පසක් කැරු දක්වා* විසූ.

124. කුසා ගිහිගෙයි සරාණ—තැත් කරාණ මෙනෙන්,
ඉහි මැතිවරාණ මතුරු—කළ ගුරුවරාණ මෙ සග.

## දෙවෙනි සග.

---

125. පිළිගන්මිනෙ වදන්—මුහුලැදිලි බද† මුදුනෙන්,
එතර ඒ රූ හරණෝ—සිළිපන්නු යා බමුණෝ.

126 නේ මලමඩුලු වැදූ—ගම් නියම්ගම්‡ රජදහන්,
හැරු මහවෙ බරණැස්—ගිය දූ සැදූ රූනෙන්.

---

123. බැපින්, දරුවෙනි; මෙ රූ දුරු, මේ රූපය ධාරණය කොට; සියල් දඹදිව්තෙලේ, සකලජම්බූවීපයතලයෙහි; සැරු, සඤ්චාරණය කොට; මෙ එක්දූසි, මේ රූපය හා සාදෘශ්‍යවූ; දිගැසියක්, දීඝාක්ෂියක්; පසක් කැරු, ප්‍රත්‍යක්ෂ කොට; දක්වා, නිරීක්ෂණය කරවයි; විසූ, කථනය කළා.

124 කුසා, කුසරජහු; ගිහිගෙයි, ගෘහසථවාසයෙහි; සරාණ, සඤ්චාරණය කිරීමට; තැත් කරාණ මෙනෙන්, උත්සාහ කරන්නාවූ චිත්තයෙන්; මැතිවරාණ ඉහි, අමාත්‍යෝත්තමයන් හා සමග, ගුරුවරාණ, ගුරුශ්‍රෙෂ්ඨයන්; මතුරු කළ, මන්ත්‍රණය කළාවූ; මෙ සග, මේ සර්ගයයි.

විතීයසර්ගයයි.

---

125. මුහුලැදිලි, මකුලාඤ්ජලි; බද, බඳනා ලද; මුදුනෙන්, මස්තකයෙන්; එ වදන්, ඒ වචනය; පිළිගන්මින්, ප්‍රතිග්‍රහණය කෙරෙමින්; ඒ රූ හරණෝ, ඒ රූපය ගෙනයන්නාවූ; බමුණෝ, බ්‍රාහ්මණයෝ; එතර, ඒ ක්ෂණයෙහි; යා පිළිපන්නු, යාත්‍රා§ ප්‍රතිපන්න වූවාහු :—

126. නේ, අනෙකප්‍රකාරවූ; මලමඩුලු, ශෛලදුර්ගයට ද ගම්, ග්‍රාමයට ද; නියම්ගම්, නිගමයන්ට ද; රජදහන්, රාජ

---

* දක්ව විසූ-බො: (දක්වවී යූ-හිත් මැනවී.) † බැඳි-බැඳ-බද-සම:
‡ නියම්-සූ: පො: (හේ පසල්දනව්වට නම්.) § යාත්‍රාවට්-ඇතැම්.

127. කුහුල්මෙකෙනොහු නැසී—සිටැ සවනක රැකුළෝ,
පිළි මෙ දුටු දෙනෙතා*—පැවතුනෙවදන් කිම වී †

128. මහවෙීහි ඔසළෝ—නුවරෝ එ රූ දසනෙන්,
සුරසිදුනාසුර ගඳබ‡—රුසිරඟ හෝයි විස්මු

129 දෙනෙ බඹදත්නිරිඳු—සතොසින් ගොසින් දූන්වී,§
නරනිඳු තා මෙ පුරවෙරෙ—පමාරුවනෙක දිස්නේ.

---

ධානිවලට ද ; වැදූ, ප්‍රවිෂ්ට වැ ; හැරැ, ඒ රූපය ගෙණ ; බරණෑස් ගිය, බාරාණසියට ප්‍රාප්තවූ ; දූ, දූතයෝ ; රූනෙන්, රූපයෙන් ; මහවේ, මහාවීථිය ; සැදූ, සජ්ජිත කළෝ.

127. පිළි, නැවත ; මෙ දුටු, මේ රූපය දර්ශනය කළාවූ ; දෙනෙතා, ජනසමූහය තාක් ; පැවතුන් එ වදන්, පවත්වන ඒ වචනය ;|| කිමවී, කිමෙක්දෝහෝයි ; කුහුල්මෙනෙන්, කුතූහල චිත්තයෙන් ; ඔහු, ඒ බ්‍රාහමණයෝ ; නැසී, ගුප්තවැ ; සිටැ, ස්ථිතවැ ; සවණත, කර්ණය ; රැකුළෝ, නමත කළෝ.

128. එ රූ, ඒ රූපය ; දසනෙන්, දර්ශනයෙන් ; මහවෙීහි, මහාවීථියෙහි ; ඔසළෝ, රැස්වූවාවූ ; නුවරෝ, නගරවාසීහු ; සුර, දිව්‍යාඞ්ගනාවක් දෝහෝ ; සිදු, සිඩාඞ්ගනාවක් දෝහෝ ; අසුර, අසුරාඞ්ගනාවක් දෝහෝ ; නා, නාගකන්‍යාවක් දෝහෝ ; ගඳබ, ගන්ධර්වඅඞ්ගනාවක් දෝහෝ ; රුසිරඟ හෝයි, රුචිරාඞ්ගියක් දෝහෝ යි ; විස්මු, විස්මයපත් වූවාහුයි

129 බඹදත්නිරිඳු, බ්‍රහ්මදත්තනරෙන්ද්‍රොත්තමයාට ;¶ සතොසින්, සන්තොෂයෙන් ; ගොසින්, ප්‍රයාණය කොට ; දෙනේ, ජනතෙම ; නරනිඳු, නරෙන්ද්‍රය ; තා, නුඹවහන්සේගේ ; මෙ පුරවෙරෙ, මේ පුරප්‍රවරයෙහි ; දිස්නේ, දෘශ්‍යමාන වන්නේ ; පමාරුවනෙක, ප්‍රමදාරත්නයෙකැයි ; දූන්වී, විඥාපනය කෙළේ.

---

* දනතා-හැම.

† පැවැතුම් වදන් කිම වි සී-බො :

‡ ගඳඹ-ගඳඹ-ගඳබ-පොත්.

§ දෙනේ බඹදත් නරනිඳු සතොසින් ගොස් දූන්වී-හැම.

|| ප්‍රවතීත-ප්‍රවෘත්තිවචනය-බො :

¶ යා-යාහට-සම :

130. සළු දූරු අතින් ගොස්--සකුස් සතොසින් එනිරිඳු,*
කිමෙක හෝසී සැකියේ - විසිනා කනාරු දිටු.

131. හැඟි† විසිනත් නැත්—සගමතනාතෙලෙ නිරිඳු,
මෙ රූ හා අත්බඳනා—පමාරූවනෙක් රඳනා.

132. මුදුනෙ‡ සැදූ දූදෙනෙ—පාතඹුරුනේ නිරිඳු,§
පවතෙ විසිතුරු පස්කැන්—සිරින් සවණත රැඳවී.

133. නරනිඳු පැසුලු ඉති—විලසෙක් නුවන් රසයින්,
මේ නෙත් නොහොසල විරී—සවණත්හි ම විසාහී.

---

130 එ නිරිඳු, ඒ නරෙන්ද්‍රතෙම; අතින්, හස්තයෙන්; සළු දූරු, සාටකොද්වහනය කොට; සකුස්, වහාම; සතොසින්, සන්තොෂයෙන්; ගොස්, ප්‍රයාණයකොට; කිමෙක හෝසී; කිමෙක් ද්‍යොහෝසී; සැකියේ, ශඞ්කිතවූයේ;|| විසිනා, පරීක්ෂා කොට; කනාරු,¶ ස්වර්ණරූපය; දිටු, දර්ශනය කෙළේ.

131. එ නිරිඳු, ඒ නරෙන්ද්‍රොත්තමතෙම; මෙ රූ හා, මේ රූපය හා; අත්බඳනා, හස්තබන්ධනය කරන්නාවූ; රඳනා, රඤ්ජමානවූ; පමාරූවනෙක්, ප්‍රමදාරත්නයෙක්; සග, ස්වර්ගයෙහිද; මත, මර්ත්‍යලොකයෙහිද; නාතෙලෙ, නාගභවනයෙහිද; විසිනත්, පරීක්ෂා කරත්හොත්; නැත්, නැත්තේ යයි; හැඟී, විඥානය** කෙළේ

132. ඒ නිරිඳු, ඒ රාජොත්තමයාගේ; පාතඹුරුන්, පාද තාමරස යන්; මුදුනේ,†† මස්තකයෙහි; සැදූ, සජ්ජිතකළාවූ; දූදෙනේ, දූතජනතෙමේ; එ විසිතුරු, ඒ විචිත්‍රවූ; පවත, ප්‍රවෘත්තිය; පස්කැන්සිරින්, කර්ණාවතංසකශ්‍රීන්; සවණත, කර්ණයෙහි;‡‡ රැඳවී, රඤ්ජමාන කෙළේ.

133. නරනිඳු, නරෙන්ද්‍රතෙමේ; පැසුලු, පසුව; නුවන් රසයින්, නෙත්‍රරසායන බැවින්; ඉත විලසෙක්, මෙබඳු විලාසයෙක්; මේ නෙත්, මේ නෙත්‍රයෙහිද; සවණත්හි, කර්ණයෙහිද; මවිසාහි, මාගේ විෂයෙහිද; නො හොසල§§ විරී, නො පහළ විරී.

---

* මෙය සත්කවල නැත. † හැඟිනී-ඇතැම්. ‡ මුදුන්-හැම.
§ පාතඹුරෙනේනිරිඳු-හැම. || ශංකා වූයේ-හැම. ¶ කනාරුව-සම්:
** විඥාපනය-පූ: බො: †† පාතඹුරු, පාද තාමරසයන්; මුදුනේ-හැම.
‡‡ කර්ණය-හැම. §§ හසළ-සළ-හළ-පූ: බො:

134. මහතුන් පින් විසිනත—දුදැනිය යෙත් ලෙව්හි,
මෙසේනි අන්තැන් හා—විසිනා ම දක්වා වී

135 සදමිනුසා වැ ලෙන්—දුනේ වදන් වදන්මගැ,
සැරුතු ගොසිනොහු නෙවිසා—දැකැ නො අද* රූ විමසා

136. නුවනුපුලෙන් පියුම්—වුවන්† මතවරඟනන්,
වරල් බමරිඑනවුල්—මහවිල් සදිස් වන්නා.

137. පල හෙළ පවුරු වෙළ—ලෙනි දද රළ පරපුරෙන්,
විහිගුම් ගිගුම්නී පබඳ—දලනිදුහු දක්වන්නා.

---

134. මහතුන්, මහාත්මයන්ගේ ; පින්, පුණ්‍යය ; විසිනත, පරීක්‍ෂා කරත්හොත් ; ලෙව්හි, ලොකයෙහි ; දුදැනිය යෙත්, දුර්විඥෙය‡යයි යන්නාහ ; මෙසේනි, මෙ පරිද්දෙන්ම ; අන්තැන් හා, අන්‍යස්ථානයන්ද ; විසිනාම, පරීක්‍ෂා කොටම ; දක්වා, නිරීක්‍ෂණය කරවයි ; වී, කථනය කෙළේ.

135. දුන්, දානය කළාවූ ; ඒ වදන්, ඒ වචනය ; වදන්මගැ, වචනමාර්ගයෙහි ; සදමින්, සජ්ජිත කෙරෙමින් ; ලෙන්, චිත්ත යෙන් ; උසාවැ, උත්සාහ සහිතවැ ; ගොසින්, ප්‍රයාණය කොට ; නෙවිසා, අනෙකවිෂයෙහි ; සැරුතු, සඤ්චාරණය කොට ; රූ විමසා, රූපයක්§ පරීක්‍ෂා කොට ; නො දැක, දෘශ්‍යමාන නොවැ ; ඔහු, ඒ බ්‍රාහමණයෝ ; අද, අවුත් :—||

136. නුවනුපුලෙන්, උත්පලයන් කරණකොට ගෙණ නෙත්‍ර යන්ද ; පියුම්, පද්මයන්, කරණකොට ගෙණ ; උවන්, වක්ත්‍ර යන්ද ; බමරිඑනවුල්-බමරිඑනි, භෘඞ්ගශ්‍රෙණීන්ගෙන් ; අවුල්, ආකුලවූ ; වරල්, ධම්මිල්ලයන්ද ඇති ; මතවරඟනන්, මත්ත වරාඞ්ගනාවන් ; සදිස්වන්නා, සදෘශ්‍යවූ ; මහවිල්, මහා තටාක යන් ඇති :—

137. පල, ව්‍යක්තවූ ; හෙළ, ධවලවූ ; පවුරු, ප්‍රාකාර නැමැති ; වෙළෙලෙනි, වෙලන්තයන් ඇති ; දද, ධවජ නැමැති ;

---

* නොහැද-සම :
† පියමුවන්-පු : ඊවන්පියුමෙන්-ඇතැම්.
‡ දුඥෙය-පු : පො : § රූපයන්-සම :
|| 145 ගීයේ "සගල්නුවරටපත්" යන්න හා සම්බන්ධයි.

138. නේ විසිතුරු රුවනු—දුල තරපතර කෙළියෙන්,
ඉසිහු සිලිල්ලුළ සියල්—රුවනකර* දුර ලන්නා.

139. සහස සියල් දෙසෙනො—සළ නන්දන බිරිඳුහට,
විපුල් ඉසුරු දීමෙන්—කප්තුරු ඉසුරු සාහන්නා†

140. පහ මුදුනෙ වූ රුව—නුදුල රන්සත් රිදීසත්,
ගිරිරජ ලගන හිරසඳ‡—සුවහස්න හගවන්නා.

---

රළපරපුරෙන්, තරඞ්ගපරම්පරාවන් ඇති ; විහිගුම්, මහත් මහත් ඝොෂා§ නැමැති ; ගිගුම්නී, සමුද්‍රනාද|| ඇති ; දලනිදුහු, ජලනිධිය ; පබඳ, ප්‍රබන්ධයෙන් ; දක්වන්නා, නිරීක්‍ෂණිය කරවන්නාවූ :—

138. නේ, අනෙකප්‍රකාරවූ ; විසිතුරු, විචිත්‍රවූ ; රුවන්, රත්නයෙන් ; උදුල, උජ්ජ්වලිතවූ ; තරපතර, රශ්මි රාශියෙහි ; කෙළියෙන්, ක්‍රීඩායෙන් ; ඉසිහු, ඍෂීහු විසින් ; සිලිල්, ජලය ; ලුළ,¶ පානය කළාවූ ; සියල්රුවනකර, සකල රත්නාකරයන් ; දුරලන්නා, දූරීකරණිය කරන්නාවූ :—

139. සහස, අනවරතයෙන් ; සියල්දෙසෙනොසළ, සකල දිග්භාගයෙන්** රැස්වූ ; නන්දනබිරිඳුහට, අනෙක ජනසමූහයාහට ; විපුල්, මහත්වූ ; ඉසුරු දීමෙන් ; ඓශ්වර්‍ය්‍ය ප්‍රදානය කිරීමෙන් ; කප්තුරු, කල්පවෘක්‍ෂයෙහි ; ඉසුරු, ඓශ්වර්‍ය්‍යය, සාහන්නා, උමහනය කරන්නාවූ :—

140. මුදුනේ වූ, මස්තකයෙහි වූ ; රුවන්, රත්නයෙන් ; උදුල, උජ්ජ්වලිතවූ ; රන්සත්, සුවර්ණාතපත්‍රයන්ද ; රිදීසත්, ධවලාතපත්‍රයන්ද ඇති ; පහ, ප්‍රාසාදයෙන් ;†† හිරසඳ ලගන, සූර්‍ය්‍ය චන්ද්‍රයන්‡‡ ලගනවූ ; ගිරිරජසුවහස්න, ලක්‍ෂගණින් පර්‍වතරාජයන් ; හගවන්නා, ප්‍රකාශකරන්නාවූ.§§

---

* සිලි (ල) ලුල සියල් රුවනාකර-බො : † සහන්නා-සම :

‡ හිරුසඳු-සම : § මිහිගුන්-මිහිගුම්, මහත්ඝොෂා-බො :

|| සමුද්‍රනාදඝොෂා-ඇතැම්. ¶ සිලිල, ජලය ; ඵල-ලුලා-බො :

** දිසානුදිසාවෙන්-ඇතැම්. †† පහා, ප්‍රාසාදයෝ-හැම.

‡‡ චන්ද්‍රසූර්‍ය්‍යයන්-හැම. §§ ප්‍රකාශවන්නාවූ-සම :

141. පළ කොකුම තවර—රන්පටුදුල මතවරණ,
සඳපැහැ විදුලේ විඳු—ගිරිරජ දපුදුලන්නා.

142. පනන සහ යොග සිඳු—සිය හොත සෙමෙරවල්බර,
බහසුරුකෙසරුසිරජ—සුවහස් විකුම් ගන්නා.

143. පුරයෝනන් බැම—සැව්හි ලා දිගුනුවන් හී,
පියවුරුගලසැ මද දුතු—මුවන් හිද බිඳැ විදුනා.

144. දුන් මුවරදද දුම්—සුනිල් සැරකලබනෙන්,
පමාලියසැවිනැව්හල්—සහ දප කඳප පානා.

---

141. පළ, ව්‍යක්තවූ ;* කොකුමතවර, කුංකුමයෙන් චර්චිතවූ ;† රන්පට, සුවර්ණපට්ටයෙන් ; උදුල, උජ්ජ්වලිතවූ ; මතවරණ,‡ මත්තහස්තීහු ; සඳපැහැ, සන්ධ්‍යාප්‍රභාව හා ; විදුලේ, විද්‍යුල්ලතා වන් ; විඳු, අනුභව කරන්නාවූ ; ගිරිරජ, පර්වතරාජයන්ගේ ; දප, දර්පයෙන් ; උදුලන්නා, උජ්ජ්වලිත වන්නාවූ.

142. බහසුරු, භාස්වරවූ, කෙසුරු, කෙසරඇති ; සිරජ, සිංහරාජයන් ; සුවහස්, ලක්ෂගණන්ගේ ; විකුම් ගන්නා, වික්‍රම ග්‍රහණය කරන්නාවූ ; හොත, බහාලනලද ;§ සෙමෙරවල්බර, චමරවාලධිභාර ඇති ; පනන, ඛඩමපාවට ; සහයොග, අභ්‍යාස සහිතවූ ; සිඳුසිය, සෛන්ධව ශතයෙන්|| යුක්තවූ :—

143. පුරයෝනන්, පුරයුවතීන්ගේ ; බැමසැව්හි, භ්‍රූචාපයෙහි ; දිගු, දික්වූ ; නුවන්හී, නෙත්‍ර නැමැති බාණයන් ; ලා, බහා ; පියවුරුගලසැ, පයොධර පර්වතප්‍රාන්තයෙහි ; දුතු මුවන්, ධූර්ත නැමැති මෘගයන්ගේ ; හිදබිඳැ, හෘද්විදාරණය කොට ; විදුනා, ප්‍රහාර දෙන්නාවූ ; මද, අනඞ්ගයා ඇති :—

144. දුන්, දෘනය කළාවූ ; මුවරදද දුම්, මකරධ්වජධූම නැමැති; සුනිල්, අතිනීලවූ ; සැරකලබනෙන්, ශරකලාපයෙන් හා ; පමාලියසැවින්, ප්‍රමදා නැමැති ලතාචාපයෙන් ; සහ දප, දර්ප සහිතවූ ; කඳප, කන්දර්පයාගේ ; ඇව්හල්, ආයුධ ශාලාවන් ;¶ පානා, ප්‍රකාශ කරන්නාවූ :—

---

* ව්‍යපතවූ-ඇතැම්.
† මණ්ඩිතවූ-සම :
‡ මතවරනන්-හැම.
§ බහණලද-සම :
|| ශතයන්ගෙන්-ඇතැම්.
¶ ශාලාවල්-ඇතැම්.

145. ඉති නුවන්මන* විසි—විසාඉකුත් අසිරි,
දෙනෙ එ විසිතුරු රුගත්—විසල් සගල්නුවර පත්.

146. නන් කුසුමරජ වුදු—රුදු තරඟපරපුරෙන්,
සුනිලඹරෙ ලෙල ඉඳුසැව්—සුවහස්න හඟවන්නා.

147. මුවරදඹර †වැළ කි—තරඟවැලනු වැ බමත්,
මිහිවමිය රුදු රන්දම්— පුළුලුකුළෙ රඳනා වන්.

148. වැළැ වතළ ලෙල සුල—කළ රන්හසවැලන් මත්,
සහ විදු සුනිල් මෙරජ—සිරින් නුවන් වුළුඹුනා.

145. ඉති, මෙසේ ; නුවන්, නෙත්‍රයටද ; මන, චිත්තයටද ; විසි, වචනයට ද ; විසා ඉකුත්, විෂයාති ක්‍රාන්තවූ ; අසිරි, ආශ්චර්‍ය්‍යමත්වූ ; විසල්, විශාලවූ ; සගල්නුවර, සාගල නගර යට ; එ විසිතුරු, ඒ විචිත්‍රවූ ; රුගත්, රූපග්‍රහණය කළාවූ ; දෙනෙ, ඒ දූතජනතෙමේ ; පත්, ප්‍රාප්තවී.‡

146. නන්, අනෙකප්‍රකාරවූ ; කුසුමරජ, කුසුම මකරන්ද යෙන් ; වුදු, දිගඩවූ ; රුදු, මහත්වූ ; තරඟපරපුරෙන්, තරඞ්ග පරම්පරායෙන් ; සුනිලඹරෙ, නිලාම්බරයෙහි ; ලෙල, ලීලො පෙතවූ ; ඉඳුසැව් , ඉන්ද්‍රචාපයන් ; සුවහස්න 'ලක්ෂගණින් ; හඟවන්නා, ප්‍රකාශ කරන්නාක් වැනිවූ :—

147. මිහිවමිය, මහීකාන්තාවගේ ; පුළුල්, පෘථුලවූ ; ළකු ළෙ, ශ්‍රොණියෙහි ; රඳනා, රඤ්ජමානවූ ; රුදු, මහත්වූ ; රන්දම් වන්, සුවණ්ණදාමයක් වැනිවූ; වැළකි, වෙලාන්ත යෙහි ; තරඟවැල, තරඞ්ගමාලාවට ; අනුවැ, අනුගතවැ ; බමත්, භ්‍රමණය කරන්නාවූ ; මුවරදඹර, මකරන්දභාරයන් ඇති :—

148. වැළැ, වෙලාන්තයෙහි ; වතළ, පැමිණියාවූ ; ලෙල, ලීලොපෙතවූ ; සුලකළ, අලඞ්කෘතවූ ; මත්රන්හසවැලන්,

* මනස-ඇතම්. † බමර-බොහෝ.

‡ 145. ඉති, මෙසේ; එ විසිතුරු, ඒ විචිත්‍රවූ ; රුගත්, රූපග්‍රහණය කළාවූ ; දෙනේ, ඒ දූතජනතෙමේ ; නුවන්, නෙත්‍රයටද ; මන, චිත්ත යටද ; විසි, වචනයටද , විසාඉකුත්, විෂය අතික්‍රාන්තවූ ; අසිරි, ආශ්චර්‍ය්‍ය මත්වූ: විසල්, විශාලවූ ; සාගල්නුවර, සාගල් නගරයට ; පත, ප්‍රාප්ත වි-සි-ඇතම්.

149. සහ ගුම් බිඟුවල මල්—දමුදුල වෙන්බඳ වන්,
දෙපස්හී කුල්නා—හසවැල නුවන් බඳනා.

150. පිරිළි රළපෙළ වැළැ—දලනිදු ඉඳුලපුල්සත්,
දවනදලකඳනෙන් රුදු—මිණිනිල්යටෙව් තෙවුනා.

151. සදත නිති තන කොකු—ම ඳෙ පින්පියවුරන්,
තහත වහත ගුරු තැවරි*—බජනිඳුනිල්තලා වන්.

152. දෙපස්හී දිස්නා—විමල් පුලින් යුවලදළ,
බජන† ගිරිරජ ගජ රුදු—රළරැලිතුදුල සොඬවන්.

---

මතහසව ශ්‍රේණිහංසාවලි නැමැති; විදු සහ, විද්‍යුත් සහිතවූ; සුනිල, අතිනීලවූ; මෙරජසිරින්. මෙඝරාජශ්‍රීන්; නුවන්. නෙත්‍රයන්; වුලුඹනා, පැහැර ගන්නාවූ :—

149. සහ ගුම්, නාද සහිතවූ; බිඟු, භෘඞ්ගයන්ගෙන්; අවල, හැවසී ගත්තාවූ; මල්මද, කුසුම්දමයෙන්; උදුල, උජ්ජවලිතවූ; වෙන්. විෂ්ණුහුගේ; බඳ වන්, මධ්‍යප්‍රදෙශය වැනිවූ; දෙපස්හි, උභය පාර්‍ශ්වයෙහි; කුල්නා, නාද කරන්නාවූ; හසවැල, හංසාවලින්ගෙන්; නුවන්; නෙත්‍රයන්; බඳනා, බන්ධනය කරන්නාවූ :—

150. වැළැ, වෙලාන්තයෙහි; රළපෙළ, තරඞ්ගපරම්පරා නැමැති; පිරිළි, පිරිළි ඇත්තාවූ; දලනිදු, ජලනිධි නැමැති; ඉඳුලපුල්සත්, ඉන්ද්‍රනීලමාණික්‍යඡත්‍රයෙහි; දවන, ධාවනය කරන්නාවූ; දලකඳනෙන්, ජලස්කන්ධවාජයෙන්; රුදු, මහත්වූ; මිණිනිල්, ඉන්ද්‍රනීලමාණික්‍යමයවූ; යටෙව්, යෂ්ටියක් මෙන්; තෙවුනා, විරාජමානවූ :—

151. පින්පියවුරන්. පීණපයොධරීන්; තන ඳෙ, ස්තනද්වයවූ; කොකුම, කුඞ්කුමයෙන්; නිති, අනවරතයෙන්; සදත, සජ්ජිත කරණ කල්හි; තහත, අනවරතයෙන්; වහත, උපගූහනය කරන්නාවූ; ගුරුතැවරි, ගෛරිකයෙන් වර්‍ණව් තවැ; බජන, විරාජමානවූ; ඉඳුනිල්තලා වන්, ඉන්ද්‍රනීලලසතල යක් වැනිවූ :—

152. දෙපස්හි, උභයපාර්‍ශ්වයෙහි;‡ දිස්නා, දෘශ්‍යමානවූ; විමල්, නිර්‍මලවූ; පුලින්, වාලුකාසතල නැමැති; යුවලදළ,

---

* තවර-හැම. † බජනා-හැම. ‡ දෙපාර්‍ශවයෙශි-ඇතම්.

153. ඉති සිරිසරගඟ—වැලඟි වැලහුනුහු තබා,
නුවනබරණ කනාරූ—පිළි එවුහු රූහරණෝ.

154. මිහිවමියට බරණ—නුවන්සර රුසෙක්ලක්,
අනත වනදෙවියන් නෙත්—කුමුදුන් ලද* අමාවිල්.

155. වනදෙවියන් නුවන්—මිනිසඳකතට සඳලේ,
ගී වූ සිත් මියුරුනට—නවමේරජ වැජඹෙනා.†

---

දන්තයුගමයකින්; බජන විරාජමානවූ; ගිරිරජ, පර්වත රාජ නැමැති; රූදු, මහත්වූ; ගජ, හස්තීහුගේ; රළුරුළින්, තරඞ්ග මාලා නැමැති වලියෙන්; උදුල, උජ්ජ්වලිතවූ; සොඬවත්, චුණ්ඩා වක් වැනිවූ :—

153. ඉති, මෙසේ; සිරිසර, ශ්‍රීසාරවූ; ගඟවැලඟි, ගඞ්ගා වෙලාන්තයෙහි; නුවනබරණ, නෙත්‍රයට ආභරණයක් වැනිවූ; කනාරූ, ස්වර්ණරූපය; තබා, සමර්පණය‡ කොට; පිළි, නැවත; රූහරණෝ, රූපය ගෙන ගියාවූ; එවුහු, ඒ බ්‍රාහ්මණයෝ; වැලහුනුහු, ගුප්ත වූහ.

154. මිහිවමියට, මහීකාන්තාවට; අබරණ, ආභරණයක් වැනිවූ; නුවන්, නෙත්‍ර නැමැති; සරරුස්, බාණරාශියට; එක් ලක්, අසහාය ලක්ෂයක් වැනිවූ; අනත, අපරිමිතවූ; වන දෙවියන්, වනදෙවතාවන්ගේ; නෙත්, නෙත්‍රයෙහි ;§ කුමුදුන්, කෞමුදයන්; ලද, ලබ්ධවූ; අමාවිල්. අමෘතතටාකයක් වැනිවූ :—

155. වනදෙවියන්, වනදෙවතාවන්ගේ; නුවන්මිණි, නෙත්‍ර මාණික්‍ය නැමැති; සඳකතට, චන්ද්‍රකාන්තියට; සඳලේ, චන්ද්‍ර ලේඛාවක් වැනිවූ; සිත්, චිත්ත නැමැති; මියුරුනට, මයූරයන්ට; වැජඹෙනා, විජෘම්භමානවූ; නවමේරජ, අභිනව මෙඝරාජයක්; ගීවූ, ප්‍රකාශ කළාක් වැනිවූ :—

---

* කුමුදුත්වනා-ඇතම්.
† වජඹනා-හැම.
‡ ස්ථාපනය-ඇතම්.
§ නෙත්‍ර නැමැති-සම.

156. එ රුසරසඳ— පැහැසී මෙද වනගුවන්.
පෙබසී හා වනමුරුන්—මෙනෙ සොම්නස් කුමුදුවිල්.

157. විසඹරෙසෙ නිම්යතෙක්—යම් පිළිබඳ දූහී,
පෙලෙකැත්නම් මෙම හා—වෙසෙසෙම්නොසී සැමැමෙන්.

158. ලඟා නිගා ඇර දුන්—එ රූ දෙවසරන් වරන්,
මනදෙළ රහස් දෙව්පුත්—ගෙණෙ හඟවතේ පැවියේ.

159. වනදෙව්දූලියෝ—පියන් ඉහිලස විඳියෝ,
පිළිපන් දරුණු දළසෝ—දලනිදු නො නො කිම්දියෝ.

---

156. එ රූ, ඒ සුවර්ණරූපය නැමැති; සරසඳ, ශරච්චන්ද්‍රයා; වනගුවන්, වන නැමැති ආකාශය; පැහැසී මෙද, ප්‍රභා කෙළේ මතුද; වනමුරුන්, වනදෙවතාවන්ගේ; මෙනේ, චිත්තයෙහි; සොම්නස්, සන්තොෂ නැමැති; කුමුදුවිල්, කෞමුදතටාකයන්; පෙබසී හා, ප්‍රබොධයද කෙළේ.

157. පිළිබඳ දූහි, ප්‍රතිබද්ධ ජාතියෙහි; යම් පෙලෙකැත් නම්, යම් ඵලයෙක් ඇත්නම්ද; විසඹරෙසේ, විෂයාස්වාද රසයෙහි; නිම්යතෙක්, කොටිප්‍රාප්තයෙක්; මෙම හා, මේ කාන්තාව හා; සැමැමෙන්, සමාගමයෙන්; වෙසෙසෙම්නොසී, විශෙෂයම් හයි කියා.

158. වරත්, උත්තමවූ; දෙවසරන්, දිව්‍යපසරාවන්ට; ලඟා, සමීපයෙහි; නිගා ඇර, නිග්‍රහයන් ඇර; දුන්, දානය කළාවූ; එ රූ, ඒ රූපයට; දෙව්පුත්ගෙණේ, දිව්‍යපුත්‍ර සමූහයතෙමේ; රහස් මනදෙළ, ප්‍රච්ඡන්න මනොදෞහළය; හඟවතේ, ප්‍රකාශ කිරීමෙහි; පැවියේ, පටන්ගත්තේයි.

159. පියන්, වල්ලභයන්ගේ; ඉහිලස, ශෛථිල්‍යය; විඳියෝ, අනුභව කළාවූ; වනදෙව්දූලියෝ, වනදෙවතා* කාන්තාවෝ; පිළිපන්, ප්‍රතිපන්නවූ; දරුණු, දාරුණ්‍යවූ; දළසෝ, දෘඪශොක නැමැති; දලනිදු, ජලනිධියෙහි; නො නො කිම්දියෝ, නො කිම්දියෝ නොවෙත්.

---

* වනදෙව-බො: වනදිව්‍යස්ත්‍රී-ඇතම්.

160. මෙ ලු විසඹරෙසෙ නම්—මේ ලූ නුරාරෙසෙ නම්,
මේ ලූ පුරුදු ගුණ සබා—පිළි මෙ ලු නෙවෙන් දිවිබා.

161. හිද වුදු අපසෙරෙනා—සෙනේ මෙ මත් හා වී.
ගියෝද අන්තැන් දූහැ—මනනෙත් සවන් හිමියන්.

162. ඉති පියන් පියනා—තුරෙ වත පණිවියගුරෙන්,
සෝ වුදු කුදුකලක් එක්—පිරිපත් නැතදෙ තෙර පත්.

163. පැහැරූ මොලොකතිනේ—රූ දිසි විසල් කොපුල්බිත්,
විලස කියලි* රහු එකෙණෙ—ගහණෙතවරූ සුපුන්සඳ.

---

160. විසඹ, විෂයාස්වාදවූ ; රෙසෙ නම්, රසය නමුත් ; මේ ලූ, මේ වන්නේල ; නුරාරෙසෙ නම්, අනුරාගරසය නමුත් ; මේලූ, මේ වන්නේල ; සබා, සත්‍යවූ ; පුරුදු, පරිචයවූ ; ගුණ, ගුණය නමුත් ; මේ ලූ, මේම වන්නේල ; පිළි, නැවත ; නෙවෙන් දිවිබා, අභිනව ජීවිත ප්‍රතිලාභය නමුත් ; මේ ලූ, මේ වන්නේලයයි කියා.

161. හිද, හෘදයෙහි ; වුදු, දිගුවූ ; අප, අපගේ ; සෙරෙන, චිරත්කාලයක් ; ආ, පැවත එන්නාවූ ; සෙනේ, සෙනහය ; මෙ මත්හා වී, මේ මාත්‍රයක් වියයි කියා ; මන, චිත්තයද ; සවන්, කර්ණයද ; නෙත්, නෙත්‍රයද ; හිමියන්, ස්වාමියන් ; දූහැ, හැරූ ; අන්තැන්, අන්‍යස්ථානයකට ; ගියෝද, ප්‍රයාණය කොළෝදූයි† සේයි

162. ඉති, මෙසේ ; සෝ වුදු, ශොකයෙන් දිගුවූ ; පියන්, කාන්තාවන් ; පියනතුරෙ, වල්ලභයන් කෙරෙහි ; පණිවිය ගුරෙන් වත, ප්‍රණයකලහයෙන් යුක්ත කල්හි ; එක් කුදු කලක්, එක් බුජ්ජකාන්තාවක් ; පිරිපත් නැතැද, පරිපන්ථයක් නැතිවැම ; එ තෙර, ඒ තීරයට ; පත්, පාපත වූ.

163. ඒ රූ, ඒ රූපයෙහි ; දිසි, දෘශ්‍යමානවූ ; විසල්, මහත්වූ ; කොපුල්බිත්, කපොල භිත්තියෙහි ; මොලොකතින්, මෘදුලවූ හස්තයෙන් ; පැහැරූ, ප්‍රහාර කොට ; එකෙණේ, ඒ ක්‍ෂණයෙහි ; රහු, රාහු විසින් ; ගහණෙත වරූ, ග්‍රහණය කළාවූ කාලයෙහි ; සුපුන්සඳ, සම්පූර්ණ චන්ද්‍රයාගේ ; විලස, විලාසය ; කියලි, ප්‍රකාශ කෙළේ.

---

* කල-සන්නේදි-කලි-හැම-　　† කෙළේදූසී-පූ : හැම.

164. හැඟෑ තම හතැ වෙයින්—මෑ තද කනාරූ බැව්,
නුළුම්* මා දූ රූ—විලසින් නෙත් බිසෙස්වා.

165 කිණිහිරිසපුදුනු—කේ රද හරා† වරාමල්,
පිළි සුඹුනා බමරකල්—ගින් නෙළියෙම් යෙහෙලියෙනි.

166. බණිත ඉති වනදෙව්—පුත්ගණ සිත්හි නුරා,
වියගුරු ඔවුන් වමියන්—දූහැ සත්හුන් සමාහි.

167. පැනී පැනී‡ සේ—එතෙර පුල්මහසරා,
සුහුවැ ඇ හැමූවට—දෙනෙ දූ සඃ§සොම්නස්ලෙන්.

---

164. තම, තමාගේ; අතැ, හස්තයෙහි; වෙයින්මැ, වේද නායෙන්ම; තද, සන්බද්ධවූ; කනාරූබැව්, සුවර්ණරූපභාවය; හැඟෑ, විඥනය කොට; මා දූ, මාගේ දුවිතෘවගේ;|| රූ, රූපයෙහි; විලසින්, විලාසයෙන්; නෙත්, නෙත්‍රයන්; බිසෙස්වා අභිෂේක කොට; නුළුම්, වඤ්චිත වීම්.

165. කිණිහිරි, කණිකාර කුසුමයෙහිද; සපු, චම්පක කුසුමයෙහිද; දුනුකේ, ධනුකෙතකී¶ කුසුමයෙහිද; රද හරා, මකරන්දග්‍රහණය කොට; පිළි, නැවත; වරාමල්, අතීක කුසුමයන්; සුඹුනා, ආඝ්‍රාණය කරන්නාවූ; බමරකල් ගින්,** භෘඞ්ගධේනුවක මෙන්; යෙහෙලියෙනි, සඛීනි; නෙළියෙම්, වඤ්චිතවීම්යි කියත්.

166. ඉති, මෙසේ; බණිත, කථනය කරණ කල්හි; වන දෙව්පුත්ගණ, වනදෙවපුත්‍රසමූහය; සිත්හි, චිත්තයෙහි; නුරා අනුරාගයද; ඔවුන්, ඒ වනදෙවතාවන්ගේ; වමියන්, කාන්තා වන්ගේ; වියගුරු, ප්‍රණයකලහයන්ද; දූහැ, දුරු කොට; සත්හුන් සමාහි, සන්තර්පණය වූවාවූ කාලයෙහි:—

167. පුල්, විකසිතවූ; මහසරා, මහාතටාකයට; පැනීසේ, පානාර්ථීහු†† පරිද්දෙන්; දූදෙනේ, දූතජනසමූහයතෙම; ස සොම්නස් ලෙන්, සෞමනස්‍ය සහිත චිත්තයෙන්; ඇ, ඒ

---

* නුළුමු-හැම.
† රදගරා-හැම.
‡ පැනිනා-ඇතම්.
§ සහ-සම:

|| දුහිතුවගේ-හැම.
¶ කෙතකී-බොහෝ.
** ගී-බොහෝ.
†† පනිනවූ-ඇතම්.

168. ගරහා මේ සරා—සිසිමඬලෙ සිත්තම් සේ,
විතර කළ තොප සඳවත්—පියබසිනි හෝ කෙ නම් වී.

169. එතෙපලසා කුදූ—වියූ සසලේ වෙන්වූ,
නිසයුරු වන් සසරසර—පබවත මුය තෙමූයේ.

170. දූ දෙනෙ තුටුවැ හෝ-පිළිවිත් පිළි කවර වී,
පබවතනැමින්මැ දනා—සවන්මනනෙත් හදනා.

171 මදිඳුහු දූ රජ—කුල අඹරේ වජඹනා,
කලාසිරිපත් සඳ මෙන්—පෙබයූ සිත්කුමුදුවිල්.

---

බුජ්ජකාවගේ ;* හැමුවට, අභිමුඛයට; යුහුවැ, ශීඝ්‍රවැ ; එතෙර, ඒ තීරයෙහි; පැනී, †දෘශ්‍යමාන වැ :—

168. පියබසිනි, ප්‍රියවූ වචනයෙන්; මේ ගරහා, මේ ගර්හා කොට; සරාසිසිමඬලේ, ශරච්චන්ද්‍රමණ්ඩලයෙහි; සිත්තම් සේ, චිත්‍රකර්මාන්තය කරන්නාක් මෙන්; තොප විතර කළ, තොපවිසින් විස්තර කරණලද්දාවූ; සඳවත් හෝ, චන්ද්‍රමුඛී හෝ වනාහි; කෙ නම්, කවර නාමයෙක්දැයි; වී, කථනය කෙළේ.

169. එ තෙපලසා, ඒ වචනය ශ්‍රවණය කොට; කුදූ, බුජ්ජකාතොමෝ; වියූ, කථනය කරන්නී; සසලේ, සසලෙබාව; වෙන්වූ, විනිර්මුක්තවූ; නිසයුරු, නිශාකරයා; වන්, වැනිවූ‡ සසර, සංසාරයෙහි; සර, සාරවූ; පබවත, ප්‍රභාවතීයගේ; මුය, මුඛය; තෙමූයේ, සෙතාත්‍ර කළා.§

170. දූ දෙනේ, දූතජනතෙම; තුටුවැ, සන්තුෂ්ටව ;|| හෝ, ඒ කාන්තාතොමෝ; කවර වී, කවරක්හිදැයි කියා; පිළිවිත්, විචාළේය; පිළි, නැවත; පබවත නැමින්මැ, ප්‍රභාවතී යයි යන නාමයෙන්ම; දනා, ජනයාගේ; සවන්, කර්ණයද; මන, චිත්තයද; නෙත්, නෙත්‍රයන්ද; අදනා, ආකර්ෂණය කරන්නාවූ —

171. රජකුල, රාජවංශ නැමැති; අඹරේ, ආකාශයෙහි; වජඹනා, විජෘම්භණය කරන්නාවූ; කලා සිරිපත්, කලාශ්‍රී ප්‍රාප්තවූ; සිත් කුමුදුවිල්, චිත්ත නැමැති කෞමුදතටාකයන්;

---

* බුජ්ජකාතනාවන්ගේ-සම :
† දෘශ්‍යමානවී-බො :
‡ සාම්‍යවූ-සමහර.
§ කෙළේ-හැම.
|| සන්තොෂව-සම :

172. ඉති වදන් මනහර—පුන්සසක් වජ්ඹමෙන්,
උදලද තුරුමුහුදු හී—රිසිදෙළ රළපරපුරෙන්.

173. යතෙම්නි මෙන් ගොස්—දෙනේ එසඳ විගුහු,
දසුන් තෙරපතුයෙ—ඔකාවස් නිරිඳු පියදු සේ කී.

174. රූ දූසි ඉති විමසාන දූ රුසාන සෙරෙන්,
සැරනන්විසාන විලස්වෙසෙසාන මෙ කළ සග.

තුන්වන සග.

පෙබසු, ප්‍රබොධ කළාවූ ; සඳ මෙන් චන්‍ද්‍රයා වැනිවූ ; මදිඳුහු ; මද්‍ර* නරෙන්‍ද්‍රයාගේ ; දූ දුහිතෘ†යයි කී.

172. ඉති, මෙසේ ; වදන් මනහර–මනහර, මනොහරවූ, වදන්, වචන නැමැති ; පුන්සසක්. පූර්‍ණශශාඞ්කයා ; වජ්ඹමෙන්, විජෘම්භණය කිරීමෙන් ; උදලද, උදුම ලද් දුවූ ; තුරුමුහුදු, උතුරු නැමැති ; සමුද්‍රයෙහි ; හී, පතිතැව ; රිසි දෙළ. ඉච්ඡා දෙහළ නැමැති ; රළපරපුරෙන්, තරඞ්ග පරම්පරාවෙන් :—

173. යතෙම්නිමෙන්, ප්‍රෙෂණය කරන්නවුන් මෙන් ;‡ ගොස්, ප්‍රයාණය කොට ; දෙනේ, ඒ දූතජනතෙම ; එසඳ විගුහු, ඒ සඳවිග්‍රහුගේ ; දසුන්, දර්‍ශන නැමැති ; තෙරපතුයේ, තීරප්‍රාප්ත වූයේ ; ඔකාවස් නිරිඳු–ඔකාවස්, ඉක්‍ෂ්වාකු§ වංශයෙහි වූ ; නිරිඳු, නරෙන්‍ද්‍රයා ; පියදු සේ, ප්‍රෙෂණය කළ පරිදි ; කී, කථනය කෙළේ.

174. ඉති, මෙසේ ; රූදූසි, රූපදර්‍ශිනියක ; විමසාන, පරීක්‍ෂා කරණු පිණිස ; දූරුසාන, දූතජනසමූහයා ; සෙරෙන්, චිරාත්කාලයක් ; නන්විසාන, අනෙකවිධයෙහි ; සැර, සඤ්චාරය|| කළාවූ ; විලස්, විලාසය ; වෙසෙසාන කළ, විශෙෂ¶ කළාවූ ; මෙ සග; මේ සර්‍ගයයි.

තෘතීයසර්‍ගයයි.

---

* මද්‍ර-හැම.
† දුහිතෘ-හැම.
‡ ප්‍රෙෂණය කරන්නාහු-බො :
§ ඉක්‍ෂ්වාක-හැම.
|| සඤ්චාරණය -සම :
¶ විශෙෂණය-සම :

175. එතර විතර සැදුම්—නී මදසිනාගත් වන්,
සියනැගෑ මුතුවැලසිරින්—සුදම්සබයට සොබනා.

176. හැනී සොම් සියුරූ—සිලිලාර වුඩුනැඟි වන්,
පල කැල්මෙනවල විසිත්—රුවන් සියෙන් වජඹනා.

177. පහසිරිවමිය කොකු—මෙනද පින් පියවුරෙව්,
පැහැසර සොම් පියුම්රා—මිණිවැතිනි නෙත් බඳනා

178. ඇත රුසිරූ විසිත්—රුවන්ගන එනී මුමූ,
තෝරුවන්දහර වන්—සුවහස්ටැම් වජඹනා.

---

175. එතර, ඒ ක්‍ෂණයෙහි; විතරසැදුම්නි, විස්තර සජ්ජිත යෙන්; සියනැගෑ, ජදනාග්‍රයෙහි; මුතුවැල සිරින්, මුක්තා ලතිකාශ්‍රීන්; සොබනා, ශොභමානවූ; සුදම්සබයට, සුධර්මා නම් දිව්‍යසභාවට; මදසිනා ගත් වන්, මන්දස්මිතග්‍රහණය කළාක් මෙනි.

176 සොම්, සෞම්‍යවූ; සියුරූ*සිලිලාර, චතුස්සාගරය; හැනී, මිශ්‍රවූ; උඩුනැඟිවන්, උද්ගතවූවාක් වැනිවූ; පල ව්‍යක්තවූ; කැල්මෙන්, කාන්තියෙන්; අවල, ගැවසිගත්තාවූ; විසිත්, විචිත්‍රවූ; රුවන්සියෙන්, රත්නජදනාග්‍රයෙන්; වජඹනා, විජෘම්භමානවූ:—

177. පහ, ප්‍රාසාද නැමැති; සිරිවමිය, ශ්‍රීකාන්තාවගේ; කොකුමෙනද, කුඞ්කුමයෙන් ආර්ද්‍රවූ; පින්පියවුරෙව්, පීණ පයොධරයන් වැනිවූ; පැහැසර, ප්‍රභාසාරවූ; සොම්, සෞම්‍යවූ; පියුම්රාමිණිවැතිනි පද්මරාගමාණික්‍ය භාජනයන්ගෙන්; නෙත්, නෙත්‍රයන්; බඳනා, බන්ධනය කරන්නාවූ:—

178 රුසිරූ, සිත්කලුවූ; විසිත් විචිත්‍රවූ; රුවන්ගන, රත්නමෙඝයක්;† ඇත, විද්‍යමාන වුවහොත්; එනී, ඒ රත්න මෙඝයෙන්; මුමූ, වහනය කරන්නාවූ; තෝරුවන්දහරවන්, තොයරත්නධාරාවන් වැනිවූ; සුවහස්, ලක්‍ෂගණන්; ටැම්,‡ ස්තම්භයන්; වජඹනා, විරාජමානවූ:—

---

* සිවුරූ ඇතම්. † මහොඝයක්-බොහෝ. ‡ වැඹ-බොහෝ.

179. බජන විමන් පිළි—බිඹුනි ඉඳුනිල්මිණිතෙලෙ,
බුන දෙරණ උවිඳුනා—විමන්සිය සිරි පානා.

180. අසෙනිඝමල් තරු—විමලිඳුනිල්මිණිතලා,
ගුවනත් සිහසන සරා—සිසිබිඹුසොමි මමන්නා.*

181 සුදම්විමනට නිගාය—දනන් මනදගාය
රුසිරගලගාය සමගාය—නරගාය සැදි රඟබිම්.

182. ඉති පුරසයුරොද—ගින් පින්පිඬෙව් ඉමහත්,
මුලුලෝ සව්සුරුසුමු—රිසිනු වැටුම්මඬුයේ.

---

179. ඉඳුනිල්මිණිතෙලේ, ඉන්ද්‍රනීලමාණික්‍යතලයෙහි ; බජන, විරාජමානවූ; විමන්, ප්‍රාසාදයන්ගේ; පිළිබිඹුනි ප්‍රතිබිම්බයන් කරණකොට ගෙණ; උවිඳු උපෙන්ද්‍රයා විසින්; දෙරණ පෘථිවිය ; බුන, භගනකල කල්හි ; නාවිමන්සිය, නාගවිමානශතයන්ගේ; සිරි, ශොභාව ; පානා, ප්‍රකාශ කරන්නාවූ :—

180. අසෙනියමල්, උපහාරකුසුම නැමැති ; තරු තාරකාවන් ඇති ; විමල්, නිර්මලවූ; ඉඳුනිල්මිණිතලා, ඉන්ද්‍රනීල මාණික්‍යතල නැමැති ; ගුවනත්, ආකාශයෙහි ; සිහසන, සිංහාසනය නැමැතිවූ ;† සරාසිසිබිඹු ශරච්චන්ද්‍රබිම්බයෙන්; සොමි, සෞම්‍යයන් ; මමන්නා, වගනය කරන්නාවූ:—

181. සුදම්විමනට, සුධර්මා නම් දිව්‍යවිමානයට නිගාය, නිග්‍රහදූනය කලාවූ ; දනන්, ජනයන්ගේ; මනදගාය මනොබන්ධනය කලාවූ ; නරගාය, අනඞ්ගයා හා ; සමගාය, සාමාග්‍රීවූ ; රුසිරග, රුචිරාඞ්ගීන් ; ලගාය සම්පසථවීමෙන් ; සැදි, සජ්ජිතවූ ; රඟබිම්, රඞ්ගභූමියක් වැනිවූ :—

182. ඉති, මෙසේ ; පුර, පුර නැමැති ; සයුර, සමුද්‍රය ඔදගින්, උදූම වූවාක් වැනිවූ ; මුලුලෝ, සමස්තලොකයාගේ ; ඉමහත්, අතිමහත්වූ ; පින්පිඬෙව්, පුණ්‍යපුඤ්ජයක්වැනිවූ ; සව් සුරුසුමු ; සකලෛශ්වර්‍ය්‍යරාශීභූතවූ ; රිසිනු, ඉච්ඡානුකූලවූ ; වැටුම්මඬුයේ, ආස්ථාන‡මණ්ඩපයෙහි :—

---

* සොමින් මමනා-ඇතම්. † වැනිවූ-සමහර. ‡ මඬපපයෙහි ඇතම්.

183. පැසුලු තමා රජ—දහමිසිරු ගත්ගත් වන්,
නරවිරු සුදගරා ගත්—සිසිබිඹු සොමි මමන්නා

184 විසිත් සව්බරණ—මෙරජනවල තුනුසිරින්,
පරයා නත්රුවන් රුස්—විහිදි රුසිරු දුගුම්මෙර.

185. දිය සරණ ඒ නර—වරණ සඳරණ රණදිනු,
සහසැස් පඬුසලැ හුනෙව්—සහසා සිහසන සැදී.

186. දන දෙද ද වදන්—රළගොස් අවිඅමින්මින්,
බමන රජසබමුහුදු—නරනිඳු ඉඳු වජඹමෙන්.

---

183. පැසුලු, පසුව; තමා රජදහම්, තමාගේ රාජධර්මයන්; ඉසිරු, විසිණෙවූ; ගත්ගත් වන්, ගාත්‍රග්‍රහණය* කළාක් වැනිවූ; සුදගරා ගත්, ශුභ්‍රාඞ්ගරාග† ග්‍රහණය කළාවූ; සොමි, සෞම්‍යයන්;‡ මමන්නා, වහනය කරන්නාවූ; සිසිබිඹු, චන්ද්‍රබිම්බයක් වැනිවූ; නරවිරු, නරොත්තමතෙම :—

184. විසිත්, විචිත්‍රවූ; සව්බරණ, සකලාභරණයෙහි; මෙරජන්, මරීචි(රාජී)න්; අවල, ගැවසිගත්තාවූ; තුනුසිරින්, ශරීර ශ්‍රීන්; නත්රුවන්, අනෙකප්‍රකාර රත්නයෙහි; රුස්විහිදි, රශ්මීන් විසිණෙවූ; දුගුම් මෙර, ජඞ්ගමමෙරුවක්; පරයා, පරාජය කොට :—

185. සඳරණ, දූරුණා සහිතවූ; රණ, යුද්ධයෙහි; දිනූ, ජය ගත්තාවූ දිය, ජගත්ත්‍රයට; සරණ, ප්‍රතිෂ්ඨාධාරවූ; ඒ නර වරණ, ඒ නරෙන්ද්‍රොත්තමයා; සහසැස්, සහස්‍රාක්ෂීහු; පඬුසලැ හුනෙව්, පාණ්ඩුකම්බලශෛලාසනයෙහි හුන්නාක්මෙන්; සිහසන, සිංහාසනය; සහසා, වහා; සැදී, සජ්ජිත කෙළේ.

186. දෙද ද දන, බ්‍රාහමණජනයාගේ; වදන්, වචන නැමති; රළගොස්, තරඞ්ගඝොෂාවන් ඇති; අවි, ආයුධ නැමැති; අමින්, බෝහෝවූ; මින්, මත්ස්‍යයන් ඇති; රජසබ, රාජසභා නැමැති; මුහුදු, සමුද්‍රය; නරනිඳු, නරෙන්ද්‍රොත්තමයා නැමැති; ඉඳු, චන්ද්‍රයා; වජඹමෙන්, විජෘම්භණයෙන්; බමන, භ්‍රමවත් වන කල්හි :—

---

* ගාත්‍රාග්‍රහණය-සමහර. † ශුඹාඞ්ගරාග-ඇතම්. ‡ සෞම්‍යය-ඇතම්.

187 විමලිඳුනිල්බමර—කිරුළුවල විලැ රඳනා,
පුදන පුදන රජමුළු—මුහුලැදිළි තඹරවෙනෙන්.

188. නො පෑ පොපි නුවන්—සල සේසෙමෙර වල්ගත්,
බලතොහුම වරඟනන්—සුරකල්න හඟවත් වත්.

189. යුවරජ රජනැමැති*—බලවිප්වැඩිසුතන්කැන්,
තමා සියතැන් පත් වත්—සකොබ වියුදම්සයුරෙව්.

190. පසඟ ගදෙව් වනෙවූ—සිහසනට† සොළොස්අත්,
සඅඟ ළුවඟ‡ ඹිමින්—ළියනු නැටුම් වත්වත්.

---

187. **විමල්**, නිර්මලවූ; ඉඳු (මිණි) නිල්, ඉන්ද්‍රනීල මාණික්‍ය නැමැති;§ බමර, භෘඞ්ගයන්; අවල, ගැවසිගත්තාවූ; කිරුළු, කිරීට නැමැති; විලැ, තටාකයෙහි; රඳනා, රඤ්ජමානවූ; රජමුළු, රාජසමූහයාගේ; මුහුලැදිළි, මුකුලාඤ්ජලී නැමැති; තඹර වෙනෙන්, තාමරසවනයෙන්; පුදනපුදන. පූජාකරණකල්හි:—

188. සල, චඤ්චලවූ, සේසෙමෙර, ශ්වෙතචාමර; වල්ගත්, වාලග්‍රහණය කළාවූ; වරඟනන්, උත්තමාඞ්ගනාවන්; නුවන්, නෙත්‍රයෙහි; පොපි නො පෑ, සපන්දප්‍රකාශ නොකොට; ඔහුම, ඒ රාජොත්තමයාම, බලන, විලොකනය කරණ කල්හි; සුරකල්න, දිව්‍යාඞ්ගනාවන්ගේ, වත්, වක්ත්‍රයන්; හඟවත්, ප්‍රකාශ කරන්නාවූ කල්හී :—

**189.** යුවරජ, යුවරජදරුවන්ද; රජන්, රජදරුවන්ද; ඇමැති, අමාත්‍යයන්ද; බළ, භටයන්ද; විප්, බ්‍රාහ්මණයන්ද; වැඩිසුතන්කැන්, වෘද්ධපුත්‍ර සමූහයාද, තමා සියතැන් පත්වත්, තමාගේ ස්වකීය ස්ථානයට සම්ප්‍රාප්ත වූ කල්හි : සකොබ, සංක්ෂොභයෙන් ; උදම් සයුරෙව් වී, උද්දාමවූ සාගරයක්මෙන් වී.

**190.** සිහසනට, සිංහාසනයට; සොළොස්අත්, ෂොඩශ හස්තප්‍රමාණයෙහි. පසඟ, පඤ්චාඞ්ගිකනාද ඇති; ගදෙව්,

---

* රජ ඇමති-සමහර.
† වනෙවනෙවූසිහස්නට-සම :
‡ සඅඟව අඟ-සහවඅඟ-හැම
§ ඉඳුනිල්, ඉන්ද්‍රනීල නැමැති-සම :

191. විඳැ තනවා ඉස්—සුර ඉඳු ගඳෙව් මෙ වන් වී,
හඟවමින් සබ සියල්—තලනු වැ අසුරු දෙත්දෙත්.

192. මාපියන් පියඳු—දූදනනද හිමියා,
සීදොරෙහි රැඳියා බැව් —පිළිහැරි එතර දූත්වූ.

193. බෙජෙම්නි හිගි* නිරිඳු—පිළිහැරි කැඳෙමිනෙදනන්,
රූ දක්වූ මහසෙබෙහි—විසිතුරු අලෙව් රුවන්.

194. වහත නො වැතවැ මෙන්—බර රිසිදෙළ දූරැස්,
නැමී නැමැ නිරිඳු නෙත්—මිණී ළඳිනෙකෙක් මේ වී.

---

ගාන්ධර්වය; වනෙවු, පවත්වන කල්හි; සඅඟළවඟ ඔමින්, සාඛෝපාඛ බහා; ලියනු, ලයානවිතවූ; නැටුම් වත්වත්, නෘත්‍යය කරණ† කල්හි :—

191. ඉස් තනවා, ශිරශ්චාලනය‡ කොට; විඳැ, අනුභව කෙරෙමින්; සුරඉඳු, ශක්‍රදෙවෙන්ද්‍රයාගේ; ගඳෙව්, ගාන්ධර්වය; මෙ වන් වී, මේ වනැයි කියා; හඟවමින්, සිතවමින්; සියල්සබ, සකලසභාව; තලනුවැ, තාලානවිතවැ; අසුරු දෙත්දෙත්, අසුරුසන් දෙමින් සිටිනු§ කල්හි :—

192. හිමියා, ස්වාමිහුගේ, මාපියන්, මාතෘ පිතෘ දෙදෙනා; පියඳු, ප්‍රෙෂණය කළාවූ; දූදනන්, දූතජනයා; අද, අවුත්; සීදොරෙහි, සිංහද්වාරයෙහි : රැඳියා බැව්, රඤ්ජිතභාවය; පිළිහැරී, ප්‍රතිහාරිතොමෝ; එතර, ඒ ක්ෂණයෙහි; දූන්වූ, විඥාපනය කළා.

193. නිරිඳු, නරෙන්ද්‍රොත්තමයාගේ; හිගි, අභිප්‍රාව; බෙජෙම්නි, භජනය කෙරෙමින්; පිළිහැරි; ප්‍රතීහාරීතොමෝ; එ දනන්, ඒ දූතජයන්; කැඳෙමින්, ආමන්ත්‍රණය කෙරෙමින්; විසිතුරු, විචිත්‍රවූ; අලෙව්රු වන්, ආලෙඛ්‍යරූපයක් වැනිවූ; මහසෙබෙහි, මහා සභාවෙහි; රූ දක්වූ, රූපය ගෙණහැර දර්ශනය කර වූ.

194. දූරැස් දූතසමූහයා; රිසිදෙළබර, ඉච්ඡාදෞහළ භාරය; වහත, උවහනය කිරීමට; නොවැතවැ මෙන්,

---

* බෙජෙම්නිහි-සමහර.

† නෘත්‍යය කරණ කරණ-ඇතැම්.

‡ ශිරශ්චලනය-සමහර.

§ දෙමින් දෙමින් සිටී-ඇතැම්.

195. නරනිඳු ඔකාවස්—පරපුරැ කැත්කුලට කොත්,
යසතෙදසොමිනුවණ ඈ—ගුණ ඈවිලගත් ගත් වන්.

196. මිහිකත පැලැඳි නේ—නරනිඳු රුවන්මල්හි,
නාමිණිතන් රැඳියේ—කුසවිරුමිණි පැලැඳියෙන්.

197. යදි දනනදහස්—පිරූ කුසරජකප්රුක්,
ලියකැතහොත් වලඳනා—වෙසෙසින් ම වේ රඳනා

198. එහෙයිනොහු ගුරුවිරූ—තා දූසඳ පුවත්නෙන්,
සවණිත සඳූ තුටුලෙන්—පියදූ අප නරපවර.

---

අසමර්ථ වූවවුන් මෙන්; නැමී, නනමවූ; නැමූ, නමස්කාර කොට; නිරිඳු නරෙන්ද්‍රයාගේ; නෙත්මිණි ලදින්, නෙත්‍ර මාණික්‍යප්‍රතිලාභයෙන්; එකෙක්, එක් දූතයෙක්; මේ වී, මෙසේ කථනය කෙළේ.

195. නරනිඳු. නරෙන්ද්‍රොත්තමය; ඔකාවස් පරපුරැ ඉක්ෂ්වාකුවංශ පරම්පරාවෙහි වූ; කැත්කුලට. ක්ෂත්‍රිය කුලයට; කොත්, කෙතුවක් වැනිවූ; යස, යශස්ද; තෙද තෙජස්ද; සොමි, සෞම්‍යතාවද; නුවණ ඈ ගුණ, ප්‍රඥාවද යන මේ ආදි ගුණයන්; ඈවිලගත්, ආවිෂ්ටග්‍රහණය කළාවූ, ගත් වන්, ගාත්‍රයක් වැනිවූ :—

196. මිහිකත, මහීකාන්තාව; පැලැඳි, ප්‍රසාධනය කළාවූ; නේනරනිඳු, අනෙකනරෙන්ද්‍ර නැමැති; රුවන් මල්හි, රත්නමාලාවෙහි; නාමිණිතන්, නායක මාණික්‍ය ස්ථාන; රැඳියේ, රඤ්ජමාන වූයේ; කුසවිරු, කුසරාජ නැමැති; මිණි, මාණික්‍යය; පැලැඳියෙන්, ප්‍රසාධනය කිරීමෙනි.

197. යදිදනන්, යාචකජනයන්ගේ; අදහස, අධ්‍යාශය, පිරූ, පූරණය කළාවූ; කුසරජ, කුසරාජ නැමැති; කප්රුක්, කල්පවෘක්ෂය; වලඳනා, ආශ්ලෙෂ කරන්නාවූ; ලියක්, කාන්තාවක්; ඇතහොත්, විද්‍යමාන වූවහොත්; වෙසෙසින්ම, විශෙෂයෙන්ම; රඳනා වේ, රඤ්ජමාන වේ

198. එහෙයින්, ඒ කාරණයෙන්; ඔහු, ඒ කුසරාජයාගේ; ගුරුවිරු, ගුරුශ්‍රෙෂ්ඨයෝ; තා, නුඹවහන්සේගේ; දූසඳ, දුහිතෘචන්ද්‍රිකාවගේ; පුවත්නෙන්, ප්‍රවෘත්තියෙන්; සවණිත, කර්ණය; සදූ, සජ්ජිත කොට; තුටුලෙන්, සන්තුෂ්ට චිත්ත යෙන්; නරපවර, නරප්‍රවරය; අප පියදූ, අප ප්‍රෙෂණය කළෝ (යත්)

199. මදු ඒ සඳු රොහී—ණිය මෙන් නො වෙන් වූ නම්,
සවණතනෙතමන තමා—සැණකෙළියෙ පාබඳනේ

200. කැත්කුලකොත ගත—නුවනත මදුසඳලේ,
වතැරිසිනු එ කුසා—කෙ සතුටු නම් නො බෙජෙම්.

201. ඉති පිරිමදිමිනැත්—ලෙන් නරනිඳු මේ වී,
පිළිසෙව් කල්නකත් මුත්—පිවිතුරුනු ඒ බමණෙන්.

202. ඉතිඳුහොතින් පසක්—කැරැ පබවතුන් එ විලස්,
සිමියෙතහොත පුවත්නෙන්—කුසා සවණත රඳවා.

---

199. මදු, මාගේ පුත්‍රීතොමෝ * ඒ සඳු, ඒ රාජචන්ද්‍රයාට ; රොහිණිය මෙන්, රොහිණී නක්ෂත්‍රතාරකාව මෙන් ; නො වෙන්වූනම්, ඒ අන්‍යෝන්‍ය භාවයට† සම්ප්‍රාප්ත නුවූනම් ; සවණත, කර්ණයද ; නෙත, නෙත්‍රයද ; මන, චිත්තයද ; තමා සැණකෙළියේ, තමාගේ උත්සව ක්‍රීඩාවෙහි ; පාබඳනේ, පාද න්‍යාසය කරන්නේයි.‡

200. නුවනත ගත, නෙත්‍රග්‍රහණය කළාවූ ; මදුසඳලේ, මාගේ දුහිතෘචන්ද්‍රලේඛාව ; කැත්කුලකොත, ක්ෂත්‍රියකුලෙක තුවූ ; එ කුසා, ඒ කුසරජහු ; රිසිනු වත, ඉච්ඡානුකූල වූව හොත් ; කේසතුටුනම්, කෙබඳු සන්තොෂයක් නම් ; නො බෙජෙම්, භජනය නො කෙරෙම්දැයි :—

201. නරනිඳු, නරෙන්ද්‍රතෙම ; ඇත්ලෙන්, චිත්තාභ්‍යන්තරයෙන් ; ඉති, මෙසේ ; පිරිමදිමින්, පරීක්ෂාකෙරෙමින් ; බමණෙන්, බ්‍රාහ්මණයෙනි ; පිළිසෙවු, ප්‍රතික්ෂෙප නම් ; කල්නකත්මුත්, කාලනක්ෂත්‍ර (මුහූර්ත) මුත් ; ඒ, ඒ ප්‍රවෘත්තිය ; පිවිතුරුනු, පවිත්‍රයයි ; මේ වී, මෙසේ කථනය කෙළේ.

202. ඉතිඳුහොතින්, එතකුදු ඌවත් ; පබවතුන්, ප්‍රභාවතීන්ගේ ; එවිලස්, ඒ විලාසය ; සිමියෙතහොත, අභිප්‍රායානුකූල ඌවහොත් ; පුවත්නෙන්, ප්‍රවෘත්තියෙන් ; පසක් කැරැ, ප්‍රත්‍යක්ෂ කොට ; කුසා, කුසරජහු ; සවණත, කර්ණය ; රඳවා, රඤ්ජමාන කරවයි කියා.

---

* ධීතෘ-ඇතම්. † සමභාවයට-ඇතම්. ‡ පද-පදා-පාදා-සමහර.

203. නරනිඳු ඉති කියා—පබවතසඳ කැඳෙනු වස්,
පිළිහැරියක ළුවන්පුල්—පියුමට වුහුටු නෙත් බිඟු.

204. කලහසුන්මෙ* පිළිබඳ—කැරැ මදලස හෝ ගමන්,
ගොසින් කැඳූ පබවත්—සිරි පැ කප්ලියෙ දෑගුම්.

205. පියවුරු බරුසුලා—නොසැහැ එව් මෙවුල්නි දුවන්,
එ දෙබරින් යුග* දඟ—නුරුරුවිනි ගුගුරණ වන්.

206. නියරුසිනුනඟ යස—තුනු කෙසරරජනුදහස්,
තෙද ලවනතඅතලෙන්—සරරුස්වහස්බැල්මෙන්.

---

**203.** නරනිඳු, නරෙන්ද්‍රොත්තමතෙම ; ඉති, මෙසේ ; කියා. කථනය කොට ; පබවතසඳ, ප්‍රභාවතී චන්ද්‍රිකාව ; කැඳෙනු වස්, ආමන්ත්‍රණය කරණුපිණිස ; පිළිහැරියක. ප්‍රතිහාරියක ; ගේ ; ළුවන්, වක්ත්‍ර නැමැති ; පුල්. විකසිතවූ ; පියුමට, පද්ම යට ; නෙත්බිඟු, නෙත්‍ර නැමැති භෘඞ්ගයන් ; වුහුටු, ප්‍රෙෂණය කෙළේ.

204. හෝ, ඒ චාරපාලිකාතොමෝ ; මදලස. මදව ලීලො පෙතවූ ; ගමන්, යාත්‍රාව ; කලහසුන්මෙ, කාලහංසයන්ටම ; පිළිබඳ කැරැ, ප්‍රතිබද්ධ කොට ; ගොසින්, ප්‍රයාණය කොට ; පබවත්, ප්‍රභාවතීන් ; කැඳූ, ආමන්ත්‍රණය කළාය ; දෑගුම් කප් ලියෙ, ජඞ්ගමකල්පලතිකාවෙක්හි ; සිරි, ශොභාව ; පැ. ප්‍රකාශ කෙළේ.

205. පියවුරු, පයොධරයන්ගේ ; බරුසුලා, භාරොද්වහ නය කොට ; නොසැහැ එව්, අසහනීයවූවක මෙන් ; දුවන්, ජසනය ; මෙවුල්නි, මෙඛලාවසාජයෙන් ; ගුගුරණ වන්, නාද කරන්නියක මෙනි ; එ දෙබරින්, ඒ භාරවයෙන් ; යුගදඟ, ජඞ්ඝායුගමය ; නුරුරුවිනි, නූපුරධ්වනීන් කරණකොටගෙණ ; (ගුගුරණ වන්, නාදකරන්නියක මෙනි.)

206. නියරුසින්, නඛරශ්මීන් ; ළනඟ, අනඞ්ගයාගේ ; යස, යසසද ; තුනු, ශරීරයෙහි ; කෙසරරජන්, රොමරාජීන් ; ළුදහස්, කොපයද ; ලවනත, අධරය හා ; අතලෙන්, හස්ත තලයෙන් ; තෙද, තෙජස්ද ; වහස්බැල්මෙන්, අපහාස්‍ය නිරීක්‍ෂණයෙන් ; සරරුස්, බාණරාශීන්ගේ ; සිරී, ශොභාවද ; පැ, ප්‍රකාශකොට :—

---

* යුවල-යුගල-සමහර.

207. සිරි පැ නනබරණින්—සැදී දිගැසුන් මැදහි,
සහතරු තරුවැලන්කැන්—සරා සිසිලේ කියලූ.

208. බැමලියසැව්සවන්—පසනුවනතසරනෙන්,
නරඟ විසල් අවිහල්—සිරි ඉසිලූ තුනුසිරින්.

209. වැලබිඹු වන් ලවන්—කිසලත තඹුරුපල්ලෙන්,
පබලුතුළුතුරුසයුරේ—හළ* දප් ඇය පැහෙන්හෙම්.†

210. වසාකුඹුතුරුසළු ලුවර රසමෙණි නිරිඳු මෙර,
සබසයුරනඟ කන්දර—තුනුනැව් ගත් නුවන්තොට.

---

207. නනබරණින්, අනෙකාභරණයෙන්; සැදී, සජ්ජිතවූ; දිගැසුන්, දීර්ඝාක්ෂීන් නැමැති; සහතරු, තරුසහිතවූ;‡ තරු වැලන්කැන්, තාරකාවලී සමූහයන්; මැදහි, මධ්‍යයෙහි; සරා, ප්‍රභාසහිතවූ; සිසිලේ, චන්ද්‍රලෙඛාව; කියලූ, ප්‍රකාශකළාවූ:—

208. බැම, භ්‍රූනැමැති; ලියසැව්, ලතාචාපයෙන්ද; සවන්, කර්ණ නැමැති; පස, පාශායුධයෙන්ද; නුවනත, නෙත්‍ර නැමැති; සරනෙන්, බාණරාශියෙන්ද; තුනුසිරින්, ශරීරශ්‍රීන්; නරඟ, අනඞ්ගයාගේ; විසල්, විශාලවූ; අවිහල්, ආයුධශාලා වෙහි; සිරි, ශොභාව; ඉසිලූ, උවහනය කළාවූ:—

209. වැලබිඹු වන්, පක්වබිම්බඵලයන් වැනි; ලවන්, අධර යෙන්ද; කිසලත, පල්ලවයන් වැනිවූ හස්තයෙන්ද; තඹුරු පල්ලෙන්, තාමරසයන් වැනිවූ පාදතලයෙන්ද; පබලුතුළු, ප්‍රවාලයන් උවහයක කළාවූ; ඇය, ඒ කාන්තාවගේ; හෙම් පැහෙන්, හෙමප්‍රභාවයෙන්; උතුරුසයුරේ, උත්තරසාගරයෙහි; දප්, දර්පය; හළ, දුරුකළා.

210. වසා, වසාරාජි නැමැති; කුඹු, කුම්භක්ඇති; උතුරු සළු, උත්තරසාටක නැමැති; ලුවර, ලකාර ඇති (හෙවත්) රුවල් ඇති; රසමෙණි, ශෘඞ්ගාරාදිමාණික්‍යයෙන් (සජ්ජිතවූ);

---

* වහළ-සමහර.

† පැයෙන්, පැහැයෙන්; සම: ශිසන්න.

‡ එක පොතක පමණක් මෙසේ නමුත් පුරාතන පොත්වලැ "සහතර" යන්නක් ගියේදී පමණක් පෙණෙන්නා. එහි අර්ථය "රශ්මිසහිතවූ" යි වියයුතු.

211. නේදනන් නුවන්—පැහැරජයොත් දහස්නෙන්,
ඇයෙන්නී* මෙන් සබ වන්—තුනුකැලුමලුකැරැවිමන්.

212. නරනිඳුබැලුම්—බිසෙව් තො දෙ අතිනුකහා,
ගෙණ මුදුනෙනුසුලාමෙන්—පලන් මුහුලත්තඹරන්.

213. නරනිඳුහු ඉංගෙන්—සෙමෙනද නැසී පැසැඟී,
විලස කළ ලඟ කප්තුරු—මදලෙල හෙම්ලිය කලඹ.

---

තුනුනැව්, ශරීර නැමැති නෞකාවක් ඇති ; නිරඳු, නරෙන්ද්‍ර නැමැති ; මෙර, මෙරුව ඇති ; සබසයුර, සභා නැමැති සමුද්‍ර යෙහි ; අනඟ, කාමදෙව නැමැති ; කන්දර, කර්‍ණධාරතෙම ; නුවන්, නෙත්‍රනැමැති ; තොට ගත්, තීර්‍ථ†ග්‍රහණය කෙළේ.

211. නේදනන්, අනෙක ජනයන්ගේ ; නුවන්, නෙත්‍රයන්ගේ ; පැහැරජ, ප්‍රභාරාජි නැමැති ; යොත්දහස්නෙන්, රජ්ජුසහස්‍ර යෙන් ; ඇයෙන්නි මෙන්, ආකර්‍ෂණය කරන්නියක මෙන් ; තුනු, ශරීරයෙහි ; කැලුම්, කාන්තියෙන් ; විමන්, ප්‍රාසාදය ; අලු කැරැ, ආලොක කෙරෙමින් ; සබ, සභාවට ; වන්, ප්‍රවිෂ්ට වූ.

212. නරනිඳු, නරෙන්ද්‍රොත්තමයාගේ ; බැලුම්, විලොකන නැමැති ; බිසෙව්තො, අභිෂෙකජලය ; දෙඅතින්, හස්තපුට යෙන් ; උකහාගෙණ, සමූර්ණග්‍රහණය කොට, මුදුනෙන්, මස්තකයෙන් ; උසුලා මෙන්, උද්වහනය කරන්නියක මෙන් ; මුහුලත්, සඞ්කුචිතහස්ත නැමැති ; තඹරන්, තාමරසයන් ; පලන්, ප්‍රසාධනය කළා.

213. නරනිඳුහු, නරෙන්ද්‍රයාගේ ; ඉංගෙන්, අභිප්‍රායෙන් ; සෙමෙන්, මන්දවැ ; අද, අවුත් ; පැසැඟී, පාර්‍ශ්වයෙක්හි ; නැසී, ගුප්තවැ ; කප්තුරුලඟ, කල්පවෘක්‍ෂසමීපයෙහි ; මදලෙල, මදව ලීලොපෙතවූ ; හෙම්ලියකලඹ, හෙමලතා කලාපයෙක්හි ; විලස, විලාසය ; කළ, ප්‍රකාශ කළා.

---

* ඇයෙම්නි-බො : † තීර-බොහෝ.

214. දූදෙනේ නෙත්කැටැ—වැජඹි පිළිබිඹු මුඹුනෙන්,
ඇසිපියනෙවු වහන්නා*—යහදසන ලය වොලොගත්.

215. රිසිසේ අයා බොත—දෙනෙ නිල්නෙත්පෙණෙල ලා,
රුසයුරය ලොමුදෙහෙන්—තුනුහි විසල් විලස් පෑ.

216. නොසේ ලඟුව හොත්—මොවුනබියෙස් කනාරු,
වහස් කෙසේ හෝ වී—හැඟි එක්දූයෙක් මෙ වී.

217. අද මද දූමඟුල්—බිසෙව් විසඹරජහට,
නුවනතසිත් සැණිසෙමේ—සිරිලද රජසිරි සභා.

---

214. දූදෙනේ, දූතජනතෙම; නෙත්කැටැ, නෙත්‍ර නැමැති දර්පණයෙහි; වැජඹි, විජෘම්භණය කළාවූ; පිළිබිඹු, ප්‍රතිබිම්බ නැමැති; මුඹුනෙන්, යෂ්ටිකොටියෙන්; ඇසිපියන්, අක්ෂිපක්ෂ්මයන්; වහන්නා එවී, උද්වහනයකරන්නාක්හු මෙන්; ලය, චිත්තයෙන්; යහදසන, ප්‍රියදර්ශිනිය; වොලොගත්, පැහැර ගත්තේයි.

215. ඇය, ඒ ප්‍රභාවතියගේ; රුසයුරු, රූපසාගරය; දෙනේ, ජනසමූහතෙම; නිල්නෙත්, නීලනෙත්‍ර නැමැති; පෙණෙල ලා, ප්‍රණාලයන් බහා; රිසිසේ, අභිප්‍රායානුකූලවූ පරිද්දෙන්; අයා, ආකර්ෂණය කොට; බොත, පානය කරණ කල්හි; ලොමුදෙහෙන්, ලොමොද්ගමයෙන්; තුනුහි, ශරීරයෙහි; විසල්, විශාල වූ; විලස්, විලාසය; පෑ, ප්‍රකාශ කෙළේ.

216. නොසේ, යම් පරිද්දෙකින්; කනාරු, සුවර්ණරූපය; මොවුනබියෙස්, මේ කාන්තාවගේ අභිමුඛයට; ලඟුව හොත්, සමීපස්ථ කළහොත්; වහස්, අපහාස; කෙසේ හෝ වී, කෙලෙස වේ`දැහෝයි;† හැඟි, සිතන්නාවූ; එක් දූයෙක්, එක්, දූතයෙක්; මේ වී, මෙසේ කථනය කෙළේ.

217. අද, මෙ දිනයෙහි; මද, අනඞ්ගයාගේ; දූමඟුල්, ජාතිමඞ්ගල්‍යයෙක; විසඹරජහට, විසයාස්වාද රජහට; බිසෙව්, අභිෂෙකයෙක; නුවනත, නෙත්‍රයටද; සිත්, චිත්තයටද; සැණිසෙමේ, උත්සව කාලයෙක; රජසිරි, රාජ්‍යශ්‍රී තොමෝ; සභාසිරි ලද, සභායශ්‍රීප්‍රතිලාභය කළා.

---

* හම්නා-හමනා-හැම.        † කෙලෙස සමන වේදේහෝයි-බො.

218. ඉති පවසම්නෙදූ—දූදනනෙක් වැ නිරිඳු,
ලැබ නෙත්සිත්මිණි සරණ—නියකැල්මනොත් මුදුනේ.

219. එතරවඩුත් සඳ—වියූ පිළිහැරියක හස්,
ලැගෙමිනඟ ලොමුදෙහෙන්—සදමින් රජ විමන් වන්.

220. දූදන රූ ගතාය පුරපතාය සගල්,
කතාය දූක සොම්නස් පතාය මෙ කියූ සග.

## සතරවන සග.

---

221. දූදෙනෙ එතර නිකුත්—සකුස් සතොසිනෙපුරෙන්,
පබවත පුවත් පස්කැන්—දූරැ සාගත් කුසාවත්.

---

218. එදූ, ඒ දූතතෙම; ඉති, මෙසේ; පවසමින්; ප්‍රකාශ කෙරෙමින්; දූදනනෙක්වැ. දූතජනයා හා සමගවැ; නිරිඳු, නරෙන්‍ද්‍රයාගේ; නෙත්, නෙත්‍ර නැමැති. සිත්මිණි, චින්තා මාණික්‍යයක්; ලැබ, ලබ්ධවැ;* සරණ, ශ්‍රීපාදයෙහි; නිය කැල්මන්,† නඛමයූඛයන්; මුදුනේ, මස්තකයෙහි; ඔත්, බැහුයේයි.

219. එතර, ඒ ක්‍ෂණයෙහි; වඩුත් සඳ, වඩනාකල්හි (හෙවත් වඩනා කාලයෙහි); වියූ, කථනය කළාවූ; පිළිහැරියක, වාරපාලිකාවකගේ; හස්, පාර්‍ශ්වයට; ලැගෙමින්, සමීපස්ථ වෙමින්; අඟ, ශරීරය ලොමුදෙහෙන්, ලොමොද්ගමයෙන්; සදමින්, සජ්ජිතකෙරෙමින්; රජ, ඒ රාජොත්තමතෙම; විමන්, ප්‍රාසාදයට; වන්, ප්‍රවිෂ්ට වී.

220. රූ ගතාය. රූපග්‍රහණය කළාවූ; දූදන, දූතජනතෙම; සගල්පුර පතාය, සාගල නගරයට සම්ප්‍රාප්තවැ; කතාය දූකැ, කාන්තාව දර්‍ශනය කොට; සොම්නස් පතාය, සෞමනස්‍ය ප්‍රාප්තවූ පරිදි; කියූ, කථනය කළාවූ; මෙසග, මේ සර්ගයයි.

චතුර්ථසර්ගයයි.

---

221. දූදෙනේ, දූතජනතෙම; එතර, ඒ ක්‍ෂණයෙහි; එ පුරෙන්, ඒ පුරයෙන්; සකුස්, වහා; නිකුත්, නිර්ගතව;

---

* ලබ්ධවෙමින්-බොහෝ. † කැල්ම-බොහෝ.

222. මුවගැබෙහි අස්කළ—පුවතොදිනද රජවිමන්,
*පිවිසැ ලවනින් කියොලා—පලගත් සේ සිත්ලියන්*

223. විරු ගුරුන් සරණ—නියරුස්අහස්ගඟැ හී,
සිට පිවිතුරු මුදුනෙන්—දෙනෙ දූ බින්දෙත් මුවහස්.

224. එතර කැදෙව්නු† වස්—වහා ඒ උතුමා මා,
පිළිහැරියක දෙසේ නිල්—නුවනත‡ රහස්යවි දුන්.

---

පබවත, ප්‍රභාවතියගේ; පුවත්, ප්‍රවෘත්ති නැමැති; පස්කැන්, කණ්ණාවතංසයන්; දුරු, ලවහනය කොට; සතොසින්, සන්තොෂයෙන්; කුසාවත්, කුසාවතියට; යාගත්, යාත්‍රාග්‍රහණය කෙළේයි.

222. මුවගැබෙහි, මුඛගර්භයෙහි; අස්කළ, ලාඤ්ඡන කළාවූ; පුවතොදින්, ප්‍රවෘත්තිඋදුමයෙන්; අද, අවුත්; රජවිමන්, රාජවිමානයට; පිවිසැ, ප්‍රවිෂ්ටව; සිත්ලියන්, චිත්තනැමැති ලතිකාවෙහි; පලගත් සේ, ඵලග්‍රහණය කළාක්මෙන්; ලවනින්, වක්‍ත්‍රයෙන්; කියොලා, ප්‍රකාශ කෙරෙමින්.

223. විරු, ඒ වීරයාගේ; ගුරුන්, මව්පියන්ගේ; සරණ, පාදයන්ගේ; නියරුස්, නඛමයූඛ නැමැති; අහස්ගඟැ, ආකාශ ගඞ්ගාවෙහි; හී, පතිතවැ; සිටැ, සවිතවැ; පිවිතුරු මුදුනෙන්, පවිත්‍රවූ මස්තකයෙන්; දූදෙනේ, දූතජනතෙම; බත්, බහනලද; මුවහස්, මුඛලාඤ්ඡනය; බින්ද, බඟන කෙළේ.

224. එතර, ඒ ක්ෂණයෙහි; මා, ජනනීතොමෝ; ඒ උතුමා, ඒ උත්තමයා; වහා, ශීඝ්‍රව; කැදෙව්නුවස්, ආමන්ත්‍රණය කරණු පිණිස; පිළිහැරියක, ප්‍රතිහාරියක; දෙසේ, දසාවම; නිල්නුවනත, නීලනෙත්‍ර නැමැති; රහස්යවි දුන්, රහොයෂ්ටි දානය කළා.

---

* සියලු පොත්හිම මෙසේ "සිත්ලියන්" හිම දක්නාලැබේ.

† කැදෙව්නු කැදෙව්නු-සමහර.

‡ නුවන්-හැම.

225. හො ගොස් ලො එකඇසා—කුසාළ මවුනබියෙස්,
දූදෙනෙ එ තතු දතුයේ—පබවත විතර පතුයේ.

226. බලතෙක්දෙස් විලස්—තිදසිඳු වත් වණිත නත්,
පබවතුනේවිලස් හා—පවසම් ලූ සී මේ වී.

227. ඇය රුසිරු සරණ—තල තඹරනියරැස්නෙන්,
සිනාගතෙව් තඹරට—සියහ මුහුලස පානා.

228. ඇය මනදඟදඟ—දුවන්විමනැත් වදනා,
වියොවගට දුලූ කල්—යුවල වැටුප් පුවළ හළ.

---

225. හෝ, වාරපාලිකාතොමෝ ; ගොස්, ප්‍රයාණය කොට ; ලෝ, ලෝකයාට ; එක ඇසා, අසහාය චක්‍ෂුසක් වැනිවූ ; කුසා, කුසරජහු ; මවුනබියෙස්, මව්පියන්ගේ අභිමුඛයට ; අළ, පැමුණුවූය ; දූදෙනෝ, දූතජනතෙම ; එතතු දතුයේ, ඒ තත්වය විඥාපනය කෙළේ ; පබවත, ප්‍රභාවතියගේ ; විතර, විස්තරයෙහි ; පතුයේ, ප්‍රාප්තවී.

226. විලස්, විලාසයෙහි ; එක්දෙස්, එකදෙශයක් ; බලත, විලොකනය කරත්හොත් ; තිදසිඳු, ශක්‍රදෙවෙන්ද්‍රයා ; වත්, සමර්ථ වූයේය ; වණිත, වණ්ණනා කරත්හොත් ; නත්, අනන්තයා (වත්, සමර්ථය ;) පබවතුන්, ප්‍රභාවතීන්ගේ ; ඒ විලස්, ඒ විලාසය ; පවසම් ලූ සී හා, ප්‍රකාශ කරමෝදූයි ; මේ වී, මෙසේ කථනය කෙළේ.

227. ඇය, ඒ ප්‍රභාවතියගේ ; රුසිරු, සිත්කළුවූ ; සරණ තල, චරණතල නැමැති ; තඹර, තාමරසයෙහි ; නියරැස්නෙන්, නඛරශ්මිව්‍යාජයෙන් ; සියහ, නිරන්තරයෙන් ; මුහුලසපානා, සඞ්කුචිතභාවය ප්‍රකාශකරන්නාවූ ; තඹරට, තාමරසයට ; සිනාගතෙව්, සම්තග්‍රහණය කළාක් වැනි වී.

228. ඇය, ඒ කාන්තාවගේ ; මනදඟ, මනොබන්ධනය කරන්නාවූ ; දඟ, ජඞ්ඝායුගමය ; දුවන්, ජඝනතල නැමැති ; විමනැත්, විමානොදරයට ; වදනා, ප්‍රවිෂ්ටවන්නාවූ ;* වියො වගට, අනඞ්ගයාට ; දුලූ, ජ්වලිතකරණලද ; කල්, කලාවූ ;† වැටුප්යුවල, ප්‍රදීපයුගමයෙක්හි ; පුවළ, ප්‍රෞඪිය ; හළ, දුරු කෙළේ.

---

* ප්‍රවිෂ්ටවූ-බොහෝ. † පොත්වල නැ.

229. කිබිසි කළ රන්තුතු—සුදුසු කිරා තරාදී,
මදරස රූ තිවට වට—යුගද නමඬුලු කෙ වණිත්.

230. දියෑ දියලදමලඟ—පලඟ දියටැඹ ඉඳුවූ*,
දුවනත්රන්ගිරිතෙලේ—පැහැසරවටොර කෙ කියත්.

231. හරසුරගඟ ලඟැ—දිවනතනුතත පුල්විල්,
දුරූ පුළුලුකුළ හිමව්—ගිරිරජබෙයද කෙ වණිත්.

232. වියොවග මිවු කියලු—විලි තුනු ලියසැව්හී,
වණිත කෙ වත බිඟුපෙල—දියසිරිපත් වසාරද.

---

229. තිවට, මහාබ්‍රහමයා විසින්; මදරස, ශෘඞ්ගාර රසය හා; රූ, රූපරසය; කිරා, විභාග කොට; කිබිසිකළ, අධොමුඛ කළාවූ; තරාදී, තාරාදියෙක්හි; රන්තුතු සුදුසු, සුවර්ණ කපාලයුගමයක් වැනිවූ; වට, වෘත්තවූ; යුගදනමඬුලු, යුගමජානුමණ්ඩලය; කෙ වණිත්, කවරෙක් වර්ණනා කෙරේද?

230. දියෑ, ජගත්හි; දියලද, ජයප්‍රතිලාභය කළාවූ; මලඟ, අනඞ්ග නැමැති; පලඟ, භටයා විසින්; දුවනත්, ජඝනතල නැමැති; රන්ගිරිතෙලේ, සුවර්ණශෛලතලප්‍රාන්තයෙහි; ඉඳුව, සමර්පිත† කරනලද; දියටැඹ, ජයස්තම්භයක් වැනිවූ; පැහැසර, ප්‍රභාසාරවූ; වටොර, වෘත්තොරූන්; කෙ කියත්, කවරෙක් කථනය කෙරේද?

231. හර, මුක්තාහාර නැමැති; සුරගඟ, ආකාශගඞ්ගාව; ලඟැ, සමීපස්ථව;‡ දුවනත, ජගනතල නැමැති; පුල, විකසිතවූ; අනුතතවිල්, අනවතප්ත තටාකය; දුරූ, දරණ§ ලද්දාවූ; හිමව්ගිරිරජබෙයද, හිමාලයපර්වතශ්‍රොණිතටය වැනිවූ; පුළුල්, පෘථුලවූ; උකුළ, ශ්‍රොණිය; කෙ වණිත්, කවරෙක් වර්ණනා කෙරේද?

232. වියොවග, අනඞ්ගයාගේ; මිවු කියලු, මුෂ්ටිග්‍රහය ප්‍රකාශ කළාක් වැනිවූ; විලි, වලයන් ඇති; තුනු, ශරීර නැමැති; ලියසැව්හි, ලතාචාපයෙහි; බිඟුපෙල දියසිරිපත්, භෘඞ්ගාවලීජයශ්‍රී ප්‍රාප්තවූ; වසාරද, වසාරාජිය; වණිත, වර්ණනා කරත; කෙ වත,|| කවරෙක් සමර්ථද?

---

* දියලදමලඟපලඟ දියදියටැඹ ඉඳුවූ-හැම. † සජ්ජිත-ඇතම්.
‡ සමීපයෙහි-ඇතම් § දුරුකරනා-හරනා-හැම. || වති-ඇතම්.

233. තරඟ දුවන් රණබිම්—අරා ලෝ දනනුවස්,
ලියසැව් නඟන ඇය නැබ—කියලී මුඛා වන් තැන්.

234. දුවන් පියවුරු දුටු—මහපතරාම මුත් බඹ,
සියුම් කැමි නො පොහො සී—දිය බඳ සඳ විහිදි මැද.

235. නියරුස්පෙණවලන—සුරතැඟිලි පබලිසිලු,
රුසයුරේ තරඟ වන්—යුවලත වණද කවර.*

336. තබත මියුරු සම—රඟු සර සතින් ගම්රා,
පැහැසර සුවට මට කට—සිරි ලද කසුන්වස්තළ.

---

233. ඇය, ඒ කාන්තාවගේ ; නැබ, නාභිය ; ලෝ, ලොකය ; දනනුවස් ; ජයගන්නා පිණිස ; දුවන්, ජඝනතල නැමැති ; රණබිම්, යුධභූමියට ; අරා, ආරූඪව ; තරඟ, අනඞ්ගයා ; ලියසැව්, ලතාචාපය ; නඟන, උද්ගත† කරණ කල්හි ; මුඛාවන්තැන්, චාපකොටිය වන්නාවූ ස්ථානය ; කියලී, ප්‍රකාශ කෙළේ.

234, දුවන්, ජඝනතලය හා ; පියවුරු, පයොධරයන් ; දුටු, දර්ශනය කළාවූ ; බඹ, මහාබ්‍රහ්මතෙම ; මහපතරා ම මුත්, මහාපතරනිර්මිතම මුත් ; සියුම්, සූක්ෂමවූ ; කැමි, කර්මාන්ත යෙහි ; නො පොහෝ සී, අසමර්ථයයි ; දිය, ජගත්වාසීන් ; බඳ, බඳනාලද්දවූ ; සඳ, සන්දහය ; මැද, මධ්‍යප්‍රදෙශය ; විහිදි දුරු කෙළේයි.

235. නියරුස්, නඛරශ්මි‡ නැමැති ; පෙණවලන-පෙණ, ඵෙණයෙන් ; අවලන, ගැවසිගත්තාවූ ; සුරතැඟිලි, සුරකතා ඞගුලි නැමැති ; පබලිසිලු, ප්‍රවාලොපහසනය කරන්නාවූ ; රූ, සයුරේ, රූපසාගරයෙහි ; තරඟ වන්, තරඞ්ගමාලාවන් වැනිවූ ; යුවලත, හස්තයුග්මය ; කවරෙක් වණද ; කවර නම් කවීශ්වර යෙක්, වර්ණනා කෙරේද?

236. සමරඟු, අනඞ්ගයාගේ ; මියුරු, මධුරවූ ; සරසතින්, සප්තස්වරයෙන් ; ගම්රා, ග්‍රාමරාගයන් ; තබත, ස්ථාපිත කරණ කල්හි ; පැහැසර, ප්‍රභාසාරවූ ; සුවට, මනාව වෘත්තවූ ; මට, සංශ්ලිෂ්ටවූ ; කට, කණ්ඨය ; කසුන් වස්නල, කාඤ්චන වංශනල යෙක්හි ; සිරි, ශොභාව ; ලද, ලබධ වී.

---

* කවරෙක්-බොහෝ. † ඊමහනය-බොහෝ. මයූඛ-සම:

237. උවනිකැය පියුම්—පැරැදූ හව්සිරිසියෝ,
ලැබැ පියුම් පියුමතින්—වී හැඟියෙම් පියුම් නම්.

238. දසන්වැල සිඳුවර—මුවමිවිතැ පිලැ දුළු,
දල වන් ලවන් රතුපුල්—වෙසෙසත් බසැත් ල තමා.

239 වණ්ණිම්හ හා ඇය—මුව පුල්තඹුරු ගබිහි,
වසන සරසවිය පලන්—දසනග කඬාමල්කඩ.

240. නලලත්හි සඳනලෙ—ලගොබ පත් දෙ බැමලේ,
මනහර රඹපුවල හළ—ගහණිත වණ්ද කවර.

---

237. හව්සිරිසියෝ, සකල ඓශ්වර්‍ය්‍යයෙන් සමග්‍රවූ ; ඇය, ඒ ප්‍රභාවතියගේ ; උවනින්, වක්‍ත්‍රයෙන් ; පැරැදූ, පරාජය කළාවූ ; පියුම්, පද්මය ; පියුමතින්, පද්මාවගේ* හස්තයෙන් ; පියුම් ලැබැ, පරිත්‍යාග ප්‍රතිලාභය කොට ; පියුම් නම්, පියුමැයි යන නාමය ; වී, කථනය කෙරෙතියි ; හැඟියෙම්, සිතම්.

238. දසන්වැල, දශනාවලී නැමැති ; සිඳුවර, සින්ධුවාර යන් ඇති ; මුව, මුඛ නැමැති ; මිවිතැ, මධුචෂකයෙහි ; ඉපිලැ,† උත්පලාවිතවූ ; දුළු, දලිතවූ ; රතුපුල්, රක්තොත්පල ;‡ දල වන් පත්‍රයක් වැනිවූ ; ලවන්, අධරය ; වෙසෙසත්, විශෙෂ කරත් ; තමා බසැත් ල, තමා වචන ප්‍රමාණ ල.

239. ඇය, ඒ ප්‍රභාවතීන්ගේ ; මුව, මුඛ නැමැති ; පුල්, විකසිතවූ ; තඹුරුගබිහි තාමරස ගර්භයෙහි ; වසන, වාසය කරන්නාවූ ; සරසවිය, සරස්වතීදෙවිය ; පලන්, ප්‍රසාධනය කළාවූ ; කඬාමල්කඩ, උත්තමාඞ්ගකුසුම කාණ්ඩයක් වැනිවූ දසනග, දශනාග්‍රය ; වණ්ණිම්හ හා, වර්ණනා කරමෝළු.

240. නලලත්හි, ලලාටසතලයෙහි ; සඳනලෙ, චන්ද්‍රන ලෙඛා නැමැති ; ලගොබ, අභිනව ගොබක් ඇති ; බැමලේ, භ්‍රැලෙඛා නැමැති ; දෙපත්, පත්‍රද්වයක් ඇති ; මනහර, මනොහරවූ ; රඹපුවල, ස්වර්ණරම්භාවෙක්හි ප්‍රෞඪ්‍යය ; හළ, දුරු කළාවූ ; ගහණිත, ශ්‍රාණිය ; කවර වණ්ද, කවරෙක් වර්ණනා කෙරේද ?

---

* පදමාවතින්ගේ-සම. † පිලැ-බොහෝ.
‡ රක්තොත්පල නැමැති-බෙහෝ.

241. සවණ්ණ පත සුනිල්—පැහැකිඳු දඹු නෙතතලා
සරහත් මල්කෙහෙල්ලා—සරය වී යත නො සකියෙම්.

242. නුවන්විලැසිපිය—රළ යතු නිල් පැහැරිණී,
සිරි ඉසිලූ නලළ තෙර—බැමලේ වණ්ණද කවර.

243 සොමි උවන් සුපුන්—සරාසිසිබිඹු ලඟවූ,
සුනිලබකැල පුවළ හළ—වරල්කලඹේ කෙ වණ්ණත්.

244 දනනැස් පසක් කළ—විසල් දලනිදුනෙක්දෙස්.
හාත්පස් නිදෙසිනෙව්—වැණීම් ලූ පබවත රූ.

---

241. සවණ්ණ, කණ්ණ නැමැති; පත, පත්‍රයෙන් යුක්තවූ; සුනිල් පැහැකිඳු, සුනීල ප්‍රභාකදම්බ නැමැති; දඹු, දණ්ඩයක් ඇති; නෙතතලා, නෙත්‍ර නැමැති බාණකොටියක් ඇති; මල් කෙහෙල්ලා, කුසුමකේතුහු විසින්; සරහත්, සජ්ජිත කරණ ලද; සරය වී යත, බාණයෙකැයි යතහොත්; නො සකියෙම්, අශක්‍යයෙම්.*

242. නුවන්, නෙත්‍ර නැමැති; විලැ, කටාක්ෂයෙහි; නලළ, ලලාට නැමැති; තෙර. තීරයට; ඇසිපිය, අක්ෂිපක්ෂම නැමැති; රළයතු, තරඞ්ගයෙන් ප්‍රෙෂණිය කළාවූ. නිල්පැහැරිණී, නීලප්‍රභා රාජියෙහි; සිරි, ශොභාව; ඉසිලූ. උවහනයකරන් නාවූ; බැමලේ භ්‍රැලෙඛාව; කවර වණ්ණද, කවර කවීශ්වර යෙක් වර්ණනා කෙරේද?

243. සොමි, සෞම්‍යවූ; උවන්, වක්ත්‍ර නැමැති; සුපුන්; සම්පූර්ණවූ; සරාසිසිබිඹු, ශරච්චන්ද්‍රබිම්බයට; ලඟවූ. සමී පස්ථ වූවාවූ; සුනිලබකැල සුනීලාබ්‍ර සමූහයෙක්හි; පුවළ. ප්‍රෞඪිය; හළ. දුරුකළාවූ; වරල්කලඹේ, ඒ කෙශකලාපය; කෙ වණ්ණත්. කවරෙක් වර්ණනා කෙරෙත්ද?

244. විසල්, විශාලවූ; දලනිදුන්, සමුද්‍රයෙන්; එක්දෙස්, එකදෙශයක්; ඇස්පසක් කළ. චක්ෂුසට ප්‍රත්‍යක්ෂ කළාවූ; දනන්, ජනයන්ට; හාත්පස්. සමන්තපාර්ශ්වයෙන්; නිදෙසි නෙව්, නිර්දේශ කළාක් මෙන්; පබවත. ප්‍රභාවතියගේ; රූ වැණීම් ලූ, රූපවර්ණනා කෙළෙමෝ ලූ.

---

* අශඞ්කායෙම්-ඇතම්.

245. හරු මදහට කෝ—මහසතනවිදු විදුමත්,
දනහට හව් දහම්* කෝ—පබවත වතෙසමාගී.

246. මදනරස රූ හව්—මුළුලෝ බෙදූ දෙනුවස්,
එ කොමලඟ සුමුගුගී—කෙළෙයිම් රැස් සිවුමුවා.

247. මනහර වදන් හිම්- දනන්† පින්පෙලෙ මහත්.
වදුරස්නමගැ ලූ පස්—විසී පබවත එ විලස්.

248. සහ විස්මලෙන් ඉතී—කියත පබවත එ විලස්,
කෙළෙ පස්කම් දළගහණ—බිඳැ අස්ගත් දළගහණ.

---

245. එසමාගී, ඒ සමයෙහි ; පබවත, ප්‍රභාවතීන්ගේ ; වතෙ, ප්‍රවෘත්තිය ; මදහට, අනඞ්ගයාහට ; හරු, ඊශ්වරයාගේ ; කෝ, ක්‍රොධය ; කෝ, කොයිද ; මහසතන, මහාබොධිසත්වයන්ගේ ; අවිදු, අවිද්‍යාව ; විදුමත්, විධ්වංශනය ; (කෝ, කොයිද ;) හව්දනහට, සකල ජනයාහට ; දහම් (කෝ,) ඇදහීම (කොයිද.)

246. මදනරස, ශෘඞ්ගාරරසය හා ; හව්රූ, සකල රූපරසය ; මුළුලෝ, සමස්තලොකයහට ; බෙදූ දෙනුවස්, විභජනය කරණු පිණිස ; එ කොමල, ඒ කොමලඞ්ගියගේ ; අඟ, ශරීර නැමැති ; සුමුගුගී, සමුග්ගයෙහි ;‡ සිවුමුවා, චතුර්මුඛයා ; රැස් කෙළෙයිම්, රාශීභූත කළහයි සිතම්.

247. පබවත, ප්‍රභවතීන්ගේ ; එ විලස්, ඒ විලාසය ; මනහරවදන්හිම්, මනොහර වචන ප්‍රමාණ කොට ඇත්තේ ; දනන්, ජනයන්ගේ ; ඉමහත්. අති මහත්තවූ ; පින්පෙලෙ, පුණ්‍ය ඵලයෙක ; වදුරස්නමගැ, වජ්‍රාසනාරූඪ මාර්ගයෙහි ; ලූ, බහන්§ ලද්දාවූ ; පස්, පාශයෙක ; විසී, ලොකවශ්‍යයෙකි.

248. පබවත, ප්‍රභාවතීන්ගේ ; එ විලස්, ඒ විලාසය ; සහ විස්ම ලෙන්, විස්මයසහිත චිත්තයෙන් ; ඉතී; මෙසේ ; කියත, කථනය කරණ කල්හි ; හස්ගත්, ලාඤ්ජනග්‍රහණය කළාවූ ; දළගහණ, දෘඪග්‍රහණය ; බිඳැ, භග්නකොට ; පස්කම්, පඤ්චකාමයෙහි ; දළගහණ කෙළේ, දෘඪග්‍රහණය කෙළේ.

---

* අවුදහත්-හැම.   † දනානෙත් හැම.

‡ සමුදගයෙහි-ඇතම්.   § බහාලන-සමහර..

249 එතර පියනරවර—ණෝ මැතිමඬුලු අමතා,
සිවුරඟසෙනඟ සැරහුම්—කරවා වි යී නොසරස්.

250. සරහා සෙනඟ නා—දනන් දන්වතෙ යතුරට.
රිසිදූ යොගමොහොත්නෙන්—පියරජ එතර යාගත්

251. සිලිලාර හෝ නැවත—යුගතපවනින් ගස් කැ.
පුර හෝ එදූ යාගත්—සිවුරඟ සකොබිනුදුහු.

252. තමා සෙරෙනා කල්—මිහිවමිය සතුස්වා මෙන්,
මොලොක සරණත තඹරන්—පහසසිරි* දෙමිනෙනිරිඳු,

---

249, එතර, ඒ ක්ෂණයෙහි ; පියනරවරණෝ. ඒ පිතුරාජෝත්තමතෙම ; මැතිමඬුලු, අමාත්‍යසමූහ ; අමතා. ආමන්ත්‍රණය කොට ; නොසරස්, වහා ; සිවුරඟසෙනඟ. චතුරඞ්ගසෙන්‍යය ; සැරහුම් කරවා, සමෘඬකරවායි ;† වියි. කථනය කෙළේ.

250. සෙනඟ, සෙන්‍යය ; සරහා. සජ්ජිත කොට ; නා දනන්. නායකජනයන් ; එ යතුරට, ඒ යාත්‍රාවට ; දන්වත. විඥපනය කළ කල්හි ; රිසිදූ. ඉච්ඡාදූයකවූ ; යොගමොහොත්නෙන්, යොගනක්ෂත්‍ර මුහුර්තයෙන් ; පියරජ. පිතෘරාජතෙම ;‡ එතර. ඒ ක්ෂණයෙහි ; යාගත්. යාත්‍රාග්‍රහණය කෙළේයි

251. එදූ. එදිනයෙහි ; යාගත්. යාත්‍රාග්‍රහණය කළාවූ ; සිවුරඟ. චතුරඞ්ගසෙන්‍යයාගේ ; සකොබින්, සංක්ෂොභයෙන් ; උදුහු. උඩුතවූ ; පුර හෝ. ඒ පුරය දෝ හෝ ; නැවත. නොහොත් ; යුගතපවනින්. යුගාන්තමාරුතයෙන් ; ගස්කැ, ප්‍රහාර ලද්දාවූ : සිලිලාර හෝ. සමුද්‍රය දෝ හෝ යි .

252 එ නිරිඳු. ඒ නරෙන්ද්‍රතෙම ; තමා, තමාගේ ; සෙරෙන්, චිරාත්කාලයක් ; ආ. පැමිණිඑන්නාවූ ; කල්. මනොඥවූ ; මිහිවමිය, මහීකාන්තාවිය ; සතුස්වා මෙන්, සන්තුෂ්ට කරන්නාක් මෙන් ; මොලොක, මෘදුවූ ; සරණත, චරණතල නැමැති ; තඹරන්, තාමරසයන්ගේ ; පහසසිරි, ස්පර්ශශ්‍රිය ; දෙමින්, දානය කෙරෙමින් :—

---

* පහසිසිර-හැම.  † සමෘඞිකරවිසි-සම්හර.
‡ පියරජිණෝ-බොහෝ ; පිතෘනරෙන්ද්‍ර-ඇතම්.

253. මහදොර සදා සිටැ—උර රන්බෙයද මඬලෙන්,
වෙසෙසි රැකුළ ඇත්කඳ—සුරින්දෙව් එරවණකඳ.

254. මහවේ දෙපසැ කළුන්—බැලුම් දළවුලෙ නිරිඳු වත,
සිවුරඟ සෙනඟ සැදෙමෙන් පුර යුගසකොබ නොදිහී.

255. සහසැසහු හරණෙන්—සිරිනඳුනුයන් යාගත්,
මහවේ පුවා බිහිදොර—ලද මඳමරු උයන්විල්.

256. දෙසඳනලෙව් ගඟුල්—හැලිගනසාහි සිහිල්.
සහ මල්පලුලියව්මන්—සිරි විඳුමිනබියෙස් වී.

---

253. උර, වක්‍ෂඃස්ථල නැමැති; රන්බෙයද මඬලෙන්, සුවර්ණ පීඨ ප්‍රාන්තයෙන්; මහ දොර, මහාවාරය; සදා, සජ්ජිත කොට; සිටැ, ස්ථිතව; එරවණකඳ, ඓරාවණ හස්තිස්කන්ධ යෙහි; සුරින්දෙව්, ශක්‍රයා මෙන්; රැකුළ, පමුණුවනලද; ඇත් කඳ, හස්තිස්කන්ධය; වෙසෙසි, විශෙෂ කෙළේ.

254. ඒ නිරිඳු, ඒ නරෙන්ද්‍රයා, මහවේ, මහා වීථියෙහි; දෙපසැ, උභයපාර්ශ්වයෙහි; කළුන්, කාන්තාවන්ගේ; බැලුම්, විලොකනය නැමැති; දළවුල්, ජලාකුලයෙහි; වත, පැමිණි කල්හි; සිවුරඟසෙනඟ සැදෙමෙන්, චතුරඞ්ගසෙන්‍යසජ්ජිත යෙන්; පුර, ඒ පුරය; යුගසකොබ, යුගාන්තසංක්‍ෂොභය; නොදිහී, අපරිත්‍යක්ත කෙළේ.

255. සිරිනඳුනුයන්, ශ්‍රීනන්දනොද්‍යානයට; යාගත්, යාත්‍රාග්‍රහ ණය කළාවූ; සහසැසහු හරණේන්, සහස්‍රාක්ෂීහු මෙන්; මහවේ: මහාවීථිය; පුවා, අතික්‍රාන්ත කොට; බිහිදොර, බාහ්‍ය ද්වාර යෙන්; උයන්විල්, උද්‍යානතටාකයන්ගේ; මඳමරු, මන්දමාරුතය; ලද, ලබ්ධ වී.

256. දෙසඳනලෙව්, උභය චන්දනාලෙපයක්* වැනිවූ; ගඟුල් හැලි, ගඞ්ගානිර්ඣරයන් හා; ගනසාහි, ඝනච්ඡායා† වෙහි: සිහිල්, ශෛත්‍යයද; සහමල්පලු පල්ලවකුසුමයෙන් සජ්ජිතවූ; ලියව්මන්, ලතාගුල්ම‡ යන්ගේ; සිරි, ඓශ්වර්‍ය්‍යී; විඳුමින්, අනුභව කෙරෙමින්; අබියෙස්වී, ඒ පුරාසන්න වී.

---

* චන්දනලෙපයක්-බොහෝ.  † සාන්ද්‍රච්ඡායා-බොහෝ.

‡ ගුලුඑ-හැම.

257. සිවුරඟසෙනඟ ඉති—සියකැන් හා මදුනිරිඳු,
මුහුදෙව් වැඩි හිරුගොත්—නරනිඳුඉඳු වැජඹමෙන්.

258. ඔහු දසුන්දලනිදු—වරද රජ ඇමැතිරැස්,
නැමැ නැමැ උඩිලැගැමෙන්—තරඟපෙල තර පැළුවි.

259. තුරඟ කුරසුන් රද—සිවුරඟසෙනඟ එකෙණේ,
වසත ගජ කන්තලදෘ*—නලවෙයින් නොවැස්වැ බිජී.

260. පබවත සිත්මිණි—හෙනි සක්විතිරුවන් වස්,
යුගඳුරුමලට පුණුබද—විලසින් රජ පුර පිවිටු.

---

257. සිවුරඟසෙනඟ, චතුරඞ්ගසෙන්‍යය හා ; සියකැන් හා බන්ධු සමූහයා හා ; ඉති, සමගින් ; මදුනිරිඳු, මද්‍රනරේන්ද්‍රයා ; හිරුගොත් සූය්‍ර්‍යවංශයෙහි වූ ; නරනිඳු, නරෙන්ද්‍ර නැමැති ; ඉඳු, චන්ද්‍රයා ; වැජඹමෙන්, විජෘම්භමාණයෙන් ; මුහුදෙව්, සමුද්‍රය මෙන් ; වැඩි, උදෑම වී.

258. ඔහු, ඒ රාජොත්තමයාගේ ; දසුන්, දශීන නැමැති ; දලනිදු, ජලනිධියෙහි ; වරද, යුවරජදරුවන්ද ; රජ, රජදරුවන්ද ;† ඇමැතිරැස්, අමාත්‍යසමූහයා ; නැමැනැමැ, නමස්කාර කොටකොට, උඩිලැගැමෙන්, ඌර්ධ්වගත වීමෙන් ; තරඟපෙල, තරඞ්ග පරම්පරාවෙහි ; තර, ශොභාව ; පැළුවි, ප්‍රකාශ කළාක් මෙනි.

259 තුරඟ, අශ්වයන්ගේ ; කුරසුන්, ඛුරප්‍රහාරයෙන් බණ්ඩි තවූ ; රද, රජසින් ; සිවුරඟ සෙනඟ, චතුරඞ්ගසෙන්‍යය ; වසත, ප්‍රවර්ෂනත කරණ කල්හි ; එකෙණේ, ඒ ක්ෂණයෙහි ; ගජ, හස්තීන්ගේ ; කන්තලදෘ, කර්ණතාලයෙන් ජනිත ; නලවෙයින්, මාරුතවෙගයෙන් ; නොවැස්වැ, ප්‍රකාශව ; බිජී, භ්‍රාජිත වී.

260. සක්විතිරුවන් වස්, චක්‍රවර්තිරත්නය පිණිස ; යුගඳුරුමලට, යුගන්ධරපර්වතයට ගියාවූ ; පුණුබද, පූර්ණභද්‍ර යාගේ ; විලසින්, විලාසයෙන් ; පබවත, ප්‍රභාවතීන් නැමැති ; සිත්මිණිහෙනි, චින්තාමාණික්‍යය පිණිස ; රජ, ඒ රාජොත්තම තෙම, පුර, ඒ පුරයට ; පිවිටු, ප්‍රවිෂ්ට වී.

---

* ගජන් කන්තලින්දෘ-සම:　　† රජද-සම:

261. හිවි පුළුප්කලස—පිවිතුරු ලකළ හෙම්කළ.
සමෝරඹ තැඹිලියෙන්—නවමල්සියෙන් රඳනා.

262. ලඹ කන්මල් සරා—වෙරළුමිණිවැති සියෙන්,
පිවිටු එ රජ මහලට—දිමුතු මුතුලැල් දිස්නා.

263. සිඳෙමිනි තැන්තැනැ*—ලියනූ ගඳෙව් වත්නා,
රුසිරඟ රඟ වරඟනන්†—මන රැඳවී නරවරා.

264. දෙතා වතා තුටිඳු ගතා එතා සේනඟින්,
පතා කතා පුර සෙ සපතා වතා වූ සඟ.

## පස්වන සඟ.

261. හිවි, ගැවසීගත්තාවූ ; පුළුප්, නාළිකෙර කුසුමයෙන් ; කලස, පූර්ණකලස් හා ; පිවිතුරු, පවිත්‍රවූ ; ලකළ, අලඞ්කෘතවූ ; හෙම්කළ, හෙමඝටයෙන් හා ; සමෝරඹ, මූඛහරිතවූ රම්භාද්‍රැමයෙන් හා ; තැඹිලියෙන්, සනහීර ඵලයෙන් හා ; නවමල්සියෙන්, අභිනව කුසුම ශතයෙන් ; රඳනා, රඤ්ජමානවූ :—

262. ලඹ, ලම්බමානවූ ; කන්මල්, කර්ණමාල්‍යයෙන් හා ; සරා, ප්‍රභා සහිතවූ ; වෙරළුමිණිවැති, වෛදූර්‍ය්‍ය මාණික්‍ය භාජනයන් ඇති ; දිමුතු, දීප්තිමත්වූ ; මුතුලැල්, මුක්තාලතිකාවන් ; දිස්නා, දෘශ්‍යමානවූ ; සියෙන්, ඡදනයන් ඇති ; මහලට, මතුමහලීතලයට ; එ රජ, ඒ රාජොත්තමතෙම ; පිවිටු, ප්‍රවිෂ්ටවී.

263. තැන්තැනැ, ඒ ඒ ස්ථානයෙහි ; සිඳෙමිනි, පරිච්ඡෙද කෙරෙමින් ; ලියනූ, ලයාන්විතවූ ; ගඳෙව්, ගාන්ධර්වය ; වත්නා, පවත්නාවූ ; රුසිරඟ, රුචිරාඞ්ග ඇති ; වරඟනන්, උත්තමාඞ්ගනාවන්ගේ ; රඟ, නෘත්‍යය ; නරවරා, නරවීරයාගේ ; මන රැඳවී, මනොනන්දනය කෙළේ.

264. ගතා, ගමනින් ;‡ සෙනඟින්, සෛන්‍යයෙන් ; දෙතා, අත්‍යර්ථයෙන් ; තුටුවතා, සන්තුෂ්ටවූ ; එතා ඉඳු, ඒ රාජචන්ද්‍රතෙම ; කතා, කාන්තාව ; පතා, ප්‍රාර්ථනා කොට ; පුර, ඒ සාගල පුරයට ; සපතා, සෙ, සම්ප්‍රාප්තවූ පරිදි ; වතා වූ සඟ, කීවාවූ සර්ගයයි

පඤ්චම සර්ගයයි.

---

* සිඳෙමින් තැන තැන-සම: † වරඟනන්රඟ-ඇතම්.
‡ ගමනයකරන්නාවූ-සම;

265. එ සඳ දිගුමගැ සැරැ—ඔබල කල්කල්නට,
මොලොක සැර පාමින් මෙන්—දිවයුරු අත්ගිරි බිජී.

266. නන්ලියගුම් මද—පිරිමැදූ ලෙල කිසල්පෙළ,
මුවරඳ රැඳි කොවුල්සර—ඇඳූ හමලෙ කොමලපවන්.

267. පිරිමැදූ තුඩු වෙළ—පස්හි(තුරු)ලග්නා මොනර මුළු,
පවනිනඹළ පිල්බර—කැරැ ඉඳු කෙකාරැව් ගත්.

268. රිවිකල්හු යත විල්||—හසවැල හළ මෙවුල්දම්,
පියුම්දඟ බිඟුරැව්නෙන්—වනසොවිනි ගුගුරා මෙන්

---

265. එසඳ, ඒ කාලයෙහි ; දිගුමගැ, දීඝීමාර්ගයෙහි ; සැරැ, සඤ්චාරය කොට ; ඔබල, දුර්වලවූ ; කල්කල්නට, කලත්‍රවූ කාන්තාවන්ට ; මොලොකසැර, මෘදුභාවය ; පාමින් මෙන් ; ප්‍රකාශ කොට දක්වන්නාක්* මෙන් ; දිවයුරු, සූය්‍යීතෙම : අත්ගිරි, අස්තගිරිය, බිජී, භජනය කෙළේයි.

266 ලෙල, ලීලොපෙතවූ ; කිසල්පෙළ, පල්ලවපඞ්ක්තීන් ඇති ; නන්, අනෙකප්‍රකාරවූ ; ලියගුම්, ලතාගුල්මයන් ;† මද පිරිමැදැ, මදක් පරාමර්ශනය කොට ; මුවරඳ, මකරන්දයෙන් ; රැඳි, රඤ්ජමානවූ ; කොමල, කොමලවූ ; කොවුල්, කොකිලාවන්ගේ ;‡ සර, නාදයන් ; ඇඳැ, ආකර්ෂණය කොට ;§ පවන්, මන්දමාරුතය ; හමලේ, හැමී.

267. ලග්නා, ලැගුම්ගත්තාවූ ; මොනර මුළු, මයූරසමූහ තෙම ; තුරු, වෘක්ෂයන්ගේ ; වෙළපස්හි, විටපපාර්ශ්වයෙහි ; තුඩු, චඤ්චූන් ; පිරිමැදූ, පරාමර්ශනය කොට ; පවනින්, මාරුත යෙන් ; අඹළ, ආවෘතවූ ; පිල්බර, පිඤ්ඡභාරයන් ; ඉඳුකැරැ, ඍජු කොට ; කෙකාරැව් ගත්, කෙකාධ්වනි නැඟුයේයි.

268. රිවිකල්හු, සූය්‍යී නැමැති වල්ලභයා ; යත, (පරලොක යට) යන කල්හි ; හසවැල, හංසාවලී නැමැති ; මෙවුල්දම් හළ, මෙඛලාදාම දුරුකළාවූ ; විල් (කත), සරසි නැමැති කාන්තා තොම ; පියුම්දඟ, පියුම්මැදෙහි බඩවූ ; බිඟුරැව්නෙන්, භෘඞ්ග ධ්වනී කරණකොට ගෙණ ; වනසොවිනි, විරහශොකයෙන් ; ගුගුරා මෙන්, හඬන්නියක මෙනි.

---

* අඟවන්නාක්-බොහෝ.　　† ගුලඑයන්-හැම.

‡ කෙවුල් : කොකිලයන්ගේ-සම.　　§ සර; නාදයන් සහිතවැ (වූ)-හැම.

|| "විල්කල්" සී ඇතම් පොතක දක්නා නමුත් පරණ පොතක සන්නයෙහි පෙළට පහළින් "කත" යන්නක් ලියාතිබෙන නිසාත් මාත්‍රා වැඩි නිසාත් එය ගීයට ඇතුළත් නොකෙළෙමු.

269. දිවයුරුරැස් බියෙන්—පැල තම රැස් ගත්ගත්,
ගීවෙමින්*දසදෙසෙනා—සමත සමත සරසිරි.

270. සඳගරා සක්වළ—කොරොස් රිවිමෙණි තෙවුනා,
පතළ කරනළසියෙන්—දසනගවර කිරීමෙන්.

271. දිමුතුමෙණේ† දලනිදු—රුදුසුමුගත්හි නදන්,
කැරැ නිසකත් රක්නා—තමපියනෙතර දුන් වන්.

272. තමරැස්නුබඳ සඳ—කැලුම්පතර දිස්නේ,
ගුවන් නිසවමිය පළන්—කඩුපුල් පුල් විලස්නෙන්.

---

269. දිවයුරුරැස් බියෙන්, සූර්‍ය්‍යාගේ රශ්මිභීතියෙන්; පැල, කාන්දිශිකවූ;‡ ගත්ගත්, මූර්තිමත්වූ; තමරැස් ගීවෙමින්, අන්ධකාරරාශිආකාර වෙමින්, දසදෙසෙන් ආ දිශානුදිශාවෙන් සම්ප්‍රාප්තවූ; සමතසමත, පරභෘත§ සමත්ථයන්ගේ; සරසිරි, ධ්වනිය ඇසිරිනි.

270. සඳගරා, සන්ධ්‍යා නැමැති අඞ්ගරාගඇති.|| සක්වළ කොරොස්, චක්‍රවාල පර්‍වත නැමැති සරාවයෙහි; තෙවුනා, බබලන්නාවූ; රිවිමෙණි සූර්‍ය්‍යබිම්බ නැමැති මාණික්‍යය; පතළ, ව්‍යාප්තවූ ¶ කර, රශ්මි නැමැති; නළසියෙන්, නාලශතයෙන්; දසන, දශීනිය විසින්; අගවර කිරීමෙන්, අගතිවාර කිරීමෙන්:—

271. දිමුතුමෙණේ, දීප්තිමත්වූ ඒ මාණික්‍යය; දලනිදු, ජලනිධි නැමැති; රුදුසුමුගත්හි, මහත්වූ සමුද්‍රාභ්‍යන්තරයෙහි; නදන් කැරැ, නිධාන කොට; රක්නා, රක්‍ෂාකරන්නාවූ; නිසකත්, නිශාකාන්තාව විසින්; එතර, එව්ගස්හි; තම පියන දුන්වන්, අන්ධකාර නැමැති පිධානය දෙනලදැයි සිතමු.

272. තමරැස්නුබඳ, තමිස්‍රරාශිය විසින් අනුබද්ධවූ; සඳ කැලුම් පතර, සන්ධ්‍යාකාන්ති සමූහ ඇති; ගුවන්, ගගනයතෙම; නිසවමිය පළන්, නිශා නැමැති කාන්තාව විසින් ප්‍රසාධිතවූ: පුල්කඩුපුල් විලස්නෙන්, ඵුල්ලවූ කණ්ඩොත්පල විලාසයෙන්; දිස්නේ, දෘශ්‍යමාන වින්නේයි.

---

* ගීවිමෙන්-හැම. † දිමුතුමන්-බොහෝ. ‡ කානන්දිසිකවූ-හැම.
§ පරභුති-හැම. || සඳඟර-අඟාර ඇති-බො. ¶ ව්‍යක්තවූ-බො.

273. නොදැක්මෙන් රිවිඳු—දවකත සඳගවදනා,
සිඳැ විසුළ මුත්හර මෙන්—ගහරුස් දිසි නුබතෙලේ

274 විමලඹරවිල් සැදී—තමරුස් සෙවෙල් බිදුමට,
ගී කරනැඟු රජහස්—සරාසිසි දිසි මඳමඳ.

275. නිසයුරු දූදුරු කැරු—කුමුදු සමග වණින් සිත්,
දිරිය ඉහි බොම්නි තමස්—මුහුදෛද ඉහිඳු වැඩි දුක්.

276. මෙනෙ සක්වායුවල—පිරුණු දළසෝ ලෙස්නෙන්,
වැජඹි සිසිපා ලැබ ගෙල්—තමරුස් බියෙන් වන් වන්.

---

273. රිවිඳු, සූර්ය්‍ය නැමැති වල්ලභයාගේ ; නොදැක්මෙන්, අදර්ශනයෙන් ; සඳගවදනා, සන්ධ්‍යාකාන්ති නැමැති අග්නිප්‍රවෙශය කරන්නාවූ ; දවකත, දිවාකාන්තාව විසින් ; සිඳැ විසුළ, ඡින්න කොට විසීර්ණකළාවූ ; මුත්හර මෙන්, මුක්තාහාරයක් මෙන් ; ගහරුස්, ග්‍රහරාශිතෙම ; නුබතෙලේ, ආකාශතලයෙහි ; දිසි, දෘශ්‍යමාන වී.

274. විමලඹරවිල්, නිර්ම්මලවූ ආකාශ නැමැති තටාකයෙහි ; සැදී, ගැවසී සිටියාවූ ;* තමරුස්, තමිස්‍රරාශි නැමැති ; සෙවෙල්, ශෛවාලයන්ගේ ; බිදුමට, භොජනයට (දොහෝ නොහොත්) භෙදයට ; කරනැඟු, උත්කණ්ඨවූ ; රජහස්ගී, රාජහංසයෙකු බඳුවූ ; සරාසිසි, ප්‍රභාසහිතවූ චන්ද්‍රතෙම ; මඳ මඳ දිසි, මන්දමන්දව දෘශ්‍යමාන වී.

275. නිසයුරු, නිශාකරතෙම ; වණින්, විරහීන්ගේ ; සිත් සමග, හෘදය හා සමග ; කුමුදු දූදුරු කැරු. කෛරවයන් ජර්ජ්ජර කොට ; දිරිය ඉහි, ඔවුන්ගේ ධෛර්ය්‍යය හා සමග ; තමස් බොම්නි, අන්ධකාරය පානය කෙරෙමින් ; දුක් ඉහිඳු, ඔවුන්ගේ දුඃඛය හා සමග ; මුහුදෛද වැඩී, සමුද්‍රයාගේ ඔජස් වැඩී.

276.* වැජඹි, විජෘම්භිතවූ ; සිසිපාගෙල් ලැබ, චන්ද්‍රරශ්මීන් (දොහෝ නොහොත්) චන්ද්‍රපාදයෙන් ප්‍රහාර ලදින් ; බියෙන් වන් වන්, භීතියෙන් ප්‍රවිෂ්ටවූවාක් බඳුවූ ; තමරුස්, තමිස්‍රරාශියතෙම ; සක්වා යුවල මෙනෙ චක්‍රවාකයුගලයන්ගේ හෘදයෙහි ; දළසෝලෙස්නෙන්, මහත්වූ ශොකව්‍යාජයෙන් ; පිරුණු, පූර්ණ වී.

---

* ගැවසීගත්තාවූ-ඇතම්.

277. වෑ ද සෙමෙර සෙ දිගත—දිගඹුවනට සිඳුවර
මිහිකතට අහරා හෙළ—වැජඹී සුපුන් සිසිමෙරජ.

278. මිහිපඹුරු මල්දම්—කපුරුහර සඳනඟරා,*
හඟවමිනවුදු කෙළිකල්—මදදූනෙව් පුරවෙරේ.

279 මලිගියමල්දම් සුද—ඟර තවර හර අඹරෙන්,
සරා සිසිරැස් ගත්ගත්—ගී දූපියෝ පුරපියෝ.

280. කෙනකන ගී නඟමි—නි පෙද නඟමිනී නැමෙත්;
පියවුරුළගාය වුවන්—සමගාය තෙපියුම් වන්.

---

277. සුපුන්, සම්පූර්ණවූ; සිසිමෙරජ, චන්ද්‍රමරීචිතොමෝ; දිගත, දිග්දන්තීන්ට; සෙමෙරසෙවැද, චාමරාකාරවද; දිගඹුවනට, දික්කාන්තාවන්ට; සිඳුවර සේ වැ ද, සින්දුවාරාකාරවද; මිහිකතට, මහීකාන්තාවට; හෙළඅහරාසේ වැ ද, ශුභ්‍රාඞ්ගරාගාකාරවද; වැජඹී, විජෘම්භිත වූ.

278. මිහිපඹුරු, මධුප්‍රාභෘතද; මල්දම්, කුසුමදාමද; කපුරු, කර්පූරද; හර, මුක්තාහාරද; සඳනඟරා, චන්දනාඞ්ගරාගයද යන මොහු; මදදූනෙව්, කාමදූතයන් මෙන්; එ පුරවෙරේ, ඒ පුර ප්‍රවරයෙහි; කෙළිකල් හඟවමින්, ක්‍රීඩාකාලය ප්‍රකාශකෙරෙමින්; අවුදු, ඇවිද්දේය.

279. මලිගියමල්දම්, මාලතීකුසුමදාමය; සුදඟරාතවර, ශුභ්‍රාඞ්ගරාගචර්චිතය; හර, මුක්තාහාරය; අඹරෙන්, ශුභ්‍රාම්බරය යන මෙකී දෙය කරණකොටගෙණ; ගත්ගත්, ගාත්‍රයක් ගාත්‍රයක් පාසා;† සරා, ශරත්කාලයෙහි; සිසිරැස්ගී, චන්ද්‍රමරීචි ආකාරවූ; පුරපියෝ, පුරප්‍රියාවෝ; දූපියෝ, දර්පිත වූ.

280. කෙනකන, සමහර කෙනකුන්; ගීනඟමිනි, ගීත ගායනා කෙරෙමින්; පෙදෙනඟමිනි, කන්දුකොත්ක්ෂෙපණය කෙරෙමින්; නැමෙත්, නමනවන කල්හි; පියයුරුළගාය, පයොධරවයට සම්පවූ; වුවන්, වක්ත්‍රයතෙම; සමගාය තෙපියුම් වන්, සමග්‍රවූ පද්මත්‍රයක් බඳු වී.

---

* සඳුනාගරා-සන්න. † ගාත්‍රාග්‍රහණය කළාවූ-ඇතම්.

281. ඉමිනි ලැගිනි හෙම්—කළ අතලානෙතිනික්ටැඹ,
පෙණතුල උතුරුසයුරේ - සිරි ඉසිලි අවන්හල්.

282. මීකපුරු ගරු දුමින් - සපුදුනුකේ ලඹ දුන්,
මලියිය මල්දම් ලැල් නරඟ රඟ බිම්වූ හල්.

283. මලියියමල් දම්—සදල මහනෙල් ඇසැහි,*
සලසාගතෙව් මල්ගී—යස කෝ තෙදෙනරවරා

284. මමන පොද වත්සුන්—පැහැසර සරඟ මල්දම්,
බඳ මුහුලස හඟවා—ගනකුළුවට සුරිඳුසැව්.

---

281. හෙම් (මිණි) ඉමිණි, පස්බඳනක් දියගන්නා රන් සැළියෙන්ද ; හෙම්ලැගිනි ; මහත් කළයෙන්ද පස්කළයක් දිය ගන්නා ස්වර්ණභාජනයෙන්ද ; හෙම්කළ අතලානෙන්, අත ලයෙන් පස්අතලයක් දියගන්නා හෙමසටයෙන්ද ; හෙම්ඉනික්, මෙම කළයෙන් පස්කළයක් ගන්නා රන්පැනයෙන්ද ; හෙම් ටැඹ, ඒ පැනයෙන් දෙපැන භාගයක් ගන්නා ස්වර්ණ සනමහයෙන්ද යන මෙතෙක් මෙතෙක් භාජනයෙන් යුක්තවූ ; අවන්හල්, ආපානශාලාතොමෝ ; පෙණුතුල, ෆෙණයෙන් යුක්තවූ ; උතුරුසයුරේ, උත්තරසාගරයෙහි ; සිරිඉසිලි, ශ්‍රී දැරී

282. මීකපුරුගරුදුමින්, මධුකර්පූරයෙන් යුක්තවූ කෘෂ්ණා ගරුධූපයෙන්ද ; ලඹදුන්, ලම්බමානවූ ; සුපුදුනුකේ, චම්පක රාජකෙතකී කුසුමයෙන්ද ; මලියියමල්දම්ලැල්, මාලතී කුසුම දාමජාලයෙන්ද ; හල්, ආපානශාලාතොමෝ ; නරඟ රඟබිම්වූ ; අනඞ්ගයාගේ රඞ්ගභූමියක් බඳු වූ.

283 මලියියමල්දම්, මාලතීකුසුමදාමයෙන්ද ; සදල, ශාඩ්වල යෙන්ද (හෙවත්) හීතණයෙන්ද ; මහනෙල්, උත්පලදාමයෙන්ද යන මෙකී දෙය කරණකොට ගෙණ ; එනරවරා, ඒ නරොත්තම තෙම ; මල්ගී, අනඞ්ගයාගේ ; යස කෝතෙද, යශස්-කොප -තෙජස්-යන මේ ; ඇසැහි සලසාගත් එව්, අංසයෙහි සලසාගත් ත්‍යාක්හු මෙනි.

284. වත්සුන්පොද මමන, වාසචූර්ණ නැමැති වෘෂ්ටිබින්දු වැහෙන්නාවූ ; පැහැසර, ප්‍රභායෙන් සාරවූ ; සරඟමල්දම්බඳ අනෙකවර්ණ කුසුමදාමයෙන් බඩවූ ; මුහුලස, ධම්මිල්ලයතෙම ; ගනකුළුවට, මෙඝකූටවෘත්තයෙක්හි ; සුරිඳුසැව් හඟවා, ඉන්ද්‍රචාප යක් ප්‍රකාශ කෙළේ.

---

* ඇකහි-ඇතම්

285. දිමුතු මුතුබරණින්—මල්දියුලින්* රදනා,
සැදිනි මෙද නිරිඳුසඳ—පෙබයි හා මනකුමුදු.

286. පමාලිය කුමුදු—හරපොකුරුකුරු නෙත්මින්,
මිහිකළපියුම් හල්විල්—බිජී මිලොල් රජහස්.

287. පිළිබිඹු නෙතුපුලොත—නරනිඳු ලැදිපියක් දුන්,
මිහිවිතැ යෙහෙන් දිස්නා—උවනත මත් කෙළෙ පටන්.

288. නැත ද සෙස් පිළිමිණී—චිත් කතක මිහිමත්,
නහා දෙත සිණේරජ—රජ ලද බිසෙව්සිරි හා.

---

285. දිමුතු, දීප්තිමත්වූ; මුතුබරණින්, මුක්තාභරණයෙන්ද; රදනා, රඤ්ජමානවූ;† මල්දියුලින්, පුෂ්පද්‍රකුලයෙන්ද; නිරිඳුසඳ, නරෙන්‍ද්‍රචන්‍ද්‍රතෙම; සැදිනි මෙද, සජ්ජිත වූයේ මතු නො වෙයි; මනකුමුදු හා, හෘදයකෛරවයන්ද; පෙබයි, ප්‍රබොධ කෙළේ.

286. පමාලිය, ප්‍රමදාසමූහ නැමැති; කුමුදු, කෛරවඇති; හර, මුක්තාහාර නැමැති; පොකුරුකුරු, පුෂ්කරාඞ්කුරඇති; නෙත්මින් නෙත්‍ර නැමැති මීනයන් ඇති; මිහිකළ, මධුඝට නැමැති; පියුම්, පද්මඇති; හල්, ආපානශාලා නැමැති; විල් ‡ තටාකය. මිහිලොල්, මධුලොලවූ; රජහස්, රාජහංස තෙම; බිජී, භජනය කෙළේ.

287. නෙත්පිළිබිඹු, නෙත්‍රප්‍රතිබිම්බ නැමැති; උපුල් ඔත, බහාලනලද උත්පලඇති; ලැදීපියක දුන්, පාක්ෂිකවූ ප්‍රියාවක දෙනලද්දවූ; මිහිවිතැ, මධුචෂකයෙහි; යෙහෙන් දිස්නා, සුවසේ දෘශ්‍යවූ; උවනත, වක්ත්‍රයතෙම; නරනිඳු, නරෙන්‍ද්‍රයා; පටන් මත් කෙළෙ, ආසවඅපි කොට මත් කෙළේ.

288. මිහිමත් කතක, මධුමත්තවූ කාන්තාවකගේ; සෙස් නැතද, අවශෙෂ මධුවක් නැතද; පිළිමිණීචිත්, සළුවික මාණික්‍යචෂකය; නහා දෙත, උත්ක්ෂෙපණය කොට දෙන කල්හි; රජ, රාජතෙම; සිණේරජ. සම්න්තරාජ්‍යයෙහි; බිසෙව්සිරි හා ලද, අභිෂෙකශ්‍රී ලද්දේයි.

---

* දිඹුලින්-සම. † ශොභමානවූ-සම. ‡ සර-සම.

289. පැසි හිඟුරු අමදූ—පලහා කට මී මියුරු,
බමත් ඇතොරන් බී—සියලඟැ මද බුමුත් වන්.

290. සැහැ බද මැසි පියන්—මී බොත චිත තුබු*සෙස්,
සිරි ලද මෙද ලසඳ ඉඳු—පෙබයී හා මනකුමුදු.

291. සැකී දල් මහනෙල්—නෙත්පිළිබිඹු චිත්හී,
පුඹුතු මතෙයෝනන්—නරනිඳු සිනෙන් බිජී.

292. මද සැව් නඟා දිය—පිරිමදිමිනත්පල්ලෙන්,
බිමි නරදෙක් අත්ලා—පියන් තුනුලිය වදලේ.

---

289. පැසි හිඟුරු, ආලම්බවූ ශෘඞ්ගවේරය; අමදූ, ආස්වාද කොට; කට පලහා, මුඛය සපෂ්ට කොට; මියුරුමී බී, මධුරවූ මධු පානය කොට; බමත්, භ්‍රමත් වන්නාවූ; ඇතොරන්, අන්තඃපුරවධූන්ගේ; සියලැඟැ, සකලාඞ්ගයෙහි; මද, අනඞ්ග තෙම; බුමුත් වන්, ආවිෂ්ට වූවාක් බඳුයි.

290. පියන්, ප්‍රියාවන්; බදමැසි, බඩවූ ආමෂීය;† සැහැ, ක්‍ෂමා කොට; මී බොත, මධුපානය කරණකල්හි; චිත තුබු සෙස්, චෂකයෙහි තිබූ අවශෙෂයතෙමේ; ලසඳසිරි ලද මෙද, අයි නවචන්ද්‍රයාගේ ශ්‍රීලද්දේ මතු නොවෙයි; ඉඳු, නරෙන්ද්‍රයාගේ; මනකුමුදු හා පෙබයී, හෘදය නැමැති කෛරවද ප්‍රබොධ කෙළේයි.

291. මත් එ යෝනන්, මත්තවූ ඒ අඞ්ගනාවන්; චිත්හී, චෂකයෙහි නෙත්පිළිබිඹු, නෙත්‍රප්‍රතිබිම්බය; මහනෙල්දල සැකී, උත්පලපත්‍රයෙකැයි ශඞ්කා කොට; පිඹුතු, ආඝ්‍රාණය කරණකල්හි; නරනිඳු, නරෙන්ද්‍රතෙම; සිනෙන් බිජී, ස්මිත යෙන් ශොභිත වී.

292. මද, අනඞ්ගතෙම; සැව් නඟා, චාපාරොහණය කොට; අත්පල්ලෙන්, හස්තපල්ලවයෙන්; දිය පිරිමදිමින්, ජගත්‍රය පරාමර්ශනය‡කෙරෙමින්; එක් නරද අත්ලා, එක් නාරාචයක් අතලා; පියන් තුනුලිය වදලේ, ප්‍රියාවන්ගේ ශරීර නැමැති ලතාගුම්බයෙහි; බිමි, භ්‍රාන්ත වී.

---

* තිබූ-සම. † අමෂීණය-සම. ‡ ආප්පරාමර්ශනය-බොහො.

203. එත ගමනුකහා—නරනිඳු ඇකපහස් වස්,
රසන් නුරුගොස් යෝනන්—කියළි නරඟ තුරු ගොස්.

294. කලකද කදවිතැ—සරා සිසිබිඹුසේ හෙත,
මේ කලදෝ තැරි වී—කැරැ සැකි අසක් නැරැඹූ.

295. සිසිරැස්රැස් දෙලෙ—නුදුල රඟකිරිමුහුදුහි,
රළෙව් රඟොත යොනෝ—හිමසඳුනඟ පහානෝ.

296. රඟොත මතඟනක—ඉහිල් වසන්දෙසේ නෙත්,
තහත පියොදමිනෙනිරිඳු—කෙළෙ මීමතවම වෙසෙස්.

---

293. නරනිඳු, නරෙන්ද්‍රයාගේ; ඇකපහස්වස්, අඞ්කස්පර්ශය පිණිස; යෝනන්, අඞ්ගනාවන්; ගමන් උකහා එත, ගමන් ගෙණ එනකල්හි; රසන් නුරුගොස්, රසනානූපුර ධ්වනියතෙම; නරඟ, අනඞ්ගයාගේ; තුරුගොස් කියළි, තූර්‍ය්‍යඝෝෂා හැඟවී.

294. කදවිතැ, කාචවෂකයෙහි; සරාසිසිබිඹුසේ හෙත, ශරච්චන්ද්‍රබිම්බයාගේ ජායාව හෙනකල්හි; කලක්, කාන්තාවක්; අද, අවුත්; මේ කලදොතැරි වී, මාගේ කලධෞත චෂකයෙහි දොහෝසි කියා; සැකි කරු, ශඞ්කා කොට; අසක් නැරඹූ, මදක් නිරීක්‍ෂණය කළා.

295. සිසිරැස්රැස්, චන්ද්‍රරශ්මිසමූහ නැමැති; දෙලෙන්, ජලයෙන්; උදුල, උජ්ජ්වලිතවූ; රඟකිරිමුහුදුහි, රඞ්ග නැමැති ක්‍ෂීරාර්ණවයෙහි; හිමසඳුනඟ පහානෝ, හිමාලය චන්දනය අඞ්ගප්‍රසාධනය කොට ඇති; රඟොත, නෘත්‍යගත්තාවූ; යෝනෝ, යුවතීහු; රළෙව්, තරඞ්ගයන් වැනි වූ.

296. රඟොත, නෘත්‍යාරම්භ කළාවූ; මතඟනක, මත්තාඞ්ගනාවකගේ; ඉහිල්වසන්දෙස්, ශිථිලවස්ත්‍රප්‍රදෙශයෙහි; එනිරිඳු, ඒ නරෙන්ද්‍රතෙම; නෙත්, නෙත්‍රය; තහත, අනවරතයෙන්; පියොදමින්, මෙහෙයමින්; මීමතවම, ඒ මධුමත්තාවම; වෙසෙස් කෙළෙ, විශිෂ්ට කෙළේයි.

297. දිසි මිහිවිත් ලඟ—සසල සිසිබිඹු යෝනන්,
ළවනත බලා වරද හැඟෑ—සහවෙම්නුදු* තෙනේමෙන්.

298. බොම්සී තුඩට ලඟ—මීවිතැ කලක නෙත්කල්.
වුවන් පිලිබිඹු ගෙන වී—බඟහරම්නෙක් රජහට.

299. කතක මී මියුරු—කැරු දෙන තුඩ පහරවා,
වහා නොගත එ වරද – පියවනුය පියතෙපලින්.

300. තොට නොසිම්යේ† කිය—ග තොප තුඩග වැකිතැන්,
වියත ඉති නිරිඳු සී—පියකල් මැසී පිය පෙවූ.

---

297. ලඟමිහිවිත්, සමීපවූ මධුවෂකයෙහි ; දිසි දෘශ්‍යවූ ; සසල සිසිබිඹු, චඤ්චලවූ චන්‍ද්‍රබිම්බයතෙමේ ; යෝනන්. යුවතීන්ගේ ; ළවනත බලා, වක්‍ත්‍ර නිරීක්‍ෂණය කොට ; සහ වෙම්නුදු, සමානවෙමිසී යන ; වරද හැඟෑ, අපරාධය සලකා ; තෙනේ මෙන්, කම්පිත වන්නාක් මෙනි.

298. බොම්සී, පානය කෙරෙමිසී ; තුඩට ලඟ, මුඛාසන්නවූ ; මීවිතැ, මධුවෂකයෙහි ; කලක, කාන්තාවකගේ ; නෙත්කල්, නෙත්‍රයට කාන්තවූ ; වුවන්පිළිබිඹු ගෙන, වදනප්‍රතිබිම්බය ගෙනකල්හි ; රජහට, රාජයාහට ; බඟහර, මධුව ; අම්නෙක් වී, අප්‍රමාණ වී.

299. කතක, කාන්තාවක ; මී, මධුව ; තුඩ පහරවා, මුඛයෙහි පහරවා ; මියුරු කැරු දෙන, මධුර කොට දෙනකල්හි ; වහා නොගත එ වරද, ශීඝ්‍රව නොගත්තාවූ ඒ අපරාධය ; පියතෙපලින්, ප්‍රියවචනයෙන් පියවනුය, දුරකරන්නේයි.

300. තොට නොසිම්යේ, කීර්තිය නොහැඟින ; තොප තුඩග වැකි තැන්, තොපගේ තුණ්ඩාග්‍රයෙන් සපශී කළාවූ ස්ථානය ; කියග, කථනයකරග යි ; නිරිඳු, නරේන්ද්‍රයා ; ඉති වියත, මෙසේ කියනකල්හි ; පියකල්, ප්‍රියවූ කාන්තාවෝ ; සී, හාස්‍යකොට ; මැසි පිය, ආමක්‍ෂිය දුරුකොට ; පෙවූ, පානය කර වූ.

---

* වෙම්නිදු-සමහර. † නොසිම්යෝ-සම.

301. මීවිතැ දිසි සිසිබිඹු—නි සළාහළ විලස් ගත්,
සුරත වුවනත යෝනන්—නරනිඳු හැසී නෙත් සිත්.

302. දූනවීමෙන් නුවනක—රත උවනත සේබිඳු,
ලවනත කැළුම් බීමෙන්—සිරි ලද මී පිය පියන්.

303. මත පුරයෝනන්—උවනත සඳකැල්මේ,
පළ සේබිඳු ගහගහල—සිනේ සිසිලේ වන් වී.

304. වැලැතැ එකක කතක*—බිබී දුනඩබැල්මෙන්,
මීවිත් උතුළ වන් වී—නරනිඳු රතුපුල්දෙලෙන්.

---

301. මීවිතැ, මධුචෂකයෙහි; දිසි, දෘශ්‍යවූ; සිසිබිඹුනි, චන්‍ද්‍රබිම්බය කරණකොට ගෙණ; සළාහළ, නිමේමාක† හළ වාවූ විලස්ගත්. විලාසය ගත්තාවූ; යෝනන්, යුවතීන්ගේ; සුරත උවනත,‡ සුරක්තවූ වදනයතෙම; නරනිඳු, නරෙන්‍ද්‍රයාගේ නෙත්සිත් හැසී, නෙත්‍රචිත්තාකර්‍ෂණය§ කෙළේ.

302. මී, මධුවතෙම; පියන්, වල්ලභයන්ගේ; නුවනත, නෙත්‍රයෙහි; රත දූනවීමෙන්, රක්තය ඉපදවීමෙන්ද; උවනත, වක්‍ත්‍රයෙහි; සේබිඳු දූනවීමෙන්, ස්වෙදබින්දු ඉපදවීමෙන්ද; ලවනත, අධරයෙහි; කැළුම් බීමෙන්, කාන්තිපානයෙන්ද; පියසිරි ලද, වල්ලභශ්‍රී ලද්දේයි.

303. මත පුරයෝනන්, මත්තවූ පුරාඞ්ගනාවන්ගේ; උවනතසඳකැල්මේ, වක්‍ත්‍ර නැමැති සන්ධ්‍යාකාන්තියෙහි; පළ, ව්‍යක්තවූ; සේබිඳු, ස්වෙදබින්දුතෙම; ගහගහළවන්වී, තාරකා සමූහ බඳු විය; සිනේ, ස්මිතය; සිසිලේ වන් වී, ශශලේඛා බඳු වී.

304. නරනිඳු, නරෙන්‍ද්‍රයා; එකක වැලැතැ, එක් කාන්තා වක ආලිඞ්ගනය කරණ කල්හි; කතක, අන්‍ය කාන්තාවක; බිබී, මධුපානය කොටකොට; දුනුඩබැල්මෙන්, දෙනලද්දාවූ අභිනිරීක්‍ෂණය කරණකොට ගෙණ; මීවිත්, මධුචෂකයතෙම; රතුපුල් දෙලෙන් උතුළ වන් වී, රක්තොත්පල පත්‍රයෙන් ඉතිර ගියාක් බඳු වී.

---

* වැලලත එකඑක කත-සම.
‡ වදනත-සම.

† නිමේමාහක-නිර්මාහක-හැම.
§ නයනෞහෘදයකරවාපූර්ණය-සම.

305. කතක බොන මීවිත්—හී හෙත කියඹු සිඳුවර
දුරලන්නසින් පිඹියේ—මුවම් ගතෙනරවරා.

306. වෙණනු සලි කල්—සම මදර තර ගම්රා,
ගනුත් නිසන් රඟහී—නරනිඳු ඇසි සේපියන්.

307. ලියදෙන් අන්තලිරා—නඟත මතකතන නිරිඳු,
නුපුපුලේ අඟ* නුවනින්—සුලු දෙලේ නොගිලීමත්.

308. සපිරිනු නො සපිරුණු—සහස සිලුමහ† කරණ,
ගත ගත ඇතොරන්කැන්—වද අතඹතෙ නරපවර.

---

305. කතක, කාන්තාවක විසින්; බොන, පානය කරන් නාවූ; මීවිත්හී, මධුවචෂකයෙහි; කියඹු සිඳුවර හෙත, අලක සින්‍ධුවාරයන් පතිතවන කල්හි; දුරලන්නසින් පිඹියේ, ඒ ඒ දුරුකරණ අභිප්‍රායෙන් ආධ්මානය කළාවූ; ඒ නරවරා, ඒ නරොත්තමතෙම; මුවම් ගත්, මුඛමධුව පානය කෙළේ.

306. සේ පියන්, ජෙකප්‍රියාවන්; රඟහී, රඞ්ගයෙහි; වෙණ, වීණාවට; අනු, අනුව; සලි, ලය‡ සහිතව; කල්, මනොඥව; සමමදරතර, සමය මධුරය තාරය යන; ගම්රා ගනුත්, ග්‍රාමරාව ගනුත්; නිසන්, නිශ්‍යබ්දව; නිරිඳු, නරෙන්‍ද්‍රතෙම; ඇසි, ශ්‍රවණය කෙළේ.

307. මතකතන, මත්තවූ කාන්තාව; ලියදෙන්, අන්තලිරා නඟත, ලය§වයෙන් යුක්තවූ අන්තලීරාගය නඟන කල්හි; නිරිඳු, නරෙන්‍ද්‍රයාගේ; අඟනුපුපුලේ, අඞ්ගදාභරණය නොපි පිරුණ; නුවනින් සුලු දෙලෙ, නයනයෙන් චුතවූ සන්තොෂ බාෂ්පයෙන්; නොගිලීමත්, නුගලානොමවූ.||

308. ඒ නරපවර, ඒ නරප්‍රවරතෙම; සපිරිනු නො සපිරුණු, සම්පූර්ණය අසම්පූර්ණය; සහසසිලුමහකරණ, සහසවය සිලුමහකරණය යන ස්තර; ඇතොරන්කැන් ගත ගත, අන්තඃපුර වධූසමූහයන් ගායනා කරත් කරත්; වද අත ඔත්, වාද්‍ය හසතයෙහි ඔත්තේයි.

---

* හඟු-ඇතම්. † සිල්මග; මත-සම. ‡ ලීලා-බො.
§ තාල-ඇතම්. || නුගලාම්නොමත්නු-සම-

309. වසම්ලියනු ගී—කියත සහ යොග යෝනන්,
මියුරු කළ තැන් එ නිරිඳු—රිසි බඳ නිබඳ වම්යන්.

310. ඉති පිවිතුරු ගඳෙව්—නි නන්අවන්කෙළිගෙන්,
මී මත කලුන් ඉහි රජ—අවරඹරෙ සඳ රුඳවී.

311. සහ තර තරුවැල—නුදුල ගුවනෙව් තෙවුනා,
විසුරු අසෙනිය කුසුම්—සුනිල් මිණිබිම් රඳනා.

312. මුවරදදඳුම් නිදි—කලස කුසුමතළයහන්,
වෙලෙප්* මලෝලඹු දුන්—කළ බිත් විසිත් සිත්තම්.

---

309. සහයෝගයෝනන්, අභ්‍යාස සහිතවූ යුවතීන්; වසම් ලියනු ගී කියත, විෂමලයාන්විතවූ ගීතය කියන කල්හි; එ නරනිඳු, ඒ නරෙන්ද්‍රයා; මියුරු කළ තැන්, මධුර කළාවූ ස්ථානය; වම්යන් රිසි, අඛනාවන්ගේ ඉච්ඡාව; නිබඳ බඳ, නිරන්තරයෙන් බැන්දේයි.

310. ඉති, මෙසේ; පිවිතුරු ගඳෙවනි, පවිත්‍රවූ ගාන්ධර්ව යෙන්ද; නන් අවන්කෙළිගෙන්, නානා අපානක්‍රීඩායෙන්ද; රජ, රාජතෙම; මී මත කලුන් ඉහි, මධුමත්ත කාන්තාවන් හා එක්ව; අවරඹරෙ සඳ රුඳවී, අවරාම්බරයෙහි චන්ද්‍රයා රැඳැවී.†

311. සහ තර, ශොභාසහිතවූ; තරුවැලන්, තාරකාවලීන්; උදුල, උජ්ජ්වලිතවූ; ගුවනෙව් තෙවුනා, ගගනය මෙන් බබලන්නාවූ; විසුරු, විසිණිණ කළාවූ; අසෙනිය කුසුම්, අවිවනිය‡ කුසුම ඇති; සුනිල්මිණිබිම් රඳනා, සුනීලවූ මාණික්‍ය භූමියෙන් (රඤ්ජමානවූ) බබලන්නාවූ :—

312. මුවරදදඳුම්, මකරධ්වජධූමයෙන්ද; නිදිකලස, නිද්‍රා කලසයෙන්ද; කුසුමතළයහන්, කුසුමාස්තරණශයනයෙන්ද; මලෝලඹු දුන්, මාලා අවලම්බනය දුන්නාවූ; වෙලෙප්, ශ්වෙත විතානයෙන්ද; විසිත් සිත්තම් කළ බිත්, විචිත්‍ර චිත්‍රකර්මාන්ත කළාවූ භිත්තියෙන්ද උපලක්ෂිතවූ :—

---

* මෙලප්-මෙලක්-හැම. † රඤ්ජමානදැවි-බො. ‡ අචිවනිය-බො.

313. බිජී යහන් සිරිගේ—සුදඅත යත ඇතොරන්,
නුවනත පසින් හැම්නූ*—මෙහෙසුන්කල ඉහි නිරිඳු.

314. වැජඹි දියඅත සඳය‡ ඇතොර සඳය දුලුසඳය,
කල්බඳනාය අවන්පබඳය මෙ කියූ සග.

## සවන සග.

---

315. එතර නිරිඳු සිත්—ඉහි ලියසැව්ව හයමින්,
ලියසැව් කඩ ඉහි කුසුම්—දූවවී තෙද මද තමා.

316. පියයුරෙනි‡තැවරු—කොකුමඟරා උරතෙලේ,
වැලලත§ මැඹිලි දුන් වන්—මදරද කිදගෙ වදමට.

---

313. ඇතොරන්, අනතඃපුරවධූන් ; සුදඅත යත, සුධාන්ත යට යනකල්හි ; නුවනත පසින් හැම්නූ, නයනපාශයෙන් රඳවනලද ; මේහෙසුන්කල ඉහි, මහෙසිකා කාන්තාවක හා එක්ව ; නිරිඳු, නරෙන්ද්‍රතෙම ; සිරිගේ, ශ්‍රීගෘහයෙහි ; යහන් බිජී, සයනය සෙවනය කෙළේ.

314. දියඅත වැජඹි සඳය, ජගදන්තරයෙහි විජෘම්භිතවූ සන්ධ්‍යාකාන්තියද, ඇතොරසඳය, අනතඃපුරවධූන්ද ; දුලුසඳය, ජ්වලිතවූ චන්ද්‍රයාද ; කල්බඳනාය; කාන්තාදෙහින් විසින් අනුබඩවූ; අවන් පබඳය, අපානප්‍රබන්ධයන්ද ; මෙ කියූ සග, මේ කථනය කළාවූසගීයයි.

ෂෂ්ඨ සගීයයි.

---

315. ලියසැව්, අනඞ්ගතෙම ; එතර, ඒ ක්ෂණයෙහි ; නිරිඳු සිත් ඉහි, නරෙන්ද්‍රයාගේ චිත්තය හා සමග ; ලියසැව්ව හය මින්, ලතාචාපය ආකර්ෂණය කෙරෙමින් ; කුසුම්කඩ ඉහි, කුසුම කාණ්ඩය හා එක්ව ; තමාතෙද මද, තමාගේ තෙජස්ද මදද ; දූවවී, ධාවනය කැරවී.

316. වැලලත, ආලිඞ්ගනය කරත්ම ; කොකුමඟරා තැවරු, කුඞ්කුමාඞ්ගරාගයන් චර්චනය කරණලද්දාවූ ; පිය

---

* හම්නූ-හැමූනූ-සම. † දියඅතවැජඹිසඳය-සම.
‡ පියයුරෙහි-බෝ: § වලදුත-ඇතම.

317. සවසනෙලෙ යතමෙන්—ලවනත රතුවුවන්ගත්,
වළඳුතු ලපිරුණු නුරා—නුව නග වහන් ගත් මෙන්.

318. දුවනත අවුදු පා—මිණිමෙවුල් රැවු කන් ගත්,
හැනී නිරකුරු ගිගුරු—දියගොස් මෙන් තුනුවනා.

319. හෙත දුවනත නෙත—සදත සුරතතතඹරෙන්,
නරඹත අත කර පහා—තනබරිනුර සැදූ යළ.

320. මිණිදූල්සිදින් වත්—නලනු ලඹ කුසුම්දම්
කදහස වැටුප්මරුයෙන්—පියදෙවුහුදු හිදු ගත්.

---

වුරෙනි, පයොධරය කරණකොට ගෙණ ; මදරද හිදගෙවද මට, කාමරාජයාගේ හෘදය නැමැති ගෘහප්‍රවෙශවීමට ;* උර තෙලේ, වක්‍ෂස්ථලයෙහි ; දුන්, දෙනලද්දාවූ ; මැඩිලි වත්, මණ්ඩලයක් බඳුවූ.

317. වලඳුතු ආලිඞ්ගනය කරත්ම ; සවසනෙලෙයතමෙන්, සායාහනමාරුතයාගේ† ප්‍රහාරයෙන් ; ලවනත රතුවුවන් ගත්, අධරයෙහි රක්තමය වක්‍ත්‍රය ගත්තාක් මෙන් ; ලපිරුණු නුරා, හෘදයපූරිතවූ අනුරාගය ; නුවනගවහන්ගත්මෙන්, නයනාග්‍රයෙන් ප්‍රවාහයක් ගත්තාක් බඳුයි.

318. දුවනපාඅවුදු, ජඝනපාදයෙහි ආධාවනය කරන්නාවූ ; මිණිමෙවුල්රැවූ, මණිමෙඛලාධ්වනියතෙම ; නිරකුරුගිගුරු හැනී, නිරක්‍ෂරනාදය හා එක්ව ; තුනුවනා දියගොස් මෙන්, අනඞ්ගයාගේ ජයඝොෂාවක් මෙන් ; කන් ගත්, ශ්‍රවණ කර්ණය කෙළේයි

319. දුවනත, ජඝනයෙහි ; නෙත හෙත, නෙත්‍රය පතිත වත්ම ; සුරතතතඹරෙන්, සුරක්තවූ හස්තතාමරසයෙන් ; සදත, ඡාදනය කරණ කල්හි ; අතකර පහා, හස්තය පහ කොට ; නරඹත, බලනකල්හි ; යළ, නැවත ; තනබරින්, පයොධරභාරයෙන් ; උර සැදූ, වක්‍ෂඃස්ථලය ඡාදනය කළා.

320. මිණිදූල්සිදින් වත්, මාණික්‍යජ්වලඡිද්‍රයෙන් ප්‍රවිෂ්ටවූ ; නලනුලඹකුසුම්දම්, මාරුතයට අනුවූ ලම්බකුසුමදාමයතෙම ; කදහස වැටුප්මරුයෙන්, කදාචිත්කාලයෙක්හි ප්‍රදීපාලොක නිවාරණය පිණිස ; පියදෙව්හුදු, ප්‍රියාවද වල්ලභයාද ; හිදුගත්, හෘදයාග්‍රහණය කෙළේ.

---

* ප්‍රවෙශයට-සම.　　　　† සවසානිලයාගේ-ඇතම්.

321. සමරදෙලෙනද ලෙහි—තමා පිළිබිඹු මගමින්,
කියූ වදනෙක අදහා—වැළඳ කලක්* සෙද නිරිඳු.

322. කොපොල්තෙලෙ පතලේ—කොකුමඟරා පියවුරේ,
සමරදෙලෙනද වැ ගලත්—පිවිටෙව් නුරෙව්හු උරේ.

323. නරතුරු දිගත්හි—පතළ තා යස මෙන්.
දසඅත් වසා බට හිම—රජ සිළුමිණිකිණු සරණ.

324. දුරුකෙළේ අලුයම්—බෙරමේගොස් පියතමන්.
උරවිල් ලැගුම් ගොස් ගත්—අබිසරුවන් තනහසුන්.

---

321. සමරදෙලෙනද, ශ්‍රමජලයෙන් ආර්ද්‍රවූ; ලෙහි, හෘදයෙහි; තමා පිළිබිඹු මගමින්, තමාගේ ප්‍රතිබිම්බය බලමින්; කියූ වදනෙක අදහා, කීවාවූ වචනයක් අදහා ගෙණ; කලක්, කාන්තාවක්තොම; නිරිඳු ,නරෙන්ද්‍රයා; සෙද වැළඳ, දෘඪව ආලිඞ්ගනය කළා.

322. කොපොල්තෙලෙ පතලේ; කපොලස්ථලයෙහි පත්‍රලේඛාද; පියවුරේ කොකුමඟරා, පයොධරයෙහි කුඞ්කුමාඞ්ගරාගද; සමරදෙලෙනදවැ; ශ්‍රමජලයෙන් ආර්ද්‍රව; ගලත්, ගිලිහෙනකල්හි; එව්හු උරේ, ඔහුගේ වක්‍ෂස්ථලයෙහි; නුරා පිවිටෙව්, අනුරාගය ප්‍රවිෂ්ටවූවාක් බඳු වී. [පොබයන්නසින්, ප්‍රබුඩ කරණ අභිප්‍රායෙන්; මෙ වී, මෙසේ කථනය කෙළේ.]

323. රජසිළුමිණි, රජදරුවන්ගේ චූඩාමාණික්‍ය (කෘෂ්ණ) යෙන්; කිණුසරණ, කෘෂ්ණවූ චරණ ඇති; නරතුරු, නිරන්තරයෙන්; දිගත්හි පතළ, දිගන්තයෙහි පැතුරුණාවූ; තා යස මෙන්, තාගේ යසස මෙන්; හිම, හිම (සමූහ) යතෙම; දසඅත් වසා බට, දිශාන්තඡාදනය කොට බටී.

324. අලුයම් බෙර, ප්‍රත්‍යූෂභෙරි නැමැති; මේගොස්, මෙඝධ්වනියතෙම, පියතමන්, වල්ලභයන්ගේ; උරවිල් ගොස්, වක්‍ෂස්ථල නැමැති තටාකයට ප්‍රයාණය කොට; ලැගුම් ගත්. ආවාසය† කළාවූ; අබිසරුවන් තනහසුන්, අභිසාරිකාවන්ගේ ස්තන නැමැති හංසයන්; දුරුකෙළේ, දුරීභූත කෙළේ

---

* මැළලූවකල්-බො. † වාසය-සම.

325. ත සතර කත නෙත —දලබිඳු හෙන් සඳනනෙන්,*
කොපුලත ළඟ රතතලේ—තඹරතෙහි හුනු බිඟුලේ.

326. පවනිනි මද කෙළි—සුපුන් සසක් මෙරජ කිඳු,
අවරදලනිදු විදුමෙන්—ලැසුනුදුල මිණිඅතලෙව්.

327. එකලුයම් සිරිවම්—ස ලෝ නුවන් ගන්නා,
උදුගිරු අවරසඳ—සවණත්හි පෙද වන් වි.

328. තුඩුඩුතැලි කැරැ හිඳැ†—සහයුරු තුරුවෙලෙප්හි,
දිගැලි සමත කළ රැව්—සිහිලැල් බොලඳු මඳමරු.

329. සාමුව පින්මෙන් —බැසැ සා නැඟෙත යොරයොර,
තුරුපෙත් නන්සිදන්වන්—කැදීමෙන් මුවන්කැන්.

---

325. තසතරකතනෙත,' තාගේ ශත්‍රුකාන්තාවන්ගේ නෙත්‍රයෙහි ; දලබිඳු, ජලබින්දු ; කොපුලතලඟ රතතලේහෙන්,‡ කපොලස්ථලයට සමීපවූ රක්තවූ ගණ්ඩතලයෙහි පතිතවූවාක් මෙන් ; බිඟුලේ, භෘඞ්ගලේඛාතොම ; සඳනනෙන්, කෛරවයෙන් ; තඹරතෙහි හුනු ; තාමරසාභ්‍යන්තරයෙහි පතිතවූ.

326. පවනිනි, මාරුතයෙන් ; මදකෙළි, මඳක් චලිතවන ;§ සුපුන්සසක්, සම්පූර්ණශශාඞ්කයාගේ ; මෙරජකිඳු, මරීචිරාජියෙහි ; විදුමෙන්, දීඝකිරීමෙන් ; අවරදලනිදු, අපරසාගරයතෙම : ලැසුනුදුල, ලසත|| උජ්ජ්වලවූ ; මිණිඅතලෙව්, මාණික්‍යස්ථලයක් මෙනි.

327. ලෝනුවන් ගන්නා, ලොකයාගේ නෙත්‍රග්‍රහණය කරන්නාවූ ; එකලුයම් සිරිවමිය; ආගාමිවූ අරුණෝදය ශ්‍රීකාන්තාවගේ ; සවණත්හි, ශ්‍රවණාන්තයෙහි ; උදුගිරු, උදයසූර්‍ය්‍යාද ; අවරසඳ, අපරචන්ද්‍රයාද ; පෙද වන් වී, තාඩඞ්කද්වයක් බඳුවී.

328. සිහිලැල් බොලඳු මඳමරු අත්‍යර්ථයෙන් ශීතලවූ ඝනවූ ප්‍රභාත මන්දමාරුතයතෙම ; සහයුරුතුරු වෙලෙප්හි, සහකාරද්‍රුමවිටපයෙහි ; තුඩුලඩුතැලී කැරැ. චඤ්චුව ඌර්ධ්වමුඛ කොට ; හිඳැ, නිෂණ්ණවූ ; සමත කළ රැව්, කෙරවන් විසින් කරණලද්දාවූ නාදය ; දිගැලි, දීර්ඝ කෙළේ.

329. සාමුවපිම්මෙන්,* ශාඛාමෘගයන්ගේ උල්ලඞ්ඝනයෙන් ; යොරයොර, එක්වන් ; සා, ශාඛාසමූහයන් ;¶ බැසැනැඟෙත, අවනතවැ උන්නතවන කල්හි ; තුරුපෙත්, වෘක්ෂපඞ්ක්ති

---

* නෙත්සඳනෙන්-හැම † තෙලිතුඩුහිඳ-බො. ‡ නෙක-නෙත-හැම.
§ චලිතවූ-සම. || ලසන-හැම. ¶ සාමුවන්, ශාඛාමෘගයන්-හැම.

330. මැඩෑ පිරිපත්න යස—ත තෙදසෙයින් වඩනා,
දිවූ දිවයුරුරස්රැස්—කෙළෙ පියවිළි සිසිරස්.

331. සිසිකල්හු යත හළ—වනසෙව්නි මෙන් වනපෙත්,
පලන් මොනරිඳුවරකැන්—සිසිකැත් හැලි දිමුත්හර

332. සුරාදිවයුරු කර—වසනත්හි දෙත් විල්කල්,
තඹර විලෙනුතුළ කෙසර—දසනගැරැ පෑ මඳ මඳ.

333. පියදූ හිරුපියා—විල්කත් කැලුම් රන්පත්,
කියවා මෙනැත් බිඟුගොස්—මිණිද්දිරි තඹරමියෙන්.

---

තොම ; නත්සිදන් වන්, නානාඅඛනසථානයට ප්‍රවිෂ්ටවූ ; මුවන්කැන්, මෘගසමූහයන් ; කැඳිමෙන්, කැඳවන්නාක් බඳුයි.

330. පිරිපත්න යස, ප්‍රතිපක්ෂයන්ගේ යසස ; මැඩෑ වඩනා, මර්දනයකොට වර්ධමානවූ ; ත තෙද සෙයින්, තාගේ තෙජසක් මෙන් ; දිවූ; ධාවනය කළාවූ ; දිවයුරුරස්රැස්, සූර්‍ය්‍යයාගේ රශ්මි රාශියතෙම ; සිසිරස්පියවිළි කෙළෙ, චන්ද්‍ර කාන්තිය පාද පට* කෙළේ.

331. සිසිකල්හු යත, චන්ද්‍ර නැමැති වල්ලභයා යනකල්හී ; වනපෙත්, වෘක්ෂපඞ්ක්තිතොම ; වනසෙව්නි මෙන්, විරහ ශොකයෙන් මෙන් ; පලන් මොනරිඳුවරකැන්, ප්‍රසාධිතවූ මයූරරාජ නැමැති ඉන්ද්‍රිවරකලාපයද ; සිසිකැත් හැලිදිමුතු හර, චන්ද්‍රකාන්තිනිර්ඣර නැමැති දීප්තිමත්වූ මුක්තාහාර යද ; හළ, දුරුකළා.

332. සරාදිවයුරු, ශරද්දිවාකරයා ; කර, රශ්මි (ද්‍යො හෝ නොහොත්) හස්තය ; වසනත්හි, ජලාන්තයෙහි (ද්‍යො හෝ නොහොත්) වස්ත්‍රාන්තයෙහි ; දෙත්, දෙනකල්හි ; විල්කල්, තටාකකාන්තාතොමෝ ; තඹරමියෙන් ; තාමරස නැමැති මුඛ යෙන් ; උතුළ, උදගතවූ ; කෙසරදසනග, කෙශර නැමැති දසනාග්‍රය ; මඳමඳ ඈර පෑ, මන්ද මන්ද කොට හැරදක්වා.

333. විල්කත්, සරසි නැමැති කාන්තාතොමෝ ; හිරු පියා, සූර්‍ය්‍ය නැමැති වල්ලභයා විසින් ; පියදූ, මෙහෙයනලද ; කැලුම් රන්පත්, කාන්ති නැමැති සුවර්ණපත්‍ර ඇති ; ඇත්බිඟු ගොස්, ඇතුළත්හි භෘඞ්ගඝොෂාඇති ; මිණිද්දිරි, මණිජඣ්ඣරවූ ; තඹරමියෙන්, තාමරස නැමැති මුඛයෙන් ; කියවා මෙනි, කියවූවාක් මෙනි.

---

* පබ-පාබ-බිඹ-හැම.

334. ඉති පවසත ගත—ලියගී ගඳෙව්මඬලෙන්,
නිදි පිසින් මෙද නිරිඳු*—සවන්රසයින් හා වින්.

335. හුවා ඇඹෙත අත—වලා පළු තොතැන්නේ,
සුරතුරු පැ වඩනා—මුළුලෝ දිළිඳු මඩනා.

336. දදවේමතුරුනෙන්—තලපාහි රූ මගමින්,
අසම්නී ආසී නන්—රජ වන් තැන් පහායින්.

337. අඟු කළු වැල එකා—නනබරණමිණිරැසින්,
දැඟුම් මෙර විලස් පැ—දියනෙත ගතෙනරපවර.

---

334. ලියගී ගත, ලයාන්විතවූ ගීත ගත්තාවූ; ගඳෙව්මඬලෙන්, ගාන්ධර්වමණ්ඩලයෙන්; ඉති පවසත, මෙසේ ප්‍රකාශ කරණකල්හි; නිරිඳු, නරේන්ද්‍රතෙම; නිදිපිසින් මෙද, නිද්‍රා ප්‍රවර්ජනකකෙළේ මතු නොවෙයි; සවන්රසයින් හා වින්, කර්ණරසායනද වින්දේයි.

335. හුවා, දික්කොට; ඇඹෙත, (ගාත්‍ර) විජෘම්භණය කරණකල්හි; අතු, හස්තයතෙම; වලා, වලය නැමැති; පළු, ධෘතවූ; තොතැන්නේ, ආලවාලයෙහි; වඩනා, වර්ධමානවූ; මුළුලෝ, සකලලොකයාගේ; දිළිඳුමඩනා; දාරිද්‍ර්‍යමර්දනය කරන්නාවූ, සුරතුරු පැ, කල්පද්‍රැමයක් දැක්වී.

336. දද වේමතුරුනෙන්; විජයන්ගේ වේදමන්ත්‍රයෙන් ස්තුතව; තලපාහි රූ මගමින්, තෛලපාත්‍රයෙන් රූපදර්ශනය කෙරෙමින් . නන්ආසී අසම්නී, නානාවිධවූ ආශීර්වාද ශ්‍රවණය කෙරෙමින් , රජ, රාජතෙම; පහායින්තැන් වන්, ප්‍රසාධනස්ථානයට ප්‍රවිෂ්ටවී.

337. අඟු, අඞ්ගදාභරණය; කළු, කටකාභරණය; එකාවැල, එකාවලිය යන; නනබරණ මිණිරැසින්, නානාභරණ මාණික්‍යරශ්මීන්; එ නරපවර, ඒ නරප්‍රවරතෙම; දැඟුම් මෙර විලස් පැ, ජඞ්ඝමමෙරයෙහි විලාස දක්වා; දියනෙත ගත්, ජගනෙනත්‍රාකර්ෂණය කෙළේයි.

---

* පසිත්මෙදනිදිනිරිඳුපියඳු-බොහෝ.

338 මිණිබිම්හි නත් රුවන්—ටැඹ සියන් කනමුවා
සිලිලාරෙනදනා නා—කැලන් ගුරුළිඳු බඳ වන්.

339 සියල් දෙරණෙදරුස්—මහගඟ නුබඳ වදනා,
දදරළ තියුදහස්ගොස්—රුවනාර හඟවන්නා.

340. මුතුවැල ලඹදුන්—පිළිබිඹුනෙන් මිණිතෙලේ,
සැකි පොකුරුකුරු ගෙතිසර—සියතුඩින් ගෙල් විඳුනා.

341. විමලිඳුනිල්මිණි බිම්හි ඔත් අසෙනියකුසුම්,
සහ සේබිඳු උවිඳු රුදු—උරමඩල ඇක්මෙන්නා.

---

338. මිණිපිම්හි, මාණික්‍යභූමියෙහි ; නන්රුවන්ටැඹ, නානාරත්නස්තම්භයන් කරණකොට ගෙණද ; කනමුවා සියන්, කනකමය ඡදනයන් කරණකොට ගෙණද ; සිලිලාරෙන්, සලිලාකරයෙන් ; නාකැලන් අදනා, නාගසමූහයා ආකර්ෂණය කරන්නාවූ ; ගුරුළිඳු බඳ වන්, ගරුඩෙන්ද්‍රයාගේ දෙහය බඳුවූ :—

339. නුබඳ වදනා, නිරන්තරයෙන් ප්‍රවිෂ්ටවන්නාවූ ; සියල් දෙරණෙද රුස්, සකලධරණියෙහි ඔජෝරාශි නැමැති ; මහ ගඟ, මහානදීන් ඇති ; දදරළ, ධ්වජ නැමැති තරඞ්ගඇති ; තියුදහස්ගොස්, ස්තුතිසහස්‍ර නැමැති සමුද්‍රඝොෂා ඇති ; රුවනාර හඟවන්නා, රත්නාකර දක්වන්නාවූ :—

340. මිණිතෙලේ, මාණික්‍යතලයෙහි ; පිළිබිඹුනෙන්, ප්‍රතිබිම්බය කරණකොට ගෙණ ; පොකුරුකුරු සැකි. පුෂ්කරාඞ්කුරයයි ශඞ්කා කළ ; ගෙතිසර, ගෘහහංසයන්ගේ ; සියතුඩින් ගෙල් විඳුනා, ස්වකීයචඤ්චුයෙන් ප්‍රහාර ලබන්නාවූ ; ලඹදුන් මුතුවැල, ලම්බමානවූ මුක්තාදාම ඇති :—

341. විමල්, නිර්මලවූ ; ඉඳුනිල්මිණි බිම්හි, ඉන්ද්‍රනීලමාණික්‍යභූමියෙහි ; ඔත්, විසීර්ණකළාවූ ; අසෙනියකුසුම්, අවනීයකුසුමයන් කරණකොට ගෙණ ; සහ සේබිඳු, ස්වෙදබින්දු සහිතවූ ; රුදු, මහත්වූ ; උවිඳු උරමඩල, උපෙන්ද්‍රයාගේ වක්ෂොමණ්ඩලය ; ඇක්මෙන්නා, ආක්‍රාන්ත වන්නාවූ :—

342. බඳ සල රන්දද—පිළිබිඹුනෙන් මිනිතෙලේ,
සුනිලබගබතැ විදුකිඳු—සුවහස්න හගවන්නා.

343. නේනරදෙව් දෙව් —තුරු වොවුනුකුරු රඳනා.
දනනෙත්බිඟු වැලඳනා—පමාලිය සිත් හදනා.

344. වැරැළි දුහුල් පලස්—මිහිඟු සමත මියුරු ගී,
මිණිලකළ අබරණ යුත්—බලරුසිනුයන් පානා.

345. මහබඹහු වහසන්—කළ වදනැජරකෙල්ලෙන්,
මහගත්රු කළ තැවරු—වියතසබනෙන් සොබනා.

---

342 සල, චඤ්චලවූ; බඳ රන්දද, බඩවූ සුවර්ණධ්වජයන්ගේ; මිණිතෙලේ. මාණික්‍යතලයෙහි; පිළිබිඹුනෙන්, ප්‍රතිබිම්බය කරණකොට ගෙණ; සුනිලබගබතැ, සුනීලාභ්‍රගර්භයෙහි; විදුකිඳු සුවහස්න හගවන්නා; විද්‍යුත්සහස්‍රයන් ප්‍රකාශ කාරන්නාවූ :—

343. වොවුනුකුරු රඳනා, කිරීටාඞ්කුරයෙන් විරාජිතවූ; නේනරදෙව්, අනෙකනරෙන්ද්‍ර නැමැති; දෙව්තුරු, කල්පද්‍රැමයන් ඇති; දනනෙත්බිඟු වැලඳනා, ජනයන්ගේ නෙත්‍ර නැමැති භෘඞ්ගයන් විසින් ආලිඞ්ගිතවූ*; සිත්හදනා, චිත්තාකර්ෂණය කරන්නාවූ; පමාලිය, ප්‍රමදා නැමැති ලතා ඇති : -

344. වැරැළි, ලම්බාම්බරයෙන් (දොහෝ නොහොත්) වැරැළිගසින්; දුහුල්, දුකූලයෙන් (දොහෝ නොහොත්) දුහුල් ගසින්; පලස්, කුළුයෙන් (දොහෝ නොහොත්) පලාශද්‍රැමයෙන්; මිහිඟු මෘදඞ්ගභෙරියෙන් (දොහෝ නොහොත්) මීගසින්; සමත මියුරුගී සමන්තීයන්ගේ මධුරගීතියෙන් (දොහෝ නොහොත්) කොකිල මයූරයන්ගේ ගීතියෙන්; මිණිලකළ, මාණික්‍යයෙන් අලඞ්කෘතවූ; අබරණ, ආභරණයෙන් (දොහෝ නොහොත්) මිණිල, මිණිලගසින් හා; කල, කලගසින් හා; අඹ, අඹගසින් හා; රණ, රණහුණ ගසින් හා; යුත්, යුක්තවූ; බලරුසින්, භටරාශීන් කරණකොට ගෙණ; (දොහෝ නොහොත්) බලගස් සමූහය කරණකොට ගෙණ; උයන් පානා. උද්‍යානශ්‍රී දක්වන්නාවූ :—

345. මහබඹහු, මහාබ්‍රහ්මයා විසින්; වහසන්කළ, ප්‍රථම සංඥා කරණලද; මහගත් රු, මහාග්‍රන්ථ නැමැති රූපය;

---

* ආලිඞ්ගිතවූ-බොහෝ.

346. ඉති විසිතුරු වැටුම්—මඬු පිවිසැ සිරිනදන්,
සැදී සිහසුනෙ නිරිඳු—තිකුළගැ පැ කනාමෙර.

347. එතර ඔකාවස්—නරවිරුහිරු වැජඹමෙන්,
නිරිඳු පිළිපන් පෙරමග—නැමැ වත්පියුම් පෙබවී.

348. එදෙනරනිඳුහු අද— වැටුම්හී අසුනඹරේ,
සුරඇජරු සරසඳ—සමාම් සිතැසැ ඇඳියේ.

349. මදිඳු ඔකාවස්—නිරිඳු දෙරණෙක්සත් කළ,
විපුල් සිරිසරම යෙහෙන්—වැළැඳොහෝසි* පිළිවිත්.

---

ඇජර වදන්තෙල්ලෙන්, ආචාර්ය වචන නැමැති තූලිකායෙන්; තැවරුකළ චර්වනය කළාවූ; වියත සබනෙන් සොබනා, ව්‍යක්තසභායෙන් ශොභමානවූ :—

346. ඉති, මෙසේ; විසිතුරු, විචිත්‍රවූ; වැටුම්මඬු පිවිසැ, ආස්ථානමණ්ඩපයට ප්‍රවිෂ්ටව; සිරිනදන්, ශ්‍රී නිධානවූ; එ නිරිඳු, ඒ නරෙන්ද්‍රතෙම; තිකුළගැ, ත්‍රිකූටාග්‍රයෙහි; කනාමෙර පැ, කනකමෙරුයෙහි විලාසය දක්වා; සිහසුන සැදී, සිංහාසනය හෙබ වී.

347. එතර, ඒ ක්ෂණයෙහි; ඔකාවස් නරවිරු, ඉක්ෂ්වාකු වංශ නරවීරයා නැමැති; හිරු වැජඹමෙන්; සූර්ය්‍යයාගේ විජෘම්භණයෙන්; පෙරමග පිළිපන්, පූර්වමාර්ගයට ප්‍රතිපන්නවූ; නිරිඳු, මද්‍ර නරෙන්ද්‍රතෙම; නැමැ, නමස්කාර කොට; වත් පියුම් පෙබවී, වක්ත්‍රපද්මය ප්‍රමුබ කෙළේ.

348. එ දෙනරනිඳුහු, ඒ නරෙන්ද්‍රයෝ දෙදෙන; අද, අවුත්; වැටුම්හි, ආස්ථානයෙහි; අසුනඹරේ, ආසන නැමැති ආකාශයෙහි; සුරඇජරු සරසඳ, සුරාචාර්ය්‍ය ශරච්චන්ද්‍ර දෙදෙනාගේ; සමාම්, සමාගමය; සිතැසැ ඇඳියේ, චිත්ත නෙත්‍රයෙහි ආලේඛ්‍ය කෙළේ.

349. මදිඳු, මද්‍රනරෙන්ද්‍රතෙම; දෙරණෙක්සත් කළ, සකලධරණීය එකච්ඡත්‍ර කළාවූ; විපුල් සිරිසරම, මහත්වූ

---

* වැළනොහො-හැම.

350. එ වදනසා රජ—සිව්සයුරත් මුලුදෙරණ,
සියල්සිරිසරම යෙහෙන්—වැළැඳෙයි පිළිවදන් දින්.

351. විලසක් පසක් කැරැ—මුහුදද ගඟට පිළිපන්,
කිම ආ කරුණු වි රජ—කෙලෙ එ විතර රජවැහැජ්.

352. එ වදනසා රජ—සරණිත ත ඇසුරු තමා,
තබ අන් නොතානු කොද—දෙනෙ නරනැ සුරන්ලෝ.

353. තිබියෙව අන් එත—සිරිකත නිතැතිනි නිවෙස්,
කරණිවරණි නරවරන—දෙනෙ නම් කෙ ඇද්ද දියේ.

---

ඓශ්වර්‍ය්‍යසාරයම ; යෙහෙන් වැලඳොහෝ සී, සුවසේ වැළැඳොනෝද්දයි කියා ; ඔකාවස් නිරිඳු, ඉක්‍ෂවකු නරේන්‍ද්‍රයා ; පිළිවිත්, විචාළේ.

350 රජ, ඉක්‍ෂ්වාකු රජතෙම ; එ වදනසා, ඒ වචන ශ්‍රවණය කොට ; සිව්සයුරත් මුලුදෙරණ, චතුස්සාගරාභ්‍යන්තරවර්ත්තිවූ සකල ධරණියෙහි ; සියල්සිරිසරම, සකලෛශ්වර්‍ය්‍යසාරයම ; යෙහෙන් වැළැඳෙයි, ධාර්ම්මිකව අනුභව කරණු ලැබේ සී ; පිළිවදන් දින්, ප්‍රතිවචන දිනි

351. රජ, මද්‍රරජතෙම ; මුහුද, සමුද්‍රය ; ගඟට අද පිළිපන් විලසක්, ගඞ්ගාවට අවුත් ප්‍රතිපන්නවූ විලාසයක් ; පසක් කැරැ, ප්‍රත්‍යක්‍ෂ කොට ; ආ කරුණු කිම වී, ආ ගමන හෙතු කිමෙක්ද්දයි කියා ; රජවැහැජ්, රාජ වෘෂභතෙම ; එ විතර කෙලේ, ඒ විස්තරය කෙළේ.

352. රජ, මද්‍රරජතෙම ; එවදනසා, ඒ වචන ශ්‍රවණය කොට ; නරනැ, නරනායකය ; ත සරණිත ඇසුරුතමා තබ, තාගේ චරණශ්‍රය කළාවූ මා තබා ; සුරන්ලෝ, දිව්‍යලොක යෙහිද්‍ද ; නො තානු, තට අනුනුවූ ; අන් දෙනේ කොද, අන්‍ය ජනයෙක් කොයින්ද ?

353. නරවරණි, නරොත්තමය ; අන් තිබියෙව, අවශෙෂ හෙතු තිබෙවයි ; සිරිකත, ශ්‍රීකාන්තාව ; නිතැතිනි නිවෙස් එත, නිරුත්සාහයෙන් නිවෙසයට එනකල්හි ; අවරණි කරණි, ආවරණ කරන්නාවූ ; කෙ දෙනේ නම්, කවර නම් ජනයෙක් ; දියේ ඇද්ද, ජගත්හි විද්‍යමානද ?

354. පබවත මදුසඳ—සිරිසර කුසනිරිඳුහට,
දෙවනුවැ වත හොත නෙත, පිළිලබති ලබ විඳුනෙමි.

355. ඉති කියා පබවත—කත සහ පිරිවරනෙන්,
දූරු යනුවට තුටුදහස්—දූරු නැගිය රජ වැටමෙන්.*

356, වදනෙ සමග සියලඟ—සදු ලොමුදහසියෙන්,
ගමන් පිළිවෙළ වැ නිරිඳු—පෙ වි දදන් වදන් දුන්.

357. හයන් කුරෙනුදුහු—රජවතුරු මගගඟහී,
පබවතමැ පස්බඳ බද —ගජනැවිනි වන් පුරතෙර.

358. එතර සැදූ දෙව්—පුර දිස්වත් කුසාවත්,
ඇරු දුක්වූ පුරපියෝ—විසිත් සුරකල්න පියෝ.

---

354. පබවත මදුසඳ, ප්‍රභාවතී නම් මාගේ දුහිතෘ සුන්‍දරීය ; සිරිසර කුසනිරිඳුහට, ශ්‍රීසාරවූ කුශනරෙන්‍ද්‍රයාහට ; දෙවනුවැ වතහොත; විතීයිකාව ප්‍රවත්ති වත්හොත් ; නෙතුපිළිලබති, නෙත්‍රප්‍රතිලාභයෙහි ; ලබ විඳුනෙමි, ලාභය අනුභව කෙරෙමි.

355. රජ, මද්‍රනරෙන්‍ද්‍රතෙම ; ඉති කියා, මෙසේ කථනය කොට ; පබවත කත, ප්‍රභාවති කාන්තාව ; සහ පිරිවරනෙන් දූරු යනුවට, පරිවාර හා එක්කොට ගෙණියනු සඳහා ; තුටු දහස් දූරු, සන්තුෂ්ටවූ අඛ්‍යාශ දී ; වැටමෙන් නැගිය. ආසථාන යෙන් නැඟිසිටියේයි.

356. නිරිඳු. නරෙන්‍ද්‍රතෙම ; එවදන් සමග, ඒ වචනය හා එක්ව ; ලොමුදහසියෙන්, ලොමොදගමශතයෙන් ; සියලඟ සදු. සකල ශරීරය ඡාදනය කොට ; පෙරවි දදන්, පුරොහිත විජයා ; දුන් වදන්, දුන්නාවූ වචනයෙන් ; ගමන් පිළිවෙළ වැ. ගමනට සැරැහිගෙණ :—

357. හයන්, අශ්වයන්ගේ ; කුරෙනුදුහු, ඛුරයෙන් ලඬු තවූ ; රජවතුරු, රජස් නැමැති ප්‍රවාහඇති ; මගගඟහී, මාර්‍ග නැමැති ගඞ්ගායෙහි ; පබවතමැ, ප්‍රභාවතී නැමැති ; බද, බඩවූ ; පස්බද. පාශබන්ධන ඇති ; ගජනැවිනි, හසති නැමැති නෞකායෙන් ; පුරතෙර වන්, පුර නැමැති තීර්ථයට ප්‍රවිෂ්ටවී.

358. එතර, ඒ ක්‍ෂණයෙහි ; සැදූ කුසාවත්, සජ්ජිතකරණ ලද්දාවූ කුසාවතී නම් රාජධානිය ;† දෙව්පුර දිස්වත්, දිව්‍ය

---

* දූරනැඟි වැටෙමින්රජ-ඇතම්. † රාජධානිතොමො-හැම.

359. පබවත දසුන් ලොල්—බැර සිත් හයත් එක්වන්,
නුවරෝ ඇතොරසියෝ—පිළිපන්හු යා පෙරමගැ.

360. දුවැ යත කතක වත—කළ එක්කණිැ කනාපෙද,
ගී වී රන්රිය විලස්—ගුළුඑක්සක් තුනුවනා.

361. ගුළුවරලෙක්අතැ—තනහසුනෙකතැගී දිවූ,
ඉහිල් වසනත්නි කලක්—වැලකූ කලක් දනනෙත්.

362. දවත රිසි කලක්—තමා පබවත දස්නට,
පුළුලුකුලෙහි දිමුත්හර—මිණිමෙවුලෙකැසැ රුඳවූ.

---

පුරය දක්වන කල්හි ; පුරපියෝ, පුරස්ත්‍රීහු ; විසිත් සුර කල්න පියෝ, විචිත්‍රවූ සුරකාන්තාවන්ගේ ප්‍රයෝග ; ඇරැ දැක්වූ, ගෙණහැර පෑවූ.

359. පබවත ප්‍රභාවතියගේ ; දසුන්ලොල්, දර්‍ශනයෙහි ලොලවූ ; සිත්බැර චිත්තභාරය ; එක්වන් හයත්, නිරන්තර යෙන් ආකර්‍ෂණය කරණකල්හි ; නුවරෝ, නාගරිකයෝද ; ඇතොරසියෝ, අන්තඃපුරජනයෝද ; පෙරමගැ, පූර්‍වමාර්‍ග යෙහි ; යා පිළිපන්හු, යාත්‍රාවට ප්‍රතිපන්නවූ.

360. දුවැයත කතක, ධාවනය කොට යන්නාවූ කාන්තා වක ; එක් කණිැ කළ, එකකණෙක තබනලද්දාවූ ; කනාපෙද, කනකතාඩඞකය ඇති ; වත, වක්ත්‍රයතෙම ; තුනුවනා, අන ඞගයාගේ ; ගුළු එක්සක්, ගලිතවූ එක්චක්‍රයක් ඇති ; රන්රිය විලස් ගී වී, සුවර්‍ණරථාකාර වී

361. එක්අතැ එකඅතෙක ; ගුළු වරල, ගලිතවූ ධම්මිල්ල ඇති ; එකතැහි, එක්හස්තයෙක්හි ; තනහසුන් කුචහංසයන් ඇති ; දිවූ කලක්, ධාවනය කළාවූ කාන්තාවක් ; ඉහිල් වස නත්නි, ශිථිලවූ වසනාන්තයෙන් ; දනනෙත් කලක් වැළකූ, ජනයාගේ නෙත්‍ර කර්‍ණයක් රුඳවූ.

362. කලක්. කාන්තාවක ; තමාරිසි, තමාගේ ඉච්ඡාව ; පබවත දස්නට දවත, ප්‍රභාවතියගේ දර්‍ශනයට ධාවනය කරණ කල්හි ; දිමුත්හර, දීප්තිමත්වූ මුක්තාහාරය ; පුළුළු කුලෙහි රුඳවූ, පෘථුලවූ කටියෙහි රුඳවූව ; මිණිමෙවුල, මණි මෙඛලාදාමය ; එකැසැ රුඳවූ, එකාංශයේ* රුඳවූ.

---

* එකාංසකොට-සම.

363. සමහර අත් වසත්—කැරැ දඟ අතින් දිවෙමින්,
නුවනත්හි අඳුනඳමින්—විසිතබරණ පලඳමින්.

364. හව්දෙනේ ගොස් ඉති—කිරිඳු අවරග රඳනා,
පබවතලසඳලේනෙන්—කොලෝ මුහුලත්තඹරන්.

365. පබවත ලෝනුවන්—පැහැවතුරේ ගැලෙම්නිඳු,
තුනුහෙම්කැලුම්හැල්ලෙන්—පුරවේගඟ ද පුරමින්

366. කල පින් පෙලෙ නුවත්—ශියදූහි හිම් මේ වී,
හැඟී නුවරන් නෙත්සිත්—හයමින් රජ විමන් වන්.

---

363. සමහර අත්* වසන්, අඞ්සංවීතවූ වසනය; අතින් දඟ කැරැ, හසතයෙන් දඟ කොට; දිවෙමින්, ධාවනය කෙරෙමින්; නුවනත්හි අඳුනඳමින්, නෙත්‍රයෙහි අඤ්ජනාලෙබන කෙරෙමින්; විසිතබරණ පලඳමින්, විචිත්‍රවූ ආභරණ ප්‍රසාධනය කෙරෙමින් :—

364. ඉති, මෙසේ; හව්දෙනේ, සකලජනයෝ; ගොස්, ගමනය කොට; කිරිඳු, කරීන්‍ද්‍ර නැමැති; අවරග රඳනා, අපරපර්වතාග්‍රයෙහි ලගනවූ; පබවත, ප්‍රභාවතී නැමැති; ලසඳලේනෙන්, බාලචන්‍ද්‍රලෙඛාව කරණකොට ගෙණ; අත් තඹරන්, හසතතාමරසයන්; මුහුලු කොලෝ, මුකුලිත කොලෝ.

365. පබවත, ප්‍රභාවතීතොමෝ; ලෝනුවන් පැහැවතුරේ ගැලෙම්නි ඳූ, ලෝකයාගේ නායනකාන්ති නැමැති ප්‍රවාහයෙහි නිමග්නවෙමින්ද; තුනුහෙම්කැලුම්හැල්ලෙන්. ශරීරයෙහි හෙමකාන්ති නැමැති නිර්ඣරයෙන්; පුරවේගඟද පුරමින්, පුරවීථි නැමැති ගඞ්ගාවද පූර්ණ කෙරෙමින් :—

366. ශියදූහි, අතීතකාලයෙහි; නුවන් කල, නයනයන් විසින් කරණලද්දූවූ; පින්පිලෙ, පුණ්‍යඵලයෙහි; හිම් මේ වී, මේ සීමාවනැයි; හැඟී නුවරන්, කල්පනාකලාවූ නාගරිකයන්ගේ; නෙත්සිත් හයමින්, නෙත්‍රචිත්තාකර්ෂණය කෙරෙමින්; රජ, රාජතෙමේ(ද); විමන් වන්, විමානයට ප්‍රවිෂ්ටවී.

---

* හත්-සම.

367. කෙළි කල් කළුන් සඳය උදු සඳැස දුළු,
පබවත සඳැස නුවර නිරිඳය සේ කියු සග.

**සත්වන සග.**

---

368. කැදෙමිනෙතර කුස—නිරිඳු ගුරුවිරු බමුණන්,
පිරිසිඳැ කල් සමාමට—මගලට හිගු වදන් දින්.

369. අසමිනි එ පෙරෙවි—දෙදේ ගොස් විසිත් වෙලෙප්,
මලොලඹු කනකලස නව—මලිනසේනියකුසුමෙන්.

---

367. කල් කළුන් කෙළි සඳය, ස්ත්‍රීපුරුෂයන්ගේ ක්‍රීඩා කාල යද; දුළුඋදුසඳැය, දීප්තවූ උදය සන්ධ්‍යාවද; පබවත සඳය, ප්‍රභාවතීසුන්දරිය හා සමග; නිරිඳු, නරේන්ද්‍රයා; නුවර ආය සේ කියූ සග, නගරයට ආ පරිදිද කීවාවූ සර්ගයයි.

සපනම සර්ගයයි.

---

368. කුසනිරිඳු, කුසනරේන්ද්‍රයාගේ; ගුරුවිරු. ගුරුවීරයෝ; එතර, ඒ ක්ෂණයෙහි; බමුණන් කැදෙමින්,* බ්‍රාහමණයන් කැඳවමින්; සමාමට, විවාහසම්බන්ධයට; කල්පිරිසිඳැ, කාල නියත කොට; හිගු, වහාම; මගලට, විවාහමඞ්ගල්‍යයටද; වදන් දින්, වචන දිනි.

369. පෙරෙවිදෙදේ, පුරොහිතවිජතෙම; එ අසමිනි, ඒ ශ්‍රවණය කෙරෙමින්; ගොස්, ගමනය කොට; මලොලඹු, කුසුමාවලම්බයෙන්; විසිත්, විචිත්‍ර; වෙලෙප්,† විතානයෙන්ද; කනකලස, කනක කලසයෙන්ද; නවමලින්, නවමාලිකායෙන්ද; අසෙනියකුසුමෙන්, උපහාරකුසුමයෙන්ද :—

---

* බමණන් කැඳමෙන්-බොහෝ.

† මෙලෙප්-මේලප්-හැම.

370. සඳ, යළි කරත—මඟුලසිඳුසක් නො තබා,
විසිත් සත්රුවනෙන්—පිවිතුරු කැරැ මඟුල්හල්.

371. රැඳන්වා නිරිඳු—පබවත ඉහි සියන් කැන්,
කි යු සුබමොහොත්නකතින්—දදන් වදන් පිවිතුරෙන්.

372. වඩා මඟුල්හල්—පුවහා නනබරණි දෙව්,
තොහා වේ කියා මුදුන්—පිවිතුරු තොයින් සනහා.

373. කැරැ සෙත බිසෙව් බිසෙව්—මව් ඉහි මඟලවදන්,
පබවතකත කුසවරා—යහන් සිරි ගැබැ රැඳවූ.

---

370. සඳ, සජ්ජිත කොට ; යළි මඟුල් කරත, නැවත මඟුල් කරත්හොත් ; අසි දූසක් නොතබා, අංශුවකුත් ශෙෂ නොකොට ; විසිත් සත්රුවනෙන්, විචිත්‍රවූ සප්තරත්නයෙන් ; මඟුල්හල් පිවිතුරු කැරැ, මඞ්ගල්‍යශාලාව පවිත්‍ර කොට :—

371. නිරිඳු රැඳන්වා, නරෙන්ද්‍රයාට විඥාපනය කොට ; සියන්කැන් ඉහි, ඥාතිසමූහයා එක්ව ; පබවත, ප්‍රභාවතී ; කියු සුබමොහොත් නකතින්, කියනලද්දාවූ ශුභමුහූර්ත* නක්ෂත්‍රයෙන් ; දදන්, විජයන්ගේ ; වදන් පිවිතුරෙන්, පවිත්‍රවූ වචනයෙන්ද :—

372. මඟුල්හල් වඩා ; මඞ්ගල්‍යශාලාවට ගෙණ ගොසින් ; නනබරණි පුවහා, නානා උපද්‍රව දුරු කොට ; දෙව් තොහා, දෙවතාවන් සන්තොෂ කොට ; වේ කියා, වෙදමන්ත්‍ර උච්චාරණය කොට ; මුදුන්, මස්තකය ; පිවිතුරු තොයින් සනහා, පවිත්‍රවූ ජලයෙන් අභිෂෙකය කොට :—

373. මව්බිසෙව්, ජනනීරාජ්ඥීතොම ; සෙතබිසෙව් කැරැ, ශාන්ති† අභිෂෙකය කොට ; මඟලවදන් ඉහි, මඞ්ගලවචනය හා එක්ව ; පබවතකත, ප්‍රභාවතී කාන්තාවද ; කුසවරා, කුස රාජයාද ; සිරියහන් ගැබැ රැඳවූ, ශ්‍රී යහන් ගර්භයෙහි රැඳවූහ‡.

---

* සුමොහොත්- සුමුහූර්ත-සම. † ශාන්තී-සම. ‡ හෙබවූ-සම්.

374. සියෝ සිරිසර විඳැ—කුසා දුරැලූ පස්කම්,
කැරැ අත්සරු නො දිස්වා—දවහල්* වසන කල්හි

375. නො දැක්මෙන් කුසා—දවහල් කුහුල්බරසිත්,
විනෙයනුවට† බිසෙව් මව්—පබවතසඳට මෙ වියූ.

376. මිසුලැසිනපකුලේ—සෙරෙනා රජදහම් නම්,
නිස මුත් නැත් සමාමෙක්—දනතෙක් ගබක් දක්වා.

377. පවසත ඉති දැහැ සක්—අසක් වසනෙසමාහි,‡
කුසා ඇය රූ රසයින්§—නුවනඳනා රිසි කෙළේ.

---

374. කුසා, කුසරාජයා ; සියෝ සිරිසර විඳැ, සඝගම ශ්‍රී සාරය අනුභව කොට ; දුරැලූ පස්කම්, දූරිභූත කළාවූ පඤ්ච කාමයන් ; අත්සරු කැරැ, හසනසාර කොට ; දවහල් නොදිස්වා, දිවාභාගයෙහි නොපෙණී ; වසනකල්හි, වාසය කරණ සමයෙහි :—

375. කුසා, කුසරාජයා ; දවහල් නොදැක්මෙන්, දිවා භාගයෙහි අදශීනයෙන් ; කුහුල්බර සිත්, කුතුහලභාර චිත්තය ; විනෙයනුවට, දුරුකරණු පිණිස ; මව්බිසෙව්, ජනනිරාඥී|| තොම ; පබවත සඳට, ප්‍රභාවතී සුන්‍දරියහට ; මෙ වියූ, මෙසේ කිවු.

376. මිසුලැසිනි, මෘගාක්ෂිනි ; අප කුලේ, අපගේ වංශයෙහි ; සෙරෙනා, චිරානුගතවූ ; රජදහම් නම්, රාජධර්මයෙක් නම් ; එක්ගබක් දනත දක්වා, එක් ගර්භයක් ජනිතවන තාක් ; නිසමුත්, රාත්‍රියෙහි මුත් ; සමාමෙක් නැත්, සමාගම යෙක් නැති.

377. ඉති පවසත, මෙසේ කියනකල්හි මැ ; සක්අසක් දැහැ, ශඩකාව මඳක් දුරුකොට ; වසනෙසමාහි. (සමග) වසන්නාවූ ඒ¶ කාලයෙහි ; කුසා, කුසරාජතෙම ; ඇය, ඒ ප්‍රභාවතීයගේ ; රූරසයින්, රූපරසායනය ; නුවනඳනා රිසි කෙළේ, නයනයෙහි අඤ්ජනකරණ අභිප්‍රාය කෙළේ.

---

* දහවල්-සම.　　† විනෙවට-විදෙයනුවට-බොහෝ.
‡ වතෙසමාහි-බො.　　§ රසිසින්-රසයෙන්-සම.　　|| රාජඥ-බොහෝ.
¶ සමගිවන්නාවූ-සම.

378. වරෙක් දහක් නැමැ—තමා පබවත දස්නෙහි,
රිසි හැඟවී බිසෙව් මව්—පිළිසෙව් එවිරු නොගිණී.

379. මෙහෙයා එතර සඳ—මිනි ඇත්හල් වරණමුළු,
සුහුල් පබවත ඉහි ගොස්—පැවූ දසමද මත් ඇත්.

380. සත්තැන් බිම පහල—හිව් කුඹු දකුණුදළ උස්,
කළ රජවහන් මේ ඇත්—තුරිනි බලාම් තුස්නා

381. විසිනිය කොපොල්බොල්—දේඅසුන් සමතලා වූ,
මොහොලතිනෙඩිරුපුනිරිඳු—සිය බිඳුන මෙ ගඳත්නම්.

382. නුපු කටඹුඇසන්—පුළුල් නහර නො පහළ,
සවඹුදුල දියසෙන් නම්—දකුණුදඬුදා මේ ඇත්.

---

378. එවිරු, ඒ වීරතෙම ; එක දහක්වර, එක් දිවසවාර යෙක්හි ; නැමැ, ජනනිය නමස්කාර කොට ; තමා පබවත දස්නෙහි, තමාගේ ප්‍රභාවතී* දර්‍ශනයෙහි ; රිසි හැඟවී, අභිප්‍රාය හඟවා ; මව්බිසෙව්. ජනනීරාජිනියගේ : පිළිසෙව්, ප්‍රතික්‍ෂෙපය ; නොගිණී, නො ගත.

379. එතර, ඒ ක්‍ෂණයෙහි ; මෙහෙයා, නියොග කොට ; ඇත්හල්, හස්තිශාලාවද ; වරණමුළු, හස්තිසමූහයාද ; සඳමිනි, හොබවමින් ; සුහුල්, ශවශ්‍රැතොමෝ ; පබවත ඉහි, ප්‍රභාවතිය හා එක්ව ; ගොස්, ගමනය කොට ; දසමදමත් ඇත්පැවූ, දශමද යකින් මත්වූ හස්තීහු දුක්වූ.

380. බිම පහල සත්තැන්, භූමිස්පර්‍ශය කරන්නාවූ සප්ත ස්ථානයක් ඇති ; හිව්, උස්වූ : කුඹු, කුම්භස්තල ඇති ; උස් දකුණු දළ, උස්වූ දක්‍ෂිණදන්ත ඇති, බලාම්තුරිනි තුස්නා, යුධභෙරි යෙන් සන්තුෂ්ට වන්නාවූ ; රජවහන් කළ, රාජවාහනය කළාවූ ; මේ ඇත්, මේ හස්තීහු.

381. විසිනිය, විංශතිනඛයන් ඇති ; බොල්කොපොල්, බහලවූ කපොල ඇති : දෙඅසුන් සමතලාවූ ; සමතලාවූ උභ යාසන ඇති ; මොහොලතින්, මුශලහස්තයෙන් ; රුපුනිරිඳු සිය එඩි බිඳුනා, ශත්‍රැනරෙන්ද්‍රශතයන්ගේ දර්පමර්‍දනය කරන්නාවූ ; මෙ ගඳත් නම්, මේ ගන්ධහස්ති නම්වූ.

382. නුපු කට අනුපූර්‍වවූ කණ්ඨ ඇති ; අණුඇස්, ක්‍ෂුද්‍රවූ අක්‍ෂි ඇති ; පුළුල් අන්, පෘථුලවූ හනුඇති ; නොපහළ නහර,

---

* ප්‍රභාවතියගේ-සම.

383. පළ සුදුනිය වන ලප්—දළ දළ හිව්කුඹින් නත්,
නැබ ලඹ නුපුවටඅත්—පවන්වේ නම් මෙ වරණ.

384. අවිදුමනු දවවේ—නෙත්සිලිල් කලබබිරු,
මෙදෙහි පිසනුව දන්නා—මෙ ඇත් පරසක් මඩනා.

385. වැළඟී අතරුවන—තුරෙතර*තණකලබනෙන්,
තමා දළ ලොබකලබෙව්—පහල පබවත සත්සර.

386. රෙසී දම්†මුහුනැ—ත අද රදහට දන්වා.
සියකඩ කෙරෙම් ද වියූ—පබවත බිසෙව් සැනහූ.

---

අප්‍රකාශවූ ධමනි ඇති; සවණදුල, උජ්ජ්වලිත කර්ණඇති; දකුණු දඹදෑ මේ ඇත් දක්ෂිණදණ්ඩයෙහි ජාතවූ මේ හස්තීහු; දීයසෙන් නම්, ජයසෙන නම්.

383. පළ සුදුනිය, ව්‍යක්තවූ ධවලවූ නබඇති; ලප්වන, කලඞ්කරහිතවූ; දළ, මහත්වූ; දළ, දන්ත ඇති; හිව්කුඹින් නත්, උස්වූ කුම්භයෙන් අවනතවූ; නැබ ලඹ, ලම්බමානවූ නාභි ඇති; නුපුවට අත්, අනුපූර්ව්වර්තීවූ හස්ත ඇති; මෙ වරණ, මේ වාරණතෙම; පවන්වේ නම්, මාරුතවේග නම් වෙයි.

384. දවවේ, ජව‡ වෙගයෙහි; අවිදුමනු නෙත්සිලිල්, අවිද්‍යමානවූ නෙත්‍රබාෂ්ප ඇති; කලබ, තරුණවූ; අබිරු, අභීරුවූ; මෙදෙහි, මදයෙහි; පිසනුව දන්නා, පොෂ්‍යය කරන්නවුන් අඳුනන්නාවූ; මෙ ඇත්, මේ හස්තිතෙම; පරසක්මඩනා, පරචක්‍රමර්ද්දන නම්.

385. සත්සර, පුරුෂොත්තමතෙම; එතර, ඒ ක්‍ෂණයෙහි ඇතරුවනතුරේ වැළඟී; හස්තිරොහකයන්ගේ අන්තරයෙහි ප්‍රව්‍යක්තව; තමා දළ ලොබකලබෙව්, තමාගේ මහත් ලොභකලාපයක් බඳුවූ; තණකබලනෙන්, තෘණකලාපයෙන්; පබවත පහළ, ප්‍රභාවතිය ගැසී.

386. රෙසී, රුෂ්ටවැ; දම් මුහුනැ, දග්ධමුඛය; ත අද රදහට දන්වා, තා අද රදහට විඥාපනය කොට, සියකඩ කෙරෙම් ද වියූ, ශතඛණ්ඩ කෙරෙම්මයයි කියා; බිසෙව්, ජනනීතොම; පබවත සැනහූ, ප්‍රභාවතිය සන්සිඳුවූ.

---

* වැලඟිඇත්රුවත්තුරෙ පබවත-ඇතම්.
† දත්-සම. ‡ ජවන-සම.

387. පිළි එක් දහක් එම—නියමින් ගොස් තුරඟහල්,
කළයොග පසකලණ් යුත්—පටවඩනා තුරඟ පැවූ.

388. හිඳුල්වල් සවණින්—සමුවුසු* බරදසන් කල්,
දුව† දස සපන් මෙතුරඟ—තොප හිමියාට මනකල්.

389. පපන් දුව නළලෙක—හිඳු මුදුන් යුවල පළ,
රදුරුවරදු‡ දුව යුවල—මෙ තුරඟ මඟුල් හිමියා.

390. ගැසි නැසි සිටැ කුස—රජ යළි තණකබලනෙන්,
පබවත කෝමෙදෙනුදම්§—සුහුල් ඔවයින්‖ රඳවත්.

---

387. පිළි, නැවත ; එක් දහක්, එක් දිනයෙක්හි ; එම නිය මින්, ඒ ක්‍රමයෙන්ම ; තුරඟහල් ගොස්, තුරඞ්ගශාලාවට ගමනය කොට ; කළයොග, කළාවූ අභ්‍යාසඇති ; පසකලණ් යුත්, පඤ්චකල්‍යාණියෙන් යුක්තවූ ; පටවඩනා තුරඟ පැවූ, පටවඩීන නම් අශ්වයා දැක්වූ.

388. හිඳුල්වල්, නොබබුරුවූ වාලධියඇති ; සවණින් සමු වුසු, සඞ්ගම¶ ශ්‍රවණයෙන් යුක්තවූ ; බරදසන්, වාදශ දන්තයක් ඇති ; කල්, මනොඥවූ ; දසදුව, දශධ්‍රැවයක් ඇති ; සපන්, සම්පන්නවූ ; මෙ තුරඟ, මේ අශ්වතෙම ; තොප හිමියාට, තොපගේ ස්වාමිහට ; මනකල්, මනොඥයි.

389. පපන්දුව, ප්‍රොථයෙහි** ධ්‍රැවයෙක ; නළලෙකදුව, ලලාටයෙහි ධ්‍රැවයෙක ; හිඳුමුදුන්, හෘදය මස්තක දෙක්හි ; පළ, ව්‍යක්තවූ ; යුවල දුව, ධ්‍රැවවයක් ඇති ; රදුරුවරදු, රන්ධ්‍රො පරන්ධ්‍රයෙහි ; යුවල දුව, ධ්‍රැවවයක් ඇති ; මෙ තුරඟ, මේ තුරඞ්ගතෙම ; හිමියා, ස්වාමිහට ; මඟුල්, මඞ්ගල්‍ය අශ්වයයි.

390. යළි, නැවත ; කුසරජ, කුසරාජතෙම ; නැසී සිටැ, ප්‍රව්‍රජිතව සිට ; තණකලබනෙන්, තෘණකලාපයෙන් ; ගැසී, පහළ ; කෝමෙදෙනුදම් පබවත, කොපමදයෙන් උදැමවූ ප්‍රභාවතිය ; සුහුල්, ශ්වශ්‍රැ විසින්, ඔවයින්, අවවාදයෙන් ; රඳවත්, සන්හිඳුවන කල්හි.

---

* ලුඹු-වුඹු-සුව-බොහෝ. † දව-සම. ‡ රුදුරපරදු-රදුපරදු-සම.
§ කොමෙදෙනුදහම්ගැසි-බොහෝ. ‖ ඕයින්-සම. ¶ සඞ-බොහෝ.
** ප්‍රෝථයෙහි-හැම.

391. දකුම්නු සී ව්යූ—වරණරුණ වතු* එ කුසා,
සදා වරද රුසිරුබඳ—සුහුල් පබවත දුක්වූ.

392. වරණගොව් මෙ නො වේ—සැකී කුසා හිමියා,
කවරෙක් පෙරටුව බස්නෙ—දූනැ ඒ එයි කළ නියෝ.

393. පිළිහැරියනෙකෙණෙහි—දූවැ ගොසිනෙතතු දන්වා
වළහා අවුදු පබවත—කළ සැක යළි තුනු කළා.

394. සැක සඳ තෙර නොපත්—පබවත වතෙසමාහි,
නළමෙන් හුතැස්වෙස් ගත්—නුබරගැ ගිම්රිව් දිළී.

395. වනපෙත් වී හිදූල්—සුපක්වනසෝනී දුනු,
තැවී වහළ වන්වූ—සියොත්සිකින් හසර හළ.

---

391. එ කුසා, ඒ කුසරාජයා ; වරණරුණවතු, වාරණරුඩ වත්ම ; දකුම්නු සී ව්යූ, දකුම්හයි කීවූ ; පබවත, ප්‍රභාවතියට ; රුසිරුබඳ, රුචිරවූ සිරුරඇති ; වරද, යුවරාජයා ; සදා, සජ්ජිත කොට ; සුහුල්, ශවශ්‍රූතොම ; දූක්වූ, පෑවූ.

392. මෙ වරණගොව් නොවේ, මේ වාරණගොපක නොවෙයි ; කුසා හිමියා සැකී, කුසරාජ නම් ස්වාමියායි ශඞකා කොට ; කවරෙක් පෙරටුවැ බස්නෙ, කවරෙක් පූර්ව කොට බස්නේදැයි ; ඒ දූනැඑයි. ඒ දූත එව සී ; නියෝ කළ, නියොග කළාවූ :—

393. එකෙණෙහි. ඒ ක්‍ෂණයෙහි ; පිළිහැරියන්, ප්‍රතිහාරිකාවන් ; දූවැ ගොස්, ධාවනය කොට ගොසින් ; එ තතු දන්වා. ඒ තත්වය දූත ; අවුදු, අවුදින් ; යළි. නැවත ; වළහා, ප්‍රවජාදනය කොට ; පබවත කළ සැක, ප්‍රභාවතිය කළාවූ ශඞකාව ; තුනු කළා, මඳ කළා.

394. පබවත, ප්‍රභාවතියගේ ; සඳ, චිත්තය ; සැක තෙර නොපත්වත්, ශඞකාතීරයට ප්‍රාප්ත නොවත්ම ;. එ සමාහි, ඒ කාලයෙහි ; ගිම්රිව් සම්මසූර්‍යයතෙම ; නුබරගැ, ආකාශ නැමැති රඞගයෙහි ; හුතැස්වෙස් ගත් නළ මෙන්, හුතාශ නම් වෙශ ගත්තාවූ නවනාටකයක්හු මෙන් ; දිළී, ජ්වලිතවී.

395. දුනු, ජනිතවූ ;† සුක්වනසෝනී, සුපක්‍ෂ විරහශොක යෙන් (දෙහෝ නොහොත්) සුපක්‍ෂවිරහ ශොකයෙන් ;

---

* වත්-වනු-හැම. † දුලු, ජ්වලිතවූ-බොහෝ.

396. වැහැරැ ගජරජු සිටුතු—යොමු කළ කුඹුමඬලෙන්,
බහු ඝනසේමඬලේ—බහසුරු කෙසුරු තත් ගත්.

397. තබා කොපුලත අත—විරූ පොකුරු පොදනෙන්,
මදමේසුන් ගඳගිජිඳු—සිකිකට තෙමී යොරයොර.

398. පැනී හුරු බිම්—දූවූ දෙන අත් ගජන්කැන්,
දවත වෙයින් දළබැඳැ—දියුණු වත් දිඝී අත්.

399. නැවී හුනු හුණු දළ—ලැවග හළකළ තවරා
සිරුහඬරසු දුම්බුජඟ—වනරජ ලද රුදුරුවෙස්.

---

සියොත්සිකින්, චාතකමයූරයන්ගේ (දොහෝ නොහොත්) නැයන්, සබින්ගෙන් දොහෝ; හසර හළ, සඤ්චාර හළවාවූ; හිඳුල් වනපෙත්, පත්‍රරහිත වනපඞ්ක්තිතොම; නැවී වගළ වන්වූ ශොකසන්තාපයෙන් කෘශවූවාක් වැනිවූ.

396. ගජරජු, හස්තිරාජයා; යොමු කළ කුඹුමඬලෙන්, අවනතකරනලද්දාවූ කුම්භමණ්ඩලයෙන්; වැහැරැ සිටිතු, කෘශව සිටිනාකල්හි; බහු ඝනසේමඬලේ, බහුගේ ඝනච්ඡායාමණ්ඩලයෙහි; බහසුරු කෙසුරු, භාස්වරසිංහතෙම; තත් ගත්, ස්ථානප්‍රාප්තවී.

397. මදමේසුන් ගඳගිජිඳු, මදමෙඝජනනවූ ගන්ධගජේන්ද්‍ර තෙම; කොපුලත අත තබා, කපොලයෙහි හස්තය තබා; විරූ පොකුරුපොදනෙන්, ඉස්නාලද පුෂ්කර* වෘෂ්ටින්; යොරයොර, නැවත නැවත; සිකිකට තෙමී, ශුෂ්කකණ්ඨය තෙමනය කෙළේ.

398. පැනී, පානෙච්ඡවූ; ගජන්කැන්, හස්තිසමූහයා; හුරු බිම් දූවූ, පානස්ථානයට ධාවනය කොට; දෙන අත්, දෙන ලද්දාවූ හස්තය; දවත, දවනකල්හි; වෙයින්, වෙදනායෙන්; දළ බැඳ, දන්තයෙහි බැඳ; දියුණු වත්, විගුණවත්ම; අත් දිඝී, හස්තය හළී.

399. නැවී හුනු, තපනව පතිතවූ; හුණු† දළ, කීචක නම් ජටාඇති; ලැවග හළ කළ තවරා, දවාග්නිභස්මයෙන් කරණලද චර්චනඇති; සිරුහඬරසු, කිඩලෙරීනාද නැමැති කිඩකිණී ඇති; දුම්බුජඟ, ධූම නැමැති භුජඞ්ගයන්ඇති; වනරජ, වනරාජතෙම; රුදුරුවෙස් ලද, රුද්‍ර‡ වෙශ ලද්දේ.

---

* පුෂ්කරණී-ඇතම්. † හුණ-සම. ‡ රෞද්‍ර-ඇතම්.

400. නළලතවහිරු ගසත—හිඳුල්තුරු හිඳුල්නෙන්,
සැසේ වැසිරී නැඟි එව්—සිරුහඬ හඬ දෙරණිකත්.

401. දිදී සියසේ හොත් —මියුලඟන ලඟ වැ වෙහෙල්;
ලොමුඩුත් ලොමු ඉහි විහිදූ—බඳ තද මැසි නිසන් වූ.

402. බුත් දළ හරහැලී—තනරන්බෙයද මඬලෙන්,
නෑ අඟරා ගුරුතවර—තුනුවිල් කලුන් දෙනෙ වන්.

403. මුවතණ දැකැ පැනී—යතුරොත මුව ඉහි මියුල්,*
පැණෙන නො පත් තන්හී—අවසන් නොලද† යතුරේ.

---

400. නළලතව හිරු, ලලාටතපප සූර්‍ය්‍යයා; හිඳුල්තුරු හිඳුල්නෙන්, පත්‍රවිරචිත වෘක්ෂ නැමැති හිඳුලින්; ගසත, ප්‍රහාරය කරණ කල්හි; සිරුහඬහඬ, ඣල්ලරීධ්වනි නැමැති හඬ ඇති; දෙරණිකත්, ධරණීකාන්තාතොමෝ; සැසේ,‡ ශාඛාච්ඡායා නමැති; වැසිරී §නැගි එව්, නැඟිගාවූ වෛර ඇත්තියක මෙනි.

401. හොත් මියුලඟන ලඟවැ, ශයිතවූ මෘගාඞ්ගනාව සමීපව; සියසේ, ස්වකීයච්ඡායා; දිදී, දී; වෙහෙල්, මෘගයා; ලොමුමුත්, ලොමොද්ගමනය කරණ කල්හි; ලොමු ඉහි, රොමකූපය හා එක්ව; කද බඳ මැසි; සතබඩව බඩවූ ආමිෂය; විහිදූ, දුරු කොට; නිසන් වූ; නිශ්චල වූ..

402. තනරන්බෙයද මඬලෙන්, පයොධර නැමැති ස්වර්ණ පර්වතමණ්ඩලයෙන්; බුත් දළ හර හැලී. හිඳුරවූ|| මහත් මුක්තාහාර නැමැති නිර්ඣර ඇති; · නෑ අඟරාගුරුතවර, ස්නානය කරණලද අඞ්ගරාග නැමැති ගෛරිකචර්ණ ඇති; කලුන් තුනුවිල්, කාන්තාවන්ගේ ශරීර නැමැති තටාකයට; දෙනේ වන්, ජනතෙමේ ප්‍රවිෂ්ට වී.

403. පැනී, පානෙච්ඡවූ; මුව, මෘගතෙම; මියුල් ඉහි, මෘගිය හා එක්ව; මුවතණ දැකැ, මෘගතෘෂ්ණාව දැක; යතුරොත, යාත්‍රා ගත්තේ; නොපත් තන්හි, අප්‍රාප්තස්ථානයෙහි; පැණෙන, පැණෙන කල්හි; යතුරේ, යාත්‍රායෙහි; අවසන් නොලද, කෙළවරක් නොලද්දේයි.

---

* මියුලි-ඇතම්. † නොලදි-ඝම. ‡ සසේ-සැසේ-බොහෝ.
§ වැහිරි-වහිරු-බොහෝ. || හිදුවූ-හිනානවූ-හැම.

404. දියසුන් හෝ මහ—වැවිල් කුරුරස* මුළුලෝ,
ගිමන්හු පැන්සොම් බොන්†—සහ ඔඩම තැටි තැවූ එව්.

405. තමා සරතැස දැකැ—පවසින් ලැගැබිණි මියුල්,‡
වෙහෙළිඳු උතුළ ඇසදර—නුවනත මිණිඔඩම් කළ.

406. ඉඳුනිලිගිරි සමග—මුවරඳ කටා දියදුන්§,
පැ මෙද ගජකනා ||දම්—මේකුළු සහා විදු පැ¶.

407. තෙමෙද වනස්ට පත්—මුළුලෝ තැවූ ගිම්කල්,
පරා වෙහෙස කළ දෙනෝ වැනසෙත් මැනු බොහෝසේ.

---

404. දියසුන්, ජලශුෂ්කවූ; හෝ මහවැවිල්, නදී මහාවාපි සරසී ඇති; මුළුලෝ, සමස්තලොකයතෙම; කුරුරස, කෲර තමව;** ගිමන්හු, ඝර්මයා විසින්; පැන්සොම් බොන්, පානීය සෞම්‍යය අනුභව කළාවූ; සහ ඔඩම තැටි, චෂකරසසහිතවූ; තැවූ එව්, භොජනපාත්‍රයක් වැනි–අමත්‍ර.

405. ලැගැබිණි, තරුණගර්භිණීවූ; මියුල්, මෘගඞගනා තොමෝ; පවසින්, පිපාසායෙන් වූ; තමා සරතැස දැකැ, තමාගේ ශ්‍රාන්තත්වය දැක; වෙහෙළිඳු, මෘගරාජයාගේ; උතුළ ඇසදර නුවනත, අතිරික්ත අශ්‍රුධාරා ඇති නයන; මිණි ඔඩම් කළ, මණිචෂක කළා.

406. ඉඳුනිල්ගිරි සමඟ, ඉන්ද්‍රනීලපර්වතය හා සඞගතවූ; දියදුන්, ජලප්‍රවාහය විසින් දෙනලද්දාවූ; මුවරඳ කටා, මක රන්දරෙඛා තොමෝ; ගජකනාදම් පැ මෙද, හස්තියක්හුගේ කනකදාමයක් පෑයේ මතු නොවෙයි; මේකුළු සහා විදු පැ, මෙඝකූට සහායවූ විද්‍යුත්ද පෑවූ.

407. මුළුලෝ තැවූ, සමස්තලොකයා සන්තප්ත කළාවූ; ගිම්කල් තෙමෙද; ඝර්මකාලය තෙමේද; වනසට පත්, විනාශයට ප්‍රාප්ත විය; පරා වෙහෙස කළ දෙනෝ, පරහට විහිංසා කළ ජනයෝ; බොහෝසේ වැනසෙත් මැනු; බොහෝසේ විනාශවෙත් මැයි.

---

* වැපිවිල්කුරුර-සම. † බුන්-සන්න.
‡ පවසිත්ලැගැබිලියනාමාසරතැසදැකමියුල්-සම.
§ දියකටා-බොහෝ. || ගදගජකනක-සම. ¶ හාසහාවිදු-සම.
** කුරුර, කෲරතමව-සම.

408. විසිත් වරණ තුරඟාය වන නිගාය ගිමන්,
සැකි කොමලඟාය කුසා සමගාය මෙ කියු සඟ.

## අටවන සඟ.

---

409. පැසුළු එ ගිම්නදන්—විරු සනහනමෙනෙන් එව්,
කලමෙනෙ වන මෙසි දිගු—කරණ මෙනනා මේකල්.

410. විදුකිඳු සලපලු—බලාකැල පුල්මල්කැන්,
පොද මීපොද නිල්ගන—ගන වනඅතෙව් තෙව්නේ.

---

408. වරණ තුරඟාය විසිත්, වාරණතුරඞ්ගයන්ගේ විචිත්‍රතාවද ; වනනිගාය ගිමන්, වනනිග්‍රහකලාවූ ග්‍රීෂ්මයද ; කුසා සමගාය. කුසරාජයා හා සමග්‍රවූ ; කොමලඟාය, කොමලාඞ්ගිය ගේ ; සැකි, ශඞ්කාවද යන ; මෙ කියු සඟ; මේ කීවාවූ සර්ගයයි

අෂ්ටමසර්ගයයි.

---

409. පැසුළු. පසුවැ , එ ගිම්නදන්, ඒ ඝර්මයෙන් තිනනවූ ; විරු, විරයා ; සනහන මෙනෙන් එව්, සන්තර්පණිය කරණ අධ්‍යශයෙන් මෙන්ද ; කලමෙනේ වන මෙසි, කාන්තාවගේ චිත්තයෙහි භවිෂ්‍යත්වූ අමර්ෂය ;* දිගුකරණ මෙනෙන් (එව්), දීඝීකරණ චිත්තයෙන් මෙන්ද ; මේකල් ආ, මෙඝකාලය ප්‍රාප්තවී.

410. විදුකිඳු, විද්‍යුද්රාජි නැමැති ; සලපලු, චඤ්චලවූ පල්ලව ඇති ; බලාකැල, බලාකාසමූහ නැමැති ; පුල්මල්කැන්, පුලුලවූ පුෂ්පස්තබක ඇති ; පොද, වෘෂ්ටි නැමැති ; මීපොද, මධුබිඳු ඇති ; නිල්ගන, නීලවර්ණයෙන් ඝනවූ ; ගන, මෙඝ තෙම ; වනඅතෙව්, වනාන්තර†යක් මෙන් ; තෙව්නේ, බබලන් නේයි.

---

* ආමර්ෂය-සම. † වනාන්තර-සම.

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය

411. ළඳලිය දෙන්නට—ගනකල්හට පටන් ගත්.
තම අකරෙන්* දෙතුන්පන්—සිකිනෙක්වන් වදන් දෙත්.†

412. දලඳරහු දලඳර—මමත සහ කොක් මළරුක්,
සිකිනඹළ පිල්තඹවත්—බෙරෙව් දලමල්පල්ලෙන්.

413. නුබකුස් වි ගනනිල්—හසසර වි ගුම් ගත,
තුරුදු වි වින මෙනෙද—දකුතු නුගි හළ තුල්තද.
(කාව්‍යනාම ගර්භචක්‍රම්.)

414. සිකිනඹළ පිල් ලෙල—කියඹුවැල පොද සිඳුවර,
දසඅඹුවන් පළන් හර—විලසින් දිසි බලාවැල.

---

411. ළඳලිය, අභිනවලතා (දෙහෝ නොහොත්) තරුණි කාන්තා ; සිකින්, මයූරයන් විසින් (දෙහෝ නොහොත්) සඛීන් විසින් ; එක්වන් වදන් දෙත්, නිරන්තරයෙන් වචන දෙනකල්හි ; තම අකරෙන්, තමාගේ අඞ්කුරයෙන් (දෙහෝ නොහොත්) අක්ෂරයෙන් ; දෙතුන් පන්, දෙතුන් පර්ණයක් (දෙහෝ නොහොත්) දෙතුන් දශනොෂ්‡පත්‍රයක් ; ගන කල්හට, මෙඝකාලයහට (දෙහෝ නොහොත්) මෙඝයාට බඳුවූ ප්‍රියයාහට ; දෙන්නට පටන් ගත්, හටගන්නට පටන්ගත (දෙහෝ නොහොත්) දෙන්නට ආරම්භ කළා

412. දලඳරහු, මෙඝයා ; දලඳර මමත, ජලධාරා වහනය කරණකල්හි ; සහ කොක්, බකයන් සහිතවූ : සිකිනඹළ පිල්තඹවත්, මයූරයන් විසින් ආවර්තිතවූ ; පිඤ්ජ§හා තාම්‍රපත්‍ර ඇති ; මළරුක්, මෘතවෘක්ෂතෙම ; දලමල් පල්ලෙන්බෙර එව්, පත්‍ර කුසුම පල්ලවයෙන් භරිතවූවාක් මෙනි.

413. නුබකුස්, ආකාශකුක්ෂිය ; ගනනිල්වී, මෙඝයෙන් නිල් විය ; ගුම් ගත්, ඝොෂා ගත්තාවූ ; හසසර වී, හංසයන්ගේ ගමන විය ; විනමෙනෙද, පක්ෂීන්ගේ චිත්තයෙහිද ; තුරුදු වී, සන්තොෂජාත විය ; නුගී, අනුගතාතොමෝ ; එ දකුතු, ඒ දකුත්ම ; තුල්තද හළ, මහත්වූ සන්තාබධ්‍යය හළා. (කාව්‍යනාම ගර්භචක්‍රයයි.)

414. පොදසිඳුවර, වෘෂ්ටි නැමැති සින්ධුවාර ඇති ; සිකි

---

* අකුරෙන්-සම. † දෙත්වදන්-බොහෝ.
‡ දසනොසපක්ෂපත්‍ර-සම. (වැඩිදුර පරීක්ෂාකරණු.) § පිඤ්ජ-සම.

415. මුසවතළ හස්රැස් සවසනලලමිනස් ගත්,
වස නුවනතැ දිස්මෙන්—තනවමිනඟ තුටු මොනර.
(අභිභ්‍රමම.)

416. ලහුණිනි පුල්කඳුලු—සල පියවුරුමඬලෙන්,
කිළිටඹරෙන් ගන සමා – වියෝ පමා විලස් ලද.
(සනතානොපමා.)

417. තිනී තළා හසකල්—හැමී වැ සී නල බොල්,
දිනී සළා රැස විල්—බිමී වැසී දල වල්.
(පක්‍ෂපත්‍රම.)

---

නඹළ, ශිඛීන් විසින් ආවර්ත්තිතවූ ; ලෙල, චඤ්චලවූ ; පිල්, පිඤ්ඡ නැමැති ; කියඹුවැල, අලකමාලා ඇති ; දසඅඹුවන්, දික්කාන්තාවන් විසින් ; පලන්, ප්‍රසාධිතවූ ; හරවිලසින්, හාරවිලාසයෙන්; බලාවැල, බලාකාපඞ්ක්තිතොමෝ ; දිසි දෘශ්‍යවූ

415. වස, ජලය (ද්‍යොහෝ නොහොත්) විෂය ; නුවනතැ දිස්මෙන්, නයනයෙහි දෘශ්‍යවීමෙන් ; හස්රැස්, හංසරාශිතෙම; මුසවතළ, මූර්ඡාප්‍රාප්ත වූයේය ; සවසනල ලමින්, ශ්වාසානිල පවත්වමින් ; හස්ගත් තටාකකාන්තාප්‍රාප්ත විය ; මොනර, මයූරතෙම ; අඟ තනවමින්, අඞ්ගචලනය කෙරෙමින් ; තුටු, තුෂ්ට වී. (අභිභ්‍රමයයි.)

416. ලහුණිනි, තරුණිකලීර ඇතිහෙයින් (ද්‍යොහෝ නොහොත්) හෘදයොෂණ ඇතිහෙයින් ; පුල්කඳුලු, ඵුල්ලවූ කඳල වෘක්‍ෂ ඇතිහෙයින් (ද්‍යොහෝ නොහොත්) විපුලවූ බාෂ්ප*ඇතිහෙයින් ; සලපියවුරුමඬලෙන්, චඤ්චලවූ මෙඝමණ්ඩලයෙන් (ද්‍යොහෝ නොහොත්) චඤ්චලවූ පයෝධරමණ්ඩලයෙන්; කිලටඹරෙන්, කලිෂ්ටවූ ආකාශයෙන් (ද්‍යොහෝ නොහොත්) මලිනාම්බරයෙන් ; ගනසමා, මෙඝකාලයතෙම ; වියෝපමාවිලස් ලද, විරහකාන්තාවගේ විලාස ලදී. (සනතානොපමායි.)

417. තළාහසකල්, තටාකහංසකාන්තාතොමෝ ; තිනී, කම්පා වූව ; බොල්නල, බහලමාරුතයතෙම ; සී වැ හැමී, සීතලවැ හැමීය ; විල්, තටාකයතෙම ; සළාරැස දිනී, ජටා සමූහය ජනිත කරවිය ; වල්, වනයතෙම ; දල වැසී, පත්‍රයෙන් සඤ්ජනනව; බිම්, බැබලිනි. (පක්‍ෂපත්‍රයයි.)

---

* වාෂ්ප-හැම.

418. බිඟුරද අරද දිසි—ලියනගලාලිය කුසුම්,
වියොවුග වුදු සරසහස්—හුරිරවල අඟනන් පෑ.

419. මලපවනා බිඳුපොද—වී පිඹු වනා නෙකෙවුල්,
සිකි ඉඟි නා කෙළෙ මත—තම වී වැසි වදල් අත.
(කවිනාම ගර්භචක්‍රම් )

420. ගනකල්හු දස්නෙහි—පියබ මිහිකත සැරහූ,
සිඳුවර බර වරල් අළ—සඟ ද්‍යො කද්‍යො වනහිස්.

421. දලදරහු ගිම් සොයත්—දසැඳිරි වත් දෙත් ලෙල,
දලන විදුපෙණෙහිලි මුත්—දලරොන් වන් කබබපෙල.
(ධ්වජම්.)

---

418. අදර දිසි, නිරන්තරයෙන් දෘශ්‍යවූ ; බිඟුරද, භෘඞ්ග සමූහයන්ගෙන් යුක්තවූ ; කුසුම්, කුසුම් ඇති ; ලියනගලාලිය, ලාඞ්ගලීලතාතොමෝ ; වියොවග වුදු, අනඞ්ගයා විසින් විඩවූ ;* සරසහස්, ශරසහස්‍රයෙන් යුක්තවූ; හුරිරවල, රුධිරාකූලවූ ; අඟනන් පෑ, අඞ්ගනාවන් දැක්වී.

419. පොදබිඳු, වෘෂ්ටිබින්දු නැමැති ; මලපවන් ආ, මලය මාරුතයා ප්‍රාප්තවීය ; වනා, වනයෙහි ; නෙකෙවුල්, අනෙක කොකිල සමූහතෙම ; පිඹු වී, රුස්වීය ; මතසිකි, මත්තමයූර තෙම ; ඉඟි, එක්ව ; නා කෙළේ, නාද කෙළේ ; අත, දිසාන්තය තෙම ; වැසිවදල්, මෙඝපටලයෙන් ; තම වී, අන්ධකාර වී. (කවිනාම ගර්භචක්‍රයයි.)

420. සඟ ද්‍යො, ජෝති සහිතවූ ; කද්‍යො, ඛද්‍යෝතයන් විසින් උපලක්ෂිතවූ ; වනහිස්, වනශීර්ෂයතෙම ; ගනකල්හු, මෙඝ කාලයාගේ ; දස්නෙහි, දර්ශනයෙහි ; පියබ, ප්‍රගල්භවූ ; මිහිකත, මහීකාන්තාව විසින් ; සැරහූ, ප්‍රසාධිතවූ ; සිඳුවරබර, සින්ධුවාර පුෂ්පයෙන් භරිතවූ ; වරල් අළ, ධම්මිල්ල ශොභාව එළවූ.

421. කබබපෙල, ඉන්ද්‍රගොපක පඞ්ක්තිතොමෝ; ගිම් සොයත්, ග්‍රීෂ්මාන්වෙෂණය කරන්නාවූ ; දලදරහු, මෙඝයා විසින් ; දසැඳිරි වත්, දිසාව අන්ධකාර වත්ම ; ලෙලදෙත්, ලලිත කරන්නාවූ ; දලන විදුපෙනෙහෙලි, ජ්වලිතවූ විද්‍යුත් නැමැති උල්කායෙන් ; මුත්, ගිලිහුනාවූ ; දලරොන් වන්, අග්නිකණිකා වැනි. (ධ්වජයයි.

---

* විදදුවූ-සම.

422. නන් ලිය පෙල ලෙල—කිසලත් වටා නටමින්,
ගනකල්හු දැක්මෙන් මත්—බිඟු ගී නඟා කන් ගත්.

423. ලියනඟලා මල්—පෙති ගලතග* සිලිල්බිඳු,
සුරතැඟිලි අගිනඟනන්—ගිලියෙත් දිමුතු මුතු පෑ

424. වැඩි කලහස දස—වැසී වන දෙදෙලෙනි කඳල,
පෙලෙ ලදමින්වන පියඹ—සරා වන උදුලෙසෙමේ.†

(අතීවතුෂ්ටයම්.)

---

422. ගනකල්හු දැක්මෙන්, මෙඝ නැමැති වල්ලභයාගේ දර්ශනයෙන්; මත්, මත්වූ; නන්ලියපෙල, නානා‡ ලතා පඞ්ක්තිතොම; ලෙල, ලලිතවූ; කිසලත්, පල්ලව නැමැති හස්තයෙන්;§ වටා, වෘත්ත කොට; නටමින්, නර්තනය කෙරෙමින්; බිඟු, භෘඞ්ගයන් කරණකොට ගෙණ; ගී නඟා, ගීතොච්චාරණය කොට; කන් ගත්, ශ්‍රවණ ග්‍රහණය|| කළා.

423. ලියනඟලාමල්, ලාඞ්ගලිකුසුමයතෙම; පෙති අග, පත්‍රාග්‍රයෙන්; සිලිල්බිඳු ගලත, ජලබින්දු වැහෙන කල්හි; අඟනන්, අඞ්ගනාවන්ගේ; සුරතැඟිලි අගින්, සුරක්තාඞ්ගුලිකාග්‍රයෙන්; ගිලිහෙත්, වැහෙන්නාවූ; දිමුතු මුතු පෑ, දීප්තිමත්වූ මුක්තාඵල දැක්වූ.

424. කල හස වැඩි දස, කලාවූ සශ්‍යවර්ධිතවූ දිගන්තය; (නොහොත්) කලහස වැඩි දස, කාලහංසයන් පැලවූවාවූ දිගන්තය; (නොහොත්) කල වැඩි අහසදස, කීර්ණත්වය වැඩියාවූ ආකාශදිගන්තය; (නොහොත්) වැඩි දසහස කල, වර්ධිතවූ¶ දිගන්ත ලාඤ්ජන කරණ ලදී,—කඳල දෙලෙනි වැසී වන, කඳල** පත්‍රයෙන් සඤ්ජනන විය; (නොහොත්) අල දෙලෙකඳනි, අලුවාවූ ජලස්කන්ධයෙන්; වන වැසී, වන ප්‍රච්ජන්න විය; (නොහොත්) වන, විරහිතෙම;†† කඳල දෙලෙනි වැසී, බාෂ්පජලයෙන් සඤ්ජනනවිය; (නොහොත්)

---

* පෙතින් ගලත-බොහෝ.

† කලහස වැඩි දස කඳලි දෙලෙනි වන වැසි,
මින් වන පියඹ පෙලෙලද සරාවනඳුල එසෙමේ-ඇතම්.

‡ නොයෙක්-බොහෝ. § හස්තායන්-සම. || හරණය-හැම.

¶ වර්ධිත-සම. ** කඳලි, කඤලී-සම. †† විරහිතොම-සම.

425. සුරසැව් මිණිරසන්—බලාවැල හර විදුදම්,
දසකත් මුහුදු පියහට—පියවුරු පහස් ගොස් දුන්.

426. නො නෙද පියුම් වත—විල්කත එන බිඟුපියන්,
වනපෙත සී කඳලනෙන්—පලු අතින් දුරුලා මෙන්.

වනකඳ, වනස්කන්ධයතෙම ; ලදෙලෙනි වැසි, තරුණිපත්‍රයෙන් සඤ්ජනන විය ;—පෙලෙ, පඞ්කයෙහි ; මින්වන්, මත්ස්‍ය සමූහතෙම ; ප්‍රියඅඹ ලද, ප්‍රියවූ ජලය ලද ; (නොහොත්) අඹපිය, සමුද්‍රකාන්තාතොම ගෙවත් ගඞ්ගාතොම ; අමින්, අමිතවූ ; පෙලෙවනලද, පඞ්ක ජලය ලද ; (නොහොත්) අඹවන, ආම්‍රවනයතෙම ; අමින්, අමිතවූ ; පිය පෙලෙ ලද, ප්‍රියවූ පලුව ලද ; (නොහොත්) අඹ, ආකාශය තෙම ; පියමින් (ව), ප්‍රියවූ තාරකාවන්ගේ ; (න) පෙලෙ ලද, එල නොලදී ;—එසෙමේ, ඒ සමයෙහි ; සරා, සරසීතොම ; වන්, ජලයෙන් ;* උදුලේ, ඉතිරිණි ;† (නොහොත්) එසෙමේ, එසමයතෙම ; උදුල සරා, උජ්ජ්වලිතවූ ; පද්මයෙන් ; වන, විරහිත විය ; (නොහොත්) එසෙමේ, එසමයෙහි ; සරා වන, සරාගීවූ විරහීතොම ; උදුල, උජ්ජ්වලිතවීය ; (නොහොත්) එසෙමේ, එසමයෙහි ; වන, වනයතෙම ; සරා උදුල, ප්‍රභායෙන් උජ්ජ්වලිත වී. (අර්ථචතුෂ්ටයයි.)

425. සුරසැව්, ඉන්ද්‍රචාප නැමැති ; මිණිරසන්, මාණික්‍ය මෙඛලා ඇති ; බලාවැල, බලාකාපඞ්ක්ති නැමැති ; හර, මුක්තාහාර ඇති ; විදුදම්, විද්‍යුත් නැමැති කනකදාමයක් ඇති ; දසකත්, දික්කාන්තාතොම ; මුහුදුපියහට, සමුද්‍ර වල්ලභයාහට ; ගොස්, ගමනය කොට ; පියවුරු පහස්, මෙඝ ස්පර්ශය (ද්‍යොහෝ නොහොත්) ස්තනස්පර්ශය ; දුන්, එළවූ.

426. විල්කත, සරසී නැමැති කාන්තාව ; එන බිඟුපියන්, සම්පවන්නාවූ භෘඞ්ගවල්ලභයන්ට ; පියුම් වත නොදෙත, පද්ම නැමැති මුඛය නොදෙත්ම ; වනපෙත, වනපඞ්ක්ති නැමැති කාන්තාතොමෝ ; කලඳනෙන්, කඳලී කුසුමයන් කරණකොටගෙණ ; සී, ස්මිතය කොට ; පලුඅතින්, පලුව නැමැති හස්තයෙන් ; දුරුලා මෙන්, දුරුකරන්නියක මෙනි.

* වනයෙන්-හැම. † ඉතුරුණු-ඉතිරුණ-සම.

427. මුහුලු මිණිදූදුරු වී—කඳුලු කැකුළු වී වනන්,
මුහුලු මිණිදූදුරු වී—කඳුලු කැකුළු වී වනන්.

(සමුද්ගයමකම්.)

428. සිඳැ කලුනසඳ තද—සඳහන්නී දෙන කලනට,
ලඟා අඟයහත් දින්—සිහිලැල්කැදි* නෙලෙ සලා.

(නිරොෂ්ඨ්‍යම්.)

429. සඟ කඳල වන වත—සඟ කඳල වන වත,
ලදල වත වනත් කල්—ල දල වත වනත් කල්.

(එකාක්ෂරම්.)

---

427. වනන්, විරහීන්ගේ; මුහුලු; ධම්මිල්ලයතෙම; මිණි දූදුරු වී, බන්ධනමුක්ත විය; කඳුලු කැකුලු වී, බාෂ්පයා මුඛ්‍ය† විය; වනන්, වනයන්ගේ; මුහුලු, මුකුලවූ කුසුමය; මිණි දූදුරු වී, මණිජර්ජර විය; කඳුලුකැකුළු වී, කඤලිකුඞ්මල විය (සමුද්ගයමකයයි.)

428. කලුන්,‡ කාන්තාවන්ගේ; තද අසද සිඳැ, සනබවවූ ආමර්ෂ§ ඡෙදය කොට; සඳහන්නී දෙන කලනට සමරණ යෙන් ජීවත්වන්නාවූ කාන්තාවන්ට සිහිලැල්කැදි, අතිසීත|| සමූහ ඇති; සලානෙලේ, ආවර්තිතමාරුතයතෙමේ; ලඟා, සමීප කොට; අඟයහත් දින්, අඞ්ගශයනය එළවී. (නිරොෂ්ඨ්‍ය යයි.)

429. වන, වනය; සඟ කඳල වත, කඤලීක සහිත වත්මැ; වන, විරහීන්ගේ; වත, වකත්‍රතෙම; සහකඳල (ලද), බාෂ්ප සහිත බව ලද; වනන්, වනයන්ගේ; කල්, මනො ඥවූ; ලදල වත, තරුණපත්‍ර ඇතිවන කල්හි; වනන්කල්, විරහ පුරුෂයන්ගේ;¶ ල දල වත, ලයොජ්ජ්වලිත වී. (එකා ක්ෂරයයි.)

---

* කද-සම. † මුඛන-සම. ‡ කලත්-සම. § අමර්ෂ-බොහෝ.
|| සීතල-සම. ¶ සත්‍රීන්ගේ-බොහෝ.

430. වැළඳී ලියවමියන්—පහසිසිරයට* තුස්මින්,
කියලී කොළඹතුරුගත්—කුසුමෙන් ලොමුදහ පබඳ.

431 දුන් ලියනකරන් පත්—දුන් ලියනකරන් පත්,
වෙනෙ කඳලනෙන් අද වී—වෙනෙ කඳලනෙන් අද වී
(සඤංශය.)

432. දුනුකෙ කැකුළු ලකුළු—බිඟුවැල අරද රඳනා,
ලියවැට සැදී වන නිවෙසැ—සඟ දුම් වැටුප් වන් වී

433 මුහුලු තුරු ලද කුසුම්—නවවතුරු ලද නන්නී,
කොළඹවෙනෙ වන පවන්—තැනැවී වෙනෙ වන දනන්.
(කවාටම්.)

---

430. කොළඹතුරුගත්, කදම්බද්‍රැම නැමැති ගාත්‍රයතෙම; වැළඳී, ආලිඞ්ගනය කළාවූ; ලියවමියන්, ලතාවනිතාවන්ගේ; පහසිසිරයට, පහස ඓශ්වර්‍ය්‍යයට; තුස්මින්, සන්තුෂ්ට වෙමින්;† කුසුමෙන්, කුසුමයන් කරණකොට ගෙණ; ලොමු දහ පබඳ, ලොමොද්ගමප්‍රබන්ධය; කියලී, හැඟවී.

431. ලියන් දුන්, ලතාවන් විසින් ජනිතවූ; අකරන්පත්, අඞ්කුරපත්‍ර ඇති; වෙනෙ, වනයතෙම; කඳලනෙන් අදවී, කන්‍දලිකයෙන් (වනමුව) ආර්ද්‍ර විය; වෙනෙ, විරහයෙහි; ලියන් දුන්, අඞ්ගනාවන් විසින් දෙනලද; අකරන්පත්, අක්‍ෂර සහිතවූ පත්‍රයතෙම; කඳලනෙන් අදවී, බාෂ්පයෙන් ආර්ද්‍ර වී. (සඤංශයයි.)

432. අරද රඳනා, නිරන්තරයෙන් හොබනාවූ; බිඟුවැල ලකුළු, භෘඞ්ගාවලියෙන් අලඞ්කෘතවූ; දුනුකෙ කැකුළු, රාජ කෙතකීකුඩ්මලතෙම; වනනිවෙසැ, වන නැමැති නිවෙසම යෙහි; ලියවැට සැදී, ලතා නැමැති ප්‍රදීපාධාරයෙහි සජ්ජිතවූ; සඟ දුම්, ධූම සහිතවූ; වැටුප් වන් වී, ප්‍රදීපාකාර වී.

433 මුහුලු තුරු කුසුම් ලද, වකුලද්‍රැම කුසුම ලද; නන්නී, නානා නදීතොම ‡ නුවවතුරු ලද කාමෝඝ ලද; කොළඹවෙනෙ වන පවන්, කදම්බවනයෙහි වනමාරුතය; වෙනෙ වන දනන්, විරහ වන්නාවූ ජනයන්; තැනැවී, කම්පා කෙළේ. (කවාටයයි )

---

* සිසිරට-සම. † හඟවමින්-සම. ‡ නුමූ-සම.

434. ලියනගලාකුසුමෙන්—ලැවග ගතෙව් වනපෙත්,
එයින් මුතගරොන් වන් සුරතිඳුගොව් සියලු දුලු

435. වෙනේ හැසී නවදල—සමා වැසූ සඳලෙන්,
ගෙනේ දිසී නවදල—පමා වුසූ සඳලෙන්.

(ගොමූත්‍රිකා.)

436. ගනපොද කෙසුරුබර—දිගුදළ වතළ කොක්පෙල,
ගනගුම් ගැඹුරු නැදයෙන්*—පැළඹිනි පැදුම්සිරජ.

437. බැජූ තඹවතුරු නී—පමා තරගුතුරු ලා,
ලැගී තද යතුරුසේ—පියා තමා පතු නිඳු.

(මුරජබන්ධනම්.)

---

434. වනපෙත්, වනපතතිතොම ; ලියනගලා කුසුමෙන්, ලාංගලීකුසුමයන් කරණකොට ගෙණ, ලැවග ගත් එව්, දවාගනි ගත්තියක බඳුවූය ; දුලු, දීපතිමත්වූ ;† සුරතිඳුගොව් සියලු, රක්තවූ ඉන්ද්‍රගොපකසමූහතෙම ; එයින් මුත්, ඒ වහනි යෙන් ගිලිහුනාවූ ; අගරොන් වන්, අගනිකණිකා වැනිය.

435. වෙනේ, වනයතෙම ; නවදල හැසී, තරුණ පත්‍ර යෙන් සඤ්ජනනවිය ; සමා, පෘථිවීතොමො ; සඳලෙන් වැසූ, ෂාඩ් වලයෙන්‡ වසනලද ; ගෙනේ, මෙඝයෙහි ; නවදල දිසී, අලුත් ජල දෘශ්‍ය විය ; පමා, විරහසත්‍රී§ තොම ; සඳලෙන් වුසූ, ශෝකාගනීන් වාසය කළා. (ගොමූත්‍රිකාඅශ්වපාදමුරජබන්ධ නාමුබවඡදනාදිජල.)||

436. ගනපොද, සාන්ද්‍රවූ වෘෂ්ටිබින්දු නැමැති ; කෙසුරුබර, කෙසරභාර ඇති ; වතළ, විසතීර්ණවූ ; කොක්පෙල, බලාකා පඞ්ක්ති නැමැති ; දිගුදළ, දීර්ඝදංෂ්ට්‍රා ඇති ; ගනගුම්, ඝන ගර්ජ්ජනා නැමැති ; ගැඹුරු නැදයෙන්, ගම්භීරධ්වනිය කරණ කොට ගෙණ, පැදුම්සිරජ, ප්‍රද්‍යුම්න නැමැති සිංහරාජතෙමේ ; පැළඹිනි, විජෘම්භිත වී.

437. නිපමා, නදී නැමැති ප්‍රමදාතොමෝ ; තඹවතුරු, තාම්‍රොෂ්ඨ (දොහෝ නොහොත්) රක්තවස්ත්‍ර ; බැජූ, සෙවනය කොට ; තරග, තරඞ්ග¶ නැමැති ; උතුරු ලා, උත්තරශාට

---

* නාදෙන්-බොහෝ. † දීපතවූ-සම. ‡ ශාඩාමණ්ඩලයෙන්-බොහෝ.
§ විරහී=සම. || (මේ කිම ?). ¶ රල-සම.

438. නුරාරෙසෙනද හිද—වියොවග වුදු සරසහස්,
කියලි නුබද වියොවුන්—සහ කෙසර පුල් මල් නී.

439. ගිලි වලා දස අත්—වැනී ලැගී සිකි පිල්,
දිලී බලාරැස මත්—තිනී මැගී සැකි කල්.
(ගොමූත්‍රිකාඕපාදම්.)*

440. විදුයොත් දෙවිදුනුපට—ගිගුම් ගැජුම්කොක්පෙලදළ,
පොදමෙදේ මේගජ†—පියුම්වනන් කෙළෙ කබලා.‡

441. හැමී වැ සී නෙලෙ බොල්—තෙමී වැසි මලගල්,
බිමී හැසී දෙලෙ වල්—නිමී මැසී කල කල්.
(අවුල්ජාලය.)

---

කය ලා ; තද සතුරුංසෙ (වැ), සනබඩවූ යාත්‍රාව සෙවනය කොට ; ලැගී, සමීපවැ ; තමා පියා, තමාගේ වල්ලභවූ ; නීඉඳු, නදීඤයා කරු ; පතු, ප්‍රාප්තවූ. (මුරජබන්ධනයයි.)

438. සහ කෙසර, කෙසර සහිතවූ ; පුල් නීමල්, පුල්ලවූ නීපකුසුමතෙම ; නුබද, අනුබන්ධයෙන් ; නුරාරෙසෙනද, අනුරාගරසයෙන් ආර්ද්‍රවූ ; වියොවුන්, විරහීන්ගේ ; හිදවුදු,§ හෘදය විද්දවූ ; වියොවග, අනඞ්ගයාගේ ; සරසහස්, ශරසහස්‍රයන් ; කියලි, හැඟවී.

439. වලා, වලාහකතෙම ; දසඅත් ගිලි, දිශාන්ත ගිලිය ; සිකි, මයූරතෙම ; ලැගී, සමීපව ; පිල් වැනි, පිඤ්ඡාවර්තනය කෙළේය ; මත් බලාරැස, මත්වූ බලාකාපඞ්ක්තිතොම ; දිලී, ජ්වලිතවූය ; මැගී, පථිකතෙම ; කල් සැකී, කාන්තාව කෙරෙහි ශඞ්කා කොට ; තිනී, කම්පා වී.

440. විදුයොත්, විද්‍යුත් නැමැති යොත්‍ර ඇතී ; දෙවිදුනු, ඉන්ද්‍රචාප නැමැති ; පට, කාඤ්චපට්ට ඇති ; ගිගුම්, මේඝධ්වනි නැමැති ; ගැජුම්, ගර්ජනාඇතී ; කොක්පෙල, බලාකාපඞ්ක්ති නැමැති ; දළ, දංෂ්ට්‍රාඇති ; පොදමෙදේ, වෘෂ්ටි නැමැති දන ඇති ; මේගජ, මෙඝහස්තිතෙම ; පියුම්වනන්, පද්ම නැමැති වනයන් ; කබලා කෙළෙ, ග්‍රාස කෙළේ.

441. බොල්නෙලෙ, බහලමාරුතයංතම ; සිවැ, ශීතලව ;

---

* අඤ්චපාදම්-හැම. † මදමේගජ-බොහෝ.
‡ කබල-බොහෝ. § විදු-හැම.

442. දෙලෙනිපිල බිඟු දූගැ—ලියවැට ගත කුසුම්රොන්,
රිණී මිණී ඉනුදමවැල—විලසළ ලෙල විලසිඳුන්.

443. ගනකල්හු පොදපතර—සරසිය ලත එක්වන්,
පොරළ මිණිනිල් ගී වම්—වලා පිහිකුළු ගල්බෙළෙ

444. වගල පොදරැස වලග—හිවත් මියුරු යළි පිල්,
ගන නිල්මිණි එබී මෙද—ළෙනුදම් කළුන් ලී කර.

(චතුරශ්‍රජාලම්)

---

හැමී, වහනය කෙළේ; වැසී, වෘෂ්ටිතොම; මලගල් තෙමී; මලයපර්වතය තෙමනය කෙළේ; වල්දෙලෙ, වනපත්‍රතෙම, හැසී බිමී, ගහණව භ්‍රමත් විය; කල, කාන්තාවන්ගේ; කල්, කාන්තයා කෙරෙහි; මැසී, අමෂීය;* නිමී, නිෂ්සිතයි. (අවුල්ජාලයයි)

442. දෙලෙනිපිල, ජලයෙන් ප්ලාවිතවූ; බිඟු දූගැ, භෘඞ්ග නිරොධිතවූ; ලියවැටගත, ලතාවගේ සමන්තා†වෘත්තයෙහි සිටියාවූ; කුසුම්රොන් රිණී, පුෂ්පරේණුරාශිතෙම; ලෙල විලසියන්, ලලිතකාන්තාවන්ගේ; මිණී හිනු‡දම්වැල, මාණික්‍ය සහිතවූ මෙබලාදාමයෙක්හි; විලස් අළ, විලාස එළවී.

443. ගනකල්හු, මෙඝකාලයා; පොදපතර, වෘෂ්ටිසමූහ නැමැති; සරසිය, ශරශතයන්; එක්වන් ලත, නිරන්තරයෙන් විදිනාකල්හි; වලාපිහිකුළු මෙඝයෙන් පිහිතවූ; ගල්බෙළෙ, ශෛලභටතෙම; මිණිනිල්වම්, ඉන්ද්‍රනීලවර්මයක්; පොරළ ගී, ප්‍රාවෘත වූවාක් බඳු වී.

444. මියුරු, මයූරතෙම; වලග, වාලධියඅග්‍රයෙහි; වගල, ගලිතවූ; පොදරැස, වෘෂ්ටිසමූහයා; හිවත්, විශීර්ණ කළ කල්හි; ගනපිල්, ඝනවූ පිඤ්ඡතෙම; නිල්මිණි එබී මෙද, ඉන්ද්‍රනීලමාණික්‍ය පරාජය කෙළේ මතු නොවෙයි; යළි, නැවත; කළුන්, කාන්තාවන්ගේ; ළඳම් කර, ළඳුමවූ කාඤ්චිකශෘය; ළෙන්, හෘදයෙන්; ලී, ඡේදනය කෙළේ. (මේ දෙකවින් චතුරශ්‍රජාලයයි.)

---

* අමෂීය-අමෂීණය-සම. † ලතාගෙසමන්තා-සම

‡ හුඹ-ඉනු-සම.

445. නිල්වලා වනන්—සවසනලගසදූවි* වන්.
ගත විතුර දසන් බද—ගත හැඟි ලී පියන් තද.
(ත්‍රිශූලම්.)

446. නවදල ලද වන—වී පවන නවප වී,
සදල ව වලදස—නී තනනනනතනී.
(සම්වතොභද්‍රම්.)†

447. නී පිපි වි ලද වනත—දලදර පවන විනි ලෝ,
ලෝ නිවි නවපරද ලද—තනව දල වි පිපි නී.
(අනුලොමප්‍රතිලොමම්.)

448. වැලලඟ‡ උස් වෙළෙපැ—වෙළෙපැ වොත් සියොත් බුජුහී
රුහැ දත් මිත්කැල වතුරු—වතුරු§ නීහඟ නො තබත්.

---

445. වනන්, විරහීන්ගේ; සවසනලගස දූව වන්, ශ්වාසා නිලප්‍රහාරයෙන් දගධවූවාක් බඳුවූ; දසන් විතරගත, දිගුන්ගේ විසතර ගත්තාවූ; නිල්වලා, නීලවලාහකතෙම; පියන්, ප්‍රියාවන්ගේ; තදබද, සනබධව බඩවූ; ගතහැඟි ලී, මාන චෙඡදනය‖කෙළේ. (ත්‍රිශූලයයි.)

446. වන, වනයතෙම; නවදල ලද, තරුණපත්‍ර ලද; වී, පක්ෂීන් හා; නවප, අලුත් ජලය හා; පවන, මාරුතය; වී, විය; වලදස, වනානතයතෙම; (නව) සදලව (ලද), අභිනව ශාඛාවල ලදී; නී, ගඞගාතොම; තනන, කමපිතවන්නාවූ; අනතනී, අනනතවූ නීපද්‍රැම ඇති වී. (සම්තොභද්‍රයයි.)

447. නී, නීපවෘක්ෂතෙම; පිපි, සුපුෂපිතවූය; වි, චාතකා තොම; වනත ලද. ජලය ලද; ලෝ, ලෝකයතෙම; දල දර පවනවිනි, ජලධර මාරුතය අනුභවකෙළේ; ලෝ. භූමි තොම; අරද, නිරනතරයෙන්; නවප ලද. අලුත් ජලය ලදින්; නිවි, නිඛබුත¶ වූව; නි, නදීතොම; දලපිපි, ජලයෙන් මහත්ව; තනවනී, කමපාවූ. (අනුලොමප්‍රතිලොමයයි.)

448. නීගඟ, නදීගඞගාව; වතුරු, ප්‍රවාහයෙන්; අතුරු

---

* ගසැදම්-සම. † මේ අඩිපාද ප්‍රතිලොම යමකයයි හැගේ.
‡ වැලලඟ-සම. § අතුරු-හැම. (මේ සංදංශයමක භෙදයකි.)
‖ මනචෙඡදය-සම. ¶ නිර්වෘත-සම.

449. සරඟ වැල වතුරුනෙන්—සරඟවැල වතුරුනෙන්,
සරඟවැල ව තුරුනෙන්—සරඟ'වැල වතු රුනෙන්.
(මහායමකම්.)

450. කෙමැලිනි කස්* තුරුනෙන් —කෙමැලිනි කස්* තුරුනෙන්,
සුලු තිසර තරඟනෙන්—සුලු තිසර තරඟනෙන්.
(අඩියමකම්.)

451. විලසළ විල් විලසී—නළමුත් සිකි හසරනෙන්,
මනහර පසක්සර වූ—නළමුත් සිකි හසරනෙන්.
(පාදභාසසම්.)

---

නොතබත්, අනතරයක් නොතබනකල්හි ; මින්කැල, මත්‍ස්‍ය සමූහතෙම ; වැලලහ, තීරොපාන්තයෙහි ; උස්වෙලෙපැ, උච්චවූ වෘක්ෂයෙහි ; වෙලෙපැ. විටපයෙහි ; බත්, බඟනලද ; සියොත් මුජුහි, පක්ෂිබීජයෙහි ; රැහැ දත්, රස දත.

449. (සර, සරසිතොම ;) වැල, වෙලාන්තයෙහි ; සරඟ වතුරුනෙන්, චාතකයන් හා ප්‍රවාහයෙන්ද ; (සර, කාන්තා තොම ; සරඟවැල, සාරවූ අඞ්ගලතායෙන්ද ; වතුරුනෙන්, වක්ත්‍රලෞරුයෙන්ද ; (සරසිතොමෝ) සරඟවැල, උතුම්වූ පියුම් සමූහය හා ; වතුරුනෙන්, මාරුතවෘක්ෂයෙන්ද ; (කාන්තාතොමෝ) සරඟ, යහපත්වූ ශොභායෙන් ; අවැල, ගැවසීගත්තාවූ ; වතු, වස්ත්‍රයෙන් හා ; රුනෙන්, රූපයෙන්ද :—

450. (සර, සරසිතොම ;) කුස්. කුක්ෂියෙහි ; කෙමැලිනි, වේණිමාලායෙන්ද ; තුරුනෙන්, ද්‍රැමයෙන්ද ; (කාන්තාතොම) කෙමැලිනි, කෙස කුසුමයෙන්ද ; කස්තුරුනෙන්, කස්තුරි කාවෙන්ද ; (සර, සරසිතොම ;) තිසර සුලු, හංසයන්ගෙන් ව්‍යුතවූ ; තරඟනෙන්, තරඞ්ගයෙන්ද ; (කාන්තාතොම) සුලු තිසර, දූරුවාවූ මුත්හරින්ද ; තරඟනෙන්, ශොභා සහිතවූ අඞ්ගයෙන්ද :—

451. විල්, සරසිතොම ; නළමුත්, නෘත්‍යයෙන් මුක්තවූ ; සිකිහසරනෙන්. මයූරයන්ගේ සඤ්චාරයෙන්ද ; නළමුත්. වඤ්චායෙන් මුක්තවූ ; සිකිහසජනෙන්, සඛීන්ගේ සඤ්චාර යෙන්ද ; මනහර, මනොඥවූ ; පසක්සරවූ, ප්‍රත්‍යක්ෂචාරීවූ ; විලසිවිලස් අළ, විලාසිනියකගේ විලාස එළ වූ. (මහයමා, අඩියමා, පාදභාසසයි.)

---

* කුස්-සම.

**452.** වන් වුවන් වනන්—නව වී නන් වෙනේ වන්,
නා වි වී* වෙනේ නී—නී වන් වී වනනුවන්.
(ව්‍යඤ්ජනම්.)

**453.** නානී'නු නේ නී—නන්නී නෑ †නානා,
නනුනනී නන්නී‡—නේනීනා නින්න නී.
(ඒකාක්ෂරම්.)

**454.** පොදපෙලරළ පබල—වැල ඉඳුසැව් ගිගුම්ගොස්,
කොකසකපෙළ ගනමුහුදු—සරා ඉසී මුවමු වී.

**455.** සක්§ දද පිළිලොමාය පදයමාය විතර,
මහමේසමාය දුලු වසමාය මෙ කියූ සග.

නවවන සග.

---

**452.** වනන් වුවන් වන්, විරහීන්ගේ වකත්‍ර බඳුවූ; නන් වෙනේ, නානාවනයෙහි; වන්, වර්ණය; නව වී, අභිනව විය; නීවෙනේ, නීපවනයෙහි; වී, පක්ෂීන්ගේ; නා වී, නාද විය; වනනුවන්, විරහීන්ගේ නෙත්‍ර; නී වන් වී, නදී සමාන වී. (ව්‍යඤ්ජනයයි.)

**453.** නේ, පමණ|| නැත්තාවූ; නානී, නාගවෘක්ෂ හා නීප ද්‍රැමයෝ; නීනූ, ජලයට අනුවූහ; නන්නී නෑ, නානානදී යෙහි ස්නානය කළාවූ; නානා, නාගයන්ගේ නාද ඇත්තාහ; නනුන නී, නානාස්ථානයෙන් උනන්නාවූ ජලයඇති; නන්නී, නානානදීහු; නේ නීනා, අමිතවූ නදීනායකයන්ගේ; නින්න, නිමනස්ථානයට; නී, පැමිණියෝ. (ඒකාක්ෂරයයි.)

**454.** පොදපෙල, වෘෂ්ටිපඞ්ක්ති නැමැති; රළ, තරඞ්ග ඇති; ඉඳුසැව්, ඉන්ද්‍රචාප නැමැති; පබලවැල, ප්‍රවාලපඞ්ක්ති ඇති; ගිගුම්, ගර්ජනා නැමැති; ගොස්, ඝොෂඇති; කොක, බලාකා නැමැති; සකපෙළ, සඞ්ඛපඞ්ක්ති ඇති; ගනමුහුදු, මෙඝ නැමැති සමුද්‍රයතෙම; සරාඉසි, ශරත් නැමැති අගස්ති හුගේ; මුවමු වී, මුඛයට සම්ප්‍රාප්ත වී.

**455.** සක්දද, චක්‍රධ්වජයද; පිළිලොමාය, අනුලොමප්‍රති ලොමද; යමාය පදවිතර, යමක නම් පද¶ යන්ගේ විස්තරද; දුලු, ජ්වලිතවූ; මහමේසමාය, මහත් මෙඝකාලයද; (මෙඝා න්ධකාරය විධ්වංශනයට ප්‍රාප්තකාලයද) මෙ වසමාය කියූ සග, මේ විෂම කොට කීවාවූ සර්ගයයි.

නවම සර්ගයයි.

---

* වනා-බොහෝ. (විනා-ගීත් මැනවි.) † නා-සම. ‡ නන් නීනී-බොහෝ.
§ සක්පිළි-හැම්. || ප්‍රමාණ-සම. ¶ යමකානද-සම.

456. මෙසි දුරළූ මෙනෙහි—වතළඟනන් සනා පෑ,
ඝනවදල විදුහන් පත්—දියැ පා බඳ සරාකල්.

457. හමල නෙලෙ සරා—සරා සිසි සොමි ඉසිලි,
සිලි ගිරිරඟනී මියුරු—මියුරු සර ලී හස්කැන්.

458. මොනරඹළ පිල් නිල්—මහනෙල්කැන් බලාවැල,
මලිගියමල්දම් හළ—දසකත් යත් ඝනපියා.

459. ලියමල්කැනට රෙසී—සැදූහ තන ලොදරෙදෙන්,
නිකම් දිගුවිලැ සියෝ—ලියහස වී විලැසියෝ.

460. මීගඳ ගබපවන්—හෙත හත්වණ්ණවෙනෙන් පුල්,
මතැත් කොපොලත්නි තෙමී—ම්මන ගළ මිනි තෙමී.

---

456. අඟනන්, අඞ්ගනාවන්ගේ; මෙසි දුරළූ මෙනෙහි, ආමර්ෂය දුරුකළාවූ සිත්හි; වතළ, විස්තීර්ණවූ; සනා පෑ. ස්නේහය දක්වා; සරාකල්, ශරත්කාලයතෙම; ඝනවදල විදුහන් පත්, මේඝාන්ධකාරය විධ්වංසනයට සම්ප්‍රාප්තකාලයෙහි; දියැ පා බඳ, ජගත්හි පදන්‍යාසය කෙළේ.

457. සරානෙලේ. ශරද්මාරුතයතෙමේ; හමල, වහනය කෙළේ; සරා, ප්‍රභා සහිතවූ; සිසි, චන්ද්‍රතෙම; සොමි ඉසිලි, සෞම්‍යය දැරීය; මියුරු, මයූරතෙම; ගිරිරඟනී, පර්වත නැමැති රඞ්ගභූමියෙන්; සිලි, ච්‍යුතවීය; හස්කැන්, හංසසමූහතෙම; මියුරු සර ලී, මධුරස්වර පැවැත්වී.

458. ඝනපියා, මේඝප්‍රියයා, යත්, පහවූ කල්හි; දසකත්, දික්කාන්තාතොමෝ, මොනර, මයූරයන් විසින්; අඹළ, ආවර්ත්තිතවූ; නිල්පිල්, නීලපිඤ්ඡ නැමැති; මහනෙල්කැන්, ඉන්දීවරාවතංසයද; බලාවැල, බලාකාපඞ්ක්ති නැමැති; මලිගියමල්දම්, මාලතීකුසුමදාමයද; හළ, දුරුකළා.

459. විලැසියෝ, විලාසිනීහු; ලියමල්කැනට; ලතාකුසුමස්තබකයට; රෙසී, රොෂව; තන ලොදරෙදෙන් සැදූහ, ස්තනය ලොධ්‍රරජසින් සැදූහ; නිකම් දිගුවිලැ, තුච්ඡවූ ගෘහ දීර්ඝිකායෙහි; ලියහස, ගෘහහංසතෙම; සියෝ, වී, සඞ්ගතවී.

460. මීගඳගබපවන්, මධුගන්ධය ගර්භය කොටඇති මාරුතය; පුල්හත්වණ්ණවෙනෙන් හෙත, කුසුමිතවූ සප්තපර්ණ

461. ලැගී බිඟු දූල්වූ—තවනදඟසින් දූල්වූ,
වනනැඟ කලල මල්හී—සඟ දුම්දෙලෙව් මල්හී.

462. මමන මීපොද ලොද—රදසක් වසත තුරු හිස්,
ගී වී පොදසමවලා—පිහිකුළු ගල් හිමවලා.

463. පහසා ලා පියන්—පියනඟයහයහන්හී,
සඟ ගුම් බිඟු පියුම්හී—කෙළෙ දුරු සිත් පියුම්හී.

464. ඉතී සරා සපත—සෙමෙහි පිරිබුන් මේයෙන්,
දියකෙළිසිත් වන පියුම්—නරවිරු පබඳ වත්වත්.

---

වනයෙන් එනකල්හි ; තෙමී මත් ඇත්, ත්‍රිමදයෙන් යුක්තවූ මත්තහස්තිතෙම ; කොපොලත්නි* මමන, කපොලස්ථලයෙන් වැහෙන්නාවූ ; මිනි, මදයෙන් ; ගළ තෙමී, කණ්ඨය තෙම නය කෙළේ.

461. මල්හී, කුසුමයෙහි ; ලැගී, උලලම්බිතවූ ; දූල්වූ, සමූහවූ ; බිඟු, භෘඞ්ගයන් ඇති ; කලල,† පලාශද්‍රැමයතෙම ; මල්හී, අනඞ්ගයා විසින් ; වනන්, විරහීන්ගේ ; ඇඟ තවනදඟසින්, අඞ්ගසන්තාපය කරණ අඞ්ගශයෙන් ; දූල්වූ, දල්වනලද ; සඟ දුම්, ධූම සහිතවූ ; දෙලෙ එව්, අගනි වැනි.

462. මමන, හෙන්නාවූ ; මීපොද, මධුවෘෂ්ටි ඇති ; ලොද රදසක්, ලොධ්‍රරජශ්වක්‍රය ; හිස්වසත, ශිරශ්ඡාදනය කරණ කල්හි ; තුරු, වෘක්ෂතෙමේ ; පොදසමවලා, වෘෂ්ටීන් සමාකුලවූ ; හිමවලා පිහිකුළු, හිමාබ්භ්‍රකයෙන් පිහිතවූ ; ගල් යී වී, පර්වතාකාර වී.

463. පියුම්හි, පද්මයෙහි ; සහගුම්, ඝොෂා සහිතවූ ; බිඟු, භෘඞ්ගතෙම ; පියන්, වල්ලභයන් ; පියන්, ප්‍රියාවන්ගේ ; අඟ යහයහන්හි, ශරීර නැමැති සුන්දරශයනයෙහි ; පහසා ලා, සම්බන්ධ කොට ලා ; පියුම්හී, හැරුවීමෙහි ; සිත් දුරුකෙළෙ, චිත්තය දූරීභූත කෙළේ.

464. ඉති, මෙසේ ; සරා සපත සෙමෙහි, ශරත්කාලය සම්ප්‍රාප්තවූ කාලයෙහි ; මේයෙන් පිරිබුන්,‡ මෙඝයෙන් අව

---

* කොපොලතින්-සම : † කල-සම : ‡ මෙහින් පිරිහුන්-සම :

465. දවවල් කල දසුන්—අමා නුවනඳන මෙනෙන්,
උයන් දියකෙළි කැතියන්—රිසි හැඟවී ඇමැතියන්.

466. එතර නියුත් ඇමැති—සොයා උයන්වත් ගොස්,*
සදා අරක් දී අද—පුරවෙමග කැරැ විසිත්.

467. ගොසෙ නරනිඳු සඳ යාදසනෙනත්තඹරන්,
මුහුලු කැරැ දිනි එ වදන් සිරි පස්කැන් පලඳනා.

468. තුසින් නුමුස්නා—සුදඅත්න හා එ නිරිඳු,
ඇමැතු ගඳෙව්මුලු හා—සමඟින් නිකුත් සෙනඟින්.

---

මදීදිතවූ; නරවිරු. නරවීරයාගේ; දියකෙළිසිත්; ජලක්‍රීඩා චිත්ත නැමැති; පියුම්වන, පද්ම වනය; පබඳ වත්වත්, ප්‍රබන්ධ වත් වත්.

465. දවවල්, දිවාභාගයෙහි; කල, කාන්තාවගේ; දසුන් අමා, දර්ශනය නැමැති අමෘතය; නුවනඳන මෙනෙන්, නයන යෙහි අඤ්ජනකරණ† අභිප්‍රායෙන්; උයන්දියකෙළිරිසි, උද්‍යානජලක්‍රීඩායෙහි අභිප්‍රාය; කැතියන් ඇමැතියන්, ක්ෂත්‍රිය අමාත්‍යයන්ට; හැඟවී, ප්‍රකාශ කෙළේ.

466. එතර, එවිගස්හි; නියුත්‡ඇමැති, යුක්තාමාත්‍යතෙමේ; ගොස්, ගමනය කොට; උයන්වත් සොයා, උද්‍යාන වාස්තුව ශුධ කොට; සදා, සජ්ජිත කොට; අරක් දී, ආරක්ෂා කොට; අද, අවුත්; පුරවෙමග විසිත් කැරැ, පුරවීථිමාර්ගයීය විචිත්‍ර කොට :—

647. එ, ඒ අමාත්‍යතෙමේ; ගොස්, ගමනය කොට; නර නිඳුසඳ, නරෙන්ද්‍රචන්ද්‍රයාගේ; යාදසනෙන්, සුන්දරදර්ශනයෙන්; අත්තඹරන්, තමාගේ හස්ත තාමරසයන්; මුහුලු කැරැ, සඬකු චිතකොට; එ වදන්සිරි, ඒ වචනශ්‍රී නැමැති; පස්කැන් පල ඳනා, කර්ණාභරණ; දිනි, දානය කෙළේ.

468. එනිරිඳු, ඒ නරෙන්ද්‍රතෙම; තුසින් නුමුස්නා, සන්තොෂ යෙන් නිතොරවූ; සුදඅත්න හා, ශුධාන්තජනයා හා ද;

---

* ගොසින්-සත්‍යා. † අඳනා-අඳනා-බොහෝ. ‡ දක්‍ෂවූ-සම.

469. සැදී මෙද නරනිඳු—මහදොර දොර උරසිරින්,
රුවනුබරණින් දෙව්තුරු—සිරින් නඳයෙන් හා ගත්.

470. පියන් නුවන් පැහැ—තො පිරි මහවෙගඟහී,
නැඟී නිරිඳු කිරිඳුනැව්—යෙහෙන් බිහිදොරතෙර පත්.

471. පියඳූ උයන්කල්—නලඳූ රැඳී සිත් ගත්,
මුවරඳපට බමරබර—සහ අකුරු පත් රජහට.

472. සැදි පුරවමින් ඉහි—වන් වරදහු උයන් වන්,
නඳුනුයන්*වන් වී —තිදසිඳු දෙවසරන් ඉහි.

---

ඇමැතු, ආමන්ත්‍රිතවූ; ගදෙව්මුළු හා, ගන්ධර්වසමූහයා හා ද; සෙනඟින්, සෙනාව හා; සමයින්, සමග්‍රව;† නිකුත්, නික්මිනි.

469. නරනිඳු, නරෙන්ද්‍රතෙම; උරසිරින්, වක්‍ෂඃස්ථලශ්‍රීන්; මහදොර, මහාවාරයෙහි; දොර සැදී මෙද, වාරය හෙබවූයේ මතු නොවෙයි; රුවනබරණින්, රත්නාභරණයෙන්; දෙව් තුරුසිරින්, දෙවද්‍රුමශ්‍රීන්; නඳයෙන් හා ගත්, සංකීය කොට (ද) ගති.

470. පියන්, ප්‍රියාවන්ගේ; නුවන්පැහැ තො පිරි, නෙත්‍ර ප්‍රභා නැමැති තොයයෙන් පූර්ණවූ; මහවේ, මහාවීචි නැමැති; ගඟහී, ගඞ්ගායෙහි; නිරිඳු, නරෙන්ද්‍රතෙම; කිරිඳු නැව් නැඟී, කරීන්ද්‍ර නැමැති නාවුකාරූඪවැ; යෙහෙන්, සුවසේ; බිහිදොර, බාහ්‍යවාර නැමැති; තෙර පත්, තීර්ථයට ප්‍රාප්තවී.

471. උයන්කල්, උද්‍යානශ්‍රී නැමැති කාන්තාව විසින්; පියඳූ, ප්‍රෙරිතවූ; නලඳූ, මන්දමාරුතය නැමැති දූතතෙමේ; බමර බර, භෘඞ්ගයන් විසින් හරිතවූ; මුවරඳපට, මකරන්දපට්ට නැමැති; සහ අකුරුපත්, අක්‍ෂර සහිතවූ පත්‍රය; රජහට හැරුදී; නරෙන්ද්‍රයාහට ගෙණහැරු දී; සිත්ගත්, චිත්තග්‍රහණය‡ කෙළේ.

472. සැදි පුරවමින් ඉහි, අලඞ්කෘතවූ පුරස්ත්‍රීන් හා එක්ව; වරදහු වන් උයන්, යුවරාජයා වන්නාවූ උද්‍යානයතෙමේ; දෙවසරන් ඉහි තිදසිඳු, දිව්‍යාප්සරාවන් සහිතවූ ශක්‍රයා; වන්, ප්‍රවිෂ්ටවූ; නඳුනුයන් වන් වී, නන්දනොද්‍යානය වැනි වී.

---

* නන්දනවියන්-බොහෝ. † සාමග්‍රීව-සම: ‡ මනොහරණය-සම:

473. ගණුතු නරනිඳුහු—තඹපලු මොලොකතැකි තම,
මීපොදනි තුටු ඇස්දර—කුසුමැස්නි ගතු තුරුපෙත්.

474. මලුපුලියෙන් නන්—කුසුමෙන් පෙලෙන් දුමරිළු,
කලහස නිලුපුලෙන් සන් කෙළිවිල් දූකැ තුටු මෙනෙන්.

475. අමතා පුරපියන්—පැ නන් උයන් ඇසිරි,
එතර උයන්පල්ලා—කෙළෙ තුටු ඒ ලොපල්ලා

476. පැරුදූ තුනුහව්වට—තනන ලියවම්යෝ,
පියන් මල්මියෙනුතුළ බමර සෝසුසුමරද ලන් මෙන්.

---

473. තුරුපෙත්, තරුපනතිතොමෝ ; නරනිඳුහු, නරේන්‍ද්‍රයා ; තඹපලු, තාම්‍රපල්ලව නැමැති ; තමාමොලොකතැකි ගණුතු, තමාගේ මෘදුලවූ හස්තග්‍රහණය කරත්මැ ; මීපොදනි, මධුබින්දු කරණකොට ගෙණ ; කුසුමැස්නි, කුසුමනයනයෙන් ; තුටුඇස්දර ගතු, සන්තොෂබාෂ්ප ග්‍රහණය කළා.

474. මලුපුලියෙන්, කුසුමස්තබකයෙන් යුක්තවූ ලතායෙන්ද ; නන් කුසුමෙන්, නානා කුසුමයෙන්ද ; පෙලෙන්, ඵලයෙන්ද උපලක්ෂිතවූ ; දුමරිළු, වෘක්ෂපඞ්ක්තියෙන්ද ; කලහස, කාලහංසයන්ගෙන්ද ; නිලුපුලෙන්, නීලොත්පලයෙන්ද ; සන්, සඤ්ජනනවූ ; කෙළිවිල් දූකැ, ක්‍රීඩාසරසිය දර්ශනයකොට ; මෙනෙන් තුටු, සිතින් තුෂ්ටවී.

475. පුරපියන්, පුරප්‍රියාවන් ; අමතා, ආමන්ත්‍රණය කොට ; නන් උයන් ඇසිරි පැ, නානාවිධවූ උද්‍යාන ආශ්‍රයශ්‍රී* දක්වා ; ඒ ලොපල්ලා, ඒ ලොකපාලතෙම ; එතර, ඒ ක්‍ෂණයෙහි ; උයන්පල්ලා, උද්‍යානපාලයා ; තුටු කෙළෙ, සන්තුෂ්ට කෙළේයි.

476. පියන්, ප්‍රියාවන්ගේ ; තුනුහව්වට, ශරීරලීලාවට ; පැරුදූ, පරාජිතව ; තනන, කම්පාවන්නාවූ ; ලියවම්යෝ, ලතා අඞ්ගනාවෝ ; මල්මියෙන්, කුසුමමුඛයෙන් ; උතුළ, උද්ගතවූ ; බමර, භෘඞ්ග (නාද) නැමැති ; සෝසුසුම්, ශොක නිඃශ්වාසය ; අරද, අනවරතයෙන් ; ලන් මෙන්, ලන්නවුන් වැනෙකා.

---

* ඓශ්වර්‍ය්‍යශ්‍රී-සම :

477. සඟ ගුම්බිඟුවලා—ලියගුම් වන් තුනුවියන්,*
සඟ තූතන විදුකිඳු බඳ—ගනගබ අඹා නෙත් ගත්.

478. ලියසැව් හයා මද—ලියනවුලෙ වන් කල්නට,
පියතෙපෙලෙහි ලැබැ වහල්—සැර ලී සඳ දුරැ ලා.

479. සල නෙතිනුනා බැලූ—මෙද තුරු පුල් වමියෝ.
වනදෙවුදූ විලැස් හා—දනනෙතෙහි පිරිමැදියෝ.

480. සැදූ මෙද නිරිඳු—උරබිත් එකක් පල්ලෙන්,
හිදබඳනා ඔහු තමා—නුරා තර පස හා† පැ.

---

477. සඟ ගුම්, ඝොෂා සහිතවූ; බිඟුවලා, භෘඞ්ගයන් විසින් ගැවසී ගත්තාවූ; තුනුවියන් වන්, අඞ්ගනාවන් විසින් ප්‍රවිෂ්ටවූ; ලියගුම්, ලතාගුම්බයතෙමේ; සඟ තතන, තැතැනි සහිතවූ; විදුකිඳුබඳ, විද්‍යුද්රාජිබඩවූ; ගනගබ, මෙඝගර්භය; අඹා, පරදවා; නෙත් ගත්, නෙත්‍රග්‍රහණය කෙළේ.

478. මද, අනඞ්ගතෙම; ලියනවුලෙ වන්, ලතාවනකුලයට ප්‍රවිෂ්ටවූ. කල්නට, කාන්තාවන්ට; පියතෙපෙලෙහි වහල් ලැබැ, ප්‍රියවූ වචනයෙහි පාක්ෂික ලැබ; සඳ දුරැ ලා, සෙනහස දුරුකොට. ලියසැව් හයා, ලතාචාපාකර්ෂණය කොට; සැර ලී, ශරවෙධය කෙළේ.

479. වමියෝ, වනිතාවෝ; නෙතින්, නෙත්‍රයෙන්; සල උනා, චාපල්‍යය දුරු කොට; පුල්තුරු, ප්‍රුල්ලවූ වෘක්ෂයන්;‡ බැලූමෙද, දර්ශනය කොළෝ මතු නොවෙති; වනදෙවුදූවිලස් හා, වනදෙවකාන්තාවන්ගේ විලාසයන්ද;§ දනනෙතෙහි, ජනනෙත්‍රයෙහි; පිරිමැදියෝ, පරාමර්ශනය කොළෝ.

480. එකක්, එක් කාන්තාවක්; නිරිඳු, නරෙන්ද්‍රයාගේ; උරබිත්, වක්ෂොභිත්තිය; පල්ලෙන්, පල්ලවයෙන්; සැදූ මෙද, සජ්ජිතකළා මතු නොවෙයි; ඔහු හිද බඳනා, ඔහුගේ හෘදය බන්ධනය කරන්නාවූ; තමානුරා, තමාගේ අනුරාග නැමැති; තර පස හා පැ, සත්‍ථිරවූ පාශයද|| දැක්වූ.

---

* තුනුපියන්-තුනුලියන්-හැම: † පහසඳ-ඇතම්.
‡ වෘක්ෂමූලයන්-සම: § විලාසයෙන්-සම: || පහසයද-හැම.

481. එකක් නැමී පුල්—ලැහැබෙක්හී අත ලා,
බිඟුවැලනුඩුනැඟෙත—බා මද දියසුන් සැව් සිරි දූරු.

482. ලියගුම්නී යොනක්—පුළුලුකුළුහිම් දිස්නා,
පලම්මෙද කුසුම් කැන්—ලියකිඳුරු සිරි හා ගත්.

483. නැඅඟරා පිය—ගඳැහී ලොල් බිඟුකැල,
වහල් වි පියහට යද—නා පියන්* මෙනෙ බද තදමන්.

484. නන බරණ රසන්—මිණිහර සුන් කුසුම්දම්,
ඔබල පලුදලයහන්—දනනැලැලී ලියවිමන්.

---

481. එකක්, එක්කාන්තාවක් ; නැමී, නමනවූ ; පුල්ලැහැබෙක්හි, ප්‍රඵුල්ලවූ ලතාගුම්බයෙක්හි ; අත ලා, හස්තය මෙහෙයා ; බිඟුවැලන් උඩුනැඟෙත, භෘඞ්ගාවලින් ඌර්ධ්වෝද්ගතවත්මැ ; බා, භීතව මද, අනඞ්ගයාගේ ; දියසුන් සැව්, ජ්‍යා† ඡින්නවූ චාපයෙක්හි ; සිරි දූරු, ශ්‍රිය දූරු.

482. ලියගුම්නි, ලතාගුම්බයෙහි ; පුළුලුකුළුහිම් දිස්නා, පෘථුලවූ කටිප්‍රදේශාවධිය දක්වා පැණෙන්නාවූ ; යොනක්, යුවතියක්තොමෝ ; කුසුම් කැන් පලන් මෙද, කුසුමස්තබක ප්‍රසාධනය කළා මතු නොවෙයි ; ලියකිඳුරු සිරි හා ගත්, ලතාකින්නරශ්‍රීද ගතු.

483 මෙනෙබදතදමන්, මනොබඞවූ ස්තබ්ධවූ මානඇති ; පියන්යදනා, ප්‍රියාවන්‡ ආරාධනය කරන්නාවූ ; පියහට, ප්‍රියයාහට ; නැඅඟරා, ස්නානවූ අඞ්ගරාගයන්ගේ ; පියගඳැහි, ප්‍රියවූ ගන්ධයෙහි ; ලොල්බිඟුකැල, ලොලවූ භෘඞ්ගසමූහතෙම ; වහල් වී, අනුකූලවූ.

484. සුන්, ඡින්නවූ ; නනබරණ, නානාභරණද ; රසන් මිණි, රසනාමිණිද ; හර මුක්තාහාරද ; කුසුම්දම්, කුසුමදාමද ඇති ; ඔබල, මලානිකවූ ; පලුදලයහන්, පල්ලවදලසයන ඇති ; ලියවිමන්, ලතාවිමානතෙම ; දනනැලැලී, ජනයන් ඛ්‍යාකුල කෙළේ.

---

* පියන-බොහෝ. † ජ්‍ය-සම : ‡ ප්‍රියාවක්-සම :

485. හැනෙත් පුල්ලිය හා—මල්බැර නත යෝනන්,
සලපල්ලෙනදලැබැ ගෙල්මොලොකතගෙලැවුසිබමර.

486. කුසුමොබල හිඟැ ලැගැ—කරතෙකරජ රජනුවන්,
පියක පියකෙ දක්මින්—වැසූ කුසුමෝනා* ලෙසින්.

487. නොගෙවෙත කතක රජ—පියවුරු රොනත්නි තවර,
විලසට වැතුටු කෙළෙ නෙත් ඉහිල් දියුල්†දෙසෙ නදන්.

488. ගොතත මලිගියමල්—රතැගිලිකැල්මෙන් වුදු,
අවුදු පියන් සජ්දු—ලියමල් සැකි නරපවර.

---

485. මල්බැර, කුසුමභාරයෙන්; නත, අවනතවූ; යෝනන්, යුවතීන්; පුල්ලිය හා හැනෙත්, ඵුල්ලවූ ලතාවන් හා සාම්‍ය වන කල්හි සලපල්ලෙන්, චලපල්ලවයෙන්; ගෙල් ලැබැ, ප්‍රහාර ලැබැ; අද, අවුත්; බමර භෘඞ්ගතෙම; මොලොකතගෙලෙ ඇවුසි, මෘදුලවූ හසතප්‍රාහාරයෙහි ආවිෂ්ට වී.

486. පියක, ප්‍රියාවකගේ; කුසුමොබල, පුෂ්පභාරයෙන් මලානවූ; හිඟැ, ජඝනයෙහි; ලැගැ, ලගනවූ; රජනුවන්, රාජනෙත්‍රය; එකරජකරත්, එකරාජ්‍යය කරණ කල්හි; පියක්, ප්‍රියාවක්; එ දක්මින්, ඒ දර්ශනය කරමින්; කුසුමෝනාලෙසින්, කුසුමාවකිරණ‡ව්‍යාජයෙන්; වැසූ, ප්‍රච්ඡාදනය කළා.

487. කතක, කාන්තාවකගේ; පියවුරු, පයොධරයෙහි; අත්නි රොන්තවර, හසතයෙන් කරණලද්දාවූ රේණුචර්චිතය; නොගෙවෙත, නිමාවට නොපැමිණෙන කල්හි; රජ, රජතෙම; විලසට, ඒ විලාසයට; තුටුවැ, සනතුෂ්ටව; ඉහිල්, ශිථිලවූ; දියුල්දෙසෙ, දුකූලදෙශයෙහි; නෙත්නදන් කෙළේ, නෙත්‍රනිධාන කෙළේ.

488. පියන්, ප්‍රියාවන්ගේ; රතැගිලිකැල්මෙන්, රක්තාඞ්ගුලිශොභායෙන්; විදු, විඩ්වූ; මලිගියමල්, මලාතීකුසුමයන්; ගොතත, ග්‍රන්ථනය කරණ කල්හි; නරපවර, නරප්‍රවරතෙම; අවුදු, ප්‍රාපතව; සජ්දුලියමල්, සජීජතිලතාකුසුමයයි; සැකි ශඞ්කා කෙළේ.

---

* කුසුමොන-හැම. † දියුල්-දිවුල්-සම : ‡ කිණිණ-ඇතම්.

489. දුලු නනබරණමිණි—කැලුම්ලේ කෙළෙනා,
වනඅඹර තෙව්නා පියක්—සුරසැව්හි කැලුම්සිලූ.

490. ගෙණ මුවරඳරොන්—කනක පතලේ සඳමින්,
මුවම් හැසී එ නිරිඳු—ලවනත පබල ඔඩමින්.

491. මැසී පියක නිරිඳු—මහනෙල්දමින් වැළකූ,
ගෙල් සරණතපල්ලේ—වැළකී ලොමුදගදහස්.

492. දිගැසියන් සුරතතැ—හි තෙවුනා නාකුසුම්.
සඳපතර රඳනා—සිසි අළ ළනෙත් බඳනා.

493 නෙතින් නිලුපුලන්—මුහුලසනෙන් තමලුලිය,
පලු සුරතතලෙන් පෑ—පියවුරුනි සක්වාවත්.

---

489. දුලු නනබරණ, ජ්වලිතවූ නානාභරණ හා; මිණි කැලුම්, මාණික්‍යකාන්ති ඇති; ඒලේ කෙළෙනා, දෛලාක්‍රීඩා කරන්නාවූ; පියක්, ප්‍රියාවක්තොමෝ; වනඅඹර තෙව්නා, වනාකාශයෙහි ශොබනාවූ; සුරසැව්කැලුම්සිලූ, සුරචාපයෙහි කාන්ති දූරූ.

490. එ නිරිඳු, ඒ නරෙන්ද්‍රතෙම; මුවරඳරොන් ගෙණ, මකරන්දරෙණු ග්‍රහණය කොට; කනක පතලේ සඳමින්, කාන්තාවකගේ පාදතලයෙහි සරහමින්; ලවනත, අධර නැමැති; පබල ඔඩමින්, ප්‍රවාලවෂකයෙන්; මුවම් හැසී, මුඛ මධුව ආකර්ෂණය කෙළේ.

491. නිරිඳු, නරෙන්ද්‍රයා විසින්; මහනෙල්දමින්, ඉන්දීවර දාමයෙන්; වැළකූ, බාධිතවූ; මැසිපියක, ආමර්ෂවත් ප්‍රියාවකගේ; සරණතපල්ලේ ගෙල්, පාදපල්ලවයෙහි ප්‍රහාරය; ලොමු දහදහස් වැළකී, ලොමොදගමන (ශත) සහස්‍ර* නැවැතී.

492. දිගැසියන්, දීර්ඝාක්ෂීන්ගේ; සුරතතැහි, සුරකතවූ හස්තතලයෙහි; තෙවුනා, බබලන්නාවූ; නාකුසුම්, නාගකුසුමය තෙම; සඳපතර රඳනා, සන්ධ්‍යාකාන්ති (සමූහ) යෙහි රඤ්ජිත වන්නාවූ; ළනෙත් බඳනා, හෘදයනෙත්‍ර බන්ධනය කරන්නාවූ; සිසි අළ, චන්ද්‍රයා දැක්වී.

493. නෙතින්, නෙත්‍රයෙන්; නිලුපුලන්, නීලොත්පලයන්ද; මුහුලසනෙන්, ධම්මිල්ලයෙන්; තමලුලිය, තමාලලතාවන්ද;

---

* දශසහස්‍ර-ඇතම්.

494. සුරතුඵුල සරණින්—වටොරනෙන් සුවන්රඹ,
ගනනිල් වසාරජනි*—බමරවැල තෙපලෙන් කොවුල්සර.

495. ලවනින් බිඹුවැලන්—දසනගිනි සැදි සිඳුවර,
තුනු තුනු හව්වෙන් මඳ—නලඹු ලෙල ලියවිලස්

496. වුවනින් පුල් පියුම්—මඳසුසුමෙන් නල සුවඳ,
සවණ්තනෙන් ලියරැල්—නලළතිනි මුවරඳ පට (පෑ.)

497. ගනසා සැදි ලියගුම්—හි වැළහුනු කුසනිරිඳු,
පබවත නෙත හමුයේ—උයන්සිරි නෙත් බඳනා.

---

සුරතතලෙන්, සුරකතවූ හසතතලයෙන්; පලු, පල්ලවයන්ද; පියවුරෙනි, පයොධරයෙන්; සක්වාවන්, චක්‍රවාකයන්ද :—

494. සරණින්, චරණයෙන්; සුරතුපුල; සුරකොතාතපල යන්ද; වටොරනෙන්, වෘතතළුරුයෙන්; සුවන්රඹ, සවණ්ණ රම්භාවන්ද; ගනනිල් වසාරජනි, ඝනව නීලවූ වසාරාජීයෙන්; බමරවැල, භෘඞ්ගාවලීන්ද; තෙපලෙන්, වචනයෙන්; කොවුල්සර, කොකිලධ්වනිද :—

495. ලවනින්, අධරයෙන්; බිඹුවැලන්, පක්වබිම්බඵලද; සැදි දසනගිනි, ශෝභියාවූ දන්තාග්‍රයෙන්; සිඳුවර, සින්දුවාර යන්ද; තුනු කෘශවූ; තුනුහව්වෙන්, ශරීරලීලායෙන්; මඳ නලඹු, මන්දමාරුතයට අනුවූ; ලෙල ලියවිලස් ලලිතවූ ලතා විලාසයද :—

496. වුවනින්, වක්ත්‍රයෙන්; පුල්පියුම්, ඵුල්ලවූ පද්මයන්ද; මඳ සුසුමෙන්, මන්දනිඃශ්වාසයෙන්; සුවඳනල, සුගන්ධ මාරුත යද; සවණ්තනෙන්, කණ්ණාන්තයෙන්; ලියරැල්, ලතාදෙ ලාද; නලළතිනි, ලලාටයෙන්; මුවරඳ පට, මකරන්දපට්ටද; පෑ. දැක්වී.

497. ගනසා සැදි, ඝන ශාඛායෙන් සඤ්ජතනවූ; ලිය ගුම්හි, ලතාගුම්බයෙහි; වැළහුනු, ප්‍රච්ඡන්නවූ; කුසනිරිඳු,

---

* වසානි-බො :

498. උයන්කෙළි සහසාන මියුලැසාන සරා,
ඉහි මැතිරැසාන නිරිඳු පවසාන කළ සග මේ.

## දසවන සග.

---

499. නහන මෙහෙ*නියුත්—දෙනෙ අද සොයා විල්වත්,
සදා මග කැරැ විසිත්—ගෙණ මිටුසක් විසී මේ.

500. සුරසිඳු කලුන් ලූ—නුවන් පැහැනද වන් වූ,
සුනිල් සිලිල්තෙලෙ තරඟ—ලියෙනොබල† කොමල පවන්.

---

කුශනරෙන්‍ද්‍රයාගේ ; නෙත් බඳනා, නෙත්‍රබන්ධනය කරන්නාවූ ; පබවත, ප්‍රභාවතීතොමෝ ; නෙත ගමුයේ, නෙත්‍රාභිමුඛයෙහි වූ ; උයන් සිරි, උද්‍යානශ්‍රී යී.

498. සරා, ශරත්කාලයද ; මියුලැසාන, මෘගාක්ෂීන් ; සහ සාන, සහචරයන් හා ද ; ඇමැතිරැසාන ඉහි, අමාත්‍යසමූහයන් හා ද සමග ; නිරිඳු, නරෙන්‍ද්‍රයාගේ ; උයන්කෙළි, උද්‍යාන ක්‍රීඩාවද ; පවසාන කළ සග මේ, ප්‍රකාශකළාවූ මේ සර්ගයයි.

දශම සර්ගයයි.

---

499. නහනමෙහෙ, සදනකර්මාන්තයෙහි ; නියුත් දෙනේ, නියුක්තවූ ජනතෙම ; විල්වත්, තටාකවස්තුව ; සොයා, පරිශුද්ධ කොට ; සදා, සජ්ජිත කොට ; මග විසිත් කැරැ, (තටාක) මාර්ගය විචිත්‍ර කොට ; අද, අවුත් ; මිටුසක් ගෙණ, මුෂ්ටිශබ්ද ග්‍රහණය කොට ; මේ විසී, මෙසේ කී.

500. සුරසිඳුකලුන්, සුරසින්ධු කාන්තාවන් විසින් ; ලූ, ප්‍රේරිතවූ ; නුවන් පැහැන්, නෙත්‍රප්‍රභායෙන් ; අද වන් වූ, ආර්ද්‍ර වන්නාවූ ; තරඟලියෙනොබල, තරඞ්ගලතායෙන් දුර්වලවූ ; කොමල පවන්, මන්දමාරුත ඇති ; සුනිල් සිලිල්තෙලෙ, සුනීලවූ සලිලතලයෙහි :—

---

* නහනමේ-සම : † වැලනොබොල-බො :

501. පිළිබිඹු ලෙසින් වන්—රිවිරජහට සත්දහස්,
ලැගු*, සිරිසර විඳුනා—විසිත් පියුමෙන් රඳනා.

502. ගජමෙහි ගජමෙන්†—සිලිල්තල වෙරළුතලේ,‡
දුනු රුවනකුරුදහස්—සිරි අළ තඹුරුකැකුලෙන්.

503. ඉති සිරිසර විල්—තරඟත වටා නටමින්,
තඹරම්යෙන් බමරගී—ත දක්න මෙනෙන් කියනෙව්.§

504. ඉති වියත නරනිඳු—ඇතොරදහස් කැඳෙමින්,
මුවරදබර රළනෙලෙන්—සැනහෙම්නෙවිල් තෙරපත්.

---

501. පිළිබිඹුලෙසින්, ප්‍රතිබිම්බලෙශයෙන්; වන්, ජලාභ්‍යන්තරයට ප්‍රවිෂ්ටවූ; රිවිරජහට, සූර්‍ය්‍ය නැමැති නරෙන්ද්‍රයාහට; ලැගු, ලඳගතවූ;|| සත්දහස් සිරිසර විඳුනා, ජත්‍රසහස්‍රයන්ගේ ශ්‍රීසාරය අනුභව කරන්නාවූ; විසිත්, විචිත්‍රවූ; පියුමෙන් රඳනා; පද්මයෙන් ශොභාමානවූ:—

502. ගජමෙහි ගජමෙන්, හස්තිමෙසයෙහි ගර්ජනායෙන්; සිලිල්තල, සලිලතල නැමැති; වෙරළුඅතලේ, වෛඩූර්‍ය්‍යාස්තරයෙහි; තඹුරුකැකුලෙන්, තාමරසකුඩ්මලයන් කරණකොට ගෙණ; දුනු, ජනිතවූ; රුවනකුරුදහස් සිරි අළ, රත්නාඞ්කුර සහස්‍රයන්ගේ ශ්‍රී එළවූ:—

503. ඉති සිරිසර, මෙසේ ශ්‍රීසාරවූ; විල්, සරසිතොම; තරඟත, තරඞ්ග නැමැති හස්තයෙන්; වටා, වෘත්ත කොට; නටමින්, නෘත්‍ය කරමින්; තඹරම්යෙන්, තාමරසමුඛයෙන්; ත දක්න මෙනෙන්; තා දකිනා අභිප්‍රායෙන්; බමරගී කියන් එව්, භෘඞ්ග ගීතිකා කියන්නියක මෙනි.

504. ඉති වියත, මෙසේ කියත්ම; නරනිඳු, නරෙන්ද්‍රතෙම; ඇතොරදහස්, අන්තඃපුරසහස්‍රයන්; කැඳෙමින්, ආහවානය¶ කෙරෙමින්; මුවරදබර රළනෙලෙන්. මකරන්දභාරවූ තරඞ්ග මාරුතයෙන්; සැනහෙම්නි, සන්තුෂ්ටවෙමින්; එ විල්තෙර පත්, ඒ සරසීතීරයට සම්ප්‍රාප්ත වී.

---

* ලැඟුම්-ලැගුම්-ලැගු-සම: † ගැජ්ජුමෙන්-ඇතම්. ‡ වෙරළුඅතලෙ-සම:
§ තඹුරුම්යෙන් තදක්නමෙනෙන් බමරගී කියඑව්-බො:
|| ඵත්වාවූ-ලග්නවූ-ලංවූවාවූ-සම: ¶ අවහානය බො:

505. ලහොපලුකුසුම බඳ—දී මුහුළු කැරැ මුහුළු,
කොකුමඟරා තැවැරූ කළ—සුරත වසනත රඳනා.

506. දිමුතු මුතුවිමල්—පුලිනතල පත වම්යෝ,
කියාළුහු*කිරණ්ණවුයේ—පබලලියපෙල රඳනා.

507. බසුත් සැදි පියන්—පනතෙතර දිය තෙරකිම්,
පබවතකත සමාමෙන්—තුටිනුතුලෙව් සෙහෙලිවිල්.

408. පබවත ගළත ගලත—සොම්වුවනත දිස්නා,
මිණිමුතු ජයුම්සිරි හා—වෙනසක් නොදත් බිඟුරජ.

---

505. ලහෝපලු, බාලාශොකපල්ලවද ; කුසුම, පුෂ්පද ; දී, ප්‍රක්ෂෙප කොට ; මුහුළු කැරැ බඳ, මකුට කොට බඳවූ ; මුහුළු, ධම්මිල්ල ඇති ; කොකුමඟරා තැවැරූ කළ, කුඞ්කුමාඞ්ග රාගයෙන් චර්චිත කළාවූ ; සුරත වසනත රඳනා, සුරක්තවූ වස්ත්‍රයෙන් හොබනාවූ :—

506. දිමුතු, දීප්තිමත්වූ ; මුතුවිමල්, මුක්තාඵල සේ නිර්මලවූ ; පුලිනතල, වාලුකාතලයෙහි ; පත වම්යෝ, ප්‍රාප්ත කාන්තාවෝ ; කිරණ්ණවුයේ, ක්ෂීරාර්ණවයෙහි ; රඳනා, හොබනාවූ ; පබලලිය පෙල කියාළුහු, ප්‍රවාලලතාපඞ්ක්ති හැඟවූහු.

507. සැදි පියන්, සජ්ජිතවූ ප්‍රියාවන් ; බසුත්, අවගාඪ වත්ම ; එතර, ඒ ක්ෂණයෙහි ; දිය, ජලය ; තෙරකිම් පනත, තීරසීමාව උල්ලඞ්ඝිත වත්ම ; පබවතකත, ප්‍රභාවතී කාන්තාවගේ ; සමාමෙන්, සමාගමයෙන් ; විල්සෙහෙළි, සරසීසඛීතොම ; තුටින්, සන්තොෂයෙන් ; උතුලෙව්, අතිරික්තවියක මෙනි.

508. පබවත, ප්‍රභාවතියගේ ; ගළත, කණ්ඨාන්තය ; ගලත, ජලනිමග්න වන කල්හි ; දිස්නා, දෘශ්‍යමානවූ ; සොම්, සෞම්‍යවූ ; වුවනත, වක්ත්‍රය හා ; මිණිමුතු, මණිමුක්තාවූ ; පියුම්සිරි හා, පද්මශ්‍රී හා ; බිඟුරජ, භෘඞ්ගරාජ්‍යතෙම ; වෙනසක් නොදත්, විශෙෂයක් නොදති.

---

* කියළුහු-හැම.

509. පහළ පියවුරුනි*—සසල විල්සිලිල්හි බිජු,
වැලඟි සපුසල් සේ නා—බිය දනැවී පුරපියන්.

510. පියවුරු තො උකහත—පිහිනත උඩුමුව වුවන්,
කලක් පියුමැයි බිඟුනෙත්—කිමිඳ ගනගැබැ විදු පෑ.

511. කතක මුත් වරල්—දෙඹහෙත්—අවටැ හිවිදල,
දලබර කෙමි බමරවල—සිරි ලද සේමහපියුම්.

512. ලඟා එත† නිරිඳු—සහ මල්පලුසිරිසියෝ,
මුහුලස කතක ගැලෙන—හළපහළත නුළුවු‡ බිඟු වැල.

---

509. පියවුරුනි, පයොධරයෙන්; පහළ, ආස්ඵාලනය කළාවූ; සසල, චඤ්චලවූ; විල්සිලිල්හි, තටාකසලිලයෙහි; බිජු, භජනය කළාවූ; වැලඟි, වෙලාන්තයෙහි; සපුසල්, චම්පකසාලද්‍රැමයන්ගේ; සේ, ජායාතොම; පුරපියන්, පුරප්‍රියාවන්ට; නා බිය දනැවී, නාගභය ඉපදවී.

510. පියවුරු, සයොධරයෙන්; තො උකහත, ජලාකර්ෂණය කොට; පිහිනත, තරණය කරණ කල්හි; උඩුමුව වුවන්, ඌර්ධ්වමුඛවූ වක්ත්‍රඇති; කලක්, කාන්තාවක්; පියුමැයි, පද්මය කැයි; බිඟුන් එත්, භෘඞ්ගයන් සමීප වත්මැ; කිමිඳ, නිමග්නව; ගනගැබැ, ඝනගර්භයෙහි; විදු, විද්‍යුත්; පෑ, දක්වී.

511. මුත්වරල්, මුක්තවූ කෙශඇති; කතක, කාන්තාවක; දෙඹහෙත්, ඣම්පාතිපාතනය§කරණ කල්හි; අවටැ, හාත් පස්හි; හිවි දල, නැංගාවූ ජලයතෙම; දලබර, පත්‍රභරිතවූ; බමරවල, භෘඞ්ගයන් විසින් ආකීර්ණවූ; කෙමි, කර්ණිකාවක් ඇති; සේමහපියුම්, ශ්වෙතමහාපද්මයෙක්හි; සිරි ලද, ශ්‍රී ලදී.

512. නිරිඳු, නරෙන්ද්‍රයා; ලඟා එත, ආසන්නව එත්මැ; ගැලෙන, නිමග්න වන්නාවූ; කතක, කාන්තාවකගේ; සහ මල්පලුසිරිසියෝ, සකුසුමවූ පල්ලවශ්‍රීයෙහි සඞ්ගතවූ; මුහුලස, ධම්මිල්ලය; හළ, හැරපිවාවූ; බිඟුවැල, භෘඞ්ගාවලී; පහළත, පහළ වූවාවූ හස්තයෙන්; නුළුවු, වළිත වූවාහු.

---

* පයවුරෙනි-සන්න. † එත එත-ඇතම්. ‡ නුළු-බොහෝ.
§ ඣම්පප්‍රතිපාතනය-සම:

513. පියා වුහුටත්සතුරු—ඝෝනා පියක පියවුරු,*
කනකකලසෙව් පුළුපුදුන්—නරනිඳු බිසෙව්මඟුලේ.

514. ගෙනෑ ඝනකොකුම බිඳු—හෙත වුහුටු දියපියා,
කලක පහළැත්කුඹුනෙන්—ගලන හුරිරද මුතු පෑ.†

515. මුතඳුනැසැ සුරතොට—ද්‍යෞ වුවනත නහමතැ,
වැළඳූ කලක් එ නිරිඳු—වැළහෙමිනද පිටුදෙසෙන්.

---

513. පියා, වලලහයා විසින්; වුහුටු, ප්‍රෙරිතවූ; අත්සතුරු ඝෝනා, ඝසනයනත්‍රජලධාරාඇති; පියක, ප්‍රියාවකගේ; පියවුරු, පයොධරයතෙම; නරනිඳු, නරෙන්ද්‍රයාගේ; බිසෙව් මඟලේ, අභිෂෙකමඞ්ගල්‍යයෙහි; පුළුපුදුන්, නාලිකෙරකුසුමයෙන් ආකීර්ණවූ; කනකකලසෙව්, සුවර්ණඝටයක් මෙනි.

514. පියා, වලලහයා විසින්; වුහුටු, විසෘෂ්ටවූ; දිය, ජලය; කලක, කාන්තාවකගේ; ඝනකොකුම ගෙනෑ, සඝනකුඞ්කුම ගෙණ; බිඳුහෙත, බින්දු වැහෙන කල්හි; පහළ, පළනලද; ඇත්කුඹුනෙන්, හස්තිකුම්භයෙන්; ගලන, වැහෙන්නාවූ; හුරිරද, රුධිරාර්ද්‍රවූ; මුතු පෑ, මුක්තාඵල දැක්වී.

515. ඇසැ, අක්‍ෂියෙහි; මුතඳුන්, මුක්තවූ අඤ්ජන ඇති; ද්‍යෞ, ධෞතවූ; සුරතොට, සුරක්තවූ ඔෂ්ඨ ඇති; වුවනත, වක්ත්‍රය; නහමතැ, නිරීක්‍ෂණය කරත්මැ; කලක් කාන්තාවක්; වැළහෙමින්, ප්‍රච්ඡන්න වෙමින්; පිටුදෙසෙන්, පෘෂ්ඨ ප්‍රදෙශයෙන්; අද, අවුත්; එ නිරිඳු, ඒ නරෙශ්වරයා; වැළඳූ, ආලිඞ්ගනය කළා.

---

* වුහුටත් යතුරුහොත පියා පියක පියවුරෙ-ඇතම්.

† ම ත් තොස කැරැ නරඹා කොමලඟක ව ත
දු ත් රසවත් රසපහරින් පිය ඊර ත
ව ත් සිහනිය ඇත්කුඹුතලැ ඊරිරු ඹු ත
මෙත් මුතු දිසි දියබිඳු සහ කොකුම් මු ත
(පරවිසන්දෙශ 91.)

516. නෙත සුනිල් සුරතොට—පියත පැහැ පුරපියන්,
තරඟිනුලැඟි නිලුපුල්*—තඹුරු උඩුහුරු ලදු† වන්.

517. දිගැසියක නිරිඳු—නැඟෙතසදෙඹටහල්ලට,
ලොමුදෙහෙන් පිය පහස්—නොමැලද පිය උරපහස්.

518. නිරිඳුසවණිත ලග—දලදරනෙන් මියෙන් ලූ,
කලක් රහස්දඹුයෙන්—මෙනෙ සමරහු කියා මෙන්.

519. මුවරඳ සදත ගෙණ—පබවත දෞකොපොල්පත්,
මුවපියුමැ විසි බිඟුපෙල—නොවූ සරතසත ගෙල්කා.

---

516. පුරපියන්, පුරප්‍රියාවන්ගේ; සුනිල් නෙත, සුනීලවූ නෙත්‍රයද; සුරතොට. සුරක්තවූ ඔෂ්ඨයද; පැහැ පියත. ශොභාව හරුත්ම; තරඟින්, තරඞ්ගයෙන්; උලැඟි, උල්ලඞ්ඝිතවූ; නිලුපුල්, නීලොත්පලද; තඹුරු, රක්තපද්මද; උඩුහුරු ලදු වන්, ඌර්ධ්වශ්වාස‡ ලද්දක්හු වැනි වී.

517. දිගැසියක, දීර්ඝාක්ෂියක; නිරිඳු, නරේන්ද්‍රයාගේ; අස දෙඹටහල්ලට, අංශස්ථල නැමැති ඩිම්බපට්ටශාලාවට; නැඟෙත, ආරූඪවත්ම; ලොමුදෙහෙන්, ලොමොද්ගම කරණකොට ගෙණ; උර. වක්ෂස්ථලයතෙම; පියපහස් නොමැලද පාදස්පර්ශ නොලදී; පිය පාදයතෙම; උරපහස් නොමැ ලද, උරඃස්පර්ශද නොලදී.

518. නිරිඳු. නරේන්ද්‍රයාගේ; සවණිත ලග, ශ්‍රවණාන්තයෙහි ලගනවූ; මියෙන් ලූ, මුඛප්‍රෙරිතවූ; දලදරනෙන්, ජලධාරාව හෙතුකොට ගෙණ; කලක්, කාන්තාවක්; රහස් දඹුයෙන්, රහස්‍යජල්පියෙන්; මෙනේ, චිත්තයෙහි; සමරහු, කාමයා; කියා මෙන්, කියන්නියක මෙනි.

519. මුවරඳ ගෙණ, මකරන්දය ගෙණ; පබවත, ප්‍රභාවතී යගේ; දෞකොපොල්පත්, ධෞතවූ කපොලපත්‍රය;§ සදත, සරහන කල්හි; මුවපියුමැ විසි, මුඛපද්මයෙහි ආවිෂ්ටවූ; බිඟු පෙල, භෘඞ්ගශ්‍රෙණීතොම; අතගෙල්කා, හස්තයෙහි ප්‍රහාරලදින්; සරතස නොවූ, ශ්‍රාන්ත නොවූ.

---

* නිලිපුල්-හැම. † ලද-සම: ‡ ඌර්ධ්වපාස-සම:
§ කපොලස්ථලය-සම:

520. මැඬිලි දුන් දියෙහි—බමරවුල* කොකුමඟරා,
නරවිරු කෙළි සරත විල්—සුරතැස් ලා බලා මෙන්.

521. දිවයුරු පත්තු වරු†—අදවේ ගිමින් මේ වන්,
දෙනෙමින්‡ පැදුම්හු කුසා—නෙලුඹුදලවදලේ වන්.

522. නැසී පොකුරුපතැ—තුරෙ සිටි කුසා දක්මින්,
බැමහව් කැරු කලක් එක්—පිළිපැන් ඇතොවුරන්§කැන්.

523. සොම් සිසිලෙහි දූ—ගහණේත රාසුරිඳු මෙන්,
ලොහොකතට ලොහොකඬ මෙන්—දූවැ වැළැඳි කල
කුසරජ.

---

520. දියෙහි, ජලයෙහි ; මැඬිලි දුන්, මණ්ඩලාකාරප්‍රවෘත්තවූ; බමරවුල, භෘඞ්ගාකුලවූ ; කොකුමඟරාන, කුඞ්කුමාඞ්ගරාග කරණකොට ගෙණ ; කෙළිසරත, ක්‍රීඩාවෙන් ශ්‍රාන්තවූ ; විල්, සරසීතොම ; සුරතැස් ලා, සුරක්තවූ නයන ප්‍රෙරණය කොට ; නරවිරු, නරවීරයා ; බලා මෙන්, නිරීක්‍ෂණය කරන්නියක මෙනි.

521. දිවයුරු, දිවාකරයා ; අදවේ පත්තු වරු, අජවීථියට ප්‍රාප්තවූ අවස්ථාවෙහි ; ගිමින්. ඝර්මයෙන් ; මේ වන්, මෙඝ ප්‍රවිෂ්ටවූ ; පැදුම්හු දෙනෙමින්. ප්‍රද්‍යුම්නදිව්‍යපුත්‍රයා පරාජය කෙරෙමින් ; කුසා, කුසරාජ්තෙම ; නෙලුඹුදලවදලේ, පද්මපත්‍ර ගහනයෙහි ; වන්, ප්‍රවිෂ්ට වී.

522. පොකුරුපතැතුරේ, පුෂ්කරපත්‍රාන්තරයෙහි ; නැසී සිටි, ප්‍රච්ඡන්නව සිටියාවූ ; කුසා දක්මින්. කුශනරෙන්ද්‍රයා දර්‍ශනය කරමින් ; එක් කලක්, එක් කානතාවක් ; බැමහව්කැරු, භ්‍රූවිභ්‍රම කොට ; ඇතොවුරන්කැන්. අන්තඃපුරසමූහයා කරා ; පිළිපැන්, පැමිණියා.

523. සොම්සිසිලෙහිදූ, සෞම්‍යවූ චන්ද්‍රලෙඛායෙහිද ; ගහණේත. ග්‍රහණය කළාවූ, රාසුරිඳු මෙන්, රාහුඅසුරෙන්ද්‍රයා මෙන් ; ලොහොකතට, ලොහකාන්තමාණික්‍යයට ; ලොහොකඬ මෙන්, ලොහකාණ්ඩයක් මෙන්ද ; කුසරජ, කුසරාජතෙම ; කල, ප්‍රභාවතිය ; දූවැ, ශීඝ්‍රව ගොසින් ; වැළැඳි, ආලිඞ්ගනය කෙළේ.

---

* බමරවල-සම : † පත්වැරු-බො. ‡ මෙන්-බො :
§ ඇතොරන්නා-හැම.

524. අහෝ දියරකුස්—ගතහා වියෙ* මිනෙකෙණෙහි,
පබවතු බිය බොහෝ පත්—සැපින් පහසොහු සැකපත්.

525. පියුමසර වෙති යෙති—දෙනො† පුල්පියුම්විල්හි,
මෙ වැනියනට මොනොතත්හි—වී හැඟැ කුසාබැව් දත්.

526. බැඳැ මුලුන් තැන්තැනැ—දියකෙළිනා‡ පමාදෙනෙ,
නරනිඳු කොවා§ යාගත්—පබවත ඉහි ගමන් ගත්.

527. පබවතකතෙවදන්—වදන්මැගැ හෙත යෝනන්,
මිලිය|| ගිය වත්හි විලස්—මුහුළු පියුමුළු පැ මෙන්.

---

524. අහෝ, බෙදය; දියරකුස්, ජලරාක්‍ෂසයෙක්; ගතහා වියෙමින් මා ග්‍රහණය කෙළේ සී කියමින්; එකෙණෙහි, ඒ ක්‍ෂණයෙහි; බොහෝ බිය පත්, බොහෝ භයට ප්‍රාප්තවූ; පබවත, ප්‍රභාවතීතොමෝ; ඔහු, ඔහුගේ; සැපින්, ආලිඞ්ගනයෙන්; පහස්, ස්පර්‍ශයෙහි; සැක පත්, ශඞ්කාවට ප්‍රාප්ත වී

525. දෙනෝ, ජනයෝතුමූ; පියුමසර, පද්මාදේවිය; පුල් පියුම්විල්හි, පුළුලවූ පද්මසරස්හි; වෙති යෙති, වාසය කෙරෙතියි කියති; මො, සරසීතොමෝ; මෙවැනියනට, මෙබඳු ජලරාක්‍ෂසයන්ට; මෙ නොතත් වී හැඟැ, මේ ස්ථාන නොවෙයි කියා දැන; කුසාබැව් දත් කුසරාජයා බව දතු.

526. තැන්තැනැ, ස්ථානස්ථානයෙහි; මුලුන්¶බැඳැ, රාශිවැ; දියකෙළිනා, ජලක්‍රීඩා කරන්නාවූ; පමාදෙනෙ, ප්‍රමදා**ජන තෙමේ; නරනිඳු කොවා, නරෙන්ද්‍රයා හැරැ; යා ගත්, ගමන් ගත්තාවූ; පබවත ඉහි, ප්‍රභාවතිය හා එක්ව; ගමන් ගත්, ගමනය කෙළේ.

527. පබවතකත, ප්‍රභාවතීකාන්තාවගේ; එ වදන්, ඒ වචන; යෝනන්, යුවතීන්; වදන්මැගැ හෙත, ශ්‍රවණයෙහි හෙන කල්හි; මිලිය ගිය, ම්ලානිකව ගියාවූ; වත්හි, වක්ත්‍රයෙහි; විලස්, විලාසයතෙම; මුහුළු, කුඞ්මලවූ; පියුමුළු, පද්මවනයන්; පැ මෙන්, දැක්වූහයි හඟිම්.

---

* විය-වියො-සම: † දෙනෙ-හැම. ‡ කෙළෙනා-කෙළෙනා-සම:
§ මෙනරනිඳු කොපා-සම: || මිලී-බො: ¶ මුළු-හැම. ** ප්‍රමාද-හැම.

528 පියවුරෙනුතුළ තෝ—වළඟ පිරිමැදූ මඳ වත්,
පබවතකත වනබියෙන්—වහලෙව් යෙහෙළි විල්කල්.

529. දූහැ යන තෙර පබවත—ඉඟි දළරළ දූවාගත්,*
නොහොසී මෙන් වියෝදුක්—ගමනොත් යෙහෙළි
විල්කල්.

530. සරණතල පබවත—වෙළලත සදත විල්කල්,
තරඟතිනි වැළලා මෙන්—බිමැපිළඟී ගුගුරා.

531. මේ යක් ලූ මා හිමි—පබවත් ලූ ඔහු විඳිනී,
නිසයුරු අඳුරු කො සමග—ගොවළුයෙ කො හස් ඉස්බුම්.

---

528. පියවුරෙනි, පයොධරයෙන්; උතුළ තෝ, උතප්‍රවාහවූ ජලය; වළඟ, කෘශමධ්‍යය; පිරිමැදූ, පරාමර්ශනය† කොට; මඳවත්, ස්වල්ප වත්ම; පබවතකත, ප්‍රභාවතීකාන්තාවගේ; වනබියෙන්, විරහභීතීන්; විල්කල් යෙහෙළි, සරසී කාන්තා නැමැති සඛීතොම; වහලෙව්, කෘශ වූවාක් මෙනී.

529. තෙර දූහැ යන, තීරය‡ විජහනය කොට යන්නාවූ; පබවත ඉඟි, ප්‍රභාවතිය හා සමග; දූවාගත්, ධාවනය කළාවූ; දළරළ, මහත්වූ තරඞ්ග ඇති; විල්කළ, තටාක කාන්තාතොමෝ; යෙහෙළි වියෝදුක්, සඛීවිරහදුඃඛය; නොහොසීමෙන්, ක්ෂමා කොට ගත නොහෙන්නියක මෙන් ගමනොත්, ගමන් ගතු.

530. පබවත (කත), ප්‍රභාවතීකාන්තාවගේ; සරණතල, පාද තලය; වෙළලත සදත, වෙළාන්තය හොබවත්ම; විල්කල්, සරසීකාන්තාතොමෝ; බිමැ, ඇපිළඟී; භූමියෙහි ආස්ඵාටිතව; ගුගුරා, ගර්ජනා කොට; තරඟතිනි, තරඞ්ගහස්තයෙන්; වැළලා මෙන්, ආශ්ලෂ කරන්නියක මෙනී.

531. මාහිමි, මාගේ ස්වාමී නම්; මේ යක් ලූ, මේ යක්ෂයා ල; ඔහු විඳිනී, ඒ යක්ෂයා අනුභව කරන්නී; පබවත් ලූ, ප්‍රභා වතී ල; නිසයුරු, නිශාකරයා; අඳුරු, අන්ධකාරය හා; කො සමග, සමග්‍රතාවෙක් කොයින්ද; ගොවළුයේ,§ ගො ෂ්පදයෙහි; හස් ඉස්බුම්||කො, හංසයන්ගේ විශ්‍රාමයෙක් කොයින්ද ?

---

* දවගත්-බො : † පරාමර්ශිය-සම : ‡ තීර්ථය-ඇතම්.
§ ගොවළුව-බො : || හිස්බුත්-සම :

532. පබවත කියමිනිති—ගමනොත වරු සියනුවර,
ඇමැතිසක් ඔවා නන්—පිළිපදන වස් මේ වී.

533. තොප හිමි කුසනිරිඳු—සරණිත පිහිටි දියටඹ,
නිරිඳු බිරිඳුන්* දඹදිව්—නරඹා කිරුළු කුළුහි.

534. රසහව් දුඹුලුදුන්†—සුබැසි වදනොද හිමියා,
සවන්දොඅතිනදමින්—රිසි විදුම්තා‡ ලගනේ.

535. නොවැඳමු දෙවියන්—සැරු නො දහම් දිගැසියෝ,
පියනට කළ උවසරින්—සගමොක් වෙත් දිගැ සියෝ.

---

**532.** **පබවත**, ප්‍රභාවතිය; ඉති කියමින්, මෙසේ කථනය කෙරෙමින්; සියනුවර, ස්වකීයවූ නගරයට; ගමනොත වරු. ගමන්ගත් ක්‍ෂණයෙහි; ඇමැතිසක්, අමාත්‍යචක්‍රතෙම; නන් ඔවා, නානා අවවාද; පිළිපදන වස්, ප්‍රතිපාදනය කරණ පිණිස=ගිවිස්වන පිණිස; මේ වී, මෙසේ කී.

533. දඹදිව්තල, ජම්බුද්වීපතලයෙහි; නිරිඳු බිරිඳුන්, නරෙන්ද්‍රභාර්‍ය්‍යායාගේ; කිරුළුකුළුහි, කිරීටකූටයෙහි; පිහිටි, ප්‍රතිෂ්ඨිතවූ; තොප හිමි, තොපගේ ස්වාමියා වූ; කුසනිරිඳු, කුශනරෙන්ද්‍රයාගේ; සරණිත, චරණ නැමැති; දියටඹ, ජය සතමහය; නරඹා, බලව්.

**534.** හිමියා, ස්වාමීහුගේ; රසහව්, රසභාවයෙන්; දුඹුලුදුන්, පරිණතවූ; සුබැසි, සුභාෂිතවූ; වදනොද, වචන නැමැති අමෘතය; සවන්, ශ්‍රවණ නැමැති; දොඅතින්, කර සම්පුටයෙකින්; අදමින්, පානය කෙරෙමින්; රිසිවිදුම්, සෛවරවිහාරය; ඉතා ලගනේ, ඉතා සුදුසුයි.

535. දිගැසියෝ, දීර්ඝාක්ෂීහු; දෙවියන්, දෙවතාවන්; නොවැඳමු, නමස්කාරය නොකොටමු; දහම් නොසැරු, ධර්ම්මචර්‍ය්‍යායෙහි නොපැවැත; පියනට, වල්ලභයන්ට; කළ උවසරින්, කළාවූ ආචාර§යෙන්; දිගැ, දීර්ඝකාලයක්; සගමොක් සියෝ වෙත්, ස්වර්ගමොක්ෂයෙහි සඞ්ගත වෙත්.

---

* බිළිදුන්-සම: † දුඹුළුහුන්-බො: ‡ රිසිතාබිදුම්-බො:
§ ආදර-ඇතම්.

536. දඹදිව් හව්නිරිඳු—තොප හිමි පාම වටනේ,
කො තොප මනදෙළ පුස්නෙක්—පිළි ඔහු මුත් ලෙව්හී.

537. පසසන* ගුණ මුත්—විලසින් කිම් මහත්මන්,
පියගඳ පලොල්මල් සේ—බුහුමන් කිම කිණිහිරේ.

538. සුරූ සිකිනිඳු සුපිපි—ලියවරැ කෙ ඉසුරු දෙරේ,
තම පිඩුවන් බිඟුන් හෙත්—ඒ ඉසුරු හැඟු හිමියෙනි.

539. නිසැමියඹු ගිහිගේ—උවදුරු කේහෙනි† දෙහේ,
පියා වන දද කුම්සේ—ගමනුකහා‡ ගුවන්හී.

---

536. දඹදිව්, ජම්බුද්වීපයෙහි; හව්නිරිඳු, සකලනරෙන්ද්‍රතෙම; තොප හිමි, තොපගේ ස්වාමිහුගේ; පාම වටනේ, පාද සෙවීම වන්නේය; පිළි, නැවත; ඔහුමුත්, ඒ කුසරාජයා මුත්; ලෙව්හී, ලොකයෙහි; තොප මනදෙළ පුස්නෙක්, තොපගේ මනොරථය පොෂ්‍ය කරන්නෙක්; කො, කොයින්ද ?

537 මහත්මන්, මහාත්මයන්ගේ; පසසනගුණ මුත්, ප්‍රශස්ත§ ගුණය මුත්; විලසින් කිම්, විලාසයෙන් කිම්ද; පිය ගඳ, හද්‍රවූ සුගන්ධඇති; පලොල්මල්, සේ, පාටලීකුසුමය සේ; කිණිහිරේ, කණිණිකාරයෙහි; බුහුමන් කිම, බහුමාන්‍ය තර|| කිමෙක්ද ?

538. සුපිපි, සුපුෂ්පිතවූ; ලියවරැ, උත්තමවූ ලතායෙහි; සුරූ, මනාවූ රූප ඇති; සිකිනිඳු, ශිඛීන්ද්‍රතෙම; කෙ ඉසුරු දෙරේ, කවර ඓශ්වර්‍ය්‍යයක් දරන්නේද; (ඒ ලතායෙහි) තම පිඩු වන්, තමස්සමූහ බඳුවූ; බිඟුන් හෙත්, භෘඞ්ගයන් පතිත වන කල්හි; හිමියෙනි, ස්වාමිනි; ඒ ඉසුරු හැඟු, ඒ ඓශ්වර්‍ය්‍ය සිතව්.

539. නිසැමියඹු, අස්වාමිකවූ අම්බිකාතොමෝ; ගිහිගේ, ගෘහසථ වාසයෙහි; උවදුරු, උපද්‍රවය; කේහෙනි, කවර හෙතුයෙකින්; දෙහේ, දුරුකරන්නීද; පියා වන, පක්ෂ විර හිතවූ; දද, පක්ෂිතෙම; ගුවන්හි, ආකාශයෙහි; කුම්සේ, කවර ප්‍රකාරයකින්; ගමනුකහා, ගමනාකර්‍ෂණය කෙරේද ?

---

* පසත්-බො: † කෙහෙයෙනි-සන්න: ‡ ගමනුකුහැ-බො:
§ ප්‍රසනත-බො: || ආදර-සම:

540. දුමැසිරු වත් පුල්—ලිය වේ බමර පිරිවර,
නිරුසිරුයින් පවත්හොත්—නුසුදුහුද* කා මැඩමට.

541. නොවැ විරති හිමිසඳ—වඩුතු රජමහාලට,†
රොහැණිය‡හා ඉඳු මෙන්—පවතු දිග කුසා හා.

542. තමා වසවත ඔහු—වසවත මට මෙ දූයි,
කෙ ඉසුරු කෙ පියවදන්—වියා ගමනොත් පබවත්.

543. රෙසි ඔත්§ ගමන්—පබවත් එදා නොසරස්,
ගමනින් ලද දිය කෙණේ—කලහසුනතැ තබා යළ.

---

540. පුල්ලිය, පුල්ලවූ ලතාතොමෝ ; දුමැසිරු වත්, දුමාශ්‍රිත වූනම් ; බමර පිරිවර වේ, භෘඞග පරිවෘත වන්නීය ; නිරුසිරුයින් පවත්හොත්, නිරාශ්‍රයව ප්‍රවෘත්ත වත්හොත් ; කා මැඩමට, කාවිසින් අභිභවනයට ; නුසුදුහුද, සුදුසු නොවන්නීද ?

541. හිමිසඳ, ස්වාමිචන්ද්‍රිකාව ; විරති නොවැ, විරක්ත නොව ; රජමහාලට, රාජගෘහයෙහි මහල්තලයට ; වඩතු, ප්‍රයානය කරව ; රොහැණිය හා ඉඳු මෙන්, රොහිණිය හා චන්ද්‍රයා මෙන් ; කුසා හා දිග පවතු, කුසරාජයා හා බොහෝ කාලයක් ප්‍රවෘත්ත වව්.

542. තමා වස වත, තමාගේ වාසය වත්හොත් ; මට මෙ දූයි, මට මේ ජාතියෙහි ; ඔහු වසවත, ඔහු විෂයක් වත් ; කෙ ඉසුරු, කවර ඓශ්වර්‍ය්‍යයක්ද ; කෙ පියවදන්, කවර ප්‍රිය වචනයෙක්දැයි ; වියා, කියමින් ; පබවත, ප්‍රභාවතී ; ගම නොත්, ගමන් ගතු,

543. පබවත්, ප්‍රභාවතීතොම ; ගමනින් ලද දිය, ගමන් ලීලායෙන් (ජය) ලද්දාවූ ජය ; එදා, ඒ දිනයෙහි ; නොසරස්, වහා ; කෙණේ, ක්‍ෂණියෙක් ; කලහසුනතැ තබා, කාලහංස යන් කෙරෙහි තබා ; යළ, නැවත ; රෙසි, රුෂ්ටව ; ගමන් ඔත් ගමන් ගතු.

---

* වත් හොත් නුසුහුද-සම : † වඩු රජමහලට බො :
‡ රෙහැණිය-සම : § ගත්-සම :

544. ඉති කියා පබවත—යෙහෙළියන්නෙකතර පත්.
පවසත නොසුන්* දිවියෙන්—යෙහෙකැ'වීසී සුගල්යත්.

545. ඔහු වසන දෙසෙහි—වැසවත එම මරුකතර,
පවහා වහා ආ මට—මලගල් ගඟුල් හැලි මේ.

546. තොප පියරජහට—පිරිපත් නො මැ කරන්නේ,
කළ මෙ නිබඳින් සබඳිනි—සිමිනු අනාකල් හා.

547. මෙසේ අනත් මනත්—බැණි පබවත් එ සාගල්,†
වියොවින් නොරඳනා වන්—පුරඟන රඳවනා‡ වන්.

---

544. එ කතරපත් යෙහෙළියන්, ඒ කාන්තාරයට පැමිණි සඛීන්; නොසුන් දිවියෙන්, අවිච්ඡින්න ජීවිතයෙන්; සගල් යත් යෙහෙකැ වීසී පවසත, සාගලනුවරට ගියහොත් යෙහෙකැයි ප්‍රකාශකළ කල්හි; පබවත ඉති කියා, ප්‍රභාවතී මෙසේ කීවු.

545. ඔහු වසන දෙසෙහි වැස වත, ඔහු වසනා දිශායෙහි වාසය වතහොත්§; එම මරුකතර, ඒම මරුකාන්තාරය වූ; පවහා, ඒ ප්‍රදෙශය හැර; වහා ආ මට, ශීඝ්‍රව ප්‍රාප්තවූ මට; මේ, මේ කාන්තාරය; මලගල් ගඟුල්හැලී, මලයපර්වතයෙන් ආ ගඞ්ගානිර්ඣරයි.

546. සබඳිනි, සඛීනි; කළ මෙ නිබඳින්, කළාවූ මේ නිර්බන්ධයෙන්; තොප පියරජහට, තොපගේ පිතෘරාජයාහට; කරන්නේ, ක්‍රියමාණ වූයේ||; පිරිපත්මැනො, පරිපන්ථමය; අනාකල් හා, අනාගතකාලයද; සිමිනු, සමරණය කරව්.

547. මෙසේ, මෙපරිද්දෙන්; අනත්මනත් බැණී, අනෙක නාකථා කොට; පබවත්, ප්‍රභාවතීතොම; වියොවින් නොර දනා වන්, විරහයෙන් නොහොබනාක් වැනි; එ සාගල්පුර අඟන, ඒ සාගලපුරලක්ෂණි අඞ්ගනාව; රඳවනා වන්, හොබවා වනු.

---

* නුසුන්-සත්න. † සළගල්-ඒ සගල්-සම: ‡ රඳවා-රඳනා-හැම.
§ වාසයකරණ-සම: || ක්‍රියමානවූ දෙය සම:

548. සමග පබවත සරාය කෙළි සරාය දුලු.
කලදෙසෙ නුරාය නිරිඳුපවරාය මෙ කියූ සග.

**එකොළොස්වන සග.**

---

549. කුසවිරු එතර වැඩු—තැතින් රජමහාලට,
වනසෙවුනෙන් යහන් පත්—නරතුරෙනිති වලපගත්.*

550. මෙ දෙසෙම මල්සැර—සරලනුයෙ එ බියෙන් වන්,
නොසෙ පබවත දෙසේ ලත—නුවන්සරම තෙමෙ ද ලක්.

551. ඔවුන් අසද ඉහි—රුසිරි වෙසේ †කුම්සේ,
දලනිදුහි වැසැ වසහා—පැලඹුම අමා වැසැහා.‡

---

548. පබවත සමග, ප්‍රභාවතිය හා එක්ව; දුලු, ජ්වලිතවූ; සරාය, පඳුම ඇති; සරායකෙළි, විල්කෙළිද; නිරිඳුපවරාය, නරෙන්‍ද්‍රප්‍රවරයාගේ; කලදෙසෙනුරාය, කාන්තාව පක්‍ෂයෙහි අනුරාගයද; මෙ කියූ සග, මේ කීවාවූ සර්ගයයි.

එකාදශසර්ගයයි.

---

549. එතර, එවිගස්හි; කුසවිරු, කුසරජහු; රජමහලට, රාජමන්දිරයට; තැතින් වැඩු, උත්සාහයෙන් වැඩු; වන සෙවුනෙන්, විරහශොකයෙන්; යහන් පත්, ශයනප්‍රාප්තවූයේ; නරතුරෙන්, නිරන්තරයෙන්; ඉති, මෙසේ; වලප ගත්, විලාපයට ප්‍රාප්තවී

550. මල්සැර, අනඞ්ගයා; නොසෙ පබවත දෙසේ ලත, ඉදින් ප්‍රභාවතියකෙරෙහි ශර ලත් හොත්; නුවන්සරම තෙමෙ ද ලක්, නයනබාණයම තෙමේද ලක්‍ෂ වන්නේය; මෙ දෙසෙම සර ලනුයේ, මාකෙරෙහිම ශර ලන්නේ; එ බියෙන්වන්, ඒ හයින් වන්.

551. ඔවුන් අසද ඉහි, ඔවුන්ගේ අශ්‍රධාව හා එක්ව; රුසිරි කුම්සේ වෙසේ, රූපශ්‍රී කුමක්සේ වසන්නීද (ඒ එසේමැයි); දලනිදුහි, ජලනිධියෙහි; වස හා වැසැ, විෂය හා එක්ව; වැසැහා, වාසය කොට; අමාපැලඹුම (එවි), අමෘතයාගේ පැලඹීමක් මෙනි.

---

* වලප්පනත්-සම: † රුසිරුවේ සම: ‡ අමාඑවි-සම:

552. දිරියබල හා ඇය—අසඳ බලාම් දක්මෝ,
මද මැදහත්සිත්නෙන්—ලියසැව්ව පිරිමටනම්.

553. කෙසෙද දනිති දූන්—සැරතැස ඔහු තමාගේ,
වළගට පින් පියවුරෙන්—දුවනින් දගට දුක්දූ.

554 තමා යහදසනෙන්—නුවන් පියතෙපලෙන් කන්,
පහසින් ගත් ගෙණැ කෙසේ මන නොදිකි මා සිත් ගත්.

555 වැළකි* මෙද පිරී—මෙ කඳල එ දෙස්දස්නෙන්,
කත්සෙලෙහි සිලිල් මෙන්—ළෙහි හා දල කෙළෙ දියුණු.

---

552 මද, අනඝතෙම ; මැදහත් සිත්නෙන්, මධ්‍යස්ථ අධ්‍යාශයෙන් ; ලියසැව්ව, ලතාචාපය ;† පිරිමටනම්, පරාමර්ශනය‡ කෙළේනම් ; දිරියබල හා, මාගේ ධෛර්‍ය්‍යබල හා ; ඇය අසඳ හා, ඇගේ අශ්‍රද්ධාව හා ; බලාම් දක්මෝ, යුධ නිරීක්ෂණය කරමු.

553. පින්ප්‍රියවුරෙන්, පූර්ණපයොධරය කරණකොටගෙණ ; වළගට, මධ්‍යප්‍රදෙශයටද ; දුවනින්, ජඝනය කරණකොට ගෙණ ; දගට. ජඞ්ඝාවටද ; දුක්දූ, දුඃඛදායකවූ ; ඔහු, ඒ ප්‍රභාවතීහු ; තමාගේ, තමන්ගේ ;§ දූන් සැරතැස කෙසෙද දනිති, ශ්‍රාන්තය දූන් කෙසේ අවබොධය කෙරෙද්ද ?

554. තමා යහදසනෙන්, තමාගේ ප්‍රියදර්ශනයෙන් ; නුවන්, නයනයද ; පියතෙපලෙන්, ප්‍රියවූ වචනයෙන් ; කන්, කර්ණයද ; පහසින්, ස්පර්ශයෙන් ; ගත්, ගාත්‍රයද ; ගෙණැ, ග්‍රහණයකොට ; මන නොදිකි, අධ්‍යාශය නොදී ; මා කෙසේ සිත් ගත්, මාගේ චිත්තාකර්ෂණය කෙසේ කළාද ?

555. එ දෙස්දස්නෙන්, ඒ දිග්දර්ශනය හෙතුකොට ගෙණ ; මෙ කඳල, මේ බාෂ්පයතෙම ; පිරී, සම්පූර්ණව ; වැළකී මෙද, වැළකුයේ මතු නොවෙයි ; කත්සෙලෙහි, තපනශෛලයෙහි ; සිලිල් මෙන්, ජලය මෙන් ; ළෙහි, හෘදයෙහි ; දල හා, ශොකාග්නිය හා ; දියුණු කෙළෙ, විගුණ කෙළේයි.

---

* වැළකු-සන්න. † චාපයෙහි-බො :
‡ පරාමර්ශය-සම : § ඒ ප්‍රභාවතියගේ-ඇතම්.

556. අලළුව නෙතකැළුම්—ලසගමන් නිලුපුලන්,
කලහඝ්න දූනවූ මා—තබා අසඳහු ලු ඒ නුගියෝ.

557. නො ලත මදෙසැ හා—විරූැති දිගැස දිගැසින්,
නොවැ නු දසුන් ඉස්*නෙන්—ඔවුනිඟි කෙසේ රැකියෙම්.

558. පුරා නුරා ඇති—පියවුරු දිදී ලෙහි මා,
සැරහු වන් පෙරදවස්—හිද නො තැවේද කෙසේ.

559 රතොට රතැදියෙන්—කොපොල් පතලේ බිඳියෙන්.
තනහස මුසකෙළෙන්—නිදෙසිම්ලු හා නුගියට.

---

556 නෙතකැළුම්, නෙත්‍රකාන්තියෙන්ද ; ලසගමන්, අලස ගමනයෙන්ද ; අලළුවා, ක්‍ෂුභිත කරවා ; නිලුපුලන් නිලොත්පලයන්ද ; කලහස්න, කාලහංසයන්ද ; දූනවූ, ජය ගැන්වූ ; මා තබා, මා හැර ; ඒ නුගියෝ, ඒ අනුගතාවෝ ; අසඳහු ලු, අශ්‍රද්ධාවෝහු ලූ.

557. විරූැති දිගැසින්, විරක්ත දීඝනෙත්‍රය ; මදෙසැ හා දිගැස නොලත, මාදිශාවෙහිදු දීඝනෙත්‍රය නොලන කල්හි ; නොවැ නු, අනු නොව ; දසුන් ඉස්නෙන්, දශීනය කැමැත් තෙන් ; ඔවුන් ඉඟි, ඔවුන්ගේ අභිප්‍රාය ; කෙසේ රැකියෙම්, කෙසේ රක්‍ෂාකෙළෙම්ද ?

558. මා ලෙහි, මාගේ හෘදයෙහි ; ඇති නුරා, ඇතිතාක් අනුරාගය ; පුරා, පූර්ණයකොට ; පියවුරු දිදී, පයොධර දිදී ; පෙරදවස්, පූර්වකාලයෙහි ; සැරහු වන්, සැරහුවාක් බඳුවූ ; හිද, හෘදය ; කෙසේ නො තැවේද, කෙසේ නොතැවෙන්නේද ?

559. (දෙලෙහි, ක්‍රීඩාධුරයෙහිදී ;) රතොට, රක්තොෂ්ඨයෙහි ; රතැදියෙන්, රක්තාකර්ෂණය කෙළෙන් ; කොපොල්, කපොලයෙහි ; පතලේ බිඳියෙන්, පත්‍රලෙඛා භගන කෙළෙන් ; තනහස මුසකෙළෙන්, පයොධර නැමැති හංසයන් මූච්ඡා කෙළෙන් ; (මම ;) නුගියට, අනුගතාවට ; නිදෙසිම්ලු හා, නිර්දෝෂයෙම්ලු.

---

* ඉසිස්-ඉසි-සම :

560. හස*සමත පවන්—කල්හර සඳිඳුවරැ†තෙප්,
පැරැදූ ඇයතියෙන් හා—කුරුරස වැ ම දුබුල්හට.

561. අසද ලග මෙ සිත්—ගුණලග දිය දුරුයේ,
අසද මෙදනාසිත් දූන්—පෙරවනුයෙ හා කුම්සේ.

562. කලහසසර සමත—සර බිඹුවැළ නිලුපුලෙන්,
ගමන්පියතෙපලලවන්—නුවන දූකැ ද නොවෙහෙම්.

563 සමග පබවත යන—ගියෙ සිතු මදෙස නොබලා,
නිරතුරු මෙ වේ විඳුනෙම්—පරමතුරු‡තුරු නොකෙ
ළෙම්.

---

560. හස, හංසයෙනි ; සමත, කොකිලාවෙනි ; පවන්, මාරුතයෙනි ; කල්හර, කහලාරයෙනි ; සඳ, චන්‍ද්‍රයා ; ඉඳු වරැ, ඉන්දීවරයෙනි ; තෙප් හා, තෙපි වනාහි ; ඇයතියෙන් පැරැදූ, ඈ සනතකයෙන්§පැරද ; ම දුබුල්හට, මා දුර්වලයාහට ; කුරුරස වැ, කර්කශව :—

561. අසද, අශ්‍රද්ධාවූ නැනැත්තිය කෙරෙහි ; ලග මෙ සිත්, ලගනාවූ මේ චිත්තය ; ගුණලග, ගුණවත් කාලයෙහි ලගනා වූයේ වීනම් ; දිය දුරුයේ, ජයලද්දේසි ; මෙදනාසිත්, මේ මුග්ධවූ චිත්තයතෙම ; දූන් අසද, දූන් ඇගේ අශ්‍රද්ධාව ; කුම්සේ පෙරවනුයේ, කුමක්සේ දුරුකරන්නේද ; හා බෙදයි.

562. කලහසසර, කාලහංසයන්ගේ ගමන ; සමතසර, කොකිලධ්වනිය ; වැළබිඹු, පක්වබිම්බඵලය ; නිලු ලෙන්, නීලොත්පලය යන මොවුන් කරණකොට ගෙණ ; (ඇය, ඇගේ ;) ගමන්, ගමනයද ; පියතෙපල, ප්‍රිය වචනයද ; ලවන්, අධරයද ; නුවන, නෙත්‍රයද ; දූකැ ද, නිරීක්ෂණය කොට ද ; නොවෙහෙම්, ආශ්වාදි|| නොවෙම්.

563. යන පබවත සමග, යන්නාවූ ප්‍රභාවතිය හා එක්ව ; සිතු, චිත්තයතෙම ; මදෙස නොබලා ගියෙ, මා දිශාව නොබලාම ගමනය කෙළේ ; නිරතුරු, නිරන්තරයෙන් ; මෙ වේ විඳුනෙම්, මේ වෙදනාව අනුභව කරන්නෙම් ; පරමතුරු,¶ පරමාපීයට ; අතුරු නොකෙළෙම්, ඡිද්‍රයක් නොකෙළෙම්.

---

* හේ-සම : † සඳිනිඳු-සඳඳුවර-බො : ‡ තර-තරු-සම :
§ සනතක දෙසින්-සම : || ආශ්වාස-සම : ¶ පරමත-පරමතර-හැම.

564. කෙලෙස තෙලෙහෙම්ලිය—වෙළපා හොත් යහන් මේ,
තනකොකුමෙබෑ වැළඳි මේ—සිහිලැල්කැඳි පිළිවැඹ.

565. රිසිසෙ ගැලි එ ඇල්—කැඳි පියවුරු මඬලේ,
තවා නු*හා එක්වන්—පිවිතුරුතුරුසළු මෙ වේ.

566. නෙත්මිණිකැළුමෙබෑ—සලසා එ ඇඟිලි පහස්.
ලියූ මෙ පත් මුත්හර—පිවිතුරු පින් පියවුරෙන්.

567. නො පලහති මමන—නුරාබිඳු වුන් වන්නේ,†
විසිතුරු සකරබිම්හි—සුහුඹුල් දුටු විරූ තුරු.

---

564. කෙලෙසතෙලෙ, කෛලාස පර්වතතටයෙහි; හෙම් ලිය වෙළපා, හෙමලතාවට විඩම්බනා කෙරෙමින්; හොත් යහන් මේ, සැතපුනාවූ මේ සයනයය; තනකොකුම එබෑ, ස්තනකුඞ්කුම පිහිටුවා; වැළඳි, ආලිඞ්ගනය කළාවූ; සිහි ලැල්කැඳි, අතිශයින් ශෛත්‍යසකන්ධ ඇති; පිළිවැඹ මේ, මේ ස්ඵටිකමාණික්‍යස්තම්භයයි.

565. ඇල්කැඳි, ශීතසකන්ධ ඇති; එ පියවුරු මඬලේ, ඒ පයොධර මණ්ඩලයෙහි; රිසිසේ, ස්වච්ඡන්දව; ගැලි, නිමග්නව; පිවිතුරු, පවිත්‍රවූ; මෙ උතුරුසළු, මේ උත්තර සාටකය තෙම; එක්වන්; නිරන්තරයෙන්; තවානු වේ, සන්තාප කෙරේනු; හා, බෙදයි.

566. නෙත්මිණිකැළුමෙබෑ, නෙත්‍ර නැමැති මාණික්‍ය කාන්ති නිෂෙකය කොට; එ ඇඟිලිපහස් සලසා, ඒ අඞ්ගුලි පල්ලවස්පර්ශ යොදා; ලියූ මෙපත්, ලිඛිතවූ මේ පත්‍රය; පින් පියවුරෙන්, පීනපයොධරයෙන්; පිවිතුරු, පවිත්‍රවූ; මෙ මුත් හර, මේ මුක්තාහාරයයි.

567. විසිතුරු, විචිත්‍රවූ; සකරබිම්හි, අග්නිසංස්කාරවූ ක්ෂෙත්‍ර යෙහි; සුහුඹුල්තුරු, සමුත්පන්න‡ වන්නාවූ වෘක්ෂයන්; දුටු විරූ, දෘෂ්ටපූර්වවූ ඒ ප්‍රභාවතීහු; නුරාබිඳුවුන් වන්නේ, අනුරාග නැමැති බිජුවට රොපනය කරන්නාහු; ම මන, මාගේ චිත්ත නැමැති ක්ෂෙත්‍රය; නොපලහති, පලුෂ්ට නොකෙරෙති; (පලුෂ්ට කෙරෙත්මැයි).

---

* තවඩු-සම. † බිජු ඊන් (ලවත්) වහන්නේ-සම:
‡ සමපනන-හැම.

568. නොදෑවූ හළ* වැඩූ—හරා පලඟ රිටුමුළු,
මුවරදදු ඉඳු සමත්—වනනට සතුරුලෙව් මෙවු.

569. පියවත් පහස් ගඳ—රසරුසදත් නො තිබී,
යහදසනැයතිය තමා—තබා ගියෙ වන් එ නුවර.

570. මසඳහනින් ඔවුන්—නොමින් මෙසි වඩන්නේ,
අහෝ නොම†දළ තමා—විසිනා නොදන්නෙන් මුත්.

571 තුනුහෙම්ලිය වතළ—මෙනෙ සෝකිණු කෙසේ වී,
සැරහූ තෙනෙබරණහෙම්—කිණු‡ මුත් නැත් කනාවන්.

---

568. මුවරදදු, නොදෑවූ, මකරධ්වජයා දග්ධ නොකළාවූ; හරා, ඊශ්වරයාද ; ඉඳු හළ, චන්ද්‍රයා වැමැරුවාවූ ; පලඟ, රාහුද ; සමත් වැඩූ, කොකිලයන් වර්ණනය කළාවූ ; රිටුමුළු, කාකසමූහයාද යන ; මෙවු, මොහු ; වනනට, විරහීන්ට ; සතුරුලෙව්, ශත්‍රැලොකයාසී.

569. යහදසනැයතිය, ප්‍රියදර්ශනයන්ට විධෙයවූ ; පියවත්, ප්‍රියාවස්තුවද ; පහස්, ස්පර්ශයද ; ගඳ, ගන්ධයද ; රස, රසයද ; රූ, රූපයද ; සදත්, ශබ්දයද යන මේ ; නොතිබී, නොරැඳී ; තමා තබා, මා හැර ; එ නුවර, ඒ නගරයටම ; ගියේ වන්, ගමනය කෙළේ වන්.

570. ඔවුන්, ඒ ප්‍රභාවතීන් ; නොමින්, අපරිමිතවූ ; මෙසි වඩන්නේ, ආමර්ෂිවර්ණනය කරන්නේ ; මසඳහනින්, මාගේ ස්මරණයෙනි ; අහෝ, ඛෙදය ; තමා විසිනා නොදන්නෙන්මුත්, මා පරීක්ෂාකොට නොදන්නා හෙයින්ම මුත් ; නොමදළ, ඒ අනුග්‍රහයමැ මද ?

571. තුනුහෙම්ලිය වතළ, ගාත්‍ර නැමැති ස්වර්ණලතාව ව්‍යාපතවූ ; මෙනේ, හෘදයෙහි ; සෝකිණු කෙසේ වී, ශොක ක්‍ෂණය කෙසේ වීද ; හෙම්අබරණ සැරහූ, ස්වර්ණාභරණයෙන් සජ්ජිතකරණලද ; තෙනේ, පයොධරයෙහි ; කිණුමුත්, ක්‍ෂණයක් මුත් ; කනාවන් නැත්, කනකවර්ණයෙක් නැති.

---

* වහළ-සන්න. † හෙතම-හෙම-සම : ‡ කිණි-සම :

572. සුගතදල වන් එ මරු—කතර කෙසේ නො ගෙවෙත්.
නුවනතැ බැලුම්දල හුණු—නිවමින් ගඟුල්හැලි දෙත්.

573 දී ඉඳුපා ඉස්—උරදී වියෝ වැ ද ඔහු,
මලෙවියා පහරට—වහරවූ දනහට ලම්දිම්යෝ*.

574. වැහැවෝ නෙතින් තෙප්—දෙසැ දෙසැ එ රුදස්නෙන්.
සවණින් කෙවුල් කිල්මෙන්—වැහැවෝ ගතින් කුම්සේ.

575. පියවත්හි සොමි තා—ගතින් සවණත් නෙත්සිත්,
මෙදෙසින් මෙතෙක් ගතුයේ—නොනුරාද එපුරුද්දන්.

---

572. නුවනතැ, නෙත්‍රයෙහි ; බැලුම්දල, දෘෂ්ටිජලය ; හුණු නිවමින්, උෂ්ණය නිර්වාපණය කෙරෙමින් ; ගඟුල්හැලිදෙත්. (ගඞ්ගා) නිර්ඣර පවත්වත් ; සුගතදල වන්, සුගානනවහනියට බඳුවූ ; එ මරුකතර කෙසේ නොගෙවෙත්, ඒ නිර්ජල කාන්තාරය කෙසේ ගෙවා නොපියද්ද ?

573. වියෝවැද, වියුක්තවැද ; ඉඳුපා, චන්ද්‍රරශ්මියට ; ඉස්දී, ශීර්ෂයදී පමුණුවාද ; මලෙවියා පහරට, කාමයාගේ ආයුධයට ; උරදී, වක්ෂස පමුණුවාද ; වහරවූ දනහට, උපකාරීවූ ජනයාහට ; ඔහු ලම්දිම්යෝ, ඒ ප්‍රභාවතී ලදුසියෝයි.

574. නෙතිනි, නෙත්‍රයෙනි ; තෙප්, තෙපි වනාහි ; දෙසැ දෙසැ, දිශානුදිශාවෙහි ; එරු දස්නෙන්, ඒ රූපයාගේ දර්ශනය හෙතුකොටගෙණ ; වැහැවෝ, සන්හිඳෙව් ; සවණිනි, කර්ණයෙනි ; කෙවුල්කිල්මෙන්, කොකිල ධ්වනියෙන් ; වැහැවෝ, සන්හිඳෙව් ; ගතිනි, ගාත්‍රයෙනි ; කුම්සේ තෙප් වැහැවෝ, කවර පරිද්දෙන් තෙපි සන්හිඳෙව්ද ?

575. එ පුරුද්දන්, ඒ පරිචිතයන් ; සොම්ගතින්, තමන්ගේ සෞම්‍යවූ ගාත්‍රයෙන් ; තා පියවත්හි, තා ජහනය කරණකල්හි ; සවණත්, ශ්‍රවණයද ; නෙත්, නෙත්‍රයද ; සිත්, චිත්තයද යන ; මෙතෙක්, මෙතෙක් වස්තූන් ; මෙදෙසින් ගතුයේ, මේ දිශාවෙන් හැරගත්තේ ; නොනුරාද, අනුරාගනොවෙයි.

---

* ලම්නිම්යො-සම :

576. වියොදෙලෙනුදුලන—හිදමැද ඔවුන් වස්වා,
වමෝලු හා ඇප් දූන්—මිනිසු ගුණ රක්නා නම්.

577. නැතගා* මෙ තම නට—කසේ දෙවුද නුගියෝ,
නැතද බිජු දම්බිම්හී—ගනසා සැදී තුරු දෙනේ.

578 ලොමුදහගත්ගතින්—සෙද වැළලූ වරදට,
දෙයදෙ† පහරස මෙබලා‡—තමහට ඔහු කළා වෙත්.

579. පිළිබඳ ඔවුන් අසද—නිබඳ වැ වත මෙ§දෙසේ,
වහලෙ ලැබැ හා මෙබලා—දිරිය බල ඔබලෙ තමා.

580. වැළඳවා ගෙලෙහි—උරිනුසුලා පියවුරන්,
සිඟුවලගට මාවූ—වහලුදු නොහැගියෝ හා.

---

576. වියොදෙලෙනුදුලන හිද මැද ඔවුන් වස්වා, විරහාගනීන් ජ්වලිතවූ හෘදයමධ්‍යයෙහි ඔවුන් වාසයකරවා ; ඇප් දූන්, අපි දූන් වනාහි ; මිනිසු ගුණ රක්නානම් වමෝලු, මනුෂ්‍යගුණ රක්‍ෂා කරන්නෝ නම් වීමුලු ; හා, බෙදය.

577. නුගියෝ, අනුගතාවෝ ; තමනට නැති මෙ අගා, තමන්ට නැති මේ දුක්ඛය ; කෙසේ දෙවුද, කෙසේ දුන්නුද ; දම්බිම්හි බිජු නැතද, දග්ධභූමියෙහි බීජුවට නැතද ; ගනසා සැදී තුරුදෙනේ, ඝනච්ඡායායෙන් හෙබියාවූ ද්‍රැම ජනිතවන්නේසි.

578. ලොමුදහගත් ගතින්, ලොමොදගමනයෙන් යුක්තවූ ගාත්‍රයෙන් ; සෙදවැළලූ වරදට, දෘඪාලිඞ්ගනය කළ දොෂයට ; දෙයදෙ මෙබලා පහරස, මේ පැලගි කක්කශය ; තමහට ඔහු කළා වෙත්, තමාහට ඔහු කළානම් වෙත්.

579. ඔවුන් පිළිබඳ අසද, ඔවුන් ප්‍රතිබද්ධවූ අශ්‍රද්ධාව; මෙ දෙසේ නිබඳ වැ වත, තමා පක්‍ෂයෙහි නිරන්තරව වන කල්හි ; මෙබලා වහලෙ ලැබැ, මේ පැලගිවූ වත්තමක් ලදින් ; තමා දිරියබල හා ඔබලේ, තමාගේ ධෛර්‍ය්‍යබලය හා දුර්වල වී.

580. ගෙලෙහි වැළඳවා, කණ්ඨයෙහි ආශ්ලෙෂය කරවා ; පියවුරන් උරිනුසුලා, පයොධරයන් වක්‍ෂස්ථලයෙන් දරා ; සිඟුවලගට, කෘෂවූ මධ්‍යයට ; මාවූ වහලුදු, මාවූ (වහල්ද,) වත්තම්ද ; නොහැගියෝ හා, නොසිතූමැයි.

---

* හ-හා-හැම. † යාල-යද-දයද-සම :
‡ වලා-වතලා-හැම. § තම-ඇතම්.

581. නොවන් තුනුමැද මා—යුගදඟ නොවත් යතුරෙන්,
පියො* දෙනුයෙ දුක් කුම්සේ—මනනෙත් කැලි දිගැසියන්.

582. විදුතු ශෝසවියන් සිතු—නුරාබැර සිත් නොපැණේ,
විදුතු මැණි පියුම්රා—සුරතස නොදිස්නා සේ.

583. අසද බිජුනෙන් වේ—නුරා මන ලිය තොතැන්නෙ,
ගිහිණි කටු කරල†දම්—වේ බිජුනි රඹ වන්නේ.

584. රත්සඳුනැත් සුවට—මුහුණුරියත ඉඟි ගමන්,
තනතෝ තනසේමා—කිම ළෙන් නොවුසුලන්නේ.

---

581. මා තුනු මැද නොවත්, මා ඔවුන්ගේ තනුමධ්‍යය නොවත්; මා යුගදඟ නොවත්, මා ඔවුන්ගේ යුගමජඝාව නොවත්; යතුරෙන්, යාත්‍රායෙන්; මනනෙත් කැලි දිගැසියන්, මනනෙත්‍රකාන්ති දීඝාක්ෂීන්; දුක් කුම්සේ පියොදෙනුයේ, දුක් කුමක්සේ එවන්නේද ?

582. පියුම්රා මැණි විදුතු, පද්මරාග මාණික්‍යය විදුනා කල්හි; සුරතස නොදිස්නා සේ, සුරතතය නොපෙණෙන්නාසේ; සෙවියන් සිතු විදුතු, ශොකයෙන් චිත්තය විදුනා කල්හි; සිත් නුරාබැර නොපැණේ, චිත්තයෙහි අනුරාගභාරය නොපෙණෙන්නේයි.

583. මන තොතැන්නේ, චිත්තලක්‍ෂණ තොයාලවාලයෙහි; නුරාලිය, අනුරාග ලක්‍ෂණ ලතාව තොම; අසද බිජුනෙන් වේ, අශ්‍රුධා බිජුවටින් වන්නේය; ගිහිණි කටුකරල, (කරල) කණ්ටක යෙන් ගහණ වැ කකීශවූ; දම්වේ බිජුනි, දගධවෙත්‍ර බීජයෙන්; රඹ වන්නේ, කෙහෙලි වන්නේයි.

584. රත්සඳුන් ඇති, රක්තාධ්‍යාශ ඇතිහෙයින් (ද්‍යොහෝ නොහොත්) රක්තචන්දන ඇති හෙයින් (ද්‍යොහෝ); සුවට, මනා පැවැතුම් ඇතිහෙයින් (ද්‍යොහෝ නොහොත්) මනාවට හෙයින් (ද්‍යොහෝ); මුහුණුරියත්, මුඛාරාධනා කරණිහෙයින් (ද්‍යොහෝ නොහොත්) උෂ්ණිවමුඛව සිටිහෙයින් (ද්‍යොහෝ); ගමන් ඉඟි තනත්, ගමන් හා එක්වූ කම්පාවත්; ඕ තනසේ මා, ඒ ප්‍රභාවති යගේ තනය වැනිවූ මා; ළෙන් නො උසුලන්නේ කිම, හෘදයෙන් නුඋසුලන්නේ කිම්ද ?

---

* පිය-සන්න. † කර-සම:

585. කියමිනිති නරනිඳු*—සගල් නුවරට යාගත්,
නෙලුඹස මතැත් හරණේන්— මැතිසක් ඔවා සිඳුමින්.

586. දෙපන් දහස් දෙතුන්—සියනූ එකහඬ යුත්,
කොකුමුවාවෙණි බැර†දත්—ගදෙව් සිරිවුන් ගත්ගත්.‡

587. ඉහි යන මැති සියන්—දූහැ හුදු එකැතිය මෙනෙන්,
නො ලා මහසත් එ කලා—ගියෙ එ මහසත් එකලා.

588. බිහිවත් දූකැ මහසත්—යනෙපුරෙනෙක සරණේන්,
මුවරඳරොන්සළා සක්—ගෙණෑ නලසෙව් පළමු වී.

589. රොන් සහළගුරොත—බිඟු දුම් මල්මෙලේ ලා,
පලු අතලෙන් විදුන් ලිය—පියනට නොලී රජ නෙත්.

---

585. නෙලුඹස මතැත් හරණේන්, මෘණාලසූත්‍රයන් සිඳැ යන මත්තහස්තියකු මෙන්; මැතිසක් ඔවා සිඳුමින්, අමාත්‍ය චක්‍රයාගේ අවවාද සිඳුමින්; නරනිඳු, නරෙන්ද්‍රතෙම; ඉති කියමින්, මෙසේ කථනය කෙරෙමින්; සගල්නුවරට යාගත්, සාගල නම් නගරයට යාත්‍රා ගති.

586. දෙපන්දහස් දෙතුන්සියනූ එකහඬ යුත්, දසදහස් සසිය එකානූ හඬෙකින් යුක්තවූ; ගත්ගත් ගදෙව් සිරිවුන්, මූර්තිමත්වූ ගාන්ධර්වශ්‍රී අනුභවකොට; කොකුමුවාවෙණි බැර දත්, කොකනදවීණාභාරයෙන් යුක්තවූ.§

587. ඉහි යන මැතිසියන් දූහැ, එක්වයන අමාත්‍යශතයන් හැර; හුදු එකැතිය මෙනෙන්, හුදෙක් එකානත සිතින්; එ කලා මහසත් නොලා, ඒ කානනාතපත්‍ර නොලා; එ මහසත්; ඒ මහා සත්වතෙම; එකලා ගියේ, හුදකලාව ගියේ.

588. එපුරෙන් එකසරණේන් යන මහසත්, ඒ පුරයෙන් එකාකීව යන්නාවූ මහාසත්වයා; බිහිවත් දූකැ, බාහ්‍යවාසකු යෙහි දූක; මුවරඳරොන්සළා සක් ගෙණෑ, මකරන්දරේණු ආවර්තලක්‍ෂණ චක්‍රායුධය ගෙණ; නලසෙව් පළමුවී, මාරුත සෙවකතෙම ප්‍රථමවී.

589. රොන් සහළගුරු ඔත, රේණු ලක්‍ෂණ ජ්වලිතාඞ්ගාර සහිත; මල්මෙලේලා, කුසුම නැමැති සරාවෙහි බහාලා; බිඟු

---

* නිරිඳු-ගී. † බෙර-සන්න.

‡ ගත්ගදෙව් සිරිවුන්ගත්-සම: § භාවයෙන් යුක්තාවූ පත්‍ර ඇති-සම:

590. මදනල සසල*දුන්—පිනිනද අදලගුම්†බිඟු,
ලියෝ සැනඹු නිරිඳු—දෙලෙනොබලැය විලස් පෑ.

591. සල ඉදෙන ලතඹපලු—පවනින් යතුරුමගහි,
පබවත දුනත්සන්සැකි—මනනෙත් ගති නරවරා.

592. තඹුරු පියුමාරෙහි‡—විමලිඳුනිල්මිණිතෙලේ,
ලාරෙසනද පියසන්—පබවත සැකි වනනදන්.

593. මදමරු පහස් ලද—කොකුමුවවෙණෙිත සරනෙන්,
හේ දුටු§සිටු ගිජිඳුමුලු—දූහැ කන්තල ඉහි ගමන්.

---

දුම්, හෘඞගලකෂණ ධූමය ; පලු අතලෙන් විදුන්, පල්ලව හසත යෙන් විදුනා ; ලිය පියනට, ලතා ප්‍රියාවන්ට ; රජ, රාජෙන්‍ද්‍ර තෙම ; නෙත් නොලි, නෙත්‍රප්‍රෙරණය නොකෙළේ.

590. මදනල සසලදුන්, මන්‍දමාරුතයෙන් කම්පා කරණලද ; පිනින් අද, තුෂාරයෙන් ආර්ද්‍රවූ ; අදලගුම් බිඟු, කොලාහල හෘඞගයන් ඇති ; ලියෝ, ලතාවෝ ; දෙලෙන් ඔබල ඇය විලස් පෑ, ක්‍රීඩාබුරයෙන් මිරිකුණුවූ ඇගේ විලාස දක්වා ; නිරිඳු සැනඹු, නරෙන්‍ද්‍රයා පිණිවූ.

591. යතුරුමගහි, යාත්‍රාමාර්ගයෙහි ; පවනින් සලදෙන, මාරුතයෙන් කම්පා වන්නාවූ ; ලතඹපලු, අභිනව තාම්‍ර පල්ලවතෙම ; පබවතදුන් අත්සන්සැකි, ප්‍රභාවතිය දුන්නාවූ හසතවිහනශඞ්කිතවූ ; එනරවරා මනනෙත් ගති, ඒ නරොත්තම යාගේ මනොනෙත්‍රග්‍රහණය කෙළේයි.

592. පියුමාරෙහි තඹුරු, පද්මාකරයෙහි තඹුරුතෙම ; විමලිඳුනිල්මිණිතෙලේ, නිර්මලවූ ඉන්‍ද්‍රනීලමාණිකාතලයෙහි ; වනනදන්, විරහනිධානය ; ලාරෙසෙන් අද, ලාක්ෂාරස යෙන් ආර්ද්‍රවූ ; පබවත පියසන් සැකි, ප්‍රභාවතියගේ පාද සංඥා ශඞ්කිතවී.

593. මදමරුපහස් ලද, මන්‍දමාරුතස්පර්ශ ලද්දාවූ ; කොකු මුවවෙණෙිඹතසරනෙන්, කොකනදවීණාවෙහි පැවැත්වූවාවූ ධවනියෙන් ; ගමන් ඉහි කන්තල දූහැ, ගමන් හා එක්ව කාණිණය හැර ; සිටු ගිජිඳු මුලු හේ දුටු, සිටියාවූ ගජෙන්‍ද්‍රසමූහයා ඒ දිටී.

---

* සල-බො :   † අදලගම්-සම :
‡ පියුමාකෙරෙහි-සම් :   § දිටුසිටි-සම :

594. වගබියෙන් දිවූ—වෙහෙලුන් ඉහි මියුල්කැන්,
දිදී සවනබියෙස්වත්—වනසෙව්නෙ රජ මුසු විත්.

595. පහළ මතින් මරු—තිරිසන් කණ්ද යහදු,
එවෙණේ එ අත්පල්ලේ—සහතොස කෙසා මියුරෙක්.

596. මිදෙල් යොහොඹු කුසුම්—දැකැ විල් සිලිල් පිටුහී,
වගල මිණිබිම්හී—පබල මුතු සඳහන් කෙළෙ නිරිඳු.

597. කැරු සඳහනෙපියවුරු—එ හුණුමගැ ගියෙ නිරිඳු,
ඔහුසඳහනින් දෙනෙ දුරු—සහලගර පාබඳනේ.

598. ඉති කැරු මරුකතර—සගල් සපත් එනිරිඳු,
බජත දිවයුරු හත්ගිරි—කෙළෙ හැත්හල් යහන්තැන්.

---

594 වගබියෙන්, ව්‍යාඝ්‍රයන් කෙරෙහිවූ භයින්; දිවූ වෙහෙලුන් ඉහි මියුල්කැන්, මෘගයන් හා එක්ව ධාවනය කළාවූ මෘග ධෙනු සමූහයා; සවන් දිදී අබියෙස්වත්, කන් දිදී ආසන්න වන කල්හි; එරජ, ඒ රාජතෙමේ; වනසෙවින් මුසවින්, විරහශොකයෙන් මූර්ඡා විනි.

595 මරුපහළමතින්, මාරුතප්‍රහාරමාත්‍රයකින්; තිරිසන් කණ්ද යහදු එවෙණේ, තිරච්ඡානයන්ගේ කර්ණයෙහිදු, සුඛ දායකවූ ඒ වීණාව; එ අත්පල්ලේ පහස් ඔත, ඒ හස්තපල්ලව ස්පර්ශ ලදනහොත්; කෙසා මියුරෙක්, කෙපැලැහි මධුරයෙක් දෝ හෝ.

596. එනිරිඳු, ඒ නරෙන්ද්‍රතෙමේ; විල්සිලිල්පිටුහි, තටාක සලිලපෘෂ්ඨයෙහි; මිදෙල් යොහොඹුකුසුම් දැකැ, නිචුල මාධවී කුසුම දැක; මිණිබිම්හි වගල, මාණික්‍යභූමියෙහි වගලාවූ; පබලමුතුසඳහන් කෙළෙ, ප්‍රවාලමුක්තාඵල සමරණය කෙළේ.

597. එපියවුරුසඳහන් කැරු, ඒ පයොධරසමරණය කොට; නිරිඳු එහුණුමගැ ගියේ, නරෙන්ද්‍රතෙමේ ඒ උෂ්ණමාර්ගයෙහි ගියේය; දෙනේ, ජනතෙමේ; දුරුඔසු සඳහනින්, දූරස්ථවූ ඖෂධයාගේ සමරණයෙන්; සහලගර පාබඳනේ, ජ්වලිතාඞ්ගාර යෙහි පදන්‍යාසය කරන්නේයි.

598. මරුකතර ඉති කැරු, මරුකාන්තාරය මෙසේ ඉක්ම; සගල් සපත් එනිරිඳු, සාගලනුවරට සම්ප්‍රාප්තවූ ඒ නරෙන්ද්‍ර

599. පබවත යතුරු ගතාය සෝ පතාය කුසා,
පතාය ඈ එ සාගල්* සපතාය සෙ කියූ සග.

## දෙලොස්වන සග.

---

600. මදිඳුහු ඈ රජ—නුවරෝ යහයහන්හි,
නොහොත්හු ර කප්මින්—එතර නරනිඳු තෙදනෙන්.

601. සම මදර තර බළි—දෙවිසිහඬ තෙගම්රා,
සරසත්උනු පණස්තැන්—මුසඑක්විසි වජඹනා.

---

තෙමේ; දිවයුරු හත්ගිරි බජත්, දිවාකරයා අස්තපර්වතය සෙවුත්ම; හැත්හල් යහන්තැන් කෙළෙ, හස්තිශාලාව ශයන ස්ථාන කෙළේ.

599. පබවත යතුරුගතාය, ප්‍රභාවතිය යාත්‍රාකළ කල්හි; සෝපතාය කුසා, ශොකප්‍රාප්තවූ කුසරාජයා; ඈ පතාය, ඈ ප්‍රාර්ථනා කොට; එ සාගල් සපතාය සෙ, ඒ සාගල්නුවරට සම්ප්‍රාප්තවූ පරිදි; කියූ සග, කියා නිමවූ† සර්ගයයි.

චාදශම සර්ගයයි.

---

600. එතර, එවිගස්හි; නරනිඳු තෙදනෙන්, (ඒ කුශ) නරෙන්ද්‍රයාගේ තෙජසින්; මදිඳුහු ඈ රජ, මද්‍රරාජයා ආදිවූ රජහුද; නුවරෝ, නුවර වාසීහුද; ර කප්මින්, රාත්‍රියෙහි කම්පාවෙමින්; යහයහන්හි නොහොත්හු, සුඛසෙය්‍යායෙහි නොහොත්තෝයි.

601. සමම්දර තර, සමය මද්‍රය තාරය යන ලයත්‍රයෙන් යුක්තවූ; බළි, ආරොහ අවරොහයෙන් යුක්තවූ; දෙවිසි හඬ, දෙවිසි හඬක් ඇති; තෙගම්රා, ග්‍රාමරාවත්‍රයක්‡ ඇති; සත්සර, සප්තස්වරයෙන් යුක්තවූ; උනුපණස් තැන්, සතළිස් නවයක් පමණ ස්ථාන ඇති; එක්විසිමුස වජඹනා, එකවිංශති මූර්ඡාව කීත් හොබනාවූ :—

---

* එසගල්-සම : † කිවාවූ-සම : ‡ ග්‍රාමත්‍රයක්-හැම.

602. එදා එ වෙණ ඇත—රුවනට ඇතොත් කල්හි,
තිදසිඳු රෙසෙන් මත් වී—මුලුලෝ එකලහල් වී.

603 පබවත එතර ගෙහ—සවනැ නරවිරු වෙණරුව්,
පසක් කළ හො කුසවරා—පිළිපන් සේ සියනුවර.

604. එ වෙණ අසා මදිඳු—තුටදහස් දහස් දින්,*
දුරු ඒ පැසුළු ඇත්ගොව්—දෙවහට දිනි නරපවර.

605. එකත රු බඟහර—බොත නුවනත බොල්ලෙන්,
මෙතැන් නොතැන්වී ගොස්—මල්ගොවුනා නිවෙස්වන්

606. සියුරුස් තෙඇස් වට—විසිතුරු රුවින මල්දම්,
පියොදෙත් ගොතා තුටු රජ— දින් දුසඳ පලඳනට.

---

602. එදා එවෙණ ඇතරුවනට ඇතොත් කල්හි, එදවස් ඒ වීණාව හස්තාරොහකයනට වාදනය කළකල්හි; රෙසෙන් තිදසිඳු මත් වී, වීණාරසයෙන් ශක්‍රයා මත් විය; මුලුලෝ, සමස්ත ලොකයතෙමේ; එකලහල් වී, එකකොලාහල විය.

603. එතර, එවිගස්හි; නරවිරු වෙණරුව්, නරවීරයාගේ වීණාධ්වනිය; පබවත සවනැ ගෙත, ප්‍රභාවතියගේ කර්ණයෙහි ගෙනකල්හි; හෝ, ඕතොම; කුසවරා සියනුවර පිළිපන්සේ, කුසරජහු ස්වකීය නගරයට ප්‍රතිපන්න පරිදි; පසක්කළ, ප්‍රත්‍යක්ෂ කළා.

604. එවෙණ අසා තුටුඅදහස් මදිඳු, ඒ වීණාධ්වනිය; අසා සන්තොෂාධ්‍යාශය ඇති මද්‍රරාජතෙමේ; දහස් දින්, දහසක් දින; ඒ දුරු, ඒ ගෙණ; නරපවර, නරප්‍රවරතෙමේ; පැසුළු, පසුව; ඇත්ගොව් දෙවහට දිනි, හස්තිගොපකජ්‍යෙෂ්ඨයා හට දිනි.

605. නුවනත බොල්ලෙන්, නෙත්‍ර චෂකයෙන්; එකතරු බඟහර බොත, ඒ කාන්තාවගේ රූපලක්ෂණ මධුව බොත්හොත්; මෙ තැන් නොතැන් වී, මේ ස්ථානය අස්ථානයයි කියා; ගොස්, ප්‍රයානය කොට; මල්ගොවුනා නිවෙස් වන්, මාලාගොපක නායකයාගේ ගෘහප්‍රවෙශ වී.

606. සියුරුස් තෙඇස් වට, චතුරශ්‍ර ත්‍ර්‍යශ්‍ර වෘත්තය සත; විසිතුර රුවින, විචිත්‍රවූ රූපයෙන්; මල්දම් ගොතා පියොදෙත්,

---

* දිණෙන-බො:

607. දූවැ දූරු මල්දම්—සහසොම්නසින් පබවත්,
බලමින් නන් අසිරි—විල්කෙළියෙ අත්තම් දුටු.

608 නෙකෙළියෙ පැවිරූ—මගමින් අමින් අසිරි,
වී අන් නොවිසා මෙසිප්*—කුසා ඉතිමැ තමා දුටු.

609 දූහැ අතිනෙමල්දම්—සුරත් සරණින් මඩමින්,
සිරිහළ සිනා වඩනා—ලවනත කැලුම් වඩනා.

610. මෙ මගිනෙමහසත්—කණ්තැසිතැසැ නොපහළ,
කුඹල්කම් තුනාකම්—කැරු දස්වසක් නොලදින්.

---

කුසුමදූම ග්‍රන්තකොට යවන කල්හි ; තුටු රජ, තුෂ්ටවූ රාජ තෙමේ ; දූසඳ පලඳනට දින් දුහිතෘචන්ද්‍රිකා ප්‍රසාධනයට දිනි ; (චන්ද්‍රශබ්ද උත්තමපර්‍යාය හෙයින්, උතුම්වූ දූනට† දින යන අර්ථයි.)

607. පබවත්, ප්‍රභාවතීතොමෝ ; සහසොම්නසින් දූවැ, සොම්නස් සහිතවැ දිවෙමින් ; (ගොස්, ප්‍රයාණය කොට) ; මල්දම් දූරු, කුසුමදූමය ගෙණ ; නන්අසිරි බලමින්; නානා ආශ්චර්‍ය්‍ය බලමින් ; විල්කෙළියෙ අත්තම් දුටු, තටාක ක්‍රීඩායෙහි හස්ත කර්මාන්ත දුටු.

608. නෙකෙළියෙ පැවිරූ මගමින්, අනෙක ක්‍රීඩානියුක්ත රූප බලමින් ; අමින් අසිරි මෙසිප් අන් නොවිසා වී, ප්‍රමාණාති ක්‍රාන්ත ආශ්චර්‍ය්‍ය ඇති මේ ශිල්ප අනුන්ට විෂය නොවන්නේයයි කියා ; කුසා ඉතිමැ තමා දුටු, කුසරජයා හා එක්කොට තමා දුටු.

609 එ මල්දම් අතින් දූහැ, ඒ කුසුමදූමය හස්තයෙන් හැර ; සුරත්සරණින් මඩමින්, සුරක්තපාදයෙන් මර්දනය කෙරෙමින් ; සිනා වඩනා, සිනා වඩවන්නාවූ ; ලවනත වඩනා කැලුම් සිරි අළ, අධරයෙහි වඩනා‡ කාන්තිශ්‍රී හළු.

610. එ මහත් මෙ මගින්, ඒ මහාසත්වතෙම මෙම ආකාර යෙන් ; කණ්තැසිතැසැ නොපහළ, කර්ණ චිත්ත අක්ෂිවිෂය

---

* මෙසිප් නොවිසා-සම : † දූවට-දූවහට-සම : ‡ වඩා-සම :

611. යළැ පිළිබඳින යහ—කැතැ පිළිබඳනා උවක්,*
සිතා දතෙ විසඹසොඬ—මුළුතැන් වන් තිළි ලෙන්.

612. ඔහු දැකැ මුළුනා—දන්නෙ ත කිම්ද පිළිවිත්,
(පිළි මා) දන්නෙ මුළුමෙහෙ—වියත එ විමස්නස්නෙන්.

613. රසසුන් මසැට දී—රසක් කරහයි මෙහෙයා,
මුළුසමඟිනේ මුළුදෙට—ගියේ බුදුනාමහලට.

614. ගෙණැ එ රොළට මස්—පිසන සෙමෙහි මහත්මා,
යොදුන් සිව් නුවරහී—විසුලෙ සුවඳ දුහුන්හී†

---

නොවූ; කුඹල්කම් තුනාකම් කැරු ද, කුම්භකාරකර්‍මද තුනා කර්‍මද කොට; අස්වසක් නොලදින්, ආශ්වාසයක් නොලදින්:

611. යළි ඈ පිළිබඳින්, නැවත ඈකෙරෙහි ප්‍රතිබද්ධචිත්ත යෙන්; යහකැතැ පිළිබඳිනා උවක් සිතා, සුඛයක් හසතගත කරණ උපායක් සිතා; දත් එවිසඹ සොඬ, දතනාවූ ඒ විශ්‍රම්භ සොඬතෙමේ;‡ ලෙන් තිළි මුළුතැන් වන්, සිතින් සතුටුවැ මුළුතැන් වනී.

612. මුළුනා දැකැ, මුළුරැකිනා තෙමේ§ දැක; ත දන්නේ කිම්ද ඔහු පිළිවිත්, තා දන්නේ කිම්දැයි ඔහු විචාළේ; (පිළි, නැවත, මා දන්නෙ) මුළුමෙහෙ වියත, මා දන්නේ බත් මාළු තැන් කරණ සේයයි කී කල්හි; එවිමස්නස්නෙන්, ඒ පරීක්‍ෂා කෙරෙම් යන සිතින්:—

613. රසසුන් මස් ඇට දී, රසගුනාවූ මාංස අසථියක් දී; රසක් කරහයි, රසයක් කරවයි; මෙහෙයා, නියෝග කොට; මුළුදෙට මුළු සමඟිනේ, මුළුරැකිනාතෙමේ මෙහෙ හා එක්ව; බුදුනා මහලට ගියේ, භොජනානුභව කරණ මතුමහල්තලයට ගියේයී.

614. මහත්මා, මහොත්තමයා; එ රොළු ඇටමස් ගෙණැ පිසන සෙමෙහි, ඒ දැඩි අසථිමාංසය ගෙණ පිසන සමයෙහි; දුහුන්හී, ධූපනයෙහි;|| සුවඳ, සුගන්ධය; සිවුයොදුන් නුවරහී විසුලෙ, සතර යොදුනක් පමණ නගරයෙහි විසතීර්‍ණේ වී.

---

* යහකැතැහි බඳනා-සම: † දුම්හි-ඇතම්.
‡ දත් විසඹසෝ, දතනාවූ විශ්‍රම්භශොක ඇති; එ, හෙතෙමේ; සම:
§ මුලුරැකිනාවා-බො: || ධූපයෙහි-ඇතම්.

615 විසිනත කිමෙකැ වී—නිරිඳු මුළුනා මේ වී,
බොදුන්*හේ නිමස් ඇට—පිසමන් හෙ අත්වැසි†යකු.

616. එතර ගෙණෙනු කැරූ—විඳැ විඳැ එ රසමියුරු,
මෙබඳු අසිරි රසයින්—පබවත්සඳ පැලැඟි වී.

617. පිසමන්හි යුතු රජ—කෙලෙ මෙද ඔහු කලට කල්,
දින්හා ගිමිනදන්හට—සිහිලැල් විලසැති මෙහේ.

618. මුළුතැන් එ රජ ගත—සිකිනිඳුහට ගන සමා,
මදමත ගඳගිජිඳුහට—සිලිලුතුල විල්නු මහත්.

---

**615.** නිරිඳු කිමෙකැ වී විසිනත, නරෙන්‍ද්‍රයා කිමෙක්දැයි විචාරණ කල්හි, මුළුනා මේ වී, මුළුරැකිනා මෙසේ කී; බොදුන් හේ, භොජනය හෙතුකොටගෙණ (කන්නක් හෙතුකොටගෙණ); හේ, හේ තෙමේ; අත්වැසියකු, අනෙතවාසියකුගේ ; නිමස් ඇට පිසමන්, නිර්මාංස අස්ථිපාකයෙකි.

**616.** එතර, එවිගස්හි ; නෙණෙනු කැරූ, ගෙන්වා ; එ රස මියුරු විඳැ විඳැ, ඒ මධුර රසය අනුභව කොට කොට ; අසිරි මෙබඳු රසයින්, ආශ්චර්‍ය්‍යවූ මෙබඳු රසායනය ; පබවත්සඳ පැලැඟි වී, ප්‍රභාවතීචන්‍ද්‍රලෙඛාවට සුදුස්සයයි කී.

**617.** රජ, රජතෙමේ ; ඔහු, කුසරජහු ; කල් කලට, කානන‡ කානනාවට ; පිසමන්හි යුතු කෙලෙමෙද, පිසන්නට යුක්තකෙළේ මතු .නොවෙයි ; ගිමින් අදන්හට, ඝර්මයෙන් ඛින්න§යක්හට ; සිහිලැල් විල් අසති මෙහෙ හා දින්, ශෛත්‍ය තටාකානනයෙක්හි මෙහෙද දිනි.

**618.** එරජ ගත මුළුතැන්, ඒ රාජයා ගත්තාවූ මුළුතැන් තෙමේ; සිකිනිඳුහට ගනසමා, සිඛීන්‍ද්‍රයාහට මෙඝකාලයකමෙන් ; මදමත් ගඳගිජිඳුහට, මදයෙන් මත්ත ගන්ධහස්තියක්හට ; සිලිලුතුල මහත් විල්නු, සලිලයෙන් අතිරික්ත මහා තටාකයෙකි.

---

* බුජ්(දු)න්-සම : † වැටි-වැඩි-බො :
‡ ගහපත්වූ-ඇතම්. § භින්න-හැම.

619. සිඳු කැරැ බොඳුනොද—දුරු දතිනළ කල නිවෙස්,
රුසයුරෙයැ ලොබනෙලෙන් නෙතනැව් උපැපැමෙන්.

620. එරජු*පැවිවිලස්—පියරජ නොදන්වනු වස්,
නළවා†යුත් යෙහෙළි (ළි) ය—නෙසිය රසබොඳුන්.
නොබුදු.

621. යෙහෙළියනළ හෝ—එ රසහුන් බොජුන් මැ බොජු,
මියුරුරස පදඅත් නොවැ—හිදඅත්හි මැ වසන වන්.

622. වරෙක් දහක් මෙහෙ—වඩත් රජමහාලට,
හදහනුයෙ ඇ සිත්වැටි‡—හිනින් හිනි හේ නළනෙන්.

---

619. බොඳුන්බද සිඳුකැරැ, භොජන ලක්‍ෂණ අමෘත සිඛ කොට; කල නිවෙස්, කාන්තාවගේ නිවාසයට; දතින්, දුරු අළ, ජත්‍රුයෙන් ගෙණ ගියෝ; ඇ රු සයුරේ, ඇගේ රූප සාගරයෙහි; ලොබ නෙලෙන්, ලොභානිලයෙන්; නෙතනැව් උපැ පැ මෙන්, නෙත්‍රනෞවුකාව තබා උත්පාතකාලයක් දක්වූහයි සිතමි.

620. එරජු පැවිවිලස්, ඒ රාජයාගේ මුවා විලාසය; පියරජ නොදන්වනු වස්, පිතෘරාජයා නොදන්වනු සඳහා; යුත් යෙහෙළියන් නළවා, යුක්තසත්‍රීන් උපලාලනය කොට; එ සියරස බොඳුන්, ඒ ශතරස භොජනය; නොබුදු, අනුභව නොකළා.

621 හෝ, ඕ තොමෝ; යෙහෙළියන් අළඑරස හුන් බොජුන් මැ බොජු, සුක්තසත්‍රීන් විසින් එළුවනලද ඒ රස ශූන්‍ය ආහාරම අනුභව කළා; මියුරුරස පදඅත් නොවැ, මධුර රස යද පදාර්ථයන් කෙරෙහි නොවැ,; හිදඅත්හි මැ වසන වන්, හෘදයාන්තයෙහිම වාසයකරණ වන්.

622. වරෙක් දහක්, එක්දවසක්; රජමහලට මෙහෙ වඩත්, රාජමන්දිරයට මේ වඩනකල්හි; ඇ සිත්වැටිහදහනුයේ, ඇගේ සිත පරීක්‍ෂා කරන්නේ; නළනෙන්, වඬාවෙන්; හේ, ඒ මහාසත්වතෙමේ; හිනින් හිනි, සොපානයෙන් පතිත වී

---

* රදු-සම : † නලවවා-සම : ‡ වැට-වැර-සම :

623. පබවතෙ පුවත හෙතැ—කැණිැතැ දූවැ ගොස් හිමියා,
බලමිනි සල නැත්තා—මිහිකත වැලඳ හොත්තා.

624. තනන පියවුරු ඉහි—හර වෙව්ලුමෙවැ සුස්මෙන්,
වුවනත්හි සෝබිඳු යළ—ඉහි දනවමින් ඇස්දර.

625. ගහටත රතතලෙන්—ගලනඳන දෙ ඇස්දර,
නුවනතැ සුනිල් කැල්මන්—පියත විලසක් පාමින්.

626. තබා වටොර හිස්—හිඳ මැද රතතල තබා,
හිඳ නොවැහැ ඇලළැ බමත්—පබවත් ඉති වලප්ගත්,

627. දූහැ රජ මැතිවරන්—කළපාමැලි* දෙවසරන්,
මහෙයිනැතොරවරන්—යෙහෙ මේ ලද ගුණවරන්.

---

623. පබවත්, ප්‍රභාවතීතොමෝ ; එපුවත් කැණිැතැ හෙතැ, ඒ ප්‍රවෘත්තිය කණ්ණයෙහි පතිතවූ කල්හි ; සල නැත්තා මිහිකත වැලඳ හොත්තා, නිශ්චලව මහීකාන්තාව ආශ්ලෙෂය කොට හොත්තාවූ ; හිමියා දූවැ ගොස් බලමින්, ස්වාමීහු ධාවනයකොට විලොකනය කෙරෙමින් :—

624. තනන පියවුරු ඉහි, කම්පා වන පයොධරයෙන් හා එක්වමැ ; සුස්මෙන් හර වෙවුලුම් එවැ, ශ්වාසයෙන් හා හාර කම්පා කොට ; යළ, නැවත ; ඇස්දර ඉහි, අශ්‍රුධාරාවෙන් හා එක්වැ ; වුවනත්හි සෝබිඳු දනවමින්, වක්‍ත්‍රයෙහි ස්වෙද කනිකාවන් ජනිත කරවමින්ද :—

625. රතතලෙන් ගහටත, රක්තවූ පාණිතලයෙන් සඝට්ටය කරණ කල්හි ; ගලන අඳනදෙ ඇස්දර, වැහෙන්නාවූ අඤ්ජනධෞතවූ අශ්‍රුධාරා කරණකොට ගෙණ ; නුවනතැ සුනිල් කැල්මන්, නෙත්‍රයෙහි සුනීල කාන්තීන් ; පියනවිලසක් පාමින්, දුරුකරණ විලාසයක් පාමින් :—

626. හිස් වටොර තබා, ශීර්ෂය වෘත්තොරුවයෙහි තබා ; හිඳමැද රතතල තබා, හෘදයමධ්‍යයෙහි රක්තහස්තතලය පිහිටුවා ; හිඳ නොවැහැ ඇලළැ බමත්, හෘදය ක්ෂමාකළ නොහී කම්පාව භ්‍රාන්ත වන කල්හි ; පබවත්, ප්‍රභාවතීතොමෝ ; ඉති වලප් ගත්, මෙසේ විලාප ගතු.

627. රජ මැතිවරන් දූහැ, රාජ්‍ය අමාත්‍යවරයන් හැරද ; දෙවසරන් පාමැලිකළ, දිව්‍යප්සාරාවන් පරාජය කළාවූ ; ඇතො

---

* පැමිලි-සන්න..

628. රජසක් මබජ් ඇ—දනවටැ වටා හිඳුවා,
සිහසුනරා කළණිත්—මෙහෙවි හා මා හිමියෙනි.*

629. මෙහෙයෙනි ති සුවද—දූලි දුම් කෙසී කපුපට,†
උදුල් වැරැළි සරළු ගත්—අහෝ ලීලාදඹු වී.

630. පහණිත්වර සිහසුන්—ගෙපිරි‡ දුමන් සේසත්,
උර සෝබිඳු දිමුතු§ හර—බඳ කෙසෙ මුළු වොටුනු මේ.

631. ගඳෙව් තැන් තැනැ—අඟහර දෙවූ රඟැති,
සිවි යුත් නළුවිදුම්||මෙද—සෙරෙනා නුගි පුරුද්දෙන්.

රවරන් දූහැ, අන්තඃපුරවධූන් හැරු; මහෙසින්, මා හෙතු කොටගෙණ; මේ ගුණවරන් ලද යෙහෙ, මේ ගුණවරයන් ලද්දාවූ සුවයයි.

628. මබජ් ඇ රජසක්, මපියානන් ආදිවූ රාජචක්‍රයා; දන වටැ වටා හිඳුවා, ජානුවෘත්තයෙහි වටකොට හිඳුවා; සිහසුනරා, සිංහාසනාරූඪව; කළණිත්, කළාවූ නියොගය; මා හිමියෙනි, මාගේ ස්වාමීනි; මෙහෙවී හා, මෙසේ වී වත්.

629. මෙහෙයෙනි ඉති සුවද, මා හෙතුකොටගෙණ මෙසේ සුවද විය; දූලිදුම් කෙසි කපුපට, මයිධූමයෙන් යුක්තවූ ස්ථූල කර්පාසපටමැ; උදුල වැරැළි, උජ්වලිතවූ වැරැළිපිළි ඇතිවිය; අහෝ, පීරිහින; ගත් සරළු, ගත්තාවූ සරළුමැ; ලීලාදඹු වී, සෝලුලී වී.

630. පහණිත්වර සිහසුන්, අත්වර පහණිමැ සිංහාසන ඇති; ගෙ පිරි දුමන් සේසත්, නිවාසපූරිතවූ ධූමමැ ශ්වෙතච්ඡත්‍ර ඇති; උර සෝබිඳු දිමුතු හර, වක්‍ෂස්හි ස්වෙදබින්දු නැමැති දීප්තිමත්වූ මුක්තාහාර ඇති; මුළුබඳ කෙසෙවොටුනු මේ, මුළු කොට බඳනාලද කෙශමැ කිරීටමැයි.

631. තැන් තැනැ, ස්ථානස්ථානයෙහි; ගඳෙව්, ගාන්ධර්ව යෙහි; අඟහර දෙවූ රඟැති, අඞ්ගහාරග දෙවූ රඞ්ගයෙහි; ¶ සෙරෙනා නුගී පුරුද්දෙන්, චිරාත්කාලයක් ආ අනුගත පුරුද්දෙන්; සිවියුත් නළුවිදුම් මෙද, හාවභාවයෙන් යුක්තවූ නාටකානුභව මේද ?

* මෙවී හොහා වා හිමියන්-සම: † කෙරෙය කපුරට-හැම.
‡ ගෙපිරු-සන්න. § දිමුත්-සන්න. || බඳුම්-බිඳුම්-හැම.
¶ රඞ්ගරග දෙවූ අඞ්ගයෙහි-හැම.

632. නෙනිරිඳුන් කිරුළු—කුළු මිණිරැස් දිදුලේ,
වැටුනු මේ පාහිමියෙනි—උදුනග සිළු පහස් ලද.

633. සැලමුතු නුගි නුරා—රස විඳුන පින් නැතියෙමි,
තමේ විලසැසැ ඔතුයෙමි—නුවනැතියෙ ලබ විඳියෙමි.

634. නියලුම් පුරුද්දන්—කෙ නොදනිති සිත් ඇතියෝ,
අහෝ සිතැතියා සේ—සාහා ලෝ නුළු සේ.

635. කිසිසේනි පැවියද—සියවෙස් පහළවන වන,
ලෝ මිනිසැතුරේ ගිනු*—ගුණදම් මැනවැ† රැකි සේ.

636. නියලි මෙතෙක මා—විසඹැ රහැ දන්නා සේ,
වැහැවූනුවැ හෝ මෙ බොලද—සෙරෙනා නුගිපුරුද්දෙන්.

---

632. නෙනිරිඳුන්, අනෙක නරෙන්ද්‍රයන්ගේ; කිරුළුකුළු මිණිරැස් දිදුලේ,‡ කිරීටකූට මාණික්‍යරශ්මිජ්වාලයන්හි; වැටුනු මේ පා, පැවැත්වූ මේ පාදයතෙමේ; හිමියෙනි, ස්වාමීනි; උදුන් අගසිළුපහස් ලද, උදුනෙහි අගනිශිඛා ස්පර්ශ ලදී.

633. සැලමුතු නුගිනුරාරස විඳුන, ශඨමුක්ත අනුගත අනුරාගරසානුභවයට; පින් නැතියෙමි, පින් නැත්තෙම්;§ ත මේ විලස් ඇසැ ඔතුයෙමි, තාගේ මේ විලාස නෙත්‍රයෙහි වැකූයෙම්; නුවනැතියෙ ලබ විඳියෙමි, ඇස් ඇත්තෙහි ලාභ අනුභව කෙළෙම්.

634. පුරුද්දන් නියලුම්, පරිචිතයන්ගේ බෙදය; සිත් ඇතියෝ කෙ නොදනිති, සිත් ඇත්තාවූ කවුරුනම් නොද නිද්ද? අහෝ, පිරිහිත; සිත් ඇතියා සේ, සිත් ඇතියක සේ; ලෝ නුළු සේ සාහා, ලොකයා වඤ්චිත කළ පරිදි යහපති.

635. කිසිසේනි පැවියද, කවර පරිද්දෙන් හරණලදද; සියවෙස් පහළ වන වන, ස්වකීයවූ වෙෂ ප්‍රකට වන චිර හින්; ලෝ මිනිස් ඇතුරේ, මේ ලොකයෙහි මනුෂ්‍යයන් කෙරෙහි; ගිනු ගුණදම් මැනවැ රැකිසේ, ගුණධර්මය මනාකොට රක්ෂාකළ සේ දුන් යහපති.

636. විසඹැ රහැ දන්නා සේ, විශ්‍රම්භයෙහි රස දන්නාසේ; මා මෙතෙක නියලි, මාගේ මෙපමණකැ බෙදව; සෙරෙනා

---

* ගිනු-සම † මැදැ-මැනවි-සම:
‡ දිදිලේ-බො: § නැතතාවූ-නැත්තාවූ හෙයින්-සම:

637. මෙ හිමිනි නැත් නුරා—මෙ හිමිහි නැත් හිමියෝ,
සැළමුතුවැසඹ ලෙව්හි—වුවනත බලා හො කවර.

638. තිබියෙවැ මේ හිද—නුරා රසයින් වුන්නෙන්,
මෙ ඔබල වෙස් දස්නෙන්—තරවී හො නෙතු කුම්සේ.

639. සැළමුතු විසඹ සොඬ—මිනිසුගුණට සිරිනදන්,
සත්මත් පණත් ලද මට*—නියලී ලද යෙහෙද මේ.

640. සෙරෙනා පුරුදුගුණ—නොදතුම් නොද මිනිස් ගුණ,
වෙහෙසද නියළුමෙන් මුන්—වුන් දිවිරකනසේ මැ දතුයෙම්.

---

නුගීපුරුද්දෙන්, බොහෝකලක් ආ අනුගතයෙහි පුරුද්දෙනි; අහෙ[illegible] පිරිහින; මෙ බොලද වැහැවුනුවැ, මෙවෙනි වධනව යෙකැ සැලසුනුව.

637. මෙහිමිනි නුරා නැත්, මෙතැන් පටන්කොට අනුරාග නැති; මෙහිමිහි හිමියෝ නැත්, මෙවක් පටන්කොට ස්වාමීහු නැත්; ලෙව්හි, ලොකයෙහි; සැළමුතු විසඹ, ශඨමුක්තවූ විශ්‍රම්භවූ; කවර වුවනත බලා හෝ, කවර මුහුනක් බලා ද්‍යෙ හෝ.

638 නුරාරසයින් වුන්නෙන්, අනුරාගරසානුභව කළ හෙයින්; මෙ හිද තිබියෙවැ, මේ හෘදය තිබෙවයි; මෙ ඔබල වෙස් දස්නෙන්, මේ මිරිකුණුවිලාස දර්ශනයෙන්; නෙතු† කුම්සේ තරවී හෝ, නෙත්‍රය කුමක්සේ තරවී ද්‍යෙහෝ.

639. සැළමුතු විසඹසොඬ මිනිසුගුණට සිරිනදන්, ශඨමුක්තවූ විශ්‍රම්භයෙහි සොණ්ඩවූ මනුෂ්‍යගුණයට ශ්‍රීනිධානවූ;‡ සත්මත් පණත් ලද මට, සප්තමාත්‍ර ප්‍රඥා ඇති මට; මේ නියෙලී ලද යෙහෙද, මේ ප්‍රඥාවැ ලැබූ සුවය.

640. සෙරෙනා පුරුදු ගුණ නොදතුම්, බොහෝ කලක් පුරුදුකොට ආවාවූ ගුණ නොදත්මු; නොද මිනිස්ගුණදතුම්, නොද මනුෂ්‍යගුණයද දතුමු; නියළුමෙන් වුන් මුන් වෙහෙසද නොදතුම්, බෙදයෙන් වුන් මොවුන්ගේ දුඃඛය නොදත්මු; දිවිරකනසේ මැ දතුයෙම්, ජීවිත පාලනයම දතුමු.

---

* ම-සම : † නෙත-සම : ‡ ශ්‍රීනිධානයැ-සම :

641. වැලැපිනිති සරත—පබවත වත පියුම්හී,
මුවරඳ දිනිසැපිනි සිඳු*—දූහැ හිස් හො නැඟි මහලට.

642. යහදස්න ලොල් කතාය ඉඳු පතාය මෙහෙ කළ,
සෝ පතාය දිගැසිය පවතාය මෙ කියූ සග.

## තෙලෙස්වන සග.

643. කල මුළුගෙදෙලෙන්—දව†සරණ සමාහී,
මහසත් පත් වෙහෙස්නෙන්—අසුනිඳුහු නොසිහිල් වී.

644. කිමැ‡ වී බලා දූකැ§—දඹදිවුහි සත්රජනට,
මදුරජහු හස්නගින්—පියොදනුයෙ|| පත් දූරුස්.

---

641. ඉති වැලැපින් සරත පබවත, මෙසේ විලාපයෙන් ශ්‍රාන්ත ප්‍රභාවතියගේ; වතපියුම්හි, වක්‍රපද්මයෙහි; ඉඳු රජතෙමේ; ඉසි සැපින් මුවරඳ දින්, ඉස්සාවූ සැපින්=තාම්බූල සපයෙන් මකරන්දබින්දු දිනැ; හෝ, ප්‍රභාවතීතොමෝ; හිස් දූහැ මහලට නැඟි, ශීර්ෂය හැර මහලට නැඟුනු.

642. යහදස්න ලොල්, යහදර්ශනයෙහි ලොල්වූ; ඉඳු, රජහු; කතාය පතාය කළ මෙහෙ, කාන්තාව ප්‍රාර්ථනා කොට කළ මෙහෙද; සෝ පතාය දිගැසිය, ශොකප්‍රාප්තදීර්ඝාක්ෂියගේ; පවතාය මෙ කියූ සග, ප්‍රවෘත්තියද කථනය කළාවූ මේ සර්ගයයි.

ත්‍රයොදශමසර්ගයයි.

---

643. කල මුළුගෙදෙලෙන්¶ දවස් හරණ සමාහී, කාන්තාවගේ මුළුතැන් ගෙයි (ධූරයෙන්) දවස් හළ සමයෙහි; මහසත්පත් වෙහෙස්නෙන්, මහාසත්ත්වයා ප්‍රාප්ත දුඃඛයෙන්; ඉඳුහු අසුන් නොසිහිල් වී, ඉන්ද්‍රයාගේ ආසනය උෂ්ණවී.

644. කිමැ වී බලා දූකැ, කිමෙක්ද්‍යෝයි බලා දූක; දඹදිව්හි සත්රජනට, ජම්බුද්වීපයෙහි සප්තරාජයන්ට; මදුරජහු හස්නගින්, මද්‍රරාජයාගේ හසුන් ආකාරයෙන්; පත් දූරුස් පියොදනුයේ, පත්‍ර හා දූතරාසින් යවත්තේ :—

---

* නිරිඳු-හැම : † දිව-සම : ‡ කිමෙක-සත්න. § දූන-සම :
|| පියඳනුයැ-සම : ¶ බොදෙලෙන්-බො :

645. රඳවතහොත දෙලෙන්—පබවත මදු සඳලේ,
විසිනත් නැතත් තා මුත්—මෙහෙසුරුහු නම් ලෙව්හී.

646. ඉති වදනින් පත්—පියදූය සත් රජනට,
බලමිනෙපත් රජරුස්—සකුස් සහ සොම්නස් ලෙන්.

647. දසනුදෙසෙනා එ රජ—රුස් සහ පිරිවරනෙන්,
ඔසළ වැ කුම් හේනෙන්—ඔවුනොවුන් පිළිසුම් දින්.

648. මදිඳු අවාහේ—පියදි* සහසුන් දනන්,
පබවත පහස් ගඟුලේ—ගැලෙන මෙනෙනා සේ වී

649. පැසුළු නිරිඳුහු සත්—රෙසී සී සැහැස්මෙන්,
පබවත අප සියල්ලට—පියොදූද සී දූපියෝ.

---

645. පබවත මදුසඳලේ, ප්‍රභාවතී නම් මාගේ දුහිතෘචන්‍ද්‍ර ලෙබාව ; දෙලෙන් රඳවතහොත්, චිත්තාභිරමණීය කරවත් හොත් ; විසිනත්, විචාරත්හොත් , තා මුත්, තා මිසක් ; ලෙව්හී, ලොකයෙහි ; අන් මෙහෙසුරුහුනම් නැත්, අන්‍ය මහෙශ්වරයෙක් නම් නැති.

646. ඉති වදනින්, මේ තෙප්ලෙන් ; සත්රජනට පත් පියදූය, සපත නරෙන්‍ද්‍රයන්ට හසුන්පත්† යවීය ; රජරුස්, රාජරාශි තෙමේ ; එ පත් බලමින්, ඒ පණිණ බලමින් ; සකුස්, වහාම ; සහසොම්නස් ලෙන්, සොම්නස් සහිත සිතින් ; (සහ පිරිවරනෙන්, පරිවාර හා නික්මිනි).

647. දසනුදෙසෙන් ආ එ රජරුස්, දිග් අනුදිගින් ආ ඒ රාජරාශි තෙමේ ; කුම්හේනෙන් සහ පිරිවරනෙන් ඔසළවැ, කුමක් හෙතු කොටගෙණ පරිවාරයන් හා රුස්වූදැයි කියා ; ඔවුනොවුන් පිළිසුම් දින්, අන්‍යොන්‍යාපෘච්ඡා කෙළේ.

648. මදුඉඳු, මද්‍රරාජතෙමේ ; අවාහේ, ආවාහ හෙතුකොට ගෙණ ; සහසුන් දනන් පියදි, හසුන් සහිත ජනයන් එවීය ; පබවත පහස් ගඟුලේ, ප්‍රභාවතියගේ සසශී ලක්‍ෂණ නිර්ඣර යෙහි ; ගැලෙන මෙනෙන් ආසේ වී, නිමග්නවන චිත්තයෙන් ආශා පරිදි කී.

649. පැසුළු, පසුව ; සත්නිරිඳුහු, සපතනරෙන්‍ද්‍රයෝ ; සී සැහැස්මෙන් රෙසී, සිංහසාහසිකයන් මෙන් රොෂවැ ; පබවත,

---

* පියත්දි-හැම. † පරපත්-බො:

650. මදිඳුහට් පියඳු—තඳු සැහැස් හස්නෙන්,
සපතුමු* තා පිඹඳු—පියොදූයි† දූන් පියඳු.

651. එතර මදුනිරිඳු—පියඳු එඳු හස්නෙන්,
සහ රජ මැති සිය සියෝ—සබ මැඳ මෙ තෙපල විසී.

652. විරුරෙසෙනුතුළවුන්—යේ දෙ යුදුකැ හිදුහා,
සිතා වහල්කැන් බැඳ —යුදු දෙත නොපළඳනේ.

653. බොහොදන‡වුවද හොතෙ—පැළඹුම් නොහමුයෙතමා.
සමද ගජරජන පුවළ—බාසුරු නොසී හමුයේ.

---

ප්‍රභාවතිය; අප සියල්ලට පියොදූදූයි, අප හැමදෙනාට දේදූයි කියා; දූපියෝ, දපිපිත වූහු.

650. මදිඳුහට, මද්‍රරාජයාහට; පියඳු, එවනලද; තඳු සැහැස් හස්නෙන්, තාගේ දූතයන්ගේ සාහසික අසුන් කරණකොට ගෙණ; සපතුමු, සම්ප්‍රාප්තයම්හ; තා පියඳු, තාගේ ප්‍රියවූ දුව; පියොදූයි, එවයි කියා; දූන් පියඳු, දූතයන් යවූ.

651. එතර, එවිගස්හි; මදුනිරිඳු, මද්‍රනරේන්ද්‍රතෙමේ; පියඳු එඳු හස්නෙන්, එවනලද ඒ දූතයන්ගේ හසුන් කරණකොටගෙණ; සහරජමැතිසිය සියෝ, රජුන් සහිත අමාත්‍ය ශතයන් සඞ්ඝතවූ;§ සබ මැඳ, සභාමධ්‍යයෙහි; මෙතෙපලවිසී, මේ තෙපල කී.

652. විරුරෙසෙනුතුළවුන්, වීරරසයෙන් උජ්ජ්වලිතවූවන්; හිදුහැ දෙයුදුකැ යේ, දෙක|| හත්කරණ යුඩයෙහි ගිය; වහලක් සිතා කැන් බැඳ, ව්‍යාජයක් සිතා සමූහ බැඳ; යුදුදෙත, යුඩකරත් හොත්; නො පලඳනේ, ගේ නුසුදුසුයි.

653. බොහොදන වුවද හොත, බොහෝ ජනයා වුවද හොත්; එපැළඹුම් තමා නොහමුයේ, ඒ පැළඹීම තමා හමුයෙහි නොවෙයි; සමද ගජරජන පුවළ, මදසහිත ගජේන්ද්‍රයන්ගේ ප්‍රෞඪීතෙමේ; බහසුරු නො සී හමුයේ, භාස්වරසිංහයක්හු ඉදිරියෙහි නොපවත්නේයි.¶

---

* සපතුමු-සපතුම-සම: † පියොදූ-සන්න. ‡ දන්-හැම.
§ සඟිතවූ-හැම. || හිදුහැ (ශූ) යොදූයේදෙන්-සම:
¶ හමුයේ නොහොබි-සම:

654 ඔක්කාවස් නිරිඳු—දිවයුරුහු හා දුලු තෙද,
මෙකුලපියුමන් පොබයත්—මිස තැවුලි නොකළ විරී.

655. දඹදිව්හි අන්රජ—මුහුදුද වැඩෙමින් දිවත්.
මසෙන් වෙළලද මඩමින්—කගඉසිමුව නොලමු වේ.

656. සලසන්* නමුදු දිය—දිවි හැඟියක්හු දෙසේ,†
මේ කග රකුස්හු රුපුන්—ගලලේ බොත නැත වරණ.

657. මහසත් කුසනිරිඳු—දවහ නමඳ නැමැඳමෙන්,
පදකර මුදුන් නොබලා— පියදූහ මෙ පුවත් හා

---

654. දුලුතෙද. ජ්වලිතවූ තෙජස් ඇති ; ඔක්කාවස්නිරිඳු දිවයුරුහු හා. ඉක්ෂ්වාකුකුලෙහි වූ නරෙන්ද්‍රදිවාකරප්‍රවරයා ; මෙකුලපියුමන් පොබයත් මිස, මේ කුල නැමැති පද්මවනය ප්‍රබුඛ කරත් මුත් ; තැවුලී නොකළ විරී, සන්තාපයක් නො කළ විරී.

655. දඹදිව්හි අන්රජ මුහුදු උදවැඩෙමින් දිවත්, දඹදිව්හි අන්‍යරාජ සාගර උදයවෘඩ වෙමින් දිවෙන කල්හි ; මසෙන් වෙළල ඔදමඩමින්, මාගේ සෙනා නැමැති වෙලාන්තය අවුත් මඩිමින් ; කගඉසිමුව නො ලමු වේ, ඛඩ්ග නැමැති ඍෂීහුගේ මුඛයට උනමුඛ නොවේ.

656. දිවි, දෛවයතෙමේ ; හැඟියක්හු දෙසේ, තමා කැමැත්තක්හු කෙරෙහි ; දිය සලසන් නමුදු, ජය සල්ලස්සන්නේ වීනමුදු ; මේ කගරකුස්හු, මේ ඛඩ්ගලක්ෂණ රාක්ෂසයා ; රුපුන් ගලලේ බොත, රිපුකණ්ඨ රුධිරය බොන කල්හි ; අවරණ නැත්, ආවරණයෙක් නැති

657. මහසත් කුසනිරිඳු, මහ එඩිඇති කුශනරෙන්ද්‍රයා ; දවහ නමඳ නැමැඳමෙන්, සතතයෙන් ක්‍රණ අමන්‍දාභිවාදනයෙන් ; පදකරමුදුන් නොබලා, පාදයෙන් ක්‍ෂණමස්තකාවලොකනය නොකොට ; මෙ පුවත් හා පියදූහ ; මෙවැනි පවත් හා කීහු

---

* සලසා-සන්න.                † දිවදෙසෙ-සදෙසේ-සම :

658 පබ්බතන්ත අරියූ*—රජරුස්නට සරවරන්,
පියොදම් අද සහත් මා†—පවසා දූයෙන් මෙ වදන්.

659. පවසමිනිති නර—වරණ රණහෙ බලන් වත්,
පිරිමැද්ද නෙතින් දත් පිළු—නහවා දසන් රස්නෙන්

660 වදනෙයුගන්තල—ගස් ලද මුහුදු මිහිතෙලෙ,
දිවූ විලසක් පාමින්—රජ සිවුරඟින් යාගත්.

661. පැසුලු ගොසින් එදූ—සැදූ කන් නරවරන්,
එබසිනඟ ලොමුදෙහෙන්—සදමින් දිවි රජරුස්.

---

658. පබ්බතන්ත අරියූ රජරුස්නට, ප්‍රභාවතිය ආරාධනාකළාවූ රජරුසියට ; මා‡ අද සහත්, මා අද පොහොසත් වුවහොත් ; සරවරන් පියොදම්, අසරසුන් යම් ; දූයෙන්, දූතයෙනි ; මෙ වදන් පවසා, මේ වදන් කියව්.

659. නරවරණ, නරවාරණ තෙමැ ; ඉති පවසමින්, මෙසේ කියමින් ; රණහේ, යුධ හෙතුකොටගෙණ ; නෙතින් බලන් වත් පිරිමැද්ද, නෙත්‍රයෙන් හටයන්ගේ වක්ත්‍ර§ පිරිමැද ; දසන් රස්නෙන් දත් පිළු නහවා, දසනරශ්මීන් ජත්‍රැපිට තෙමා නහවා.

660 එවදන් යුගන්තල ගස් ලද, ඒ වචන ලක්ෂණ යුගාන්ත වාතප්‍රහාර ලද ; මුහුදු මිහිතෙලෙ දිවූ විලසක් පාමින්, සාගරය භූතලයෙහි ධාවනය කළ විලාසයක් හඟවමින් ; රජ, රාජතෙමේ ; සිවුරඟින් යාගත්, චතුරඞ්ගිනී සෙනාවෙන් ගමන් ගති.

661 පැසුලු, පසුව ; එදූ ගොසින්, ඒ දූතයෝ ගොසින් ; නරවරන් කන් සැදූ, නරවරයන්ගේ කර්‍ණණ හෙබැවූහ ; එබසින් අඟ ලොමුදෙහෙන් සදමින්, එතෙප්ලෙන් ශරීර ලොමොද්ගාමයෙන් සජ්ජිත කෙරෙමින් ; රජරුස් දිවි, රාජ සමූහතෙමැ දිවි.

---

* අමිඤ-අ. † යගන්මා-සම :
‡ අමා-හැම. § නෙත්‍ර-ඔබා :

662. තහත සරහමිනවි—දෙසෙනැගැහි නන් බලරුස්.
ඇතරුව ඉහි අසරුවන් පැලඹිනි වම් පොරෙලගත්.

663. දෙසෙන් සක්බඳ මැදවැ*—කඩපතිනි ඔවුනොවුනට,
සහදප් එඩි කල පිළිණ—තම හගවා අසුන් දින්.

664 වුහුවු සෙද දෙසෙන්—නුබ වත් කඩ කඩින් ලගැ,
සිවුරඟ සෙනඟ වැනොරු—ඔවුනොවුන ලක් නොබිඳු.

665 අසි ගස්නෙනුදහන—ගිනිරොණිනැ සරනැලැළුම්,
බියබා දෙසෙන් වුදු සර—නුබෙ බඳ දලවරණ පැ.

---

662. දෙසෙනගැහි නන් බල රුස්, දෙසෙනායෙහි අනෙක භටරාශිතෙමේ; තහත අවි සරහමින්, නොයෙක් ආයුධ සරහමින්; වම්පොරෙල ගත්, කවච යුක්ත ගාත්‍ර ඇති; ඇතරුවන් අසරුවන් ඉහි, හස්ත්‍යශ්වාරොහකයන් හා එක්ව; පැලඹිනි, විජෘම්භිත වී.

663. දෙසෙන් සක් මැදවැ, දෙසෙනාවක්‍රය මැදිවැ; කඩ පතින්, කාණ්ඩබඹවූ පත්‍රයෙන්; ඔවුනොවුනට සහදප්† එඩි, ඔවුනොවුන්ට දර්ප සහිතවූ එඩි කලකද; කල පිළිණ, කරණලද ප්‍රතිඥාද; තම හගවා අසුන් දින්, තමා හගවා හසුන් දිනී.

664 දෙසෙන් සෙද වුහුවු, දෙසෙනාව දූඩිකොට විද්දාවූ; කඩින්කඩ ලගැ නුබවත්, කාණ්ඩයෙන් කාණ්ඩය ලගනවැ නභස් වන් කල්හි; සිවුරඟසෙනඟ, චතුරඞ්ගිනී සෙනාව; නොරු වැ, රාත්‍රිය නොවැ ද; ඔවුනොවුන ලක් නොබිඳු, ඔවුනොවුනට ලක්‍ෂ්‍ය වැ නොසිටියෝ.

665. අසි ගස්නෙනුදහන, ඛඩ්ගප්‍රහාරයෙන් උඩුනවූ; ගිනිරොණින්. වහ්නිරේණුයෙන්; ඇසරන් ඇලැළුම් බිය බා, අපසරසුන්ගේ කමපාහය හිතීන්; දෙසෙන් වුදු සර, දෙසෙනාව විද්දාවූ ශරතෙමේ; නුබෙ බඳ දලවරණ පැ, නභස්හි බඹවූ ජාලාවරණ දැක්වී.

---

* බඳ-දෙවැ-හැම.

† මෙළි-බො:

666. පැණෙන්නේ* වී අද—බලන† විරූ සගතී,
යමා අණිත සහ පත් දූනෙව් සරරස් දෙසෙන්හි දිවී.

667. දවත යෝබලන්—ගිජ්ඳුන් බඳ කැරු දෙබේ,
සමහරලූ නසා සිය—කවදසලක් කොළෝ නොමැ.

668. තම අත සැකින් ලූ—වරණ රණහට ගන්මින්,
සහ කග සුනතමැ පොවා—බෙළෙක් මනදෙළු සැහී.

669. සහ කවදූත්කුඹට‡—බලා සෙදූලූ කගපත්,
බැමැත ඉතිරි වෙනෙන් හිස—සහපුඩුසත් සිරි බිජී.

---

**666.** බලන, අද විරූසගතී, භටයෝ අද වීරසඞ්ඝයෙකි; පැණෙන්නේ වී, පැණෙන්නේයයි කියා; යමා අණිත සහපත් දූනෙව්, යමයාගේ නියොග ලද පත්‍ර සහිතවූ දූතයන් මෙන්; දෙසෙන්හි සරරස් දිවී, දෙසෙනාවෙහි ශරරාශිය ධාවනය කෙළේ.

**667.** ගිජ්ඳුන් බඳ දෙබේ කැරු, ගජේන්ද්‍රයාගේ ශරීරය දෙකක් කොට; යෝබලන් දවත, යොධභටයන් දුවන් කල්හි; සමහර, සමහර භටයෝ; නසාලූ, නසාලූවාවූ; කවදසිය, කවචශතයෙහිද; සලක් නොමැ කොළෝ, ආදරයක් නොම කොළෝහයි.

**668.** සහ, සාහසිකවූ; බෙළෙක්, භටයෙක් තෙමේ; කග සුනතමැ පොවා, ඛඩ්ගශුනය හසතයෙහි වැද; තම අත සැකින් ලූ, තමාගේ හසතයෙහි චක්‍රායුධයෙන් කපනලද; වරණ, වාරණයන්; රණහට ගන්මින්, යුඩයට ගන්මින්; මන දෙළු සැහී, මනොරථය සමෘඩ කෙළේ.

**669.** බලා,§ භටයා; සහකවද ඇත්කුඹට, කවචසහිතවූ හසතිකුම්භය; සෙදූ ලූ කගපත්, දැඩිකොට කැපූ ඛඩ්ගපත්‍ර; ඉතිරිවෙනෙන් හිස බැමැත, අධික වෙගයෙන් හිස භ්‍රමත්මැ; සහපුඩු සත්සිරි බිජී, පුඩුසහිත ජත්‍රශ්‍රී ලදූ.

---

* පැනෙනින-පැණෙන්න-හැම. † බලන්-සම:
‡ කුඹු-සන්න. § පලා-ගී.

670. ගජබඳිනි කිඹිලි කඩ—සහලේ බළනුර ලගත්,
ළෙන් නොසැරැකි කෝදල—උතුළෙව් නුබඳ කිඳු දී.

671. වේනල ගස් හැනී—ගජ මේයුග ගැහැටමෙන්,
කුඹුහුරිරු දහර සෙන—මුතුරුස් පොද පතර පෑ.

672. ඉයෝර සිස්වත්—තමන් උරෙනුපුරා හී,
ගෙණ විදුනැතම් සෙබලෝ—උරෙහි පුළුලට තුටුවූ.

673 ගජනුඩු නැගු සර—සුවහසිනුදුල සෙබළෝ,
කුඹුතලගිරි රඟහී—මොණරනළානළ* විලස්.

---

670. ගජබඳින් කිඹිලි, හස්තිදෙහයෙන් නික්මැ; සහලේකඩ, සහ රුධිර කාණ්ඩ; බළන් උර ලගත්, භටයන්ගේ වක්‍ෂසට ආශක්ත කල්හි; කෝදල, කොපාගනිය; ළෙන් නොසැරැකි නුබඳ කිඳු දී, ලෙහි නොසැරැකි අනුබඩරාජීවූ; උතුළෙව්, උතුළාක් වැනි වී.

671. වේනලගස් හැනී, වෙගලක්‍ෂණ මාරුතයෙන් යුක්තවූ; ගජමේයුග ගැහැටමෙන්, හස්තිමෙඝ යුග්මයාගේ ඝර්ෂණයෙන්; කුඹු හුරිරු දහර, කුම්භස්තලයෙහි රුධිරධාරාතොමෝ; සෙන, පැහැය නොදක්වී; මුතුරුස්පොද පතර පෑ, මුක්තාරාශි පතර දක්වී.

672. ඉයෝර සිස්වත්, තුනීරය සිස්වන කල්හි; තමන් උරෙන් හී උපුරාගෙණ විදුනා, තමන්ගේ උරඃස්තලයෙන් ශර යන් උපුටාගෙණ විදින්නාවූ; ඇතම් සෙබළෝ, ඇතම් දක්‍ෂ භටයෝ; උරෙහි පුළුලට තුටුවූ, උරොහිතනියෙහි පෘථුලත්වයට සන්තුෂ්ටවූ.

673. ගජන් උඩුනැගු, හස්තීන් උඩට නඟනලද; සර සුවහසින් උදුල සෙබළෝ, ශර ශතසහස්‍රයෙන් උජ්වලිතවූ දක්‍ෂ භටයෝ; කුඹුතල ගිරිරඟහී, කුම්භස්තල ලක්‍ෂණ ගිරි රඞ්ගයෙහි; මොණරනළාන විලස් අළ, මයූරනාටකයන්ගේ විලාස දැක්වූ.

---

* නළ-නළාන-හැම.

674. හුරිරද වැ අවිසක්—කුඹුතල පිවිටු සමහර,
සඳපැහැ ලකලා අවර—ගිරිකුළුහි සඳලේ පෑ,

675. පහල ගජකුඹුනි මුතු—මුතුහුරිරද කොත්පෙළ.
විදුසිරි එන මැගෑ දුන්—විලඳ වැටුප් විලස් ලද.

676. සරපත් කඩ නෙලෙන්—කගගස්නි මුත් ගිනිරොන්,
දිලියෙන නැඟි රජදුම්—සරනැස්හසර දුරැළී.

677. නෙසත් පියුම් දද මින්—කැලහය තරඟ සැර බමර,
රණබිම්විල්හි සෙබලෝ—කගදලදරින් කෙළියෝ.

---

674. හුරිරද වැ, රුධිරාර්ද්‍රවූ; කුඹුතල සමහර පිවිටු, කුම්භස්ථලයට සමහරක් වන්නාවූ; අවිසක් චක්‍රායුධය; සඳපැහැ ලකල අවරගිරිකුළුහි, සන්ධ්‍යාප්‍රභාවෙන් අලඞ්කෘත අපරපර්වත මස්තකයෙහි; සඳලේ පෑ, රෙබාචන්ද්‍රයා දැක්වී.

675. පහල ගජකුඹුනි මුතු මුතු, ප්‍රහාර ලද හස්තිකුම්භයෙන් මුක්තවූ මුක්තාද; හුරිරද කොත්පෙළ, රුධිරයෙන් ආර්ද්‍රවූ කුන්තපඞ්ක්තිද; විදු*සිරි එන මැගෑ දුන්, විජයශ්‍රී එන මගෑ දුන්; විලඳවැටුප් විලස්ලද, විලඳ හා පුදීපයෙහි විලාස ලදී.

676. කගගස්නි මුත් ගිනිරොන්, ඛඩ්ග ප්‍රහාරයෙන් මුක්ත වහ්නිරේණු; සරපත් කඩ, ශරපත්‍රාකාණ්ඩයෙක්හි; නෙලෙන්, මාරුතයෙන්; දිලියෙන, ජ්වලිතවන කල්හි; රජදුම් නැඟි සරන් ඇස් අසර දුරැළී, රජස්නැමැති ධූම නැඟී අපසරාවන්ගේ† අක්ෂිසඤ්චාර දුරුකෙළේ.

677. නෙ සත් පියුම්, අනෙක ඡත්‍රපද්ම ඇති; දද මින් කැල, ධ්වජමැ මත්ස්‍ය සමූහ ඇති; හයතරඟ, අශ්වයන්මැ තරඞ්ගභඞ්ග කොට ඇති; සර බමර, ශරමැ භෘඞ්ගයන් ඇති; රණබිම් විල්හි, යුධභූමි නැමැති තටාකයෙහි; සෙබලෝ, සෙවා භටයෝ; කගදලදරින් කෙළියෝ, ඛඩ්ග ලක්ෂණ ජ්වාලධාරායෙන් ක්‍රීඩා කළෝ.

---

* විදු-හී. † අපසරසුන්ගේ-බො:

678. ලූ ගජනත් මැ සසල—විසුළ වොටුනතුරේ,
වම්සිය වදනා නා—සියහව්ව හළ එකෙණේ.

679. බිඳැ උරබිත් දෙද—ළිනි උඩුනැගූ සෙබළෝ,
අසිගස්නි හෙන වරණ*—සියසතරවි වරණ.

680. හෙන මහ කඩ පහ—රිනි ඔරයුග ගජරුැවා,
උදගිරිහිස් අරණ—සිරිනිදවින් අරුැණ.

681. හයත් වට කැරු සැව්—සතොස්නි සේ රිපුබල,
කපත්වැ හිස් තමා සැක—දූනවි දෙසෙන්හි බළන්.

---

678. වොටුනු අතුරේ, කිරීටාන්තරයෙහි; සසල විසුළ ලූ ගජන් අත්මැ, චඤ්චලවූ විකීර්ණවූ කපනලද හස්තීන්ගේ හස්තයතෙමේ; එකෙණේ, ඒ ක්‍ෂණයෙහි; වම්සිය වදනා, වල්මීකශතප්‍රවිෂ්ට වන්නාවූ; නා සිය හවුවක්, නාගශතයන්ගේ ලීලාවක්; අළ, එළවී.

679. උරබිත් බිඳැ, උරොභිත්තිය බිඳැ; දෙදළිනි උඩුනැගූ සෙබළෝ, උභයදන්තයෙන් උඩට නගනලද සෙවාභටයන්ගේ; අසිගස්නි, ඛඩ්ගප්‍රහාරයෙන්; අවරණ යෙන, †ආරූඪයා හෙන කල්හි; වරණසිය සතර වී, වාරණශතතෙමේ ජත්‍ර වී.

680. ගජරුැවා ඔරයුග, හස්ත්‍යාරොහකයාගේ ඌරුැවය; මහකඩපහරිනි හෙන, මහාශරප්‍රහාරයෙන් හෙන කල්හි; උද ගිරිහිස් අරණ, උදයාචලමස්තකාරූඪවූ; අරුැණ සිරිනිදවින්, අරුැණයාගේ ශ්‍රී (නිදවින්) අනුභව කෙළේ.

681. සතොස්නි, සන්තොෂයෙන්; සේරිපුබල, දක්‍ෂ ශත්‍රැ භටයා; වට කැරු සැව් හයත, වෘත්ත කොට චාපාකර්ෂණයක් කරණ කල්හි; හිස් කපත් වැ තමා, ශීර්ෂය ඡෙදය කෙරෙතියි තමන්; දෙසෙන්හි බළන්, දෙසෙනායෙහි භටයන්; සැක දූනවී, ශඞ්කා ඉපදවී.

---

* එතර අවරණ-හැම. † අරහොත-හැම.

682. ඩැහැටොට කගතැසුන්—මැද හුන් දරුණු යෝබඳ,
හුරිරද බිමින් දන්වා—දනන* විලසක් දැක්වී.

683. සුන් ගජ හිස්සු හුනු—වැ හෙත කවඳ බඳහී.
නටන සැහී එරණෙහි—ගණදෙව්ගණ විලස් ලද.

684. රුපුසෙන් මඩුත් බල—මිනි පසු ගත් තමා සෙන්,
දසන් මෙරජින් මඳ මඳ—ලවනත සදමිනෙකෙණේ.

685. මෙහෙයා මදුනිරිඳු—කිරිඳු සැහැසෙමිනෙදවස්,
රුපුමුදුනැ† හුනු කගසෙන්—සුවහසිනැත් දහස් පැ.

---

682. ඩැහැටොට කගතැ මැදසුන්, දෂ්ටවූ ඔෂ්ඨ ඇති ඛඩ්ග ධාරාමධ්‍යයෙන් කපනලද; හුන් දරුණු යෝබඳ, හුන්නාවූ කර්කශවූ යොධ ශරීරතෙමේ; හුරිරද බිමින්, රුධිරාර්ද්‍රවූ භූමියෙන්; දන්වා දනන විලසක් දැක්වී, දැනවයින් තවන විලාසයක් දැක්වී.

683. සුන් ගජහිස්සු හුණුවැ හෙත කවඳ බඳහී, කපනලද ඇත්හිස් කවණ්ඩ ශරීරයෙහි උණුවැ හෙත කල්හි; එ රණෙහි සැහී නටන, ඒ යුඩයෙහි සාහසිකවැ නටන්නාවූ; ගණදෙව්ගණ විලස් ලද, ගණදෙවතාගණයාගේ විලාස ලදී.

684. රුපුසෙන්, ශත්‍රුසෙනාව; මඩුත්, මඩනා කල්හි; පසුගත් තමා සෙන් බලමිනි, පසුව බටුවාවූ තමාගේ සෙනාව බලමින්; එකෙණේ, ඒ ක්ෂණයෙහි; දසන් මෙරජින්, දසන මරීචින්; මඳ මඳ ලවනත සදමින්, මන්‍දමන්‍ද කොට අධරය හොබවමින් :—

685. මදුනිරිඳු, මද්‍රරාජතෙමේ; එදවස්, එදවස්හි; සැහැ සෙමින්, සාහසිකවැ; කිරිඳු මෙහෙයා, හසතිරාජයා මෙහෙයා; රුපුමුදුනැ හුනු‡ කගසෙන් සුවහසින්, රිපුමස්තකයෙහි හුනුවාවූ ඛඩ්ගාසනි ශතසහස්‍රයෙන්; ඇත්දහස් පැ, හස්තිසහස්‍රයක් දැක්වී.

---

* දනත්-දන්-සම: † මුදුනෙ-සන්න. ‡ හැණු-සම:

686. ලා ගජ බඳ සෙද—පුරුදු කළ කග එ නිරිඳු,
කළ දෙසුනවටකි රුපුන්—ලැකැනොගතවී හැගිලෙන්.

687. මදිඳු නැඟි ගජරජ—නොගත් නො රජුනෙරෙණේ,
ගෙලේද පුන්සඳ මුත්—පලඟය තරු නුබතෙලේ.

688. ගජ මෙරමතින් රුදු—රුපුසයුරත් දුළ*ඹරත්,
සුරයෝනන් තියුදහස්—අමාරස† වින් එනිරිඳු.

689. රුපුසෙන් මදුනිරිඳු—මත් ගජරජ කුඹු වුහුවු,
සඳපැහැනද සඳලේ—සිරි‡ රුකළ කඩතුඹු දිවු.

---

686. ගජබඳ සෙද ලා, හස්තීන්ගේ ශරීර දැඩිකොට කපා; පුරුදුකළ කග, පරිචිතකළාවූ ඛඩ්ග ඇති; එනිරිඳු, ඒනරෙන්ද්‍ර තෙමේ; අවටකි රුපුන් ඔසුන් කළද, හාත්පස්හි සතුරන් විචජිනන කළද; ලැකැ නොගත වී ලෙන් හැඟී, ලක්‍ෂයෙහි නොගතැයි සිතින් සිති.

687. මදිඳු නැඟි ගජරජ, මද්‍රරාජයා නැංගාවූ හස්තිරාජ තෙමේ; එ රෙණේ නොරඳුන් නොගත්, ඒ යුඩයෙහි අරාජයන් නොගතැ; පලඟය, රාහුතෙමේ; පුන්සඳ මුත්, පූර්ණචන්ද්‍රයා මුත්; නුබතෙලේ තරු ගෙලේද, නභසතල යෙහි තරු ගලන්නේද.

688. ගජ මෙරමතින්, හස්තිමෙරුමථනයෙන්; රුදු රුපු සයුරත් දුළඹරත්, මහත්වූ ශත්‍රුසාගරය දැඑ භ්‍රමණය කරණ කල්හි; එ නිරිඳු, ඒ නරෙන්ද්‍රතෙමේ; සුරයෝනන් තියුදහස්, සුරයුවතීන්ගේ සතුති සහස්‍ර ලක්‍ෂණ; අමාරස, අමෘතරසයන්; වින්, අනුභව කෙළේ.

689 රුපුසෙන් ශත්‍රුසෙනා තොමෝ; මදුනිරිඳු, මද්‍ර නරෙන්ද්‍රයාගේ; මත්ගජරජ කුඹු වුහුවු, මත්තහස්තිරාජයාගේ කුම්භසතලයෙහි විද්දවූ; සඳපැහැනද සඳලේ සිරි රුකළ, සන්ධ්‍යාරාගයෙන් ආර්ද්‍රවූ අර්ධචන්ද්‍රශ්‍රී එළවූ; කඩතුඹු දිවු, කාණ්ඩ යෙහි තුඹ දිවු.

---

* දුළ-සම : † විස-බො : ‡ සඳළිසිරු-බො :

690. දෙබේ කළ සයුරේ—දලබිත් හාත්පස්නෙන්,
දවතෙනුමුත දප් පෑ—ගුරුළිඳු ඉඳු රුපුන් මැද.

691. රුපුන් ගල ලෙයෙනිපි—ලිනු ගජබඳරණ දෙරණෑ,
කියලි අඳුන්ගල්කුළු—සුවහස් කුල පැලමුහුදු.

692. බුන් තමා සිවුරඟ*—ඉගි මදුරජ යා ගත්,
දවන් පුර මුරුන් පෑ—දිත බළනතින් ගෙලෙ ලද.†

693. බියෙනැලළු එ නිරිඳු—පබවත කැඳී මේ වී,
මෙ හවනිරිඳුන් මුදුනේ—නියතර පා බිසෙව් දුන්.

---

690. දෙබේ කළ සයුරේ දලබිත්, විධා‡ කළාවූ සාගර ජලභිත්තිය; හාත්පස්නෙන් දවත්, සමන්තාත්පාර්ශ්වයෙන් දුවන කල්හි; රුපු (සෙ)න් මැද ඉඳු, ශත්‍රුමධ්‍යයෙහි නරේන්ද්‍ර තෙමේ; එනි මුත් ගුරුළුඉඳු දප් පෑ, එයින් මුක්තවූ ගරුඬෙන්ද්‍ර§යක්හුගේ දර්පය පෑයි.

691. රුපුන් ගලලෙයෙන් ඉපිලිනු, ශත්‍රූන්ගේ කණ්ඨ රුධිරයෙන් ඉපිලුනු; ගජබඳ රණ දෙරණෑ, හස්ති දේහයෙන් යුක්තවූ යුද්ධභූමියෙහි; (තෙමේ); අඳුන්ගල්කුළු සුවහස්කුල, අඤ්ජනපර්වතකූට ශතසහස්‍රයන්ගෙන් ගහණවූ; පැලමුහුදු කියලි, පශ්චිමසාගරය හැඟවී.

692. බුන් තමා සිවුරඟ ඉගි, බුන්නාවූ තමාගේ චතුරඞ්ගිනි සේනාව හා එක්ව; යා ගත් මදුරජ, යාත්‍රා ගත්තාවූ මද්‍රරාජ තෙමේ; දිතබළන් අතින් ගෙලෙ ලද, ජයගත්තාවූ අසුර භටයන් අතින් ප්‍රහාර ලද්දාවූ; පුර දවන මුරුන් පෑ, දිව්‍ය පුරයට වදනා දිව්‍යයන් දැක්වී.

693. එ නිරිඳු, ඒ නරේන්ද්‍රතෙම; බියෙන් ඇලළු, භයින් කම්පාව; පබවත කැඳී මේ වී, ප්‍රභාවතිය කැඳවා මෙසේ කී; මෙ හවනිරිඳුන් මුදුනේ, මේ සමස්තනරේන්ද්‍රයන්ගේ මස්තකයෙහි; පානියතර බිසෙව් දුන්, පාදනඛරශ්මි අභිෂේක දුන්නාවූ :—

---

* සියුරඟ-සම : † ගෙල්(ලෙ)ලැබ-සන්න :
‡ විදුරණ-බො : § ගුරුලෙ(ළී)න්ද්‍ර-හැම.

694. එ විරුහු එ මහසත්—හු එ ගරවස් ගරහා,*
ති† හේ පත් විපත් රැස්—පබවත දන් පිළිබහන්.

695. කොටැ කොටැස් තී සත්—මෙ අ රජනට පියොදැ,
මට ද මා සිවුරඟටද—පිරිපත් මුත් සෙත් දෙරෙම්.

696. බෙදැ පියොදම් යත්—පබවත් කැපෙමිනෙනිරිඳු,
කඳුලුමුසු වුවන්සඳ—කිබිසි කළා පාතඹුරෙ.

697. ගෙණහැර කියත්පත්—ලියඹු කත ලියනු වස්,
ඇතෝරන් සමග මව්‡—වැලපින් කිවු§ මේ වදන්.

---

694. එ විරුහු, ඒ වීරවූ ; එ මහසත්හු, ඒ එඩි ඇති මහා සත්වයාගේ ; එ ගරවස් ගරහා, ඒ ගෘහවාසයට නින්දා කොට ආවාවූ ; තී හේ පත් විපත්රැස්, තී හෙතුකොටගෙණ ප්‍රාප්තවූ විපත්ති රාශිය ; පබවත, ප්‍රභාවතිය ; පිළිබහන් දන්, දුරුකරණ උපායක් දනු.

695. තී සත්කොටැස් කොටැ, තී සත් කොට්ඨාසයක් කොට ; මෙ අ රජනට පියොදැ, මේ අ රාජයන්ට නඟා යවා ; මටද මා සිවුරඟටද, මටද මාගේ චතුරඞ්ගිනී සෙනාවටද ; පිරිපත් මුත්, පරිපන්ථයෙන් මුක්තවූ ; සෙත් දෙරෙම්, ශාන්ති ධරම්.

696. බෙදැ පියොදම් යත්, බෙදා යවමි යත්ම ; පබවත් කැපෙමින්, ප්‍රභාවතීතොමෝ කම්පා වෙමින් ; එ නිරිඳු පා තඹුරෙ, ඒ නරෙන්ද්‍රයාගේ පාදතාමරසයේ ; කඳුලුමුසු වුවන් සඳ, බාෂ්පයෙන් යුක්ත වක්ත්‍රචන්ද්‍රයා ; කිබිසි කළා, නැමූ.

697. කියත්පත් ගෙණ හැර, ක්‍රකචපත්‍රාරූඪ කොට ; ලියනු කත ලියනු වස්, හෙමලතාකාරකාන්තාව කපනු පිණිස, (නියොගකළ කල්හි ;) මව්, මාතෘතොමෝ ; ඇතොරන් සමග, අන්තඃපුර ස්ත්‍රීන් හා වක් වැ ; වැලපින් මේ වදන් කිවු, විලාපයෙන් මේ වචනයෙන් කිවූ.

---

* ගුරුහා-සම : † තා-සම : ‡ මවුන්-හැම. § කියූ-බො :

698 පදංහත්හී යම් සොමි—මිහිපැන්වරට ලඟ වී,
කඳපහු අද දප බින්*—නිවිනි මනගේ දුලු† වැට.

699. සසරද නිසර වී—මුලුලෝ සිත් පැතිර‡ වී,
විසඹාරද§ සුන් වී—අද හල ලෝනුවන්සැණ.

700. නිරතුරු වලප වත—කලකුළු||ඉති පියනිරිඳු.
සිරිසර කුසපිය පියා—අබැව ලැබ ලැබේ වී.

701 බලා කොවින් සලා—සුලාස හිස් නරපවර,
කැඳෙනුවස් ලියනුවන්—වුවනත් බැලී මැතියන්.

702. වදනෙ සමග පබවත්—සල ලවන් කිසල හා ඉහිමැ,
පියවුරුමුත්හර වැල—වෙවුළුම් හෙවැ මෙ විසූ.

698. පදඅත්හි යම් සොමි, පදෘජියන් කෙරෙහි යම් සෞම්‍යයෙක් ඇද්ද; මිපැන්වරට ලඟ වී, මධුපානාවසථාවට ආසන්න විය (දශවන අවසථාවයයි සේයි); අද කඳපහු දප බින්, අද කන්‍දර්පයාගේ දර්‍පප බිඳිනා; මනගේ දුලු වැට නිවිනි, මන නැමැති ගෘහයෙහි ජවලිත ප්‍රදීපය නිවුනේයි.

699. සසර අද නිසර වී, සංසාරය අද නිස්සාර විය; මුලු ලෝ සිත්පැතිර වී, සකල ලොකයතෙමේ ප්‍රාර්ථනාසිත විය; විසඹාර අද සුන්වී, විශ්‍රම්භාකරය¶ අද ශූන්‍යවිය; ලෝනුවන් සැණ අද හල, ලොකනෙත්‍රොත්සවද අද හළී.

700. ඉති නිරතුරු වලප වත, මෙසේ නිරන්තරයෙන් විලාප වන කල්හි; කලකුළු පියනිරිඳු, උත්කණ්ඨාවූ පිය නරෙන්ද්‍රතෙමේ; සිරිසර කුසපිය පියා, ශ්‍රීසාරවූ කුශප්‍රියයා හැරපියා; අබැව ලැබලැබේ වී, අබැවිහි ලාභය ලබන්නී යයි කී.

701. නරපවර, නරප්‍රවරතෙමේ; කොවින් බලා, කොප යෙන් බලා; සුලාස හිස් සලා, මඳවිගසක් හිස සලා; ලියනු වන් කැඳෙනුවස්, කපන්නාවුන් කැඳවනු පිණිස; ඇමැතියන් වුවනත් බැලී, අමාත්‍යයන් මුහුණ බැලී.

702. පබවත්, ප්‍රභාවතීතොමෝ; එ වදන් සමග, ඒ වචනය හා එක්ව; සල ලවන් කිසල හා ඉහිමැ, චඤ්චලවූ අධර

* දප්තං.හැම :  † දිලු-සන්න.  ‡ සිත් පැවැති-සන්න.
§ විසඹරස-සම :  || වැලපෙනකලකළු-සම :
¶ විශ්‍රම්භාකාරය-හැම.

703. නොපතෙවිරු මෙ දෙස—සහ පිරිපත් නො*මුස්නෙම්.
බජ් මහිමි එ† නිරිඳු මා—බොජුන්නිවෙස වසන්නේ.

704. බිය එළඹැ මුවපත්—කියතෙ කෙ‡ අදහනුවෝ,
රජසිරිසර විඳුනා—දූහැ§ හෙද ඒ නිරිඳුනා.

705. ඉදිනප පින්වෙසෙසෙක්—ඇත කුසවිරු වඩනේ,
මදුරජ අප සියල්ලට—එ නිරිඳු සෙත් කෙරේ වී.

706. ලැබ නියෝ|| මුළුතැන්—හි සුද¶කැරු වසනුයේ,
මලියියමල්දම් ඇ—වෙසෙසත්තම් කෙළෙ කුසා.

---

පල්ලව හා එක්වම; පියවුරු මුත්හරවැල, පයොධරමුක්තාහාර වලි; වෙවුළුම් හෙව, කම්පා කොට; මෙ වියු. මෙසේ කීවු.

703. බජ්, පියානෙනි; එ විරු මෙදෙස නොපත, ඒ වීරයා මේ දික්හි අප්‍රාප්ත වුවහොත්; පිරිපත් නොමුස්නෙම්, පරිපන්ථ යෙන් අමුක්තයමු; මා බොජුන් නිවෙස වසන්නේ, මාගේ මුළුතැන්ගෙයි වසන්නේ; එ මහිමි නිරිඳු, ඒ මාහිමි නරෙන්ද්‍රයි.

704. බිය එළඹැ මුවපත් කියත්, භයට පැමිණී මුඛයට ප්‍රාප්තයක් කියත්හොත්; එ කෙ අදහනුවෝ, ඒ කවුරු අද හත්ද; විඳුනා රජසිරිසර දූහැ, අනුභවකරන්නාවූ රාජ්‍යශ්‍රී හැරපියා; එ නිරිඳුනා, ඒ නරෙන්ද්‍රනායකතෙමේ; ඒද, එන්නේයැ.

705. ඉදින් අප පින්වෙසෙසෙක් ඇත, ඉදින් අපගේ පුණ්‍යවිශෙෂයක් ඇතහොත්; කුසවිරු වඩනේ, කුසවීරයා එන්නේය; මදුරජ, මද්‍රනරෙන්ද්‍රය; එ නිරිඳු අප සියල්ලට සෙත් කෙරේ වී, ඒ නරෙන්ද්‍රයා අප හැමදෙනාට ශාන්ති කෙරෙයි කී.

706. නියෝ ලැබ, නියොග ලදින්; මුළුතැන්හි සුදකැරු වස නුයේ, මුළුතැන්ගෙයි සූදකර්ම්ම කොට වසනුයේ; මලියියමල් දම් ඇ, මාලතීකුසුමදාමාදී; වෙසෙස් අත්තම් කෙළෙ, විශෙෂ හස්තකර්ම්මාන්ත කෙළේ; කුසා, කුසරජයි.

---

* නූ-සන්න. † සිමිය එ-හැම. ‡ කෙනො-බො.
§ රජසිරි විඳුනේදූ-බො.
|| නියොග නියෙන්-හැම. ¶ සුදු-සන්න.

707. එ හසුන්සා තුසවැ—වැලඳැ පබවත් දුසඳ,
වෙසෙද යම් තැන්හි—නිදෙස් වී එ නරපවර.

708. මුළුතැන්හි කියත—පබවත ඉගි පුරපියන්,
මදුරජ මැතිගණ හා—සහ සොම්නසින් යා ගත්.

709. පකුන්විල් දෙල ලොල්—මත්ගිජිඳු පුවළසර.
මැඩමැඩ මඩ කෙළෙ දියෙන්—මුළුතැන්තැනෙ මහත්මා.

710. එ සඳ සරසඳ—පිළිරූ එක් කලා හුන්,
සමගිනි උනුසඳ විරූ—දිගස පෙරමග මගන්නෙ.

---

•707. එ හසුන් අසා තුසවැ, ඒ අසුන් අසා සන්තොෂවැ; පබවත්දුසඳ වැලඳැ, ප්‍රභාවතී නම් දුහිතෘ චන්ද්‍රලෙඛාව ආලිඞ්ගනය කොට; එ නරපවර, ඒ නරප්‍රවරතෙමෙ; යම් තැන්හි වෙසේද, යම් තැනෙක වාසය කෙරේද; (එ) නිදෙස් (වවයි) වී, ඒ කියවයි කී.

708. පබවත, ප්‍රභාවතිය; මුළුතැන්හි කියත, (කුසරජු) මුළුතැන්ගෙහි යයි කියත්ම;* මදුරජ, මද්‍රරාජතෙම; මැතිගණ හා පුරපියන් ඉගි, අමාත්‍යසමූහයා හා පුරස්ත්‍රීන් හා එක්ව; සහ සොම්නසින්, සොම්නස් සහිතවැ; යා ගත්, ගමන් ගති.

709, 710. පකුන්විල් දෙල ලොල්, පඞ්කවිද්‍රැම† තටාක දෙලෙහි ලොල්වූ; මත්ගිජිඳු පුවළසර, මත්තගජේන්ද්‍රයක් හුගේ ප්‍රෞඪසාර ඇති; එ මහත්මා, ඒ මහාත්මතෙමේ; මුළු තැන් තැන්, මිළුතැන්දෙර මැඩි; දියෙන් මැඩමැඩැ මඩ කෙළෙ, ජල මිශ්‍ර කොට මැඩැ පඞ්ක කෙළේ—එක් කලා හුන් සරසඳ පිළිරූ, එක් කලාවක් ශූන්‍යවූ ශරච්චන්ද්‍රප්‍රතිරූපකවූ; සමගිනි උනු, සමාගමයෙන් ඌන; සඳ, අධ්‍යාශය ඇති; විරූ, රජතෙමේ; එ සඳ දිගස පෙරමග මගන්නේ, ඒ සන්ධියෙහි දීඝායුයගේ පූර්වමාර්ගය බලන්නේ :—

---

* මූළුතැන් වැඩූ, මුළුතැනට වඩවයි කියත්ම-බො.

† පඞ්කද්‍රම-පාඞ්කද්‍රුම-හැම.

711. ගලමිනි එදනන්—තුනුහෙම් කැළුම් වතුරේ,*
කනාලියනෙඩි මඩනා—පබවත හෙ දුටි වඩනා.

712. පබවත ඉකි මදිඳු—නැමැදූ සරණිත වතළේ,
ඇය වරළස බිඟුපෙළ—කුසපාතඹුරු ඇවුළූ.†

713. වරළස හෙ පබවත—විරූ සරණිත රදතේ,
සසරු ලස්කරවනු වස්—ලූ පස් කඳප් දප්සර.

714. එ හිමිය සඳසඳට—එදා පුණුපොහෝදා,
මුත්දළසෝපලඟ—වුහුටු සිනේ මෙරජරජ.

---

711. තුනුහෙම් කැලුම්වතුරේ එදනන් ගලමිනි, ශරීරහෙම කාන්තිතොයයෙහි එ ජනයා ගල්වමින්; කනාලියන් එඩි මඩනා පබවත, කනකලතායෙහි ප්‍රෞඪිය මඩනාවූ ප්‍රභාවතිය; හේ, ඒ රජතෙමේ; වඩිනා දුටි, එන්නා දිටී.

712. මදිඳු, මද්‍රරාජතෙමේ; පබවත ඉකි, ප්‍රභාවතිය හා එක්ව; නැමීදූ සරණිත වතළේ, නමස්කාර කොට පාද යෙහි වතළේ; ඇය වරළස බිඟුපෙළ, ඇගේ ඒ කෙශකලාප නැමැති භෘඞ්ගපඞ්ක්තිතොමෝ; කුස පාතඹුරු ඇවුළූ, කුස රජයාගේ පාදතාමරසය වැසූ.

713. විරූ සරණිත රදතේ, වීරයාගේ පාදයෙහි හොබ වන්නේ; හෙ පබවත වරළස (දම්), ප්‍රභාවතියගේ ඒ කෙශ කලාපයැ; (කෙසේද?) සසරු ලස් කරවනු වස්, සංසාරයෙහි ලස්කරවනු පිණිස; දප්සර කඳප් ලූ පස්, දර්පයෙන් සාරවූ කන්‍දර්පයා ලූ පාශයෙකි.

714. මුත්දළසෝ පලඟ, මුක්තවූ මහත්වූ ශොක නැමැති පලඟ ග්‍රහයා ඇති; සිනේමෙරජරජ වුහුටු, සමිත නැමැති මරීචිරාජී වුහුටු පා; එ හිමිය සඳසඳට, ඒ ස්වාමිහුගේ අදහස් නැමැති චන්ද්‍රයාහට; එදා පුණුපොහෝදා, එදවස පූර්ණිලපො සථ දිනයෙකි.

---

* වතුරේ ගලමින්-බො: † වවුලු-සම:

715. වෙහෙස පරවිපිලියට—විසඹරජසිරු බිසෙවු,
උනඟහට පෙරපඬුරු—පබවත බඳදිලිවිලස්.

716. ගෙණ මහසත්හු ඒ—සරණතල තඹරත්නෙන්
මදිඳු සෙවිනදන්පත්*—වදනින් තෙමේ මේ වී

717. අවුදු වැ එක්සර—දූහැ අගරජසිරි සියල්,
වුනුව‡ තෙපි මෙවලයහ‡—යහා හැමට ගියදවස්.

718. මිණිමුතු පිරි නිවෙස්—පිරිවර කියනොවා දුන්,
තැරැසි වැ§යත දියපියන්—නැරැඹුම් නැත් දියපියන්.

---

715. පබවත බඳදිලි විලස්, ප්‍රභාවතීයගේ බද්ධාඤ්ජලි විලාසතෙමේ; පරවිපිලියට වෙහෙස, විරහයට දුක්ඛයෙකි; විසඹ රජඉසුරු, විශ්වම්භරාජ්‍ය ඓශ්වර්‍ය්‍යයෙහි; බිසෙවු, අභිෂෙකයෙක; උනඟහට පෙරපඬුරු, අනඞ්ගයාහට පූර්‍ව ප්‍රාභෘතයෙකි.

716. ඒ මහසත්හු සරණතල තඹර, ඒ මහාසත්වයාගේ පාදපද්ම; අත්නෙන් ගෙණ, අතින් ගෙණ; මදිඳු, මද්‍රරාජ තෙමේ; සෙවින් අදන්පත් වදනින් තෙමේ, සොකයෙන් හිනනවූ තෙපුලෙන් සිඤ්චනය‖කොට=රැතිකොට; මේ වී, මෙසේ කී.

717. සියල් අගරජසිරි දූහැ, සමස්ත අග්‍රරාජ්‍යෛශ්වර්‍ය්‍ය හැරපියා; එකසරවැ අවුදු, එකචාරීව අවුදින්; තෙපි මෙ වලායහ වුනුව, තෙපි මේ වැළැඟී¶සුව අනුභවකළව; හැමට ගිය දවස් යහා, හැමට ගියදවස් සුවපරිද්දකි.

718. මිණිමුතු පිරි නිවෙස්, මණිමුක්තායෙන් පූර්ණ ගබ්හද; පිරිවරකියන් දුන් ඔවා, පරිවාරයෙහි හිතයන් දුන් අවවාදද; දියපියන්, ජගත්‍රයප්‍රියානය; දියපියන් තැරැසිවැ යත්, ජගත්හි ප්‍රියාවන් ත්‍රසතවැ යනකල්හි; නැරඹුම් නැත්, බැලීමෙක් නැත්.

---

* පවත්-සම : † වුත්නව-සත්න. ‡ වල-වළා-හැම.
§ තැරුැසි-තැවැරුැසි-හැම. ‖ සඤ්චනය-බො : ¶ වැලැඟී-පැලඟ-සම

719. නොමඳ බොළඳ සල—තැරුසුම් නොදුරු නැරුඹුම්,
නරනිඳු පියන් සැබැවූ—විසිනත නැතොත සැබැවූ.

720. බෙහෙවින් ඉති පියෝ—සහදෙස්හුමැ මුළුදියේ,
විසිනතහොත නිරිඳුනා*—ගුණිනම් කිමැත්† විඳුනා.

721. ගුත නො ගෙණෙත් මහ—සත්හු ඇසිරුයින් රක්නා,
වැළැඳි ලිය සා මඩුතුදු—ගුණ නොගෙණැරුක රක්නේ.

722. වෙහෙසඳ දුන් දනන්—යහ විඳුවත් මහත්මෝ,
මිරිකත සඳුන් සසිනිදු—පියගඳ නොමඳ දෙන්නේ.‡

---

719. නරනිඳු, නරේන්ද්‍රයා ; නොමඳ බොළඳ සල, අමන්‍දවූ මුග්ධත්වයෙන් චපලබවද ; තැරුසුම්, ත්‍රසත බවද ; නොදුරු නැරුඹුම්, අදූරාවලොකනයද ; මෙ පියන් සැබැවූ, මේ ප්‍රියාවන්ගේ ස්වභාවය ; විසිනත, විචාරත්හොත් ; ඕත සැබැවූ නැත්, ඔවුන්ගේ සැබැවයෙක් නැති.

720. මුළුදියේ, සමසත ජගත්හි ; බෙහෙවින්, බොහෝ සේම ; පියෝ, ප්‍රියාවෝ ; ඉති සහදෙස්හුමැ, මෙසේ සද්දෙස් හුමැ ; නිරිඳුනා, නරේන්‍ද්‍රනායකය ; විසිනතහොත, විචාරත් හොත් ; විඳුනා ගුණිනම් කිම් ඇත්, අනුභවකරන්නාවූ ගුණයෙක් නම් කොහි ඇද්ද ?

721. ඇසිරුයින් රක්නා මහසත්හු, ආශ්‍රය කළාවුන් රක්‍ෂා කරන්නාවූ මහාසත්වයෝ ; ගුණ නොගෙණෙත්, ගුණ නුගුණ නොවිචාරති ; රුක, රුක්තෙමේ ; වැළඳි ලිය සා මඩුතුදු, වැළැන්දවූ ශාඛා මඩුතුදු වීනමුත් ; ගුණ නොගෙණැ, ගුණ නොවිචාරා ; රක්නේ, රක්‍ෂා කරන්නේයි.

722. මහත්මෝ, මහාත්මයෝ ; වෙහෙසද දුන් දනන්, දුක්ඛය දුන්නාවූ ජනයන්ටමැ ; යහ විඳුවත්, සුඛානුභව කරවති ; සඳුන් සසිනිදු මිරිකත, චන්‍දනය සංඝර්ෂණය කොට මිරිකන කල්හි ; නොමඳ පියගඳ, බොහෝවූ ප්‍රියගන්ධය ; දෙන්නේ, දානය කරන්නේයි.

---

* නරනිඳුණා-සන්න. † කුමක්-හැම.

‡ අ මි ත ගුණ නුවණ ශුතු ටිතුමෝ පබ ද
අ න ත වෙහෙස ලදුවත් නොම වෙති දුහු ද
දී ග ත පතළ සුවදැති සොඳ සඳුන්කා ද
සි දි ත මඬිත එකලෙස පැතිරෙයි සුව ද—සුභාෂිතය.

723. න්රවිරු බිඳෙද මේ—රුපුසෙන් නො තා වික්මෙන්.
දලනිදු සිලිල් නො ගුරුළු—පියාපහරින් නො බිඳේ.

724 එ තෙපුලසා විරු—සිඳුවර රතුපුලදෙලේ,
පෑ ලවනත* මඩනා—දසනගරසින් මේ වී.

725. කරණතරවරු† යුදු—තමා කැවු‡ බැලුමෙක් දෙසෙ,
ලැබැ සිටුනා දෙනෙ කවර—නරනිඳු මෙ තුන්ලෙව්හි

726. බිඳෙව§ අද රුපු—රජසෙන් මා හඬිනී,
තිලොසසානෙ හා මුස වෙ—නරනිඳු තො නොකර කුහුල්.

---

723. නරවිරු, නරවීරය; නො තා වික්මෙන්, තාගේ වික්‍රම විනා; මෙ රුපුසෙන්, මේ ශත්‍රුසෙනාව; බිඳේද, බිඳෙන්නේද; දලනිදුසිලිල්, සමුද්‍රජලයතෙමේ; නො ගුරුළු පියාපහරින් නො බිඳේ නොගුරුළකුගේ පක්‍ෂප්‍රහාරයෙකින් නොබිඳෙන්නේසී.

724. විරු, වීරතෙමැ; එ තෙපුල් අසා, ඒ වචනය අසා; රත්උපුල්දෙලේ සිඳුවර පෑ, රක්තොත්පලදලයෙහි සින්දුවාර දක්වා; ලවනත මඩනා දසනගරසින්, අධරමර්දනය කරණ දන්තමරීචීන් උපලක්‍ෂිතවූ; මේ වී, මෙසේ කී.

725. යුදුකරණතර වරු, යුඞකරන්නා තබා; තමා කැවු බැලුම් එක්දෙසෙ ලැබ, තමාගේ කොපනිරීක්‍ෂණයෙහි එක දෙශයක් ලදින්; නරනිඳු, නරෙන්‍ද්‍රය; මෙ තුන්ලෙව්හි, මේ ලොකත්‍රයෙහි; සිටුනා දෙනේ කවර සිටිනා ජනයෙක් කව රෙක්ද?

726. අද මා හඬිනී, අද මාගේ හඬින්; රුපුරජසෙන් බිඳෙව. ශත්‍රුරාජසෙනාව බිඳෙව; හා, පිරිසිනැ; තිලෝ සසානේ මුස වේ, තුන්ලෝ නිඃසාරණයෙහි මූර්ඡා වෙයි; නරනිඳු, නරෙන්‍ද්‍රය තො නොකර කුහුල්, තෝ එයට් ශඞකා නොකර.

---

* ලවනතින්-ශී. † කරතතරවරු-කරනවර-සම:
‡ කොවු-කෙවූ-කැව-සම: § බිඳෙව-සම:

727. පවසමිනිති කුසා—විසිත් නිරිඳබරණෙන්,
සැදිනි මෙදෙ නිරිඳුගත්—කෙළෙ හා ලොමුදෙහෙන් සත්.

728. එතර සුසැඳූ* සැදි—පබවතකත ඉඟි නිරිඳු
වරවරණකඳ රඳවා—පුරෙනෙ කෙළෙ යා යුදගන.

729. එරවණ හරා හුන්—තමා විලසුඳු මඬනා,
සී† සර කුසාහිමියා—මිණි ගෙලෙ කෙළෙ සියහුනන්.‡

730. වැළැඳ පබවත දුන්—නරවිරු විත් යහපහස්,
වතොවුනසඳ මියුරු—මියුරු වැ කො තෙපල තඃා.

731. උදු කෙළෙ හො උද—යගැ§ පුන්සඳ සියල්ලො,
නො දැනවිය රියට සැක—උනඟවුවන් රජවූවන්.

---

727 කුසා ඉති පවසමින්, කුසරාජතෙමේ මෙසේ ප්‍රකාශ කෙරෙමින්; විසිත් නිරිඳුඅබරණෙන්, විචිත්‍ර නරෙන්ද්‍රාභරණයෙන්; සැදිනි මෙද, සජ්ජිත වූයේ මතු නොවෙයි; නරනිඳුගත් ලොමුදෙහෙන් සත් කෙළේ හා, නරෙන්ද්‍රයාගේ ශරීර ලොමොද්ගමනයෙන් සඤ්ජනන කෙළේ හායි.

728. එතර, එවිගස්හි; සුසැඳූ සැදි පබවතකත ඉඟි, මනාකොට සදනලද ප්‍රභාවතීකාන්තාව හා එක්ව; නිරිඳු වරවරණකඳ රඳවා, නරෙන්ද්‍රයා වරවාරණස්කන්ධය හොබවා; එපුරෙන් යුදගන යා කෙළෙ, ඒ පුරෙන් යුධාඞ්ගනයට ගමන්කෙළේ.

729. එරවණ හරා හුන් තමා විලසුඳු මඬනා, ඓරාවණයා ආරූඪවැ හුන්නාවූ තමාගේ විලාසයද මඬනාවූ; සීසර කුසාහිමියා, සිංහස්වර ඇති කුසරජහුගේ; ගෙලේ, කණ්ඨයෙහි; සියහුනන්, ශක්‍රතෙමේ; මිණි කෙළෙ, මාණික්‍යය කෙළේ.

730. වැළැඳ පබවත දුන් යහපහස්, වැළැඳි ප්‍රභාවතියගේ දුන්නාවූ සුඛස්පර්ශ; නරවිරු වින්, නරවීර තෙමේ අනුභව කෙළේ; ඔවුන් අසඳ මියුරු වත්, ඔවුන්ගේ අශ්‍රධාව මධුරවන කල්හි; මියුරුවැ තමා කො තෙපල, මධුරව තමාගේ කවර කථාද?

731. පුන්සඳ උදයගැ උදුකෙළෙ හෝ, පූර්ණචන්ද්‍රයා උදයාචලයෙහි උදුකෙළේ හෝයී කියා; සියල්ලෝ සැක නො දැන

---

* සුසැදු-සම : † සිරි-බො : ‡ හුණත්-සම : § උදුයගැසි-බො :

732. නරනිඳු කිරිඳුකඳ—උදයගැ රිවි විලස් දෙත්,
අඹට මිනෙක්කැලක් මෙන්—දූවැ අද වතුලෙරජරුස්.

733. යුගත පවනින් රඹ—වනකෙව් අපොළ* හඬනෙන්,
කුසා සහ රජ බළරුස්—බිමඇපිළැගී තන්ගත්.

734 බලමිනොවුන් කැපි—පබවත යදුත් සත්සර,
සියතත් ඔවා දින්† මෙද—කෙළෙ හා ලෝ යෙසෙන් හෙළ.

735. පිවිටු නරනිඳු සසෙන—ගිනෙපුර කල මන තමා,
කෙළෙ මෙද මදිඳුදු සිත්—රඟැ නැටවා තුරුැනළත්.

---

විය සමස්තලොකයාට සැක නොඉපදවීද ; (නොහොත්) රීයට, රථයට ; රජ වුවන්, රජහුගේ වක්‍ත්‍රය ; උනඟ වුවන් අනඞ්ගයාගේ වක්‍ත්‍රයයි කියාද ශඞ්කා නොඉපැදවිය

732. නරනිඳු, නරෙන්‍ද්‍රයා ; කිරිඳුකඳ උදයගැ, කරීන්‍ද්‍රස්කන්ධ ලක්‍ෂණ උදයාචලයෙහි ; රිවිවිලස් දෙත්, සූර්‍ය්‍යවිලාසය දෙන කල්හි ; අඹට එක්මින් කැලක් මෙන්, අඹට එක්වූ මත්ස්‍යසමූහයක් මෙන් ; රජරුස්, රාජරාශිතෙම ; දූවැ අද වතුළේ, දිවැ අවුත් වැතිරිවැතිරී ගියේ.

733. යුගතපවනින් රඹවනක් එව්, යුගාන්තමාරුතයෙන් කෙහෙල්වනයක් මෙන් ; කුසා අපොළ හඬනෙන්, කුසරජහුගේ අ ස්ඵොටනහඬින් ; සහරජ බළරුස්, රජුන් හා සහිත භටරාශිතෙමේ ; බිම ඇපිළැගී තන්ගත්, බිමගැසී තැන්ගතී.

734. ඔවුන් කැපි බලමින්, ඔවුන්ගේ කම්පාව බලමින් ; පබවත යදුත් සත්සර, ප්‍රභාවතී ආරාධනා කරන්නාවූ සත්ව සාරතෙමේ ; සියතත් ඔවා දින් මෙද, ස්වකීයස්ථාන හා අවවාද දුන්නේ මතු නොවෙයි ; ලෝ යෙසෙන් හෙළ කෙළෙ හා ලෝකය යසසින් ධවල කෙළේ හායි.

735. නරනිඳු, නරෙන්‍ද්‍රතෙමේ ; තමා මනකල, තමා චිත්තකාන්තාවූ ; මදිඳු දූ, මද්‍රරාජ දුහිතෘ ප්‍රභාවතියගේ ; සිත්රඟැ, චිත්තලක්‍ෂණ රඞ්ගභූමියෙහි ; තුරුැනළන් නටවා ‍ෙකෙළෙ මෙද, සන්තොෂලක්‍ෂණ නාටකයන් නර්තනයකරවූයේ මතු නොවෙයි ; සසෙනගින්, සෙනාව හා සහිතවැ ; එ පුර පිවිටු, ඒ පුරයට ප්‍රවිෂ්ට වූයේ හා.

---

* අපෙළ-බො :　　† දුන්-සම :

736. නිරිඳුන සත් කතාය අද පතාය නුවර,
කළ යුදු සෙතාය නිරිඳු පවතාය මෙ කියූ සග.

## තුදුස්වන සග.

---

737. සියොසිරිමෙර ලා—සලා විසඹරස මුහුදු,
නො සැළ ගුණ විඳැ අමා—පමා සහ සොම්නස් ළෙන්.

738. කුසවිරු නො ලසැ වැ—යමෙ බඳරිසි සියනුවර,
අමතා මැතිගණ කිසී—දෙනෙ ද පිළිපෙළ හිඟු වී.

739. නිකුත් කපතැ සයුරත්—සෙයින් වෙලෙළ මඩනා,
නරවිරු සෙනඟිනි මහත්—විසිතුරු යතුරු තුරුනෙන්.

---

736. සත්, නිරිඳුන, සප්තනරෙන්ද්‍රයන්, කතාය පතාය, කාන්තාව ප්‍රාර්ථනා කොට; නුවර අද, නගරයට අා පරිද්ද. සෙතාය කළ යුදු, ශාන්තිය හා කළාවූ යුධ ඇති; නිරිඳු පව තාය, නරෙන්ද්‍රයාගේ ප්‍රවෘත්තියද; මෙ කියූ සග, මේ කීවාවූ සර්ගයයි.

චතුර්දශම සර්ගයයි.

---

737. විසඹරස මුහුදු, විශ්‍රම්භරස සාගරය; සියොසිරි මෙර ලා සලා, සමාගමශ්‍රීමෙරුමන්ථනය* බහා අලළා; සහසොම්නස් ළෙන්, සොම්නස් සහිත චිත්තයෙන්; පමා, ප්‍රමදාවගේ; නො සැළගුණ අමා විඳැ, අශඨගුණ නැමැති අමෘතය අනුභවකොට:—

738. කුසවිරු, කුසවිරතෙමේ; සියනුවර නොලසැවැ යාමෙ බඳරිසි, ස්වකීය නගරයට නොලස්වැ යාමෙහි බඩ ඉච්ඡාව; මැතිගණ අමතා කිසී, අමාත්‍ය සමූහයා කැඳවා කිය; දෙනෙද, ජනසමූහතෙමේද; හිඟු, වහාම; පිළිවෙළ වී, ගමනට සැරැහිණි.

739. නරවිරු, නරවිරතෙමේ; වෙලෙළ මඩනා කපතැ සයුරත් සෙයින්; වෙලාන්තයෙහි මඩනාවූ කල්පාන්ත සාගරය සෙයින්; විසිතුරු යතුරු තුරුනෙන්, විචිත්‍රවූ යාත්‍රා භෙරීන්; මහත් සෙනඟිනි, මහාසෙනායෙන්; නිකුත්, නික්මිණි.

---

* මෙරුමන්ථය-බො:

740. තුරඟ් කුරගසින—හස් හී පාබඳ රජපබඳ,
වී සුරගඟ සරණ—කෙළෙ නුබනුබඳ සරනා,

741. පුරදොර සපත වත්—නරනිඳු රිය යහන්සී,*
තුරඟ ගජබළ සහස්—පුරයොග අතුරු නො නිමී.†

742. විල්නළ දද රොන්—සළා කනසක් මීතෝ,
බිඟු පිවිතුරු ගොස් වේ—ගොසින් ගියෙවිරුඟු පෙරට.

743. නැඟි රිජරුස් දද—බමණ කළනු රන්සත්,
සෙනඟ වතුරු මින්කැන් සළා මහගඟ වන් වී.

---

740. තුරඟ කුරගසින්, අශ්වයන්ගේ ඛුරප්‍රහාරයෙන්; අහස්හි පාබඳ රජපබඳ, ආකාශයෙහි පදන්‍යාසය කළාවූ ධූලි සමූහයතෙමේ; සුරගඟ වී, ආකාශගඞ්ගාජලය වී; අ සරනා, ආවාවූ දිව්‍යපසරාවන්; නුබ නුබඳ සරණ කෙළෙ, ආකාශයෙහි අනුබඹවැ ඇවිදුනා කෙළේ.

741. නරනිඳු, නරෙන්ද්‍රයාගේ; රිය යහන්සී, රථයාන වාහන; පුරදොර සපත වත්, පුරවාරයට සම්ප්‍රාප්ත වන කල්හි; තුරඟ ගජබළ සහස්, හස්ත්‍යශ්වභටසහස්‍රතෙමේ; පුරයොග අතුරු නොනිමී, පුරයොගානතර නොතවුයේ‡ නොවේ.

742. විල්නළ දද, තටාකමාරුත බ්‍රාහමණතෙමේ; රොන් සළා කනසක්, රේණුච්ඡටා නැමැති කනකසඛ්ඛ ඇති; මීතෝ, මධු මැ ජල ඇති; බිඟු පිවිතුරු, භෘඞ්ගයන්ම ෂාඩවල ඇති; ගොස් වේ ගොසින්, ඝොෂා§ ලක්‍ෂණ වෙදොච්චාරණ යෙන් ගොසින්; එ විරුඟු පෙරට ගියේ, ඒ වීරයා අභිමුඛයට ගියේය.

743. නැඟි රජරුස්, නැංගාවූ රජොරාශි හා; බමණ දද නළනු රන්සත්, භ්‍රමත් වන ධ්වජ හා පවන් අනු කනකච්ත්‍ර යෙන් යුක්ත; සෙනඟ, සෙනාව; වතුරුමින්කැන් සළා, වතුරු හා මත්ස්‍යසමූහ ආවර්ත්ති ඇති; මහගඟ වන් වී, මහාගඞ්ගා වක් වැනි වී

---

* යහස්සී-සන්න. † නිවී-සන්න.
‡ නොනිවුයේ-සම : § ඝොපා-හැම.

744. කුසුමවල නෑතුරු—රජරුස වසත නිරතුරු.
සඳපතරඟි කුමුටු—ගහරුස බර ගුවන් පෑ.

745. මඳනළ සල දුන්—තුරුසාඅතින් ඉස්නා,
සිරි ලද විලඳ පෙරමගැ—හෙන සඳලේ කරඳමල.

746. ගඟුල් දෙලන් හැලි—ලියගෙ විසිතුරු තුරුපා,
පබවත ඉඟි සිරි නිරිඳු—විඳුමින්* පුරබියෙස් වී,

747 එතර ඇමැතිසක්—මහවේ දිමුතු මුතු වන්,
පුලිනතරාකන කලස—පුළුපින් සඳ නොසරස්.

---

744. කුසුමවල නෑතුරු, කුසුමයෙන් ආකුල නාගද්‍රැම ; නිරතුරු රජරුස වසත, නිරන්තරයෙන් ධූලිරාශී වසන කල්හි ; සඳපතරුඟි කුමුටු, සන්ධ්‍යාකාන්තියෙහි ගැලුනාවූ ; ගහ රුසබර ගුවන් පෑ, ග්‍රහරාශීන් හරිත ගගනය දැක්වී.

745. සඳලේ හෙන කරඳමල. ශාඩවලයෙහි හෙන්නාවූ නක්තමාල කුසුමතෙමේ ; මඳනළසල දුන්, මන්දමාරුතයෙන් කම්පාකරණලද ; තුරුසාඅතින් පෙරමගැ හිස්නා, ද්‍රැමශාඛා ලක්ෂණ හස්තයෙන් පෙරමග හිස්නාවූ ; විලඳ සිරි ලද, විලඳ යෙහි ශ්‍රී ලදී.

746. ගඟුල්, ගඞ්ගා ජලයෙහිද ; දෙලන්, කඳුරැළියෙහිද ; හැලි, නිර්ඣරයෙහිද ; ලියගෙ, ලතාග්‍රයෙහිද ; විසිතුරු තුරුපා, විචිත්‍රවූ ද්‍රැමමූලයෙහිද ; නිරිඳු, නරෙන්ද්‍රතෙමේ ; පබ වත ඉඟි, ප්‍රභාවතිය හා එක්වැ ; සිරි විඳුමින්, ශ්‍රී අනුභව කෙරෙමින් ; පුරබියෙස් වී, පුර අභිමුඛ වී.

747. එතර, එවිගස්හි ; ඇමැතිසක්, අමාත්‍යචක්‍රතෙමේ ; මහළුවේ, මහාවීථියෙහි ; දිමුතු මුතුවන් පුලිනතරා, දීප්තිමත්වූ මුක්තාඵලසදෘශ වැලි අතුට ; නොසරස්, වහාම ; කනකලස පුළුපින් සඳ, සුවර්ණකලස නාලිකෙර කුසුමයෙන් හොබවා :—

---

* විදිමින්-බො :

748. සමෝරඹ තැඹිලි නව—මල් දම්* මලෝලඹු දී,
වෙමිණිතොරණේ රන්—දද බැඳැ විදුදහස් වන්.

749. නගා කුලාදද—පහ අතුරේ කනමුවා,
පුරසයුරෙනදනා නා—සියන් ගුරුළුදහස් වන්.†

750. කුසවත් ඉති විසිත්—කැරැ නුවරන් ඇතොරන්,
ඉති ගොස් දසුන් දෙළ වින්—පබවත හා නරවරා.

751. කල ඉති ඇත්කද—බජන නරනිඳු දෙනෙ දිවු,
සැදු එරවණිගිජිඳුකඳ—තිදසිඳු ලද‡ මඬොරවිලස්.

---

748. සමොරඹ, මුව සහිත රමහාද ; තැඹිලි නවමල් දම් මලෝලඹු, සනහිරද නවකුසුමද ඔලඹ කුසුදමද ; දී, බැඳ ; වෙමිණිතොරණේ; වීථියෙහි මණිතොරණයෙහි ; විදුදහස් වන්, විද්‍යුත්සහස්‍ර බඳුවූ ; රන්දද බැඳැ, කනකධ්වජ බැඳැ :—

749. පුරසයුරෙන් නාසියන් අදනා, පුරසාගරයෙන් නාග ශතයන් අදනාවූ ; ගුරුළුදහස් වන්, ගරුඩ සහස්‍රයන් වැනිවූ ; කනමුවා පහඅතුරේ කුලාදද නගා, කනකමය ප්‍රාසාද අතු රෙහි කුලාදද නගා :—

750. කුසවත් ඉති විසිත් කැරැ, කුසාවතිය මෙසේම විචිත්‍ර කොට සදා ; නුවරන් ඇතොරන් ඉති ගොස්, නාගරික අන්තඃ පුරස්ත්‍රීන් හා එක්ව ගොසින් ; පබවත හා නරවරා, ප්‍රභාවතිය හා නරොත්තමයාගේ ; දසුන් දෙළ වින්, දර්ශනදෛහලය අනුභව කෙළේ.

751. සැදු එරවණිගිජිඳුකඳ, සදනලද ඓරාවණහස්ති හුගේ ස්කන්ධයෙහි ; තිදසිඳුමඬොරවිලස් ලද, ශක්‍රදෙවෙන්ද්‍ර යාගේ මණ්ඩොදරහියගේ විලාසය ලද්දාවූ ; කල ඉති ඇත්කද බජන නරනිඳු, කාන්තාව හා එක්වා හස්තිස්කන්ධයෙහි හොබ නාවූ නරෙන්ද්‍රයා ; දෙනෙ දිවු, ජනතෙමේ දිටි.

---

* නවාමල්-බො :

† මිණිකිමැ දිසි දිමුත්—පහග ලෙලදෙන දද ලූත්,.
වැද සිදු සපුත් ගත්—ගුරුළු දහසෙව් දනානුවන්ගත්. 95 ගුත්තිල.

‡ ගිජිදුතිදසිඳු-බො :

752. යුගත සිව්* සයුර—දලරුස් උතුළු වැ සහා,
ගොසිනෙකමුහුදු වදනා—විලසින් සෙන් පුර බිඳු.

753. දෙරටහළු† උදයග—ලගත කුසදිවයුරා,
පුරඅඟන නොසල වුවන්—පියුමන් වී සිරිසියෝ.‡

754. සැලයුතු විලස්නෙන්—තුරිනුතුළු වම්යන් කැන්,
දළලොබිනවුදු බඳමුළු— බුජඟුන් දඟ කෙළෙ දියුණු.

755. යන සිවුරඟසෙන්—මහමේ ඔනා වත්වත්,
සැරහු සෙබලකගසිය—සරාවිදුලිය සිරි දුනු.§

---

752. යුගත සිව්සයුර උතුළු දලරුස්, යුගාන්තකාලයෙහි චතුස්සාගරයෙහි උතුළාවූ ජලරාශීන්; සහවැ, එක්ව; ගොසින් එකමුහුදු වදනා විලසින්, ගොසින් එකසාගරයට වදිනා විලාසයෙන්; සෙන්, සෙනාතොමෝ; පුරබිඳු, පුරසෙවී= පුරයට වන.

753. කුසදිවයුරා, කුසරාජ නැමැති දිවාකරයා; දෙරට හළු උදයග ලගත, වාරාට්ටාලශාලා නැමැති උදයාචලයට ආසන්නවූ කල්හි; ඔසල පුරඅඟනන්, රුස්වූ පුරස්ත්‍රීන්ගේ; වුවන් පියුමන් සිරිසියෝ වී, වක්ත්‍ර පද්ම ශ්‍රී සහිත වි.

754. සැලයුතු විලස්නෙන්, චාපල්‍යයෙන් යුක්ත විලාස යෙන්; (දෝහෝ නොහොත්) සැලයුක්ත විලාසයෙන් දෝහෝ; තුරින් උතුළු, උතුළු සන්තොෂයෙන් (දෝහෝ නොහොත්) උතුළු ද්‍රැමයෙන් දෝහෝ; වම්යන් කැන්, ස්ත්‍රීන් සම්බන්ධ සමූහ (දෝහෝ නොහොත්) තුඹස්සමූහ දෝහෝ; දළ ලොබින් අවුදු මුළුබඳ, මහත් ලොභයෙන් රුස්වූ; බුජඟුන් දියුණු දඟ කෙළෙ, භුජඞ්ගයන් (දෝහෝ නොහොත්) භුජඞ්ගම යන් දෝහෝ විගුණ කොට දඟ කෙළේ.

755. යන සිවුරඟසෙන්, යන්නාවූ චතුරඞ්ගිනීසෙනා නැමැති; මහමේ ඔනා වත්වත්, මහාමෙඝ අවස්කන්ද වන කල්හි (මහත්වන කල්හි); සැරහු සෙබළ තගසිඹ, සැරහූ දක්ෂභටයන්ගේ බඩ්ගශතතෙමේ; සරාවිදුලිය සිරි දුනු, ප්‍රභා සහිත විද්‍යුල්ලතා ශ්‍රී ලදී.

---

* සිඹු-බො: † අළු-සන්න. ‡ සිරිසියෝ වී-සම: § දින්-සන්න.

756. ගෙත නුවනත කලුන්—වැටූ නැටුම්රඟහී,
රෙසී පබවත විරුහට—නිරතුරු බැලුම් කළ මද.

757. දනහට සැණමඟුල්—දිගසුන් නුවන් රසයින්,*
බැලුම්ඟියෙන් ඇමැතියන්—කැරැ තුටු රජ විමන් වන්.

758. එතර තුරිනැදූ වැලඳි—පබවත වත්දුමඬලෙන්,
දෙගුරු නුවනත සඳකැන්—මිණින් වගුළැස්දරතෝ.†

759. පැසුළු සඳන්හල්—කැරැ නන්වතින් විල්හල්,
කැරැ එ දිළිඳුන් සඟරා—කෙළෙ නන්වතින් සඟරා.

---

756. කලුන් වැටූ නැටුම්රඟහී, කාන්තාවන් පැවැත්වූ නාත්‍යරඞ්ගයෙහි ; නුවනත ගෙත, නෙත්‍රය ගෙන කල්හි ; පබවත, ප්‍රභාවතීතොමෝ ; විරුහට, වීරයාහට ; රෙසී, රොස යෙන් ; නිරතුරු බැලුම් මද කළ. නිරන්තරයෙන් බැලුම් මඳකළා.

757. දනහට සැණමඟුල්, ජනයන්ට මහොත්සව මඞ්ගලවූ ; දිගසුන් නුවන්රසයින්, දීඝාක්ෂියගේ නෙත්‍රරසායනවූ ; බැලුම් ඉඟියෙන්, බැලීමෙන් හා ඉංගෙන් ; ඇමැතියන් තුටුකැරැ, අමාත්‍යයන් සන්තොෂ කොට ; රජ, රජතෙම ; විමන්වන්, විමානයට වනි.

758. එතර, එවිගස්හි ; තුරිනැදූ වැලඳි, සන්තොෂයෙන් ඇදූ වැලැන්දුවූ ; පබවත වත් ඉඳුමඬලෙන්, ප්‍රභාවතියගේ වක්ත්‍රචන්ද්‍රමණ්ඩලයෙන් ; දෙගුරු නුවනත සඳකැන්මිණින්, මව්පිය දෙදෙනාගේ නෙත්‍රලක්ෂණ චන්ද්‍රකාන්ත මාණික්‍යයෙන් ; ඇස්දරතෝ වගුළ, අශ්‍රැ නැමැති ජලය වගුළේ

759 පැසුළු, පසුව ; සඳන්හල් කැරැ, සඳුනශාලාවන් කරවා ; නන්වතින් විල්හල් කැරැ, නානාවස්තුයෙන් විපුල කොට ගැවසී ගන්වා ; එ දිළිඳුන් සඟරා කැරැ, ඒ අනාථයන් රැස් කොට ; නන්වතින් සඟරා කෙළෙ, නානාවස්තුයෙන් සඞ්ග්‍රහ කෙළේ.

---

* රසයෙන්-සන්න.

† එතර දෙගුරුවත් දසුන්ලොල් කුසනිරිඳු පබවතිඳු මඬලෙන් ගුරුනනුවනත සඳකැන් මිණින් වගුල ඇස්දරතො-සී.

(සී සන්න දෙකම ආකුලසී.)

760. ගැහැවුම් නමෙ සෙමෙහි—පියන් පියවුරු මඬලේ,
සිඳුම් නම් ගුණ දෙලේ—ඔවුන් මිණිමෙවුලෙම වී.

761. වසත්ගැණුම් නම්—පියන් මනදෙළකෙළියේ,
පිරිහිඹිනිවත්සෙවුවෙක්—දෙසෙ ඔවුනමෙසෙමෙහි.

762. සමර පැලඹුම නමෙ—සෙමෙහි මනදෙළ කෙළියේ,
නොහොත කලවියෝහි පියන් දෙසෙ දිස්නෙ බොහෝ.

763. නාපැලඹුම් නම්—මෙහෙසුරුහු දළමඬලේ,
නොහොත් පෙණේ එසෙමේ—නරනිඳුකිරිඳු හලහි.

---

760. එ සෙමෙහි, ඒ කාලයෙහි ; ගැහැවුම් නම්, සට්ටන යෙක්නම් ; පියන් පියවුරුමඬලේ, ප්‍රියාවන්ගේ පයොධර මණ්ඩලයෙහි මය ; ගුණසිඳුම් නම්, ගුණච්ඡෙදයෙක් නම් ; දෙළේ, ක්‍රීඩාධුරයෙහි, ඔවුන් මිණිමෙවුලේම වී, ඔවුන්ගේ මණිමෙඛලායෙහිම වී.

761. වසන් ගැණුම් නම් ; වසන් ගැන්මෙක් නම් ; පියන් මනදෙළකෙළියේ, ප්‍රියාවන්ගේ මනොදෙහළ ක්‍රීඩායෙහි මය ; එ සෙමෙහි, ඒ කාලයෙහි ; පිරිහිඹිනිවත් සෙව්වෙක්, පරිශ්‍රමයෙන් වත්සෙවාව ; ඔවුන දෙසෙම, ඒ සත්‍රීන්ගේ පක්‍ෂයෙහිමැයි.

762. එසෙමෙහි, ඒ කාලයෙහි ; සමර පැලඹුම් නම් ; සමර පැලඹිමෙක් නම් ; මනදෙළ කෙළියේ, මනොදෙහළ ක්‍රීඩායෙහි මය ; නොහොත්, එසේනොවත් හොත් ; කල්වියෝහි, කාන්තාවන්ගේ විරහයෙහිය ; බොහෝ පියන් දෙසෙ දිස්නේ, බොහෝසේම ප්‍රියාවන්ගේ පක්‍ෂයෙහිම පැණේන්නේයි.

763. නා පැලඹුම් නම්, නාගයන්ගේ පැලඹිමෙක් නම් ඇත්තේ ; මෙහෙසුරුහු දළමඬලේ, මහෙශ්වරයාණන්ගේ ජටාමණ්ඩලයෙහිය ; නොහොත්, එසේ නොවන් හොත් ; එසෙමේ, එකල්හි ; නරනිඳු කිරිඳුහලහි, නරෙන්ද්‍රයාගේ කරීන්ද්‍රශාලාවෙහි මැයි.

764. පැලඹුම් කර කුරුරු—දිවයුරු විමන්මඬලේ,
නොහොත් කෙළිදෙලේ හි—වැලලූ කලුන් අතුරේ,

765. දළදන් පියවදන්—සමඅතිනි අතසරණේන්,
සිවුසඟරවත්නෙන්—ලොසිත්*ගත් නරවරා අරියොර.

766. ලදිනෙ කල නුරා—සිතු සිතුමැණි රජදහම්,
නොමැඩැ සගපවගහේ—කැරැ රැස් රජ සැර†විසි.

767. සියො සිරි පත් කතාය පුරපතාය කුසා,
කළ නන් සෙතාය දියට පවතාය මෙ කියූ සග.

**පසළොස්වනු සග.**

---

764. කුරුරු කර පැලඹුම් නම්, කුෑරකර පැලඹීමෙක් නම්; දිවයුරු විමන්මඬලේ, දිවාකරයාගේ විමානමණ්ඩල යෙහි මය; නොහොත්, එසේ නොවත් හොත්; කෙළිදෙලෙහි, ක්‍රීඩාබුරයෙහි; වැලලූ, ආලිඞ්ගනය කළ; කලුන් අතුරේ, කාන්තාවන් අතුරේ මැයි.

765. දළ දත් පියවදන් සමඅතිනි අතසරණේන්, මහත් දූනය ප්‍රියවචනය සමානාත්මතාය අර්ථචර්‍ය්‍යාය යන; සිවු සඟරවත්නෙන්, චතුර්විධ සඞ්ග්‍රහවස්තුයෙන්; නරවරා, නර වීරතෙමෙ; අරියොර ලොසිත් ගත්, නොඑක්වන් ලොකයා සිත් ගති.

766. එකල, ඒ කාන්තාවගේ නුරාසිතු, අනුරාගචිත්ත ලක්‍ෂණ; සිතුමැණි ලදින්, චින්තාමණිය ලදින්; රජදහම් නොමැඩැ, දශරාජධර්මයන් නොහැරැ; සගපවග හේ රැස් කැරැ, ස්වර්ගාපවර්ගහෙතුරාශි කොට; රජ, රජතෙමේ; සෙරෙන් විසි, බොහෝ කාලයක් වාසය කෙළේ.

767. සියොසිරි පත් කතාය, සමාගමශ්‍රියට ප්‍රාප්ත කාන්තාව හා එක්වැ; පුරපතාය කුසා, පුරයට සම්ප්‍රාප්ත කුස රජහු; දියට කළ නන් සෙතාය, ජගත්හට කළාවූ නානා ශාන්තියගේ; පවතාය කියූ, ප්‍රවෘත්තිය කීවාවූ; මෙ සග, මේ සර්ගයයි.

පඤ්චදශම සර්ගයයි.

---

* ලෝ-හැම. † සෙරෙන්-සන්න.

768. සියබස් සකු මගද—මහගත් සයුරු තෙර පත්,
සරසවිය නම් කලිකල්—දෙව්සිරි කළ අයදමෙන්.

769. කළ මහමේ දඟ—අඩයටියෙන් සිවුසයුරු,
වැළකූ බූ මෙහේ ගත්—පඬුඉඳුහු පරපුරෙනා.

770. සඳකුල කැත්කොත්—වහත් දෙරණත් නත් වන්,
මෙත් කිත් පතළ කලිකල්—සවැණි නිරිඳු කෙළේ මේ.

---

768. සියබස්, ස්වභාෂාද ; සකු, සංස්කෘතද ; මගද, මාගධද යන ; මහගත්, මහාශාස්ත්‍ර ලක්ෂණ ඇති ; සයුරු, සාගරයාගේ ; තෙරපත්, තීරප්‍රාප්තවූ ; කලිකල් සරසවිය නම්, කලිකාල සරස්වතීය යන නම් ඇති ; දෙව්සිරි කළ අයදමෙන්, දේවී ඓශ්වර්‍ය්‍යයා කළ අරාධනාශෙන් :—

769. මහමෙ දඟ කළ, මහාමෙඝ නොවැස්ස දුන්නාවූ ; අඩයටියෙන්, (අර්ධයෂ්ටියෙන්) ශක්තීන් ; සිවුසයුරු වැළකූ, චතුස්සාගරයන් වැළකූවාවූ ; බූ මෙහේ ගත්, භූතයන් අතින් මෙහෙ ගත්තාවූ ; පඬුඉඳුහු පරපුරෙන් ආ, පාණ්ඩව රාජවංශ පරම්පරායෙන් ආවාවූ :—

770. සඳකුල කැත් කොත්, චන්ද්‍රවංශයෙහි ක්ෂත්‍රියයන්ට ධ්වජවූ ; දෙරණත් වහත්, ධරණීය උසුලන්ට ; නත් වන්, අනන්තයා වැනිවූ ; පතළ මෙත් කිත්, පතළාවූ මෛත්‍රී හා කීර්ත්ති ඇති ; කලිකල් සවැණි නිරිඳු, කලිකාල නම්වූ සර්වඥ (පණ්ඩිත) නරෙන්ද්‍රයන් විසින් ; මේ කෙළේ, මේ කාව්‍යය කරණලදී.

කව්සිළුමිණි කුසදා
පදාර්ථ නිමි

---

මෙ කව් කැරු (යළි) කලිකල් සවැණි දදගස්,
දත් ඒ කල් ලෝ පද අත් මෙ පිරික්සා.

## 108 පට.



413. නුබකුස වි ගන නිල්
හසසර වි ගුම් ගත,
තුරැදු වී වි නෙ මෙනෙ ද
දකුතු නුගි යළ තුල්තද

1. කාව්‍යනාමගර්භචක්‍රම්.

109 පිට.

| | | | | |
|---|---|---|---|---|
| මු | ස | ව | න | ළ හස්රුස් |
| ස | ව | ස | න | ල ලම්නස්ගත් |
| ව | ස | නු | ව | නතැ දිස්මෙන් |
| න | න | ව | මි | නඟ තුටු මොණර |

415. මුසවනළ හස්රුස්
සවසනල ලම්නස්ගත්,
වස නුවනතැ දිස්මෙන්
නනවමිනඟ තුටු මොණර.

2. අඞ්ගුමම්.

---




417. තිනි නළාහසක ල්
හැමී වැ සී නල බො ල්
දිනි සළාරුස වි ල්
බිමි වැසී දල ව ල්

3. පඤ්ජපතුම්.

110 පිට.



419. මලපවනා බිඳුපොද
වී පිඹු වනා නෙ කෙවුල්,
සිකි ඉඟි නා කෙළේ මත
තම වී වැසිවදල් අත.

## 4. කවිනාමගර්භචක්‍රම.




421. දලදරහු ගිම් සොයත්
දසැඳිරි වත් දෙත් ලෙල,
දලන විදුපෙනෙහෙලි මුත්
දලරොන් වන් කබබපෙල.

5. ධවජම්.

---

114 පිට.




431. දුන් ලියනකරන් පත්
දුන් ලියනකරන් පත්,
වෙනෙ කඳලනෙන් අඳ වී
වෙනෙ කඳලනෙන් අඳ වී.

84683

6. ඝඬංශය.

11(19)26

2 D

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මු | හු | ලු | තු රු ල ද | කු | සු | ම් |
| න | ව | ව | | න | න් | නී |
| කො | ල | ඹ | | ප | ව | න් |
| තැ | නැ | වී | වෙ නෙ ව න | ද | න | න් |

433. මුහුලුතුරු ලද කුසුම්, නවවතුරු ලද නන්නී,
කොලඹවෙනෙ වන පවන්, තැනැ වී වෙනෙ වන දනන්.

## 7. කවාටම්.

115 පිට.




435. වෙනේ හැසී නවදල—සමා වැසූ සදලෙන්,
ගෙනේ දීසී නවදල—පමා වුසූ සදලෙන්.

## 8. ගොමූත්‍රිකා.




437. වැජැ තඹවතුරු නී—පමා තරඟතුරු ලා,
ලැඟී තද යතුරු සේ—පියා තමා පතු නිදු

## 9. මුරජබන්ධනම්.

116 පිට.




439. ගිලී වලා දස අත්
වැනී ලැගී සිකි පිල්,
දිලී බලාරස මත්
තිනී මැගී සැකි කල්

## 10. ගොමූත්‍රිකාඞ්ඝ්‍රිපාදම්.

---




441. හැමි වැ සි නල බොල්
තෙමි වැසි මලගල්
බිමි හැසි දල වල්
නිමි මැසි කල කල්.

## 11. අවුල්ජාල.

117 පිට.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ග | න | ක | ල් | හු | පො | ද | ප | ක | ර |
| ල | | | පි | | | මෙ | | | ක |
| ව | | | ළි | | | බි | | | ලී |
| ස | ර | සි | ය | ල | ත | එ | ක් | ව | න් |
| රැ | | | රු | | | ණී | | | දු |
| ද | | | යු | | | මි | | | ක |
| පො | ර | ළ | මි | ණී | ති | ල් | ගී | ව | ම් |
| ල | | | ත් | | | නි | | | ද |
| ග | | | ව | | | න | | | නු |
| ව | ලා | පි | හි | කු | ලු | ග | ල් | බෙ | ලෙ |

443. ගනකල්හු පොදපකර
සරසිය ලත එක්වන්,
පොරළ මිණීතිල් ගීවම්
වලා පිහිකුලු ගල්බෙලෙ.

444. වගල පොදරැස වලග
හිවත් මියුරු යළි පිල්,
ගන නිල්මිණී එබි මෙද
ලෙනුදම් කදුන් ලී කර.

12. චතුරශ්‍රජාලම්.

118 පිට.




445. නිල්වලා වනන්
සවසනලගස දූව් වන්,
ගත චිතර දසන් බද
ගතහැගි ලී පියන් තද.

13. ත්‍රිශූලම්.

---

| | | | |
|---|---|---|---|
| න | ව | ද | ල |
| වි | ප | ව | න |
| ස | ද | ල | ව |
| නි | ත | න | න |

446. නවදල ලද වන
වි පවන නවප වී,
සදලව වලදස
නි තනනනතනි.

14. අඩිපාදප්‍රතිලෝමයමකම්.

CEYLON
PRINTED AT THE GOVERNMENT PRESS
COLOMBO